අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

(උසස් අධ්‍යාපන අංශය)

# ශිෂ්‍ය අත්පොත

## පොලී රහිත

## ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය

## කණ්ඩායම - 10

**අධ්‍යයන වර්ෂය**

**2025/2026**

**(අ.පො.ස (උ/පෙළ) 2022/2023/2024)**







# පටුන

හැඳින්වීම ............................................................................................................................. 4

පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය

1 කොටස ............................................................................................................................. 5

පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ උපාධි පිරිනමන ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීම සඳහා බලපාන ප්‍රතිපත්ති හා නීති රීති

2 කොටස ............................................................................................................................. 14

උපාධි පිරිනමන ආයතන වල ප්‍රථම උපාධි පාඨමාලා වලට ඇතුලත් වීම සඳහා සූදානම් විය යුතු ආකාරය පිළිබඳව වැදගත් උපදෙස්

3 කොටස ............................................................................................................................. 45

අන්තර්ජාල අයැදුම්පත්‍ර ක්‍රමවේදය පිළිබඳ වැඩි විස්තර

4 කොටස ............................................................................................................................. 64

සම්මුඛ පරීක්ෂණ ක්‍රියාපිළිවෙල

5. කොටස............................................................................................................................. 67

IFSLS හරහා පිරිනමන උපාධි පාඨමාලා

6. කොටස............................................................................................................................. 180

IFSLS හරහා උපාධි පාඨමාලා පිරිනමන ආයතන

ශිෂ්‍ය අත්පොතේ දෙමළ හෝ සිංහල අනුවාදයන් සහ ඉංග්‍රීසි අනුවාදය අතර කිසියම් විෂමතාවයක් ඇති වුවහොත්, ඉංග්‍රීසි අනුවාදය බලපැවැත්වෙන බව කාරුණිකව සලකන්න

www.studentloans.mohe.gov.lk

## කෙටි යෙදුම්

| | | | |
|---|---|---|---|
| i. | IFSLS | - | පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය |
| ii. | DAIs | - | උපාධි පිරිනමන ආයතන |
| iii. | NSHEIs | - | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන |
| iv. | SLIIT | - | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් |
| v. | NSBM | - | නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් |
| vi. | CINEC | - | සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| vii. | SIBA | - | ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි |
| viii. | ICASL | - | ඉන්ස්ටිටියුට් ඔෆ් චාටඩ් එකවුන්ටන්ට්ස් ඔෆ් ශ්‍රී ලංකා |
| ix. | HORIZON | - | හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් |
| x. | KIU | - | KIU කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| xi. | SLTC | - | ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| xii. | SAEGIS | - | සේජීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| xiii. | ESOFT | - | ඊසොෆ්ට් යුනි (ප්‍රයිවට්) ලිමිටඩ් |
| xiv. | AQUINAS | - | ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් |
| xv. | ICHEM | - | ඉන්ස්ටිටියුට් ඔෆ් කෙමිස්ට්‍රි සිලෝන් |
| xvi. | ICBT | - | ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් |
| xvii. | BCI | - | බෙනඩික් කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ප්‍රයිවට් ලිමිටඩ් |
| xviii. | NIIBS | - | නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| xix. | BMS | - | බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් |
| xx. | LYC | - | ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| xxi. | GATEWAY | - | ගේට්වේ කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් |

www.studentloans.mohe.gov.lk

## ශිෂ්‍ය අත්පොත

## පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය

### හැඳින්වීම

රටේ ආර්ථික සහ මානව සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වන ඉහළ මට්ටමේ මානව ප්‍රාග්ධන සංචිතයක් ඇති කිරීම උසස් අධ්‍යාපන ක්‍රමය මඟින් අපේක්ෂා කරයි. උසස් අධ්‍යාපනය මූලික පාසල් අධ්‍යාපනයෙන් ඔබ්බට ගොස් බුද්ධිමය සංවර්ධනය විවේචනාත්මක චින්තනය සහ පුද්ගල වර්ධනය පෝෂණය කරන විශේෂිත සහ උසස් ඉගෙනුම් ලබා දෙයි. උසස් අධ්‍යාපනය සඳහා ආයෝජනය කිරීමෙන් ඉහළ ඉපැයීමේ හැකියාව සහ ජීවන තත්ත්වය ආර්ථික වර්ධනය සහ අසමානතාව අඩු කිරීම ඇතුළු බහුවිධ ප්‍රයෝජන ලබා ගත හැක.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට තුළ පහසුකම් සැපයිය හැක්කේ අ.පො.ස (උසස් පෙළ) ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල සුදුසුකම් ලබන සිසුන්ගෙන් 25%කට පමණි. කෙසේ වුවද රාජ්‍ය විශ්වවිද්‍යාලවල ආසන සුරක්ෂිත කර ගත නොහැකි වූ බහුතරයක් අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් සහිත ශිෂ්‍යයන් හට විදේශීය විශ්වවිද්‍යාලවල, විදේශීය විශ්වවිද්‍යාලවලට අනුබද්ධිත දේශීය ආයතනවල හෝ විශ්වවිද්‍යාල පනත යටතේ පිළිගන්නා ලද දේශීය රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතනවල උසස් අධ්‍යාපන පාඨමාලා ගාස්තු දැරිය නොහැකි වේ. එම අවශ්‍යතාවය සලකා බලා ශ්‍රී ලංකාව තුළ අ.පො.ස. (උ.පෙළ) අධ්‍යාපනය සාර්ථකව නිම කරන ලද ශිෂ්‍ය පරපුර උදෙසා උසස් අධ්‍යාපන අවස්ථා වැඩි කිරීමේ පරමාර්ථය පෙරදැරිව රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල සම්බන්ධ කරගනිමින් පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය අයවැය යෝජනාවක් අනුව 2017 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

මේ යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද ඉහළ වෙළඳපොල ඉල්ලුමක් හා වෘත්තීය වටිනාකමක් සහිත උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා රජය මඟින් රු. 1,500,000/= ක උපරිමයකට යටත්ව පොලී රහිත ණය මුදලක් ලබා දීමට කටයුතු කරනු ලැබේ. තවද, සිසුන්ගේ අමතර වියදම් සඳහා ඔවුන්ගේ කැමැත්ත මත රුපියල් 300,000 /= ක උපරිමයකට යටත් පොලී රහිත ණය මුදලක්ද ලබා දේ. පොලිය රජය විසින් ගෙවන අතර ලබා ගත් ණය මුදල උපාධිය වසර 3 කින් හෝ 4 කින් හදාරා ඉන්පසු එළඹෙන වසර 1ක සහන කාලයකට පසු පිළිවෙලින් වසර 7 කින් හෝ 8 කින් ගෙවා නිමකල හකිය.පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයට අයදුම් කිරීම හා ලියාපදිංචි වීම අන්තර්ජාලය හරහා සිදු කිරීම අනිවාර්යය අවශ්‍යතාවයකි. පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය සඳහා ඇතුලත් වීමට බලාපොරොත්තු වන සියලුම සිසුන් සිය අන්තර්ජාල අයදුම්පත පිරවීමට පෙර මෙම අත්පොත ඉතා හොඳින් කියවා බලන ලෙස අවධාරණය කරනු ලැබේ.

www.studentloans.mohe.gov.lk

# 1 කොටස

**පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ උපාධි පිරිනමන ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීම සඳහා බලපාන ප්‍රතිපත්ති හා නීති රීති**

## 1.1 උපාධි පිරිනමන ආයතන සඳහා ප්‍රවේශ ප්‍රතිපත්තිය

පොලී රහිත ශිෂ්‍ය ණය වැඩසටහන සඳහා ඇතුලත් වන උපාධි පිරිනමන ආයතනවල තෝරාගත් උපාධි පාඨමාලා පමණක් හැදෑරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. අදාල පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේදී ඔවුන් විසින් සැපිරිය යුතු අවම සුදුසුකම් හා ඒ සඳහා ඔවුන් ලබා දෙන ප්‍රමුඛතාවයත්, ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාවත්, අදාල උපාධි පිරිනමන ආයතන විසින් ලබා දෙන ආසන ධාරිතාවයත් රාජ්‍ය බැංකු විසින් ලබා දෙන ණය මුදල් ප්‍රමාණයත් පාදක කර ගනු ලැබේ. යම් හෙයකින් ඒ ඒ පාඨමාලා සඳහා ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අදාල ආයතනයෙහි ආසන ධාරිතාවය ඉක්මවන අවස්ථාවකදී අ.පො.ස. (උ/පෙ) විභාගයේදී අයැදුම්කරුවන් විසින් ලබා ගත් Z ලකුණු වල සාමාන්‍ය අනුව පෙළගැස්වූ කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

## 1.2 ඇතුලත්වීම සඳහා අවම සුදුසුකම්

2025/26 අධ්‍යයන වර්ෂයට අදාලව උපාධි පිරිනමන ආයතන වෙත ප්‍රවේශය සඳහා සිසුන් තෝරාගැනීමේදී, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2022, 2023 හා 2024 අ.පො.ස. (උසස් පෙළ) විභාග සඳහා පෙනී සිට, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයින් මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුස්සන් සේ සලකනු ලබයි. අපේක්ෂකයින්;

- **(i)** අ.පො.ස. (උසස් පෙළ) විභාගයට අනුමත විෂයන් තුනක් සඳහා අවම වශයෙන් තෙවරකට නොවැඩි වාර ගණනක දී, එකවර සාමාන්‍ය සාමාර්ථ (S) ලබා සිටීම **සහ**
- **(ii)** අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා උපරිම වාර තුනක් යන කොන්දේසියට යටත්ව අවම වශයෙන් ලකුණු 30 ලබා තිබීම. (සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දින වන විට අදාළ ප්‍රතිපල නිකුත් වී තිබිය යුතුය) **සහ**
- **(iii)** අ.පො.ස. (උසස් පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂයට සාමාන්‍ය සාමාර්ථයක් (S) හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂයට සාමාන්‍ය සාමාර්ථයක් (S) ක් ලබා තිබීම **සහ**
- (iv) අයදුම්කරුවන්ගේ වයස 2025 නොවැම්බර් 30 දිනට වයස අවුරුදු 25 හෝ ඊට අඩු විය යුතුය.

www.studentloans.mohe.gov.lk

## 1.3 ඇඳුනු පාඨමාලා

අ.පො.ස. (උසස් පෙළ) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා නොමැති **හෝ** අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා නොමැති අපේක්ෂකයින්, අදාළ විෂය ධාරාවේ නිපුණතාවය ලබා ගැනීම සඳහා ඇඳුනු පාඨමාලා හැදෑරිය යුතුය.

**පරිගණක විද්‍යා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලා සඳහා ඇඳුනු පාඨමාලාව**

i. Foundational Mathematics (60 direct contact hours – 4 credits)

ii. Computational Thinking (60 (30T+30P) direct contact hours – 3 credits)

iii. English and Communication Skills (30 direct contact hours – 2 credits)

පරිගණක විද්‍යා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලා හැදෑරීමට අදාළව ඇඳුනු පාඨමාලාව හදාරන සිසුන් ඉහත සෑම විෂයයක්ම සමත් විය යුතුය ( 50% අවම ලකුණු ප්‍රතිශතයක් සහිතව).

එසේ වුවද, පරිගණක විද්‍යා උපාධි පාඨමාලාව හැදෑරීමට අදාළව ඇඳුනු පාඨමාලාව හදාරන සිසුන් ඉහත මූලික අවශ්‍යතාවයට අමතරව Foundational Mathematics විෂය 70% ක අවම ලකුණු ප්‍රතිශතයක් ලබා ගත යුතුය.

**සටහන**

එක් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක ඇඳුනු පාඨමාලාවක් හැදෑරීම තුළින් **ඕනෑම** රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක උපාධි පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලිය හැකි වේ.

www.studentsmohe.gov.lk

### 1.3.1 ඇඳුනු පාඨමාලා හැදෑරීමට පහසුකම් සලසනු ලබන උපාධි පිරිනමන ආයතන පිළිබඳ විස්තර

| ආයතනයේ නම | සම්බන්ධ කර ගත යුතු නිළධාරීන් | දුරකථන අංකය | පාඨමාලා ගාස්තුව (Rs.) |
|---|---|---|---|
| SLIIT | චාමිනි වීරක්කොඩි මිය | 011 754 3392 | 25,000/= |
| CINEC | රුවනි කරුණාදාස මිය | 076 9442866 | නැත |
| HORIZON | සංජීව කුරුප්පු මහතා | 071 1175175 | 25,000/= |
| KIU | සවිඳු ඉෂාර මහතා | 076 7334744 | 25,000/= |
| SLTC | තරිඳු නිම්සර මහතා | 070 5689968 | 20,000/= |
| SAEGIS | තරුෂි ප්‍රමෝද්‍යා මිය | 071 140 5836 | 25,000/= |
| ESOFT | එස්. තෙනුක්ෂාන් මහතා | 077 7825038 | 20,000/= |
| ICBT | විනෝත් රබින්ද්‍රකුමාර් මහතා | 077 3427287 | නැත |
| BCI | අශානි පෙරේරා මිය | 070 6035100 | 25,000/= |
| NIIBS | ආචාර්ය සජීව ජේමසිංහ | 070 3285115 | 25,000/= |
| SIBA | ටී.ආර්.එස්.මීටියාගොඩ මහතා | 070 7 940 940 | 25,000/= |

### 1.4 පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ උපාධි පිරිනමන ආයතන සඳහා ප්‍රවේශ වීමට අදාල නිර්ණායක

1. සියලුම සිසුන්හට රාජ්‍ය ප්‍රතිපාදන යටතේ උසස් අධ්‍යාපනය සඳහා එක් අවස්ථාවක් පමණක් හිමි වේ.
2. සියළුම උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.
3. 1.6 හි දක්වා ඇති පාඨමාලා ගාස්තු යටතේ උපාධි පාඨමාලාව සම්පූර්ණයෙන්ම හදාරා අවසන් කල හැකිය.
4. අනුමත උපාධි පිරිනමන ආයතනයන්හි තෝරාගත් පූර්ණ කාලීන පාඨමාලා පමණක් මේ යටතේ හැදෑරීමට අවස්ථාව හිමි වේ.
5. උපාධි පිරිනමන ආයතනයන්හි අනුමත මධ්‍යස්ථානයන්හිදී පමණක් මෙම පාඨමාලා හැදෑරීමට අවස්ථාව සලසා ඇත.
6. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින් වර සංශෝධිත) යටතේ අනුමත කරන ලද, පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයට ඇතුලත් වූ උපාධි පිරිනමන ආයතන පහත දැක්වේ.

   i. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් - SLIIT
   ii. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් - NSBM
   iii. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් - CINEC
   iv. ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි - SIBA

www.studentloans.mohe.gov.lk

v. ඉන්ස්ටිටියුට් ඔෆ් චාටඩ් එකවුන්ටන්ට්ස් ඔෆ් ශ්‍රී ලංකා - ICASL
vi. හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් - HORIZON
vii. KIU කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය -KIU
viii. ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් - SLTC
ix. සේජීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් - SAEGIS
x. ඊසොෆ්ට් යුනි (ප්‍රයිවට්) ලිමිටඩ් - ESOFT
xi. ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් - AQUINAS
xii. ඉන්ස්ටිටියුට් ඔෆ් කෙමිස්ට්‍රි සිලෝන් - ICHEM
xiii. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් - ICBT
xiv. බෙනඩික් කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ප්‍රයිවට් ලිමිටඩ්- BCI
xv. නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ්- NIIBS
xvi. බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් - BMS
xvii. ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් -LYC
xviii. ගේට්වේ කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් -GATEWAY

ඉහත දැක්වෙන රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය මෙම අත්පොතෙහි විස්තර කර ඇත. මෙහි දක්වා ඇති නීති රීති රජය විසින් හෝ අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හෝ ගනු ලබන තීරණ අනුව වෙනස් විය හැකිය.

### 1.5. පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් නොලැබීමට හේතු

i. අ.පො.ස. (උසස් පෙළ) විභාගයට අවස්ථා තුනකට වඩා පෙනී සිටි සිසුන්
කිසියම් අයැදුම්කරුවෙකුට උපාධි පිරිනමන ආයතනයකට ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් ලැබීමට අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටිය හැකි අවස්ථා තුන සමගාමී අවස්ථා වශයෙන් හෝ එසේ නොමැතිව හෝ පෙනී සිටිය හැක. නමුත් සිය අවස්ථා තුනම සම්පූර්ණ කල පසුව, ඊට පසු වර්ෂයක විභාග ප්‍රතිඵල වලින් අයදුම් කල නොහැකි වේ.

ii. මෙම වැඩසටහන සඳහා සලකනු ලබන (2022, 2023 හා 2024 වර්ෂයන්හි) උසස් පෙල විභාග ප්‍රතිඵල මත හෝ ඊට පෙර වර්ෂයකදී පවත්වනු ලැබූ අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස පළමු උපාධිය හැදෑරීම සඳහා දැනටමත් තේරී පත්ව හෝ ලියාපදිංචිව සිටින අයැදුම්කරුවකු වීම.

iii. මෙම වැඩසටහන සඳහා සලකනු ලබන (2022, 2023 හා 2024 වර්ෂයන්හි) උසස් පෙල විභාග ප්‍රතිඵල මත හෝ ඊට පෙර වර්ෂයකදී පවත්වනු ලැබූ අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙනත් පනතක් යටතේ පිහිටවනු ලැබූ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස පළමු උපාධිය හැදෑරීම සඳහා දැනටමත් තේරී පත්ව සිටින අයැදුම්කරුවකු වීම.

iv. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින අධ්‍යාපන විද්‍යාපීඨයක (College of Education) අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා දැනටමත් තේරී පත්ව සිටින අයදුම්කරුවකු වීම.

www.studentloans.mohe.gov.lk

v. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවත්නා ආයතනයක් මගින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවන් හෝ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යටතේ ඇති ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET) මගින් පවත්වන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES) පාඨමාලාව යන පාඨමාලාවන්ගෙන් වසර දෙකක හෝ ඊට වැඩි කාලයක පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීම සඳහා දැනටමත් තේරී පත්ව සිටින අයදුම්කරුවකු වීම.

vi. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය යටතේ ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාල විද්‍යායතනයක් (University College) මගින් පවත්වනු ලබන වසර දෙකකට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා අභ්‍යන්තර සිසුන් ලෙස ලියා පදිංචි වී සිටි/සිටින අයදුම්කරුවෙකු වීම.

vii. මහජන අරමුදල් මඟින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මුදල් සපයනු ලබන වෙනත් ඕනෑම ඩිප්ලෝමා හෝ උපාධි වැඩසටහනක් සඳහා තේරී පත්වී/ ලියාපදිංචි වී සිටින/ සිටි අයදුම්කරුවකු වීම.

viii. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ඕනෑම විදේශ ශිෂ්‍යත්ව වැඩසටහනක් යටතේ පළමු උපාධිය හැදෑරීම සඳහා දැනටමත් තේරීපත්ව සිටින/ ලියාපදිංචි වී සිටින අයදුම්කරුවකු වීම.

ix. පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයට සම්බන්ධව සිටින උපාධි පිරිනමන ආයතනයක පූර්ණ කාලීන ඩිප්ලෝමා හෝ උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා දැනටමත් ලියාපදිංචි වී සිටින අයදුම්කරුවකු වීම.

x. ඉහත iii සිට viii දක්වා ඡේද යටතේ සඳහන් උසස් අධ්‍යාපන ආයතනයකින් දැනටමත් ප්‍රථම උපාධියක් හෝ අදාල සුදුසුකමක් ලබා ඇති අයදුම්කරුවකු වීම.

xi. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ප්‍රවේශය සහ එහි ලියාපදිංචිය සඳහා අසත්‍ය තොරතුරු ප්‍රකාශ කරන සහ ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කරන අයදුම්කරුවකු වීම.

**සැලකිය යුතුයි :**

යම් ලෙසකින් ඇතුලත් කර ගැනීමෙන් පසු උසස් අධ්‍යාපන ආයතන ප්‍රවේශය හෝ ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමේදී අයදුම්කරු විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් එම අයදුම්කරුගේ ලියාපදිංචිය අදාල උසස් අධ්‍යාපන ආයතනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

www.studentloans.mohe.gov.lk

## 1.6 උපරිම ණය මුදල

**1.6.1 පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ වසර හතරක (4) උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා උපරිම ණය මුදල**

| | විෂය ධාරාව | උපරිම ණය මුදල (රු.) |
|---|---|---|
| 1 | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව | 800,000 |
| 2 | කළමනාකරණය සහ වාණිජ | 900,000 |
| 3 | විද්‍යාව ( ජීව විද්‍යාව/ ජෛව වෛද්‍ය) | |
| | i. විද්‍යාව (රසායනික/ජීව විද්‍යාත්මක/ජීව වෛද්‍ය) | 1,200,000 |
| | ii. විද්‍යාව (භෞතික) | 1,000,000 |
| 4 | ඉංජිනේරු තාක්ෂණය | |
| | i. ඉංජිනේරු | 1,500,000 |
| | ii. ජෛව තාක්ෂණය | 1,000,000 |
| | iii. ඉංජිනේරු තාක්ෂණය | 1,000,000 |
| 5 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |
| | i. පරිගණකවේදී | 800,000 |
| | ii. විද්‍යාවේදී | 1,000,000 |

**1.6.2 පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ වසර තුනක (3) උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා උපරිම ණය මුදල**

| | විෂය ධාරාව | උපරිම ණය මුදල (රු.) |
|---|---|---|
| 1 | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව | 600,000 |
| 2 | කළමනාකරණය සහ වාණිජ | 600,000 |
| 3 | ඉංජිනේරු තාක්ෂණය | 800,000 |
| 4 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |
| | iii. පරිගණකවේදී | 600,000 |
| | iv. විද්‍යාවේදී | 800,000 |

www.studentloans.mohe.gov.lk

## 1.7 පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය සඳහා තෝරා ගන්නා ශිෂ්‍යයන්ට වැදගත් වන වෙනත් විස්තර

1. තෝරා ගනු ලැබූ ශිෂ්‍යයන් අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අදාල නීති රීති ඇතුළත්වන ගිවිසුමකට එළඹිය යුතුය.

2. තෝරා ගනු ලැබූ ශිෂ්‍යයන් විසින් ණය පහසුකම් ලබා දෙනු ලබන රාජ්‍ය බැංකුව සමඟ ණය ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

3. මෙම ණය යෝජනා ක්‍රමය හරහා බැංකු විසින් ණය මුදල් අනුමත කරන අවස්ථාවේදී ශිෂ්‍යයාගේ මව/පියා හෝ නීත්‍යානුකූල භාරකරු පළමු ඇපකරු ලෙසත් සමීප ඥාතියෙකු හෝ දන්නා පුද්ගලයෙකු දෙවන ඇපකරු ලෙසත් ණය ගිවිසුම අත්සන් කළ යුතුය.

4. පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ මුළු ණය කාල සීමාව වසර 12කි. වසර 4ක උපාධි වැඩසටහනක් සඳහා තෝරාගනු ලැබූ ශිෂ්‍යයින්, ණය ආපසු ගෙවීම වසර 4ක අධ්‍යයන කාලය හා එක් අවුරුදු සහන කාලයකින් පසු වසර 7 කින් (සමාන වාරික 84 කින්) ගෙවා අවසන් කළ යුතුය. වසර 3ක උපාධි වැඩසටහනක් සඳහා තෝරාගනු ලැබූ ශිෂ්‍යයන්, ණය ආපසු ගෙවීම වසර 3ක අධ්‍යයන කාලය හා එක් අවුරුදු සහන කාලයකින් පසු වසර 8 කින් (සමාන වාරික 96 කින්) ගෙවා අවසන් කළ යුතුය. මෙම සම්පූර්ණ වසර 12 ක කාලසීමාව තුළ අදාල ණය පොළිය බැංකුව වෙත රජය විසින් ගෙවනු ලැබේ.

5. අදාළ ශිෂ්‍යයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය පරිදි සෑම අර්ධ වාර්ෂික පාඨමාලා කාලයක් ආරම්භයේ දී අර්ධ වාර්ෂික පාඨමාලා (Semester Basis) ගාස්තු අදාළ බැංකුව මගින් ශිෂ්‍යයා ඉගෙනුම ලබන අදාළ උපාධි පිරිනමන ආයතනය වෙත ගෙවනු ඇත.

6. අධ්‍යයන කාලය තුළ අමතර වියදම් පියවා ගැනීම සඳහා ශිෂ්‍යාධාර ණය මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් පමණක් ඒ සඳහා වසරකට රු. 75,000/= ක පොළී රහිත ණය මුදලකට ඉල්ලුම් කිරීමට අයදුම්කරුට අවස්ථාව ලැබේ. ඒ අනුව වසර 4 ක උපාධි පාඨමාලාවක් හදාරන්නේ නම් රු. 300,000/= ක උපරිම ණය මුදලක් හා වසර 3 ක උපාධි පාඨමාලාවක් හදාරන්නේ නම් රු. 225,000/= ක උපරිම ණය මුදලක් ලබාගත හැක. පාඨමාලා ගාස්තුවට අදාළ ණය මුදල සහ ශිෂ්‍යාධාර ණය මුදල යන ණය මුදල් දෙක සඳහාම ණය පොළිය රජය විසින් ලංකා බැංකුවට ගෙවනු ලැබේ. එබැවින් එම ණය මුදල නැවත ගෙවිය යුතු වනුයේද පාඨමාලා ගාස්තු නැවත ගෙවන ක්‍රමයටම ය.

7. ඉහත සඳහන් ශිෂ්‍යාධාර ණය මුදල අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව මසකට රු. 6,250 බැගින් ත්‍රෛමාසිකව රු. 18,750 ක් වන පරිදි ශිෂ්‍යයා වෙත ගෙවනු ලබන අතර මෙම මුදල ලබා ගැනීම සඳහා ලංකා බැංකුව මගින් නිකුත් කරන වවුචර්පතක් අත්සන් කළ යුතුය.

8. මෙම වැඩසටහන යටතේ පහසුකම් ලබන සෑම ශිෂ්‍යයෙකුම සෑම අනිවාර්ය අධ්‍යයන විෂයයක් සඳහාම අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ("C" සාමාර්ථයක්) ලබා ගත යුතු අතර 80% ක පැමිණීම සහතික කළ යුතුය.

9. යම් විෂයයකින් ශිෂ්‍යයා අසමත් වුවහොත් එම අධ්‍යයන වර්ෂයේ ඊළඟ අර්ධ වාර්ෂික පාඨමාලා කාලයේ දී හෝ ආසන්නතම අධ්‍යයන වර්ෂය තුළ එම විෂයයට නැවත පෙනී සිට ඉන් සාමාර්ථය ලබා ගත යුතුය. විභාගයට නැවත පෙනී සිටීමේ දී ගෙවිය යුතු විභාග ගාස්තු ශිෂ්‍යයා විසින් දැරිය යුතු වේ.

www.studentloans.mohe.gov.lk

10. යම් ශිෂ්‍යයෙකු තම අධ්‍යයන කටයුතු සාර්ථක ලෙස කර ගෙන යාමට නොහැකි තත්ත්වයක පසු වේ නම්, ශිෂ්‍යයාගේ ඉල්ලීම පරිදි සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය පරිදි බැංකුව විසින් අදාළ උපාධි පිරිනමන ආයතනය වෙත පාඨමාලා ගාස්තු ගෙවීම අත්හිටුවනු / නතර කරනු ලැබේ.

11. යම් හෙයකින් ශිෂ්‍යයෙකු සිය පෞද්ගලික කරුණක් හේතුවෙන් පාඨමාලාව හදාරමින් සිටින අතරතුර එම පාඨමාලාව සම්පූර්ණ කිරීමට අසමත් වුවහොත්, ඔහු /ඇය විසින් එම පාඨමාලාව අතහැර යන තෙක් බැංකුව විසින් ගෙවා ඇති මුළු පාඨමාලා ගාස්තුව හා ශිෂ්‍යාධාර ණය මුදල යන සම්පූර්ණ ණය මුදලම ගෙවා අවසන් කරන දිනට අදාළ පොළිය ද සමඟ එකවර ගෙවිය යුතු වේ. එසේ ගෙවීමට අපොහොසත් වන ශිෂ්‍යයන් ගේ සහ ඇපකරුවන්ගේ නම් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ ණය ගෙවීම පැහැර හරින ලද හෝ ණය ගෙවීම පැහැර හැරීමට ආසන්න පුද්ගලයන් වෙනුවෙන් පවත්වාගෙන යන අසාදු ලේඛනයට (CRIB) ඇතුළත් කරනු ඇත. තවද, ශිෂ්‍යයෙකු උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු ණය ආපසු ගෙවීම පැහැර හරින්නේ නම්, ඔහු/ඇය නම සහ ඇපකරුවන්ගේ නම් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ ණය ගෙවීම පැහැර හරින ලද හෝ ණය ගෙවීම පැහැර හැරීමට ආසන්න පුද්ගලයන් වෙනුවෙන් පවත්වාගෙන යන අසාදු ලේඛනයට (CRIB) ඇතුළත් කරනු ඇත.

12. පාඨමාලාවලට තෝරා ගනු ලැබූ ශිෂ්‍යයන් විසින් අදාල කාල සීමාව තුළ එනම් පාඨමාලා කාලය අවුරුදු 3 හෝ 4 තුළ උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.

13. සාර්ථකව උපාධි වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් අනතුරුව උචිත රැකියාවක් සොයාගැනීමේ සහ ණය නැවත ගෙවීමේ වගකීම ශිෂ්‍යයන් සතුවේ. කෙසේ වුවද මෙම පොළී රහිත ණය වැඩසටහන යටතේ බිහිවන උපාධිධාරීන්ට රැකියා අවස්ථා ඇතිකිරීම සඳහා අදාල රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතන විසින් රැකියා ජනනය කරනු ලබන ව්‍යාපාර ආයතන සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කළ යුතුය.

14. සුදුසුකම් සම්පූර්ණ කරන ලද උපාධිධාරීන් හට රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියා අවස්ථාවන්ට මෙන්ම විදේශීය රැකියා අවස්ථාවන්ට ද ඉල්ලුම් කළ හැක.

15. ශිෂ්‍යයා හට විදේශගත වීමට අවශ්‍ය වේ නම් ඔහු / ඇය විසින් ලබා ගත් සම්පූර්ණ ණය මුදල එකවර ගෙවිය යුතුය.

16. ශිෂ්‍යයන් විසින් ලබා ගත් ණය මුදල් නැවත පියවීම සඳහා බැංකුව සමඟ එළඹ ඇති ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

www.studentloans.mohe.gov.lk

## 1.8 අධීක්ෂණය

පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරකම් පූර්ණ වශයෙන් අධීක්ෂණය කිරීම සහ ප්‍රගති සමාලෝචන කටයුතු ඉටු කිරීම අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, මුදල්, ආර්ථික, ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් සිදු කරනු ලැබේ.

## උපාධි සහතිකය

උපාධි වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කරන ලද උපාධි සහතිකය ශිෂ්‍යයා ලියාපදිංචිය ලබා ඇති උසස් අධ්‍යාපන ආයතනය මගින් ශිෂ්‍යයන් වෙත පිරිනමනු ඇත.

www.studentloans.mohe.gov.lk

# 2 කොටස

## රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වල ප්‍රථම උපාධි පාඨමාලා වලට ඇතුලත් වීම සඳහා සූදානම් විය යුතු ආකාරය

### 2.1 ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ හැදෑරිය හැකි අධ්‍යයන පාඨමාලා

රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මගින් ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ හැදෑරිය හැකි පාඨමාලාවන් විෂය ධාරා පහකට (05) වර්ග කර ඇත.

1. මානව හා සමාජ විද්‍යා විෂය ධාරාව
2. වාණිජ විෂය ධාරාව
3. ජීව විද්‍යා විෂය ධාරාව
4. ඉංජිනේරු හා තාක්ෂණවේදය විෂය ධාරාව
5. පරිගණක විෂය ධාරාව

### 2.2 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වල අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් අනුයුක්ත කිරීමේ පදනම

#### 2.2.1.අවශ්‍ය සුදුසුකම්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා 2022, 2023 සහ 2024 වර්ෂවල පෙනී සිට විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සහිතව සමත් වූ නමුත් රාජ්‍ය විශ්වවිද්‍යාලවල ආසන සුරක්ෂිත කර ගත නොහැකි වූ අපේක්ෂකයින්ට පහත සඳහන් සුදුසුකම් මත පදනම්ව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි වැඩසටහනක් හැදෑරීම සඳහා 2025/26 අධ්‍යයන වර්ෂය සඳහා පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබේ.

i. 1.2 වගන්තිය යටතේ සඳහන් කර ඇති සාමාන්‍ය ඇතුළත් වීමේ අවශ්‍යතා සපුරාලීම
ii. අයදුම් කරන උපාධි පාඨමාලා/පාඨමාලා සඳහා පහත 2.3 හි සඳහන් අවම සුදුසුකම් ලබා තිබීම.

#### 2.2.2. තෝරාගැනීමේ ක්‍රියාවලිය

i. අයදුම් කරන අවස්ථාවේ දී එක් එක් අයදුම්කරුට තම අභිමතය පරිදි පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ හිමිකම් ඇති රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන්හි ඕනෑම උපාධි වැඩසටහන් සංඛ්‍යාවක් සඳහා අයදුම් කළ හැකිය. කෙසේ වෙතත්, අයදුම්කරුවෙකු තෝරා ගනු ලබන්නේ එක් උපාධි වැඩසටහනක් සඳහා පමණි.
ii. පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුගේ මනාපය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන්හි ඇති ආසන ධාරිතාව මත පදනම්ව තෝරා ගැනීම සිදු කෙරේ.
iii. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන් විසින් පිරිනමනු ලබන ආසන සංඛ්‍යාවට වඩා උපාධි වැඩසටහනක් සඳහා අයදුම්කරුවන් වැඩි නම් අයදුම්කරුගේ Z-ලකුණු සලකා බලනු ලැබේ.
iv. අයදුම්කරුගේ පළමු මනාපයට ප්‍රමුඛතාවය දෙනු ලබන අතර අයදුම්කරු පළමු මනාපය සඳහා සුදුසුකම් නොලබන්නේ නම්, තේරීම ඔහුගේ/ඇයගේ මනාප අනුපිළිවෙල මත පදනම් වේ.

mohe.gov.lk

## 2.3 පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ ඒ ඒ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන උපාධි පාඨමාලාවන්, පාඨමාලා කාල සීමාව, පාඨමාලා ගාස්තු හා පාඨමාලාව හැදෑරීම සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම්.

### 2.3.1 මානව හා සමාජ විද්‍යා විෂය ධාරාව

| | ආයතනයේ නම | උපාධි වැඩසටහන | කාල සීමාව | පාඨමාලා ගාස්තුව | ලියාපදිංචි වීමේ අවම සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 1. | **SLIIT** | **AHSS01**- ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් ('ඉංග්‍රීසි' ප්‍රධාන විෂය තුනෙන් එකක් විය යුතුය) "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම "S" සාමාර්ථ තුනක් (3) ලබා තිබීම |
| 2. | | **AHSS20**- සමාජ විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී වානිජ හෝ කලා විෂය ධාරාවන්ගෙන් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම "S" සාමාර්ථ තුනක් (3) ලබා තිබීම |
| 3. | | **AHSS03 –** භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, සහ ගණිතය යන විෂයයන් අතරින් එකවර "S" සාමාර්ථ තුනක් ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම "S" සාමාර්ථ තුනක් (3) ලබා තිබීම |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | **NSBM** | **BHSS30-**<br>නීතිවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "C" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ සිංහල හෝ දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථ ඇතුලත්ව "සම්මාන සාමාර්ථ" ("C") තුනක් සහිතව හා ගණිතය විෂය ඇතුලත්ව සාමාර්ථ 06ක් එකවර ලබා තිබීම |
| 5 | **CINEC** | **DHSS09** - තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම "S" සාමාර්ථ (3) ලබා තිබීම |
| 6 | | **DHSS22 -**<br>පූර්ව ළමාවිය අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව අවම වශයෙන් විෂයයන් 6ක් සඳහා අවම "S" සාමාර්ථ ලබා තිබීම |
| 7 | | **DHSS15 -**<br>ඉංග්‍රීසි ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් ('ඉංග්‍රීසි' ප්‍රධාන විෂය තුනෙන් එකක් විය යුතු) "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | **CINEC** | **DHSS05 –**<br>ඉංග්‍රීසි ශාස්ත්‍රවේදී උපාධිය | වසර 3 | 600,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම<br>**සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් "C" සාමාර්ථ ලබා තිබීම. |
| 9. | **HORIZON** | **GHSS13** –<br>ජෛව විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) | වසර 4 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව,භෞතික විද්‍යාව **සහ** කෘෂිකර්මය යන විෂයයන් අතුරින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම "S" සාමාර්ථ ලබා තිබීම. |
| 10. | | **GHSS23** –<br>තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම "S" සාමාර්ථ (3) ලබා තිබීම |
| 11 | | **GHSS10 -**<br>අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම "S" සාමාර්ථ (3) ලබා තිබීම |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | **AQUINAS** | **KHSS17 -** මනෝ විද්‍යාව සහ උපදේශනය පිළිබඳ විද්‍යා ශාස්ත්‍රවේදී උපාධිය | වසර 3 | 600,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම "S" සාමාර්ථ (3) ලබා තිබීම |
| 13. | **KIU** | **HHSS19** – විද්‍යාවේදී මනෝ විද්‍යා (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබීම |
| 14. | **SAEGIS** | **JHSS29** – ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | වසර 3 | 600,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් "C" සාමාර්ථ ලබා තිබීම |
| 15. | **BCI** | **NHSS26 -** ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය යන විෂයයන් අවම වශයෙන් "S" සාමාර්ථ ලබා තිබීම සහ ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම. |
| 16. | | **NHSS27 -** පූර්ව ළමාවිය අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය යන විෂයයන් අවම වශයෙන් "S" සාමාර්ථ ලබා තිබීම සහ ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | **BCI** | **NHSS31 -** උපදේශන මනෝ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම වශයෙන් "S" සාමාර්ථ ලබා තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම |
| 18 | **LYC** | **UHSS32 –** ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම "S" සාමාර්ථ (3) ලබා තිබීම |
| 19 | **Gateway College** | **VHSS33 –** අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා අවම "S" සාමාර්ථ (3) ලබා තිබීම |

www.studentloans.mohe.gov.lk

### 2.3.2 වාණිජ විෂය ධාරාව

| | ආයතන යේ නම | ප්‍රදානය කරනු ලබන උපාධි වැඩසටහන | කාල සීමාව | පාඨමාලා ගාස්තුව | ලියාපදිංචි වීමේ අවම සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 1 | **SLIIT (Malabe)** | **ACOM01** – ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. |
| 2 | **SLIIT (Kandy)** | **ACOM01-1** - ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. |
| 3 | **SLIIT (Matara)** | **ACOM01-2** - ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. |
| 4 | **SLIIT (Jaffna)** | **ACOM01-3** - ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. |
| 5 | **NSBM** | **BCOM02-** ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගිණුම්කරණය විෂය ඇතුලත්ව වාණිජ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම. **හෝ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සහ ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණ |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| | **NSBM** | | | | විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම. |
| 6 | | **BCOM17** - ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ව්‍යාපෘති කළමනාකරණ විශේෂඥ) | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම. |
| 7 | | **BCOM39 -** සංචාරක, සත්කාර සහ සිදුවීම් පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම.<br>**සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම. |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | **NSBM** | **BCOM45** ව්‍යාපාර කළමනාකරණ විද්‍යාව පිළිබඳ උපාධිය (මානව සම්පත් කළමනාකරණය) | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් “S” සාමාර්ථයක් ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් “C” සාමාර්ථයක් ලබා තිබීම. |
| 9 | | **BCOM57 –** ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් “S” සාමාර්ථයක් ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් “C” සාමාර්ථයක් ලබා තිබීම. |
| 10 | | **BCOM58 -** ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (කාර්මික කළමනාකරණය විශේෂඥ) | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් “S” සාමාර්ථයක් ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් “C” සාමාර්ථයක් ලබා තිබීම. |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | **ICASL** | **CCOM03** - ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (විශේෂ) | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගිණුම්කරණය විෂය ඇතුලත්ව වාණිජ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **හෝ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සහ ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණ විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම. |
| 12 | | **CCOM04** - ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය) | වසර 3 | 600,000 | |
| 13 | | **CCOM46** ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 14 | | **CCOM47** ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණවේදී උපාධිය | වසර 3 | 600,000 | |
| 15 | **CINEC** | **DCOM48 -** අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 16 | | **DCOM09** - සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 17 | | **DCOM18** - මානව සම්පත් කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 18 | **CINEC** | **DCOM19** - ව්‍යාපාර පරිපාලනය පිළිබඳ කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 19 | | **DCOM21** - බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගිණුම්කරණය විෂය ඇතුලත්ව වාණිජ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **හෝ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සහ ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණ විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම. |
| 20 | | **DCOM49** ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 21 | **SIBA** | **ECOM34** - ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 22 | **HORIZON** | **GCOM11**- ව්‍යාපාර කළමනාකරණ විද්‍යාව පිළිබඳ උපාධිය (මානව සම්පත් කළමනාකරණය) | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 23 | | **GCOM12**- අලෙවිකරණය පිළිබඳ කළමනාකරණ (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 24 | | **GCOM43**- ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගිණුම්කරණය විෂය ඇතුලත්ව වාණිජ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **හෝ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සහ ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණ විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම. |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 25 | **KIU** | **HCOM13** - මානව සම්පත් කළමනාකරණ (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 26 | | **HCOM14** - අලෙවි කළමනාකරණ (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 27 | | **HCOM15** - ගිණුම්කරණ කළමනාකරණ (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගිණුම්කරණය විෂය ඇතුලත්ව වාණිජ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **හෝ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සහ ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණ විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම |
| 28 | **SLTC** | **ICOM24** - සැපයුම් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 29 | | **ICOM33 –** සංචාරක හා සත්කාරක කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වසර 3 | 600,000 | |
| 30 | | **ICOM27** - මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 31 | | **ICOM25** - මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 32 | **SLTC** | **ICOM26** - ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගිණුම්කරණය විෂය ඇතුලත්ව වාණිජ විෂයය ධාරාවෙන් “S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **හෝ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සහ ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණ විෂය සඳහා “C” සාමාර්ථයක් ලබා තිබීම. |
| 33 | | **ICOM23-** අලෙවි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 34 | | **ICOM28 -** සංචාරක හා සංචාරක කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S” සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම |
| 35 | | **ICOM29 -** ඊ සංචාරක හා ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 36 | **SAEGIS** | **JCOM35** - ගිණුම්කරණය හා මූල්‍යකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගිණුම්කරණය විෂය ඇතුලත්ව වාණිජ විෂයය ධාරාවෙන් “S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **හෝ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සහ ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණ විෂය සඳහා “C” සාමාර්ථයක් ලබා තිබීම. |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 37 | **SAEGIS** | **JCOM30** – වයාපාර පරිපාලනවේදී උපාධිය | වසර 3 | 600,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 38 | | **JCOM36** - අලෙවිකරණය පිළිබඳ වයාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 39 | | **JCOM37** - මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වයාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 40 | | **JCOM38** -වයාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 41 | | **JCOM50** – සංචාරක හා ආගන්තුක සත්කාර පිළිබඳ වයාපාර කළමණාකරනවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 42 | | **JCOM55-** කාර්යෝපාය හා සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ වයාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 43 | **ICBT** | **MCOM31 (Colombo)**<br><br>**MCOM31-1 (Kandy)**<br>වයාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 44 | **BCI** | **NCOM32** - ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 45 | | **NCOM51 –**<br>අලෙවි කළමණාකරනය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 46 | | **NCOM52**<br>මානව සම්පත් කළමණාකරනය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | |
| 47 | | **NCOM53**<br>ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගිණුම්කරණය විෂය ඇතුලත්ව වාණිජ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම<br>**හෝ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සහ ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණ විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම. |
| 48 | **ESOFT** | **LCOM40 -** ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 49 | **BMS** | **QCOM42-**<br>ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 900,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |

www.studentloans.mohe.gov.lk

### 2.3.3 විද්‍යා විෂය ධාරාව

| | ආයතන යේ නම | උපාධි වැඩසටහන | කාල සීමාව | පාඨමාලා ගාස්තුව | ලියාපදිංචි වීමේ අවම සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 1 | **AQUINAS** | **KBIO09** – කෘෂි කර්මාන්ත කළමනාකරණ විද්‍යා (ගෞරව) උපාධිය | වසර 4 | 1,200,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී පහත විෂයන් දෙකක් සමඟ වෙනත් ඕනෑම විෂයක් සඳහා “ S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම.<br>ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උසස් ගණිතය හෝ සංයුක්ත ගණිතය, කෘෂිකර්මය, විද්‍යාව සඳහා තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය, කෘෂි තාක්ෂණය, ජෛව සම්පත් තාක්ෂණය සහ ආහාර තාක්ෂණය. |
| 2 | **CINEC** | **DBIO08** - රූපලාවන්‍ය නිෂ්පාදන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,200,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී පහත විෂයන් දෙකක් සමඟ රසායන විද්‍යාව හෝ විද්‍යාව සඳහා තාක්ෂණය යන විෂයන් සඳහා “ S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම.<br>ජීව විද්‍යාව , භෞතික විද්‍යාව, කෘෂිකාර්මික විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය, කෘෂි තාක්ෂණය, ජෛව සම්පත් තාක්ෂණය සහ ආහාර තාක්ෂණය. |
| 3 | | **DBIO14** වෛද්‍ය හා සෞඛ්‍ය නිෂ්පාදන කළමණාකරනය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,200,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව හෝ තාක්ෂණ විෂයය ධාරාවෙන් අවම වශයෙන් “S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. |
| 4 | | **DBIO15** රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,200,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍ය විෂයය ධාරාවෙන් හෝ භෞතික විද්‍යා විෂයය ධාරාවෙන් අවම වශයෙන් “S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | **CINEC** | **DBIO07** කර්මාන්ත ඖෂධවේදී විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,200,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී පහත විෂයන් දෙකක් සමඟ රසායන විද්‍යාව හෝ විද්‍යාව සඳහා තාක්ෂණය යන විෂයන් සඳහා " S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම.<br>ජීව විද්‍යාව , භෞතික විද්‍යාව, කෘෂිකාර්මික විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය, කෘෂි තාක්ෂණය, ජෛව සම්පත් තාක්ෂණය සහ ආහාර තාක්ෂණය. |
| 6 | | **DBIO06** විද්‍යාවේදී ජෛව වෛද්‍ය විද්‍යා (ගෞරව) උපාධිය | වසර 4 | 1,200,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව හෝ කෘෂිකාර්මික විද්‍යාව යන විෂයන් සඳහා "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. |
| 7 | **KIU** | **HBIO02** - විද්‍යාවේදී ජෛව වෛද්‍ය විද්‍යා (ගෞරව) උපාධිය | වසර 4 | 1,200,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව හෝ කෘෂිකාර්මික විද්‍යාව යන විෂයන් සඳහා "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම |
| 8 | | **HBIO03** - කටුචිකිත්සක විද්‍යාව පිලිබඳ වෛද්‍ය විද්‍යා (ගෞරව) උපාධිය | වසර 4 | 1,200,000 | |
| 9 | **HORIZON** | **GBIO13** – ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,200,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී පහත විෂයන් සඳහා ඕනෑම සංයෝජනයක් සහිතව " S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම<br>ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂිකාර්මික විද්‍යාව , විද්‍යාව සඳහා තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය, කෘෂි තාක්ෂණය, ජෛව සම්පත් තාක්ෂණය. |
| 10 | **ICHEM** | **OBIO12** - රසායනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,200,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී පහත සඳහන් විෂය සංයෝජනයක් සහිතව සාමාන්‍ය "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම.<br>1. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව.<br>2. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ ගණිතය, ජීව විද්‍යාව හෝ කෘෂිකාර්මික විද්‍යාව.<br>3. රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂිකාර්මික විද්‍යාව හෝ ගණිතය. |

www.studentloans.mohe.gov.lk

### 2.3.4. ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව

| | ආයතන යේ නම | උපාධි වැඩසටහන | කාල සීමාව | පාඨමාලා ගාස්තුව | ලියාපදිංචි වීමේ අවම සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 1 | **SLIIT** | **AENG15-** මූල්‍ය ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය සමඟ වෙනත් විෂයන් දෙකක් සඳහා "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. |
| 2 | | **AENG22-** විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | වසර 4 | 1,500,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ "S" තුනක් (03) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව) එකවර ලබා තිබීම. |
| 3 | | **AENG23-** යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය | වසර 4 | 1,500,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ "S" තුනක් (03) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව) එකවර ලබා තිබීම. |
| 4 | | **AENG24** - සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | වසර 4 | 1,500,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ "S" තුනක් (03) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව) එකවර ලබා තිබීම. |
| 5 | | **AENG25 -** ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | වසර 4 | 1,500,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ "S" තුනක් (03) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව) එකවර ලබා තිබීම. |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | **NSBM** | **BENG01** – අභ්‍යන්තර නිර්මාණවේදය පිළිබඳ උපාධිය | වසර 3 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ගණිතය විෂයය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම. |
| 7 | | **BENG13** - පරිගණක පද්ධති ඉංජිනේරු පිලිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,500,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ "S" තුනක් (03) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම. |
| 8 | | **BENG28** - මෙකාටොනික් ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) උපාධිය | වසර 4 | 1,500,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ "S" තුනක් (03) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම. |
| 9 | | **BENG29 -** විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) උපාධිය | වසර 4 | 1,500,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ "S" තුනක් (03) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව) එකවර ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | අවම වශයෙන් “S” සාමාර්ථයක් ලබා තිබීම **සහ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් “C” සාමාර්ථයක් ලබා තිබීම. |
| 10 | **CINEC** | **DENG04** මෝටර් කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,500,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ “S” තුනක් (03) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව) එකවර ලබා තිබීම |
| 11 | | **DENG02** සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | වසර 4 | 1,500,000 | |
| 12 | | **DENG05** විද්‍යුත් හා විදුළි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,500,000 | |
| 13 | | **DENG03** යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,500,000 | |
| 14 | | **DENG16** යන්ත්‍ර විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,500,000 | |
| 15 | **SLTC** | **IENG08** – විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,500,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ “S” තුනක් (03) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව) එකවර ලබා තිබීම |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 16 | **SLTC** | **IENG09** - තාක්ෂණවේදී විද්‍යුත් (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී භෞතික විද්‍යා හෝ ජීව විද්‍යා (භෞතික විද්‍යාව ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් විය යුතුය) හෝ ඉංජිනේරු තාක්ෂණ යන විෂය ධාරාවකින් "S" (සාමාන්‍ය) සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම |
| 17 | | **IENG11** - කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී පහත විෂයන් දෙකක් සමඟ වෙනත් ඕනෑම විෂයක් සඳහා " S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම.<br>ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උසස් ගණිතය හෝ සංයුක්ත ගණිතය, කෘෂිකර්මය, විද්‍යාව සඳහා තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය, කෘෂි තාක්ෂණය, ජෛව සම්පත් තාක්ෂණය සහ ආහාර තාක්ෂණය |
| 18 | | **IENG14**- සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,500,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ "S" තුනක් (03) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව) එකවර ලබා තිබීම |
| 19 | | **IENG20**-<br>විලාසිතා වෙළඳ භාණ්ඩ කළමණාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වසර 3 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 20 | | **IENG27-**<br>ජෛව පද්ධති ඉංජිනේරු විද්‍යාව පිලිබඳව විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී පහත විෂයන් දෙකක් සමඟ වෙනත් ඕනෑම විෂයක් සඳහා " S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම.<br>ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උසස් ගණිතය හෝ සංයුක්ත ගණිතය, කෘෂිකර්මය, විද්‍යාව සඳහා තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය, කෘෂි තාක්ෂණය, ජෛව සම්පත් තාක්ෂණය. |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 21 | **SLTC** | **IENG17-** රෙදිපිළි හා ඇඟලුම් තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වසර 3 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හෝ තාක්ෂණය විෂය ධාරාව යටතේ සාමාන්‍ය සාමාර්ථ "S" තුනක් (03) එකවර ලබා තිබීම |
| 22 | | **IENG19-** පරිසර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |
| 23 | **HORIZON** | **GENG26** ජෛව පද්ධති තාක්ෂණ (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ජෛව පද්ධති තාක්ෂණ විෂයය ධාරාවෙන් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම. |
| 24 | **SIBA** | **EENG21** - තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය | වසර 3 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් S" සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම |

www.studentloans.mohe.gov.lk

## 2.3.5.පරිගණක විෂය ධාරාව

| | ආයතනයේ නම | උපාධි වැඩසටහන | කාල සීමාව | පාඨමාලා ගාස්තුව | ලියාපදිංචි වීමේ අවම සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 1 | **SLIIT** | **AICT01** - තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම **හෝ** අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමඟ** නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඇදුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම (කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා ඇත්නම් ඇදුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක) |
| 2 | **SLIIT (Kandy)** | **AICT01 – 1** තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වසර 4 | 1,000,000 | |
| 3 | **SLIIT (Matara)** | **AICT01 – 2** තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වසර 4 | 1,000,000 | |
| 4 | **SLIIT (Jaffna)** | **AICT01 – 3** තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වසර 4 | 1,000,000 | |
| 5 | **AQUINAS** | **KICT13** - තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | වසර 3 | 600,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම |
| 6 | **SIBA** | **EICT08** - තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වසර 3 | 800,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම **හෝ** අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමඟ** නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඇදුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | (කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා ඇත්නම් ඇඳුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක) |
| 7 | **NSBM** | **BICT11** - පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම **සමග** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම<br>**සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම<br>**හෝ**<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමග**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමග**<br><br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඇඳුනු පාඨමාලාවක් හදාරා එහි foundational Mathematics විෂය සඳහා අවම වශයෙන් ලකුණු 70% ලබා තිබීම අනිකුත් විෂයන් දෙක සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ( S ) ලබා ඇත්නම් ඇඳුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක) **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම<br>**සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම. |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | **NSBM** | **BICT12** - මෘදුකාංග ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම **සමඟ** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම<br>**සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම<br>**හෝ**<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමඟ**<br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඇදුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා ඇත්නම් ඇදුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක) **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම<br>**සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් "C" සාමාර්ථයක් ලබා තිබීම. |
| 9 | | **BICT04** - කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | වසර 4 | 1,000,000 | |
| 10 | | **BICT10** - පරිගණක ජාලකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |
| 11 | | **BICT03** - බහුමාධ්‍ය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වසර 3 | 800,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා "S" සාමාර්ථයක් ලබා තිබීම **සහ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයය සහ ඉංග්‍රීසි භාෂාව සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම. |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | **HORIZON** | **GICT05** - තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම<br>**හෝ**<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමඟ**<br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද අඳුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා ඇත්නම් අඳුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක) |
| 13 | | **GICT29** දන්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |
| 14 | | **GICT06** - ජාලකරණ සහ ජංගම පරිගණක තොරතුරු තාක්ෂණය පිළිබඳ (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම |
| 15 | **CINEC** | **DICT15** මෘදුකාංග ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම **හෝ**<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමඟ**<br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද අඳුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා ඇත්නම් අඳුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක). |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 16 | **KIU** | **HICT20** - කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් “S” සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම **හෝ**<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් “S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා “C” සාමාර්ථයක් ලබා තිබීම **සමඟ**<br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද අඳුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා ඇත්නම් අඳුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක). |
| 17 | | **HICT21** - මෘදුකාංග ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |
| 18 | | **HICT22** - පරිගණක ජාලකරණය සයිබර් ආරක්ෂාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |
| 19 | | **HICT32**- දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | | | |
| 20 | **SAEGIS** | **JICT07** - තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය | වසර 3 | 600,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් “S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම. |
| 21 | | **JICT23** - තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් “S”සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම හෝ<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් “S” සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා “C” සාමාර්ථයක් ලබා තිබීම සමඟ<br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද අඳුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන |
| 22 | | **JICT24**- මෘදුකාංග ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා ඇත්නම් ඇදුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක). |
| 23 | **SAEGIS** | **JICT25-** පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S"සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **හෝ**<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමඟ**<br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඇදුනු පාඨමාලාවක් හදාරා එහි foundational Mathematics විෂය සඳහා අවම වශයෙන් ලකුණු 70% ලබා තිබීම අනිකුත් විෂයන් දෙක සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ( S ) ලබා ඇත්නම් ඇදුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක). |
| 24 | **ESOFT** | **LICT14** - තොරතුරු තාක්ෂණවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 800,000 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම |
| 25 | **SLTC** | **IICT16** - දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම **හෝ**<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමඟ**<br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඇදුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම |
| | | **IICT17** - සයිබර් ආරක්ෂණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 26 | **SLTC** | **IICT18** - මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම.<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ( S ) ලබා ඇත්නම් ඇදුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක)**.** |
| 28 | | **IICT19 -** වළාකුළු පරිගණකකරණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | වසර 4 | 1,000,000 | |
| 29 | **BCI** | **NICT26-** තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම **හෝ**<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමඟ**<br><br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඇදුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා ඇත්නම් ඇදුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක). |
| 30 | | **NICT30-** මෘදුකාංග ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 31 | **ICBT** | **MICT31 (Colombo)**<br>**MICT31-1 (Kandy)**<br>මෘදුකාංග ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම<br>**හෝ**<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමඟ**<br><br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඇදුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා ඇත්නම් ඇදුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක) |
| 32 | | **MICT33 (Colombo)**<br>**MICT33-1 (Kandy)**<br>සයිබර් ආරක්ෂණය පිළිබඳ තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |
| 33 | | **MICT34 (Colombo)**<br>**MICT34-1 (Kandy)**<br>දත්ත විද්‍යාව පිළිබඳ තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |
| 34 | | **MICT35 (Colombo)**<br>**MICT35-1 (Kandy)**<br>කෘතිම බුද්ධිය පිළිබඳ තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | |

www.studentloans.mohe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| 35 | **NIIBS** | **RICT28** - තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | වසර 4 | 1,000,000 | අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාවෙන් "S" සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම<br>**හෝ**<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම **සමඟ**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම **සමඟ**<br><br>නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඇදුනු පාඨමාලාවක් හදාරා එහි සියළුම විෂයන් සඳහා අවම වශයෙන් ලකුණු 50% ලබා තිබීම<br>(කිසියම් අයදුම්කරුවකු අ.පො.ස (උ/පෙළ) විභාගයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය (ICT) සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා ඇත්නම් ඇදුනු පාඨමාලාවෙන් නිදහස් විය හැක) |

** මෙහිදී **නිශ්චිත බලධරයා** ලෙස සැලකෙන්නේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

www.studentloans.mohe.gov.lk

# 3 කොටස

## අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය

### 3.1. පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ උපාධි පිරිනමන ආයතනවල උපාධි පාඨමාලා සඳහා අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු ආකාරය

☛මෙම කොටස ඔබ කැමති අධ්‍යයන පාඨමාලා සහ උපාධි පිරිනමන ආයතන සඳහා අන්තර්ජාලය හරහා අයදුම් කරන ආකාරය පිළිබඳව පැහැදිලි කරයි. අන්තර්ජාලය හරහා ප්‍රවේශ අයදුම්පත සම්පූර්ණ කිරීම පිළිබඳව පැහැදිලි උපදෙස් මෙහි අඩංගු වන අතර අන්තර්ජාලය හරහා අයදුම් කිරීමට නොහැකි/පහසුකම් නොමැති අයදුම්කරුවෙකු නම් ඒ සඳහා සලසන ලද පහසුකම් පිළිබඳවද මෙහි විස්තර වේ.

සුදුසුකම්ලත් අයදුම්කරුවන් විසින් අයැදුම්පත්‍ර යොමු කිරීමේදී www.studentloans.mohe.gov.lk වෙබ් අඩවිය යටතේ පහසුකම් සලසා ඇති අන්තර්ජාල ක්‍රමය භාවිතා කල යුතුය.

අන්තර්ජාලය හරහා අයදුම්කිරීමට නොහැකි හෝ පහසුකම් නොමැති අයදුම්කරුවකු නම් පහත සඳහන් වන මධ්‍යස්ථාන වලදී අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත්‍ර යොමු කිරීමට පහසුකම් සලසා දෙනු ඇත.

I. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ (OUSL) ප්‍රාදේශීය පරිශ්‍රයන්හි පිහිටා ඇති ජාතික අන්තර්ජාල දුරස්ථ අධ්‍යාපන පද්ධති (NODES) පිවිසුම් මධ්‍යස්ථාන (NACs)

II. අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති පළාත්බද සහ කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) මධ්‍යස්ථාන

III. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතන (ICTA) යටතේ පිහිටුවා ඇති නැණසල මධ්‍යස්ථාන

**IV.** මීට අමතරව, අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ, www.studentloans.mohe.gov.lk පළකර ඇති අන්තර්ජාල අයදුම්පත්‍රයට පිවිසීම සඳහා අයදුම්කරුවන්ට තමන්ගේම පිවිසුම් කේන්ද්‍ර භාවිතා කල හැක.

**☛පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ උපාධි පිරිනමන ආයතන ප්‍රවේශය සඳහා වූ අයැදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර මෙම අත්පොතෙහි මුල් කොටස් කීපයෙහි සඳහන් නීති රීති කියවන ලෙස අයැදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.**

www.studentloans.mohe.gov.lk





**රූපය 01 - ශිෂ්‍ය ලියාපදිංචිය**

අයදුම්පත් ඉදිරිපත් කරන සෑම අයදුම්කරුවෙකුම පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයේ නිළ වෙබ් අඩවිය **[www.studentloans.mohe.gov.lk](http://www.studentloans.mohe.gov.lk)** හරහා අන්තර්ජාලය මගින් උපාධි පිරිනමන ආයතන ප්‍රවේශ අයදුම්පත් යොමු කිරීමේ සේවාව සඳහා පරිශීලකයකු ලෙස ලියාපදිංචි විය යුතුය. මේ සඳහා අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය (අ.පො.ස. (උ/පෙළ) සඳහා ඉදිරිපත් කරන ලද සහ ඔබ අයදුම් කරනු ලබන 2022, 2023 හෝ 2024 වර්ෂවල අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා පෙනී සිටි විභාග අංකය භාවිතා කල යුතුය.





**රූපය 02 - ශිෂ්‍ය ලියාපදිංචිය**

මෙහිදී ඔබගේ මුරපදය ඔබ විසින් ඇතුළත් කර ඇති විද්‍යුත් තැපැල් ගිණුමට ලැබෙනු ඇත. එය භාවිතා කර ලියාපදිංචි වීම සිදු කළ යුතු වේ.





**රූපය 03 - ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා මුරපදය**




**රූපය 04 - මුරපදය යොදා ගනිමින් ශිෂ්‍ය ලියාපදිංචිය**

මෙහිදී විද්‍යුත් තැපැල් ගිණුමට ලැබෙන මුරපදය වෙනස් කිරීමේ පහසුකම ඔබට ලබා දී ඇත.




**රූපය 05 - මුරපදය වෙනස් කිරීම**


**සටහන:**

ඔබ විසින් භාවිතා කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනය ඔබගේ අධ්‍යාපන කටයුතු සම්පූර්ණ වන තුරුම භාවිතා කිරීමට කාරුණික වන්න.

## මුල් පිටුව

මාර්ගගත අයදුම්පතක් සඳහා ප්‍රවේශ වීමට අවස්ථාව මෙම පියවරේදී ලැබෙන අතර අවශ්‍යතාවය මත ශිෂ්‍ය අත්පොත, නිතර විමසන ප්‍රශ්න සඳහා පිළිතුරු ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය පිළිබඳ තොරතුරු ලබාගත හැකි දුරකථන අංක, විද්‍යුත් තැපැල් ගිණුම් හා ලේඛන, උපකාරක යතුර සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ලැබේ.

**ඔබ විසින් අයැදුම්පත්‍රය පිරවීම ආරම්භ කිරීමට පෙර මෙහි ඇතුලත් කර ඇති ශිෂ්‍ය අත්පොත කියවන ලෙස තරයේ දැනුවත් කරනු ලැබේ.**





රූපය 06 - මුල් පිටුව

## පිටු අංක 01

මෙම කොටසෙහි අයදුම්කරුගේ මුලකුරු සමග නම, සම්පූර්ණ නම, පුම්නිරිභාවය (ස්ත්‍රී/පුරුෂ භාවය), ජාතික හැඳුනුම්පත් අංකය, උපන් දිනය හා අ.පො.ස. (උ/පෙළ) විභාග අංකය ස්වයංක්‍රීයව ඇතුලත් වේ. අනෙකුත් සියලු තොරතුරු නිවැරදිව ඇතුලත් කළ යුතු වේ. එසේ නොවුනහොත් සම්මුඛ පරීක්ෂණයේ කැඳවීම් ලිපිය නිසි පරිදි ඔබ වෙත නොලැබීමට හේතු වනු ඇත.


සෑම පිටුවක් අවසානයේ ඊළඟ පිටුවට ප්‍රවේශ වීම සඳහා සියලුම තොරතුරු ඇතුලත් කර තිබීම අනිවාර්යය වේ.




**රූපය 07 - අයදුම්කරුගේ පෞද්ගලික තොරතුරු**

## පිටු අංක 02

මෙම කොටසෙහි පදිංචි ස්ථානයේ තොරතුරු, දෙමාපියන්/භාරකරුවන් පිළිබඳ තොරතුරු හා සම්බන්ධ කර ගත හැකි පුද්ගලයන් පිළිබඳ විස්තර ඇතුලත් වේ. සියලුම තොරතුරු නිවැරදිව ඇතුලත් කළ යුතු වේ.




**රූපය 08 - අයදුම්කරුගේ පෞද්ගලික තොරතුරු**





රූපය

**රූපය 09 - අයදුම්කරුගේ පෞද්ගලික තොරතුරු**


## පියවර අංක 03

මෙම කොටසෙහි 2022, 2023 හෝ 2024 වසර වලට අදාළ ඔබගේ අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිපල ස්වයංක්‍රීයව ඇතුලත්ව ඇත.ඔබ විසින් අදාළ කොටුවෙහි පාසැල් අයදුම්කරුවෙක්ද නැතිනම් පෞද්ගලික අයදුම්කරුවෙකුද යන්න ඇතුලත් කල යුතු වේ.




රූපය 10 - අයදුම්කරුගේ අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල


අදාළ වර්ෂයේ උසස් පෙළ විභාගයට පෙනී සිටියේ පාසැල් අයැදුම්කරුවකු වශයෙන් නම් මෙම කොටස සම්පූර්ණ කළ යුතු වේ. එහි පාසලෙහි නම, ලිපිනය, දිස්ත්‍රික්කය, අයැදුම්කරුගේ නම සහ විභාග අංකය ස්වයංක්‍රීයව ඇතුලත් වන අතර අනෙක් තොරතුරු ඔබ විසින් ඇතුලත් කළ යුතු වේ. (ඔබගේ පාසැලෙහි දුරකථන අංකය නොමැති නම් පාසැලෙහි අනෙකුත් තොරතුරු නිවැරදිව ඇතුලත් කළ යුතුය.)




**රූපය 11 - අයදුම්කරුගේ පාසැල් තොරතුරු**


## පිටු අංක 04

මෙම කොටසේදී ඔබ විසින් අ.පො.ස(සා/පෙ) විභාගයේදී ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව යන විෂයන්ට ලබාගත් සාමාර්ථයන් ඇතුලත් කළ යුතුවේ. අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී මව් භාෂාව වශයෙන් පෙනී සිටි විෂයය තෝරාගෙන ඒ සඳහා ලබා ඇති සාමාර්ථය සඳහන් කළ යුතු වේ.




**රූපය 12 - අයදුම්කරුගේ අ.පො.ස (සා/පෙළ) ප්‍රතිඵල**

ඔබ විසින් පසුගිය වර්ෂයන්හිදී අ.පො.ස. (උ.පෙළ) විභාගයන් සඳහා පෙනී සිටියේනම් ඒ පිළිබඳ විස්තර ඇතුලත් කළ යුතු වේ. ඔබ පෙර / පසු වසරවල සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත් වී ඇත්නම්, කරුණාකර එය අදාළ කොටුවට එම තොරතුරු ඇතුළත් කරන්න.


G.C.E (A/L) Results - Previous Attempts

If you have previously taken the GCE (Advanced Level) Examination, give full particulars of each attempt.
Full Particulars of Examination concerned must be given even if you had taken only a single subject.


Year: 2016
Index No
Used ID Type: NIC / PASSPORT
Used ID No
Results: PHYSICS, CHEMISTRY, COMB. MATH., GEN.ENGLISH, CGP
Z-Score
District
Candidate Type: SCHOOL / PRIVATE
School

If there was a break in the sequence of sittings for A/L examination, give below the reasons therefore

If you had not sat the G.C.E. (A/L) Examination at the first available occasion after the G.C.E. (Ordinary Level) Examination, give reasons therefore

රූපය 13 - පෙර / පසු වසරවල සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රතිඵල

මෙම කොටසේදී අ.පො.ස. උසස් පෙළ විභාගයේ සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ඔබ ලබා ඇති හොඳම ප්‍රතිඵලය අදාල වර්ෂය සමඟ ඇතුළත් කරන්න


**G.C.E (A/L) Details**

Please Enter the **Best Marks** you obtained for the **Common General Practitioner** in G.C.E (A/L).

AL Year that obtained best CGP Marks *

Best Common General Practitioner Marks obtained *

If there was a break in the sequence of sittings for A/L examination, give below the reasons therefore

If you had not sat the G.C.E. (A/L) Examination at the first available occasion after the G.C.E. (Ordinary Level) Examination, give reasons therefore

← Previous


Next →

රූපය 14 - සාමාන්‍ය පොදු පරීක්ෂණයේ හොඳම ප්‍රතිඵලය

## පිටු අංක 05


මෙම කොටසේදී  ඔබගේ මනාප අනුපිළිවෙල පරිදි උපාධි පාඨමාලා සහ උපාධි පිරිනමන ආයතනය ඇතුලත් කළ හැක.

**මෙම කොටස පිරවීමට පෙර අත්පොතෙහි 2 කොටස අනිවාර්යයයෙන්ම කියවා එහි ලබා දී ඇති උපදෙස් නිසියාකාරයෙන් තේරුම් ගත යුතු වේ.**




රූපය 15 - උපාධි පිරිනමන ආයතන

ඔබගේ පළමු මනාපය පළමු තේරීම ලෙස සඳහන් වන පරිදි කැමති තේරීම් සංඛ්‍යාවක් ඇතුලත් කළ හැකිවේ. මෙහිදී වැඩි තේරීම් සංඛ්‍යාවක් ඇතුලත් කිරීම මගින් අයැදුම්කරුගේ කැමැත්ත පරිදි උපාධි පාඨමාලාවක් ලබා ගැනීමට ඉහළ සම්භාවිතාවයක් ඇත. සීමිත තේරීම් සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීම තුළින් කිසිදු උපාධි පාඨමාලාවකට සුදුසුකම් නොලබන අයැදුම්කරුවන් පිළිබඳ අමාත්‍යාංශය වගකීම දරනු නොලැබේ.




රූපය 16 - උපාධි පාඨමාලා තෝරා ගැනීම

**සටහන**

අයදුම්පත අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව යම් අයැදුම්කරුවෙකුට මනාප ලබා දී ඇති අනුපිළිවෙල වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ***සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදී අවස්ථාව ලබා ගත හැක.***


## පිටු අංක 06

මෙම උපදෙස් අත්පොතෙහි 1.4 කොටසෙහි iii සිට x දක්වා සඳහන් කර ඇති යම් පාඨමාලාවකට දැනටමත් ඔබ ලියාපදිංචි වී ඇත්නම් එම තොරතුරු මෙම කොටසට ඇතුලත් කළ යුතු වේ.

**සටහන:**


**මෙම තොරතුරු අසත්‍ය බවට කරුණු හෙළි වුවහොත් ඕනෑම අවස්ථාවකදී පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයෙන් ඉවත් කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.**

ohegov.lk




රූපය 17 - පාඨමාලාවකට ලියාපදිංචි වී ඇත්නම් එම තොරතුරු

ඔබ මෙතෙක් පුරවන ලද තොරතුරු නැවත පරීක්ෂා කිරීමට මෙම කොටසේදී අවස්ථාව ලැබේ. අයදුම්පත්‍රය අවසන් කිරීමට ප්‍රථම ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි දැයි හොඳින් පරීක්ෂා කර බලන්න.





රූපය 18 - තොරතුරු නැවත පරීක්ෂා කිරීම


www.studentlo

අවසාන වශයෙන් ඔබ විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රයෙහි නිරවද්‍යභාවය තවදුරටත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම අයැදුම්පත්‍රය “Finalized” බොත්තම ඔබා මාර්ගගතව ඉදිරිපත් කළ යුතුවේ.

**අයදුම්පත්‍රය යොමු කිරීමේ අවසාන දිනයෙහි මධ්‍යම රාත්‍රී 12ට පෙර අයදුම්පත්‍රය යොමු කිරීම (Submit) කළ යුතුවේ.**





රූපය 19 - අයදුම්පත්‍රය “Finalized” කිරීම




රූපය 20 - අයදුම්පත්‍රය “Finalized” කිරීම තහවුරු කිරීම


මින් අනතුරුව අයදුම්පත්‍රය අප වෙත ලැබී ඇති බවට ඔබගේ විද්‍යුත් ලිපිනයට තහවුරු කරනු ලබන පණිවිඩයක් සමඟ ඔබගේ අයැදුම්පත්‍රයේ PDF පිටපතක් ඔබ වෙත ලැබී ඇත්දැයි පරීක්ෂා කරන්න. එසේ නොලැබී ඇත්නම්, ඔබගේ අයදුම්පත්‍රය නිසිපරිදි සම්පූර්ණ වී නොමැති බව සැලකිය යුතුය. එහෙයින් නැවත වතාවක් ඔබගේ අයදුම්පත්‍රයට පිවිස පරීක්ෂා කර බැලිය යුතුය. (අවසන් දින වලදී වැඩි අයැදුම්කරුවන් සංඛ්‍යාවක් වෙබ් අඩවියට ඇතුළත් වීම නිසා කාර්යබහුල විය හැකි බැවින් හැකි මුල් අවස්ථාවේදීම අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීම ඔබට පහසුවක් වනු ඇත.)





රූපය 21 - අයදුම්පත්‍රයේ PDF පිටපතක්විද්‍යුත් ලිපින ලැබීම

## 3.2 ඔබගේ අයදුම්පත්‍රය මුද්‍රණය කිරීමට උපදෙස්

සියලු තොරතුරු නිවැරදිව ඇතුළත් කර ඉදිරිපත් කරන ලද ඔබගේ අයැදුම්පත්‍රය , මුද්‍රණය **(Print Application)** යන බොත්තම භාවිතා කර මුද්‍රණය කර ගත හැක.




රූපය 22 - අයදුම්පත්‍රය මුද්‍රණය කිරීම



**Ministry of Education, Higher Education and Vocational Education (Higher Education Division)**

2024/1234567/24/00001

| | |
|---|---|
| **Interest Free Student Loan Scheme for Selected Degree Programs Application for Higher Education Admission** | **2022 / 2023 / 2024** |

**Personal Details**

| | | | |
|---|---|---|---|
| **Name with Initials** | xxxxxxxxxxxxx | | |
| **Full Name** | xxxxxxxxxxxx | | |
| **Civil Status** | SINGLE | **Gender** | FEMALE |
| **Date of Birth** | 2000-02-16 | **Place of Birth** | DEHIWELA |
| **NIC Number** | xxxxxxxxxxx | **NIC Issue Date** | 2020-01-01 |
| **Mobile Number** | xxxxxxxxxxx | **Email** | xxxxxx@xxxxx.com |
| **Ethnicity** | OTHER | **Religion** | OTHER |
| **Citizen by Descent** | YES | | |

**Residency Details**

| | |
|---|---|
| **Permanent Address of Residence** | A, B |
| **Period of Residence this Address up to 31st July 2024** | YEARS - 2, MONTHS - 1, DAYS - 5 |

රූපය 23 - අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත

### 3.3 අයැදුම්පත්‍ර ඉදිරිපත් කල යුතු කාල සීමාව

2025/26 අධ්‍යයන වර්ෂයට අදාලව උපාධි පිරිනමන ආයතන ප්‍රවේශය සඳහා **2022, 2023** හා **2024** අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිපල මත පදනම්ව පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය හරහා මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාල සීමාව **2025.11.01** දින සිට **2025.11.30** දින මධ්‍යම රාත්‍රී 12.00 න් අවසන් වේ.

### 3.4 අන්තර්ජාල අයැදුම්පත්‍ර ක්‍රමවේදය පිළිබඳ වැඩි විස්තර

i. අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම තොරතුරු පුවත්පත් දැන්වීමක් ලෙස ජාතික පුවත්පත්වල පලකරනු ඇත.

ii. වැඩිදුර තොරතුරු සඳහා,

- රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (1919)
- නිල වෙබ් අඩවිය - **www.studentloans.mohe.gov.lk**
- නිල විද්‍යුත් තැපෑල - dsls@mohe.gov.lk

**iii.** නියම කර ඇති **අවසන් දින හෝ ඊට පෙර** ශිෂ්‍යයන් විසින් අයැදුම්පත්‍ර යොමු කල යුතුය**.** **අයදුම්කිරීම සඳහා අවසන් දිනය 2025.11.30 දින වේ.**

iv. අයැදුම්පත්‍ර යොමු කිරීමේදී, අයදුම්පත්‍රය ලැබුණු බව සනාථ කෙරෙන ලියවිල්ලක දෘඪ පිටපතක් නිකුත් නොකෙරෙන බැවින්, මතු ප්‍රයෝජනය සඳහා ඉහත තහවුරු කිරීමේ පිටපතක් තබා ගැනීමට අයැදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

www.studentloans.mohe.gov.lk

# 4 කොටස

## සම්මුඛ පරීක්ෂණ ක්‍රියාපිළිවෙල

### 4.1. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම

අයදුම්පත්‍ර යොමු කිරීමේ අවසන් දිනයෙන් පසු මාසයක කාලයක් ඇතුළතදී මාර්ගගතව (**Online**) පවත්වන සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ට ඔවුන් ඒ සඳහා සුදුසුකම් ලැබූ බව තහවුරු කිරීම හා මාර්ගගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරන ලිපියක් ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරන ලද ඊ මේල් ලිපිනයට ඊ මේල් මාර්ගයෙන් යොමු කරනු ලැබේ. තවද, සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ලේඛනය අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ, [www.studentloans.mohe.gov.lk](http://www.studentloans.mohe.gov.lk) පළ කෙරෙනු ඇත.

### 4.2 මාර්ගගත සම්මුඛ පරීක්ෂණය සහ භෞතික ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන

i. අයැදුම්කරු විසින් අත්සන් කරන ලද මාර්ගගත අයැදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතක් **සමඟ** <u>ඔබ පාසල් අයදුම්කරුවෙකු ලෙස අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටියේ නම්</u> විදුහල්පති/ විදුහල්පති විසින් බලය පවරන ලද ගුරුවරයෙකුගේ සහතිකය සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද "විදුහල්පති සහතිකය" ( මුද්‍රිත අයැදුම්පත්‍රයේ අවසන් පිටුව) **හෝ** <u>ඔබ පෞද්ගලික අයැදුම්කරුවෙකු ලෙස අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටියේ නම්</u> සමාදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් අත්සන, දිනය සහ නිල මුද්‍රාව සහිතව නිවැරදි ව සම්පූර්ණ කරන ලද "දිවුරුම් ප්‍රකාශය" (මුද්‍රිත අයැදුම්පත්‍රයේ අවසන් පිටුව) **සහ**

ii. ජාතික හැඳුනුම්පත්‍රය (NIC) හෝ ගමන් බලපත්‍රය

iii. උප්පැන්න සහතිකය

iv. අ.පො.ස. (සා/පෙළ) සහතිකයේ මුල් පිටපත

v. අ.පො.ස. (උ/පෙළ) සහතිකයේ මුල් පිටපත

vi. සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත් වූ වර්ෂයට අදාල අ.පො.ස. (උ/පෙළ) සහතිකයේ මුල් පිටපත (අදාළ වර්ෂයේදී හැර වෙනත් වර්ෂයකදී සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත් වී ඇති නම් එම විභාග සහතිකයේ මුල් පිටපත ඇතුළත්ව )

vii. පාසැල් හැරයාමේ සහතිකයේ මුල් පිටපත

viii. ඇඳුනු පාඨමාලාවක් හදාරා ඇත්නම් එහි ප්‍රතිපල ලේඛණය

ix. පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය



www.studentloans.mohe.gov.lk

- අයදුම් කරන ලද උසස් අධ්‍යාපන ආයතනය, තෝරා ගන්නා ලද උපාධි පාඨමාලා අනුපිළිවෙල වෙනස් කිරීමට අපේක්ෂා කරන්නේ නම් අදාළ අභියාචනා පත්‍රය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

☛ සැලකිය යුතුය

- ඉහත සඳහන් කර ඇති සියලුම ලිපිලේඛන වල විද්‍යුත් පිටපත් (**Scan)** ශිෂ්‍ය ණය අංශය විසින් ඔබ වෙත දැනුම් දෙනු ලබන ඊ මේල් ලිපිනයට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට පෙර එවිය යුතුය**.** (සෑම අයදුම්කරුවෙක් සඳහාම වෙන වෙනම සැකසූ ඊ මේල් ලිපිනයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවන ඊ මේල් පණිවිඩයෙහි සඳහන් කර එවනු ලැබේ)
- අයදුම්පත අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව යම් අයැදුම්කරුවෙකුට මනාප ලබා දී ඇති අනුපිළිවෙල වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා *සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදී අවස්ථාව ලබා ගත හැක.*

### 4.3. උපාධි පිරිනමන ආයතනයක උපාධි පාඨමාලාවකට තෝරා ගත් බව දැනුම් දීම

මාර්ගගත සම්මුඛ පරීක්ෂණයෙන් පසු සියලුම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත ඔවුන් තේරී පත් වූ පාඨමාලාව සඳහන් කරන ලද ලිපියක් අයදුම්පත්‍රයේ සඳහන් කරන ලද ඊ මේල් ලිපිනයට ඊ මේල් මාර්ගයෙන් යොමු කරනු ලැබේ.

☛ තෝරාගත් අයදුම්කරුවන්ට පහත සඳහන් කරුණු පිළිබඳව ඊ මේල් මාර්ගයෙන් දැනුම් දෙනු ලැබේ.

i. තෝරා ගන්නා ලද උපාධි වැඩසටහන
ii. තේරී පත් වන ලද උපාධි පිරිනමන ආයතනය
iii. මාර්ගගත ලියාපදිංචිය සඳහා යොමුව (භෞතික ලියාපදිංචියට පෙර ඉදිරිපත් කළ යුතුය)
iv. තෝරාගත් උපාධි පිරිනමන ආයතනයෙහි භෞතික ලියාපදිංචිය සඳහා දිනය

### 4.5. අභියාචනා ඉදිරිපත් කිරීම

අයදුම්කරුවෙකුට තමන් තේරී පත් වූ පාඨමාලාව දැනුම් දුන් පසු එම පාඨමාලා වෙනස් කර ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් අභියාචනා අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම සඳහා තෝරා පත් කිරීම ප්‍රකාශයට පත් කල දින සිට මසක කාලයක් ලැබේ. ඒ සඳහා අපගේ වෙබ් අඩවියේ අන්තර්ගත අභියාචනා ඉදිරිපත් කිරීමට ලබා දී ඇති ආදර්ශ අයැදුම්පත්‍රය පුරවා අයදුම් කරන ලද පාඨමාලාවල අනුපිළිවෙල හෝ ඉල්ලුම් කරන ලද උපාධි පිරිනමන ආයතනය වෙනස් කිරීමට ඉහත සඳහන් කාල සීමාව තුළ අයැදුම්කරුවන්ට අවසර දෙනු ලැබේ.

ඒ අනුව ඔබ විසින් සම්පූර්ණ කරන ලද අභියාචනා අයදුම්පත නිසි පරිදි අත්සන් කර slsm@mail.mohe.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ ***අධ්‍යක්ෂ, ශිෂ්‍ය ණය අංශය, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය,980/4A, වික්‍රමසිංහ පෙදෙස, ඇතුල්කෝට්ටේ*** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත්** භාර දිය යුතුය.

www.studentloans.mohe.gov.lk

☛ මෙහිදී මාරුවීම් අපේක්ෂා කරන පාඨමාලාවේ සහ උපාධි පිරිනමන ආයතනයේ පුරප්පාඩු තිබිය යුතු වන අතර අයදුම්කරුවන් වැඩි පිරිසක් සිටින අවස්ථාවකදී ඔවුන්ගේ Z ලකුණු අනුපිළිවෙල සැලකිල්ලට ගනු ලැබේ.

2025/26 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ උපාධි පිරිනමන ආයතන වෙත සිසුන් තෝරා ගැනීමෙන් පසු ඒ ඒ අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා විමර්ශනය කර වාර්තා කිරීම සඳහා අභියාචනා කමිටුවක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කරනු ලැබේ. එම අභියාචනා කමිටුවෙහි තීරණයන් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම් විසින් අනුමත කළ පසු අයදුම්කරුවන් වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

**සැලකිය යුතුයි:**

වෙබ් අඩවියේ පළ කර ඇති අයදුම් පත්‍රය භාවිතා කර තෝරාගත් උපාධි පාඨමාලාව පිළිබඳව ඔහු/ඇය සෑහීමකට පත් නොවන්නේ නම් අයදුම්කරුට අභියාචනයක් ඉදිරිපත් කළ හැක. අයදුම්කරු අභියාචනා කිරීමට කැමති නම්, දැනටමත් තෝරාගෙන ඇති උපාධි වැඩසටහනට ලියාපදිංචි නොවිය යුතුය. තවද, අයදුම්කරුවෙකු තෝරාගත් උපාධි වැඩසටහනට ලියාපදිංචි වී අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් එවැනි අභියාචනා සලකා බලනු නොලැබේ.

අභියාචනා සඳහා ලබා දී ඇති කාල සීමාව ඉක්මවීමෙන් අනතුරුව යොමු කරන අභියාචනා කිසිවක් භාර නොගැනේ. තවද, අභියාචනා සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් වරයාගේ තීරණය අවසාන තීරණය වේ

**☛ වැඩි දුර විමසීම් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ශිෂ්‍ය ණය අංශයේ දුරකථන අංක 070 3555971-979 අමතන්න.**

www.studentloans.mohe.gov.lk

# 5 කොටස

## IFSLS හරහා පිරිනමන උපාධි පාඨමාලා

### 5.1 ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන උපාධි පාඨමාලා (SLIIT)

**1. තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදි උපාධිය (විශේෂ)**

පරිගණක විද්‍යා ආශ්‍රිත වෘත්තීය සහ ශාස්ත්‍රීය හැකියාවන් වැඩි දියුණු කර ගැනීමේ අවශ්‍යතාව සහිත ශිෂ්‍යයන් සඳහා මෙම වැඩසටහන සැලසුම් කරන ලදී. මෘදුකාංග සැලසුම්කරණය, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, මෙහෙයුම් පද්ධති, පද්ධති පරිපාලනය, තාක්ෂණික සහාය සහ ජාලකරණය යන ක්ෂේත්‍රවල තාක්ෂණික කුසලතා වඩාත් ශක්තිමත් අන්දමින් සංවර්ධනය කර ගැනීමට මෙම උපාධි වැඩසටහන මගින් ඔබට හැකියාව ලැබෙනු ඇත.

**වැඩසටහන් ව්‍යුහය**

තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහන වසරකට අධ්‍යන වාර දෙකක් සහිතව වසර 4 ක කාලසීමාවක් සඳහා පැවැත්වේ. තොරතුරු තාක්ෂණය, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, පරිගණක පද්ධති, ජාල ඉංජිනේරු විද්‍යාව, තොරතුරු පද්ධති ඉංජිනේරු විද්‍යාව, අන්තර් ක්‍රියාකාරී මාධ්‍ය, සයිබර් ආරක්ෂාව සහ දත්ත විද්‍යාව යන විශේෂිකරණ විෂය ක්ෂේත්‍ර 7 ක් මෙම උපාධි වැඩසටහනට ඇතුළත් වේ. දේශන පැය, නිබන්ධන සාකච්ඡා, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහ සීමාවාසික පුහුණුව පිළිබඳව අවධානය යොමු කරන විෂය න්‍යාස (Credits) 130 කට වැඩි හෝ ආසන්න සංඛ්‍යාවකින් මෙම එක් එක් වැඩසටහන සමන්විත වේ.

**සීමාවාසික පුහුණුව**

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ බහුජාතික ආයතන සහ දේශීය ආයතනවල දී අපගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දෙන සීමාවාසික පුහුණුව ඔස්සේ උගන්වන ලද විෂය අන්තර්ගතය ප්‍රායෝගිකව යොදාගැනීමේ අවස්ථාව සලසා දෙනු ලැබේ. ඒ හරහා ඔවුන්ගේ වෘත්තීය පෞරුෂත්වය වැඩි දියුණු කර ගැනීමේ අවස්ථාව මෙන්ම දැනුම ප්‍රායෝගිකව උපයෝගී කර ගැනීම පිළිබඳව විශිෂ්ඨ අවබෝධයක් ලබා ගැනීමට ද ඔවුන්ට අවස්ථාව සැලසේ. මාස තුනක හෝ මාස හයක පුහුණුවක් පාදක කර ගනිමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තක්සේරු කරනු ලැබේ. ශිෂ්‍යයන් විසින් මාසික වැඩ ලේඛනයක් සහ පුහුණුව අවසානයේ දී වාර්තාවක් ද ඉදිරිපත් කළ යුතු වේ. අධීක්ෂකවරයා විසින් ප්‍රතිපෝෂණය ඉදිරිපත් කිරීම ද මෙහි දී අවශ්‍ය වේ. තවද, වාචික විභාගයක් මගින් ද ශිෂ්‍යයන් ඇගයීමට ලක් කෙරේ. අධීක්ෂකවරයාගේ ප්‍රතිපෝෂණ ඇගයුම සඳහා 30% ක් ද, වාර්තාව සඳහා 30% ක් ද, වාචික පරීක්ෂණය සඳහා 40% ක් ද වශයෙන් ලකුණු බෙදී යයි.

**උපාධිය ලබා ගැනීමෙන් පසුව පිරිනැමෙන අවස්ථා**

මෙම වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව උපාධිධාරීන්ට පුද්ගලික අංශයේ තොරතුරු තාක්ෂණ විශේෂඥයන්, මෘදුකාංග ඉංජිනේරුවන්, ජාල පරිපාලකයන්, ව්‍යාපෘති කළමනාකරුවන්, ව්‍යාපාර උපදේශකයන්, දත්ත විශ්ලේෂකයන්, දත්ත විද්‍යාඥයන්, පරිශීලක අතුරු මුහුණත් ඉංජිනේරුවන්, බහු මාධ්‍ය සංවර්ධකයන්, ආරක්ෂක විශ්ලේෂකයන්, පරිගණක අපරාධ විමර්ශකයන් සහ කළමනාකරණ විධායකයන් ආදී වෘත්තීන්වල නිරත වීමේ හැකියාව ලැබේ. යම් උපාධිධාරයකුට ශාස්ත්‍රඥ වෘත්තියේ නිරත වීමට අවශ්‍ය වේ නම්, තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති (MSc) උපාධි

www.studentmohe.gov.lk

වැඩසටහන දර්ශනපති (MPhi) උපාධි වැඩසටහන සහ ආචාර්ය උපාධි වැඩසටහන (PhD) හැදෑරීමට අවස්ථාව සලසා ඇත.

## 2. ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) (ගෞරව) උපාධිය

අපගේ ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය මගින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ව්‍යාපාර කළමනාකරණයේ දී සාර්ථකත්වයට පත් වීමට අවශ්‍ය සියලුම කුසලතා ලබා දීම පමණක් නොව ස්වාධීනව විශ්ලේෂණාත්මකව සිතීමේ සහ ගැටළු විසඳීමේ හැකියාවන් වර්ධනය කිරීම ද සිදු කරයි. මීට අමතරව ව්‍යාපාර කළමනාකරණයට අදාළ නිවැරදි ආකල්ප ඇති කිරීම හරහා ක්ෂේත්‍රය තුළ විශේෂඥයන් ලෙස කටයුතු කිරීමේ හැකියාව ද ඔවුන්ට ලැබෙනු ඇත.

### වැඩසටහනේ ව්‍යුහය

ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධි වැඩසටහන වසරකට අධ්‍යයන වාර දෙකක් සහිතව වසර 4 ක කාලසීමාවක් සඳහා පැවැත්වේ. එක් අධ්‍යයන වාරයක් සඳහා විෂය න්‍යාස 15 ක එකතුවක් සහිතව විෂය මාලා පහක් හෝ හයක් පවත්වනු ලැබේ. දේශන පැය, නිබන්ධන සාකච්ඡා, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහ සීමාවාසික පුහුණුව කේන්ද්‍ර කර ගත් විෂය න්‍යාස 120 ක එකතුවකින් මෙම වැඩසටහන සමන්විත වේ. අලෙවි කළමනාකරණය, මානව ප්‍රාග්ධන කළමනාකරණය, ගිණුම්කරණය සහ මූල්‍ය, ව්‍යාපාර කළමනාකරණය, සැපයුම් සේවා සහ සැපයුම් දාම කළමනාකරණය, තත්ත්ව කළමනාකරණය, ව්‍යාපාර විශ්ලේෂණය සහ කළමනාකරණ තොරතුරු පද්ධති යන විශේෂීකරණ විෂය ක්ෂේත්‍ර 8 ක් මෙම උපාධි වැඩසටහනට ඇතුළත් වේ.

### සීමාවාසික පුහුණුව

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ බහුජාතික ආයතන සහ දේශීය ආයතනවල දී අපගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දෙන සීමාවාසික පුහුණුව ඔස්සේ උගන්වන ලද විෂය අන්තර්ගතය ප්‍රායෝගිකව යොදාගැනීමේ අවස්ථාව සලසා දෙනු ලැබේ. ඒ හරහා ඔවුන්ගේ වෘත්තීය පෞරුෂත්වය වැඩි දියුණු කර ගැනීමේ අවස්ථාව මෙන්ම දැනුම ප්‍රායෝගිකව උපයෝගී කර ගැනීම පිළිබඳව විශිෂ්ඨ අවබෝධයක් ලබා ගැනීමට ද ඔවුන්ට අවස්ථාව සැලසේ. මාස තුනක හෝ මාස හයක පුහුණුවක් පාදක කර ගනිමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තක්සේරු කරනු ලැබේ.

### උපාධිය ලබා ගැනීමෙන් පසුව පිරිනැමෙන අවස්ථා

මෙම වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, මෙම උපාධිධාරීන්ට විශේෂීකරණ ක්ෂේත්‍ර අටට අදාළව පුද්ගලික අංශයේ අභ්‍යාසලාභී කළමනාකරුවන්, උපදේශකයන්, ව්‍යාපාර විධායකයන්, ව්‍යවසායකයන්, පර්යේෂණ විධායකයන්, ප්‍රශස්තකරණ උපදේශකයන්, ව්‍යාපාර විශ්ලේෂණ ක්‍රමෝපාය උපදේශකයන්, මානව සම්පත් තොරතුරු පද්ධති විශේෂඥයන්, මානව සම්පත් විශ්ලේෂකයන්, වෙළඳ නාම විධායකයන්, ශාස්ත්‍රඥයන්, ඉල්ලූම් සැලසුම්කරුවන්, කළමනාකරණ ගණකාධිකාරීවරුන්, මූල්‍ය විශ්ලේෂකයන් සහ කළමනාකරණ උපදේශකයන් ආදී වෘත්තීන්වල නිරත වීමේ හැකියාව ලැබේ. යම් උපාධිධාරියකුට පශ්චාත් උපාධි අධ්‍යයනවල නිරත වීමට අවශ්‍ය වන්නේ නම්, එවැනි උපාධිධාරීන්ට ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති (MBA) උපාධි වැඩසටහනට ඇතුළත් වීමේ අවස්ථාව සලසා ඇත.

www.studentloans.mohe.gov.lk

### 3. භෞතික විද්‍යා / ජීව විද්‍යා / ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය

අ.පො.ස. උසස් පෙළ පන්ති ද ඇතුළත්ව ද්විතීයික පාසල්වලට ඉගැන්වීම් කටයුතු ඉටු කිරීමට දක්ෂතාවක් දක්වන ගුරුවරුන් බිහි කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) මගින් අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන් පවත්වනු ලබයි. තෝරාගත් විශේෂීකරණ වැඩසටහන් මත පදනම්ව, උපාධිධාරීන් අදාළ විෂයයන් සහ ඉගැන්වීමේ ක්‍රම පිළිබඳව දක්ෂතා දක්වනු ඇත. භෞතික විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය ලබා ගත් උපාධිධාරීන් භෞතික විද්‍යාව සහ ගණිතය විෂයයන් ද, ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය ලබා ගත් උපාධිධාරීන් ජීව විද්‍යාව සහ රසායන විද්‍යාව විෂයයන් ද, ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය ලබා ගත් උපාධිධාරීන් ඉංග්‍රීසි භාෂාව සහ සාහිත්‍යය යන විෂයයන් ද, සමාජ විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය ලබා ගත් උපාධිධාරීන් කලා සහ වාණිජ අංශයන් හි විෂයයන් සහ ඉගැන්වීමේ ක්‍රම පිළිබඳව ද දක්ෂතාවක් දක්වනු ඇත.

#### වැඩසටහනේ ව්‍යුහය

#### 3.1 භෞතික විද්‍යා අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය

දේශන පැය 1350 ක් ද, ප්‍රායෝගික සහ රසායනාගාර පැය 525 ක් සහ ඉගැන්වීම පිළිබඳ පුහුණුව ලබා දෙන පැය 160 ක් ද ලබා දීමට කේන්ද්‍ර කරන මෙම වැඩසටහනට විෂය න්‍යාස 130 ක් ඇතුළත් කර ඇත.

#### 3.3 ඉංග්‍රීසි අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය

දේශන පැය 1705 ක් ද, ප්‍රායෝගික පැය 490 ක් සහ ඉගැන්වීම පිළිබඳ පුහුණුව ලබා දෙන පැය 160 ක් ද ලබා දීමට කේන්ද්‍ර කරන මෙම වැඩසටහනට විෂය න්‍යාස 135 ක් ඇතුළත් කර ඇත.

#### 3.4 සමාජ විද්‍යා අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය

වසරකට අධ්‍යයන වාර දෙකක් සහිතව වසර 4 ක කාල සීමාවකින් යුතු මෙම වැඩසටහන, විෂය න්‍යාස 200 කින් සමන්විත වන අතර, ඒ සඳහා නිබන්ධන, සම්මන්ත්‍රණ, ආරාධිත දේශන සහ සීමාවාසික ස්ථානගත කිරීම් ඇතුළත් වේ.

#### ඉගැන්වීමේ පරිචය

අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන හදාරන සෑම ශිෂ්‍යයකු විසින්ම පාසලේ විදුහල්පතිතුමා විසින් තෝරාගත් අභ්‍යන්තර තක්සේරුකරුවකුගේ මග පෙන්වීම යටතේ ද්විතීයික පාසලක දී සති 10 ක (පැය 160 ක) ඉගැන්වීම පිළිබඳව පුහුණුවීමක් ලබා ගැනීම අවශ්‍ය වේ. එයට අමතරව, මොඩියුලය අවසානයේ දී, ශිෂ්‍යයාගේ අවසාන ඇගයීම ලබා දෙන බාහිර ඇගයුම්කරුවකුව පීඨය මගින් පත් කරනු ලබන්නේය.

#### උපාධිය ලබා ගැනීමෙන් පසුව පිරිනැමෙන අවස්ථා

මෙම උපාධි වැඩසටහනේ උපදෙස් ලබා දෙන භාෂා මාධ්‍යය ඉංග්‍රීසි වන බැවින්, මෙම වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව රාජ්‍ය අංශය පමණක් නොව පුද්ගලික අංශය මගින් ද මෙම උපාධිධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ඉහළ අපේක්ෂා තබනු ඇත. ගෞරව උපාධි අපේක්ෂකයකු වීම මූලික අවශ්‍යතාවක් වන ස්ථානවල රැකියා ලබා ගැනීම සඳහා මෙම උපාධිධාරීන්ට හැකියාවක්



www.studentloans.mohe.gov.lk

පවතී. උපාධිධාරියකුට ශාස්ත්‍රඥයකු වශයෙන් වෘත්තියේ නිරත වීමට අවශ්‍ය වන අවස්ථාවල දී, අධ්‍යාපනපති (MEd) හෝ දර්ශනපති (MPhil) උපාධි වැඩසටහනට හෝ ඇතුළත් විය හැකි වේ.

## 4. මූල්‍ය ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව

ගණිතය මූල්‍ය ලෝකයේ පදනමයි. එය ආයෝජකයින්ට, වෙළඳුන්ට සහ බැංකුකරුවන්ට ප්‍රශස්ත තීරණ ගැනීමට සහ සංවේදීව අවදානම් අවම කිරීමට ඉඩ සලසයි. මූල්‍ය ගණිතය යනු විවිධ අවදානම් සාධක සඳහා විසඳුම් සෙවීම සඳහා විවිධ මූල්‍ය ගැටලු විසඳීම සඳහා ගණිතමය ආකෘති යෙදීමයි. ව්‍යවහාරික සංඛ්‍යාලේඛන යනු එක්රැස් කරන ලද විවිධ වර්ගයේ දත්ත මත පදනම්ව ව්‍යාපාරයේ සැබෑ ගැටලු විසඳීමට සුදුසු නිගමනවලට එළඹීම සඳහා සංඛ්‍යාලේඛන යෙදීමයි. එබැවින්, මූල්‍ය ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යාලේඛනවල එකතුව මූල්‍ය ලෝකයේ මූලික ගලක් ලෙස සැලකිය හැකිය.

අනෙක් අතට, රටේ සංවර්ධන මට්ටම කුමක් වුවත්, මූල්‍ය කර්මාන්තය ලෝකයේ විශාලතම හා වඩාත්ම දත්ත මෙහෙයවන අංශයන්ගෙන් එකකි. මෙය සිදුවන්නේ ගණිතය, සංඛ්‍යාලේඛන පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති විවිධ ප්‍රමාණාත්මක කුසලතා ඇති උපාධිධාරීන් මූල්‍ය, ආර්ථික විද්‍යාව සහ පරිගණකකරණය පිළිබඳ පසුබිම් දැනුම සමඟින් ඉල්ලා සිටින කර්මාන්තයයි. තවද, මූල්‍ය අංශයේ එවැනි උපාධිධාරීන්ගේ රැකියා අවස්ථා **2019** වසරේ සිට වාර්ෂිකව වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර ඔවුන් ඕනෑම මූල්‍ය කර්මාන්තයක ප්‍රධාන පුද්ගලයින් බවට පත්වන අතර මෙම උපාධිධාරීන්ට අඩු ආතතියකින් මුදල් උපයා ගත හැකිය.

### සීමාවාසික පුහුණුව

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ බහුජාතික සහ ප්‍රාදේශීය ආයතන සමඟ අපගේ කර්මාන්ත සීමාවාසික වැඩසටහන් මගින් අපගේ සිසුන්ට ඉගැන්වූ අන්තර්ගතයෙන් ඔබ්බට ඉගෙනීමට, ඔවුන්ගේ වෘත්තීය පෞරුෂය වැඩි දියුණු කිරීමට සහ ප්‍රායෝගික භාවිතය පිළිබඳ වැඩි අවබෝධයක් ලබා දීමට අවස්ථාවක් ලබා දී ඇති බව අපි ආඩම්බරයෙන් ප්‍රකාශ කරමු. ඔවුන්ගේ දැනුම. මාස තුනක හෝ මාස හයක කාර්මික පුහුණුව මත පදනම්ව සිසුන් ඇගයීමට ලක් කෙරේ.

### උපාධියේ අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල වන්නේ:

ප්‍රශස්තකරණය, අවදානම් විශ්ලේෂණය සහ ස්ටෝචස්ටික් ක්‍රියාවලීන්හි තීරණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් දත්ත විශ්ලේෂණය කිරීමේදී ගණිතය, සංඛ්‍යාලේඛන සහ මූල්‍ය යන මූලික ක්ෂේත්‍රවල පුළුල් සහ සුසංයෝගී දැනුමක් ප්‍රදර්ශනය කරන්න.
මූල්‍ය තොරතුරු සහ දත්ත අර්ථවත් හා තාර්කික ආකාරයකින් විශ්ලේෂණය කිරීමට ඔවුන්ට හැකි ශක්තිමත් විශ්ලේෂණ කුසලතා අත්කර ගන්න.

ගණිතමය, සංඛ්‍යානමය හෝ මූල්‍ය ආකාරයෙන් සන්නිවේදනය කරන ලද තොරතුරු විවිධ ක්‍රමාංකනවලට අර්ථකථනය කරන්න.

ප්‍රවීණ ප්‍රේක්ෂකයින් සහ ව්‍යාපාර සහ මූල්‍ය අංශය සමඟ විධිමත් සහ අවිධිමත් සැකසුම් තුළ වාචික සහ ලිඛිත ආකාර දෙකෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් ඵලදායී සන්නිවේදන කුසලතා වර්ධනය කරන්න.

www.studentloans.mohe.gov.lk

සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්හිදී තීරණ ගැනීම සහ පුද්ගලික වගකීම භාර ගැනීම.

### උපාධිය සම්බන්ධ විශේෂ කරුණු

• මූල්‍ය ගණිතය සහ ව්‍යවහාරික සංඛ්‍යාලේඛන සංකලනය සහිත උපාධිය ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට **SLIIT** මගින් පිරිනමනු ලැබේ.

• මෙම උපාධිය විශේෂයෙන් සැලසුම් කර ඇත්තේ ව්‍යාපාරයේ විවිධ ක්ෂේත්‍රවල ජනප්‍රිය රැකියා ක්ෂේත්‍රයක අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසුකම් ලත් උපාධිධාරීන්ගේ හිඟයක් අප හඳුනාගෙන ඇති අතර, මූල්‍ය හා පරිගණකකරණය සමඟ ගණිතය සහ සංඛ්‍යාලේඛනවල න්‍යායාත්මක සංකල්ප සහ යෙදුම් පිළිබඳ මනා දැනුමක් ඇත.

• එවැනි උපාධිධාරීන්ට බැංකු අංශය, රක්ෂණ අංශය, දේපළ වෙළඳාම් යනාදී වශයෙන් ඉහළ රැකියා සඳහා මඟ පෑදිය හැක.

• මෙම රැකියා ලෝකයේ සියලුම රටවල ඉහළ වැටුප් ලබන නමුත්, අඩු **වැඩ** ආතතියක් ඇත.

• ලෝකයේ ඉහළම ශ්‍රේණිගත විශ්වවිද්‍යාලවල දත්ත විද්‍යාව, ව්‍යාපාර විශ්ලේෂණ, මූල්‍ය ගණිතය, ක්‍රියාකාරී විද්‍යාව, සංඛ්‍යාලේඛන වැනි විවිධ ක්ෂේත්‍රයන් යටතේ උසස් උපාධි සඳහා ලියාපදිංචි වීම පහසුය.

### උපාධි අවස්ථා

මෙම වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව රක්ෂණ සමාගම්, මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු යටතේ ඇති බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ඉහළ වැටුප් සහිත මෙම උපාධි වැඩසටහනේ උපාධිධාරීන්ට වැඩි රැකියා අවස්ථා නිර්මාණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 5. ඉංජිනේරු විද්‍යාවේදී (විශේෂ) (ගෞරව)

ඉංජිනේරු පාඨමාලා ඔස්සේ, ඒ ඒ ක්ෂේත්‍ර තුල පහසුවෙන් රැකියා වල නිරත විය හැකි අන්තර්ජාතික මට්ටමේ උපාධිධාරීන් බිහි කිරීම අපගේ අරමුණයි. උසස් අධ්‍යාපන, පර්යේෂණ සහ ඉංජිනේරු විද්‍යාවේ අනෙකුත් වෘත්තීය ක්‍රියාකාරකම්වල විශිෂ්ටත්වය කෙරෙහි අවධානය යොමු කරමින් පාඨමාලා පැවැත්වීම ඉංජිනේරු පීඨයේ මූලික අරමුණයි. ආචාර්ය උපාධිධාරීන් **29** කට වැඩි පිරිසක් සහ පශ්චාත් උපාධි සුදුසුකම් ඇති තවත් **20** දෙනෙකුගෙන් සමන්විත ඉහළ සුදුසුකම් ලත්, සියයකට අධික පූර්ණ කාලීන අධ්‍යයන කාර්ය මණ්ඩලයකගේ මඟ පෙන්වීම යටතේ නවීන පහසුකම් වලින් සමන්විත උසස් මට්ටමේ ඉගෙනුම් අත්දැකීමක් ලබා ගැනීමට **SLIIT** ඉංජිනේරු පීඨය ඔස්සේ සිසුන්ට අවස්ථාව හිමිවේ. තවද, ගෞරව මහාචාර්ය ජාලයට අයත්, විදේශීය විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන් **10** කට වැඩි පිරිසකගෙන්, දේශීය විශ්ව විද්‍යාලවල කථිකාචාර්යවරුන් / මහාචාර්යවරුන් **10** කට වැඩි පිරිසකගෙන් සහ කර්මාන්ත විශේෂඥයින්ගෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සමන්විත වේ.



www.studentloans.mohe.gov.lk

### වැඩසටහනේ ව්‍යුහය

වසරකට අධ්‍යයන වාර දෙකක් සහිතව වසර 4 ක කාල සීමාවකින් යුතු මෙම වැඩසටහන, විෂය න්‍යාස 150 කින් (සාමාන්‍යය අගයකි) සමන්විත වන අතර, ඒ සඳහා නිබන්ධන, සම්මන්ත්‍රණ, ආරාධිත දේශන සහ සීමාවාසික ස්ථානගත කිරීම් ඇතුළත් වේ.

### සීමාවාසික පුහුණුව

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ බහුජාතික සමාගම් සහ දේශීය ආයතන සමඟ සීමාවාසික පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. ඒ ඔස්සේ සිසුන් හට ඔවුන්ගේ වෘත්තීය පෞරුෂය වැඩි දියුණු කර ගනිමින් ප්‍රායෝගික කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාව හිමිවේ.

### උපාධි අවස්ථා

වැඩසටහන සාර්ථකව නිම කිරීමෙන් පසු, උපාධිධාරීන් හට පහත සඳහන් රැකියා අවස්ථා හිමිවේ:

ව්‍යුහාත්මක ඉංජිනේරුවන්, භූ තාක්‍ෂණික ඉංජිනේරුවන්, පාරිසරික ඉංජිනේරුවන්, විදුලි ඉංජිනේරුවන්, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවන්, පරිගණක පද්ධති ඉංජිනේරුවන්, ද්‍රව්‍ය ඉංජිනේරු, ලෝහ විද්‍යාඥයින්, පොලිමර් ඉංජිනේරුවන්, සෙරමික් ඉංජිනේරුවන්, යාන්ත්‍රික ඉංජිනේරුවන්, මෝටර් රථ ඉංජිනේරුවන්, ස්වයංක්‍රීය ඉංජිනේරුවන්, නඩත්තු ඉංජිනේරුවන්.

එමෙන්ම, යම් උපාධිධාරියෙකුට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු හැදෑරීමට අවශ්‍ය නම්, දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති (MPhil) හෝ දර්ශනය පිළිබඳ ආචාර්ය (PhD) පාඨමාලාවකට ඇතුළත් වීමේ හැකියාව තිබේ.

## 5.2 NSBM හරිත සරසවිය පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ පිරිනමන උපාධි පාඨමාලා

### 1. Bachelor of Interior Design (BID) - අභ්‍යන්තර නිර්මාණ ශිල්පය පිළිබඳ උපාධිය

අභ්‍යන්තර නිර්මාණ ශිල්පය පිළිබඳ උපාධිය NSBM හරිත සරසවිය මඟින් පිරිනමන උසස් අධ්‍යාපන අමාත්‍යංශය පිළිගත් අවුරුදු 3ක පූර්ණ කාලීන උපාධියකි. මෙම උපාධි පාඨමාලාව තුළ ඉඩකඩ සැලසුම්, ආලෝකකරණය, ගොඩනැගිලි සේවා සහ නියාමන නීති වැනි ක්ෂේත්‍ර ආවරණය වන අතර, අභ්‍යන්තර නිර්මාණ ශිල්පීය අවශ්‍යතා සපුරාලීමට සහ ඒවාට නිර්මාණශීලී විසඳුම් ලබා දීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබාදෙයි. එසේම ප්‍රයෝගික වැඩමුළු, සම්මන්ත්‍රණ සහ කර්මාන්ත වැඩසටහන් හරහා සිසුන්ගේ නිර්මාණ කුසලතා වර්ධනය කරමින් අනාගත වෘත්තියන්ගේ ඔවුන්ට අවශ්‍ය කුසලතාව දියුණු කරයි.ඒ හරහා උපාධිධාරීන්ට වෙළඳ, ව්‍යාපාරික, හෝටල්, ගෘහ නිර්මාණ වැනි විවිධ ක්ෂේත්‍රයන්ගේ වෘත්තීය අවස්ථාව හිමි වේ.

### 2. Bachelor of Management (Honours) in Accounting and Finance - ගිණුම්කරණය සහ මූල්‍යකරණ පිළිබඳ කළමනාකරණවේදී ගෞරව උපාධිය

ගිණුම්කරණය සහ මූල්‍යකරණ පිළිබඳ කළමනාකරණවේදී ගෞරව උපාධි පාඨමාලාව NSBM හරිත සරසවිය මඟින් පිරිනමන උසස් අධ්‍යාපන අමාත්‍යංශය පිළිගත් ඉහළ ඉල්ලුමක් ඇති උපාධියකි. වාණිජ අංශයේ ගිණුම්කරණ හා මූල්‍යකරණ සම්බන්ධ මූලධර්ම පිළිබඳ විද්‍යාත්මක දැනුම ලබා දීම මෙහි



www.studentloans.mohe.gov.lk

ප්‍රධාන අරමුණයි. මෙම වසර 4ක උපාධියේපළමු වසර 2 1/2 තුළ පූර්ණ කාලීන දේශන සමඟින් සිසුන් න්‍යායාත්මක දැනුමින් පෝෂණය වන අතර ඔවුන්ගේ 3 වන වසරේ සිට ප්‍රායෝගික වෘත්තීය පුහුණුව සඳහා අවස්ථාව ලැබේ. මෙම උපාධිය අවසානයේ උපාධිධාරීන්ට ගිණුම්කරු, මූල්‍ය විශ්ලේෂක, බදු උපදේශක වැනි ඉහළ රැකියා අවස්ථා සඳහා ප්‍රවේශ විය හැක.

### 3. Bachelor of Science in Multimedia - බහුමාධ්‍යකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

NSBM හරිත සරසවිය මඟින් පිරිනමන උසස් අධ්‍යාපන අමාත්‍යංශය පිළිගත් බහුමාධ්‍යකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියේදී නිර්මාණකරණ, නව අදහස් හා සංකල්පික චින්තනය වැනි හැකියාවන් වර්ධනය කරයි. බොහෝ කර්මාන්ත අවස්ථා ඇති වේගයෙන් වර්ධනය වන ක්ෂේත්‍රයක් වන බහුමාධ්‍යකරණය පිළිබඳ මෙම උපාධි පාඨමාලාව මඟින් 2D, 3D නිර්මාණ, වීඩියෝ සහ චලන මාධ්‍ය, ග්‍රැෆික් නිර්මාණ, වෙබ් නිර්මාණ වැනි අංශයන් ආවරණය වේ. න්‍යායාත්මක දැනුමට අමතරව ශිෂ්‍යයන් දින 90ක වෘත්තීය පුහුණුවක් ද සහිතව ඔවුන්ගේ නිර්මාණ, පර්යේෂණ, කළමනාකරණ හා නිෂ්පාදන කුසලතා දියුණු කරයි. මෙම උපාධිය අවසානයේ උපාධිධාරීන්ට ග්‍රැෆික් නිර්මාණකරුවන්, නිර්මාණාත්මක අධ්‍යක්ෂවරුන්, සජීවිකරණ ශිල්පීන්, වෙබ් අතුරුමුහුණත් නිර්මාණකරුවන් ආදී වෘත්තීය විශේෂඥයින් ලෙස රැකියා අවස්ථා හිමිකර ගත හැක.

### 4. BSc in Management Information System (Special) - කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය

NSBM හරිත සරසවිය මඟින් පිරිනමන උසස් අධ්‍යාපන අමාත්‍යංශය පිළිගත් කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ සිව් අවුරුදු විද්‍යාවේදී විශේෂ උපාධිය, ව්‍යාපාර සාර්ථකත්වය සඳහා පරිගණකකරණය සහ තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගැනීමේ සිසුන්ගේ හැකියාවන් වර්ධනය කරයි. එසේම උසස් තත්ත්වයේ තොරතුරු පද්ධති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සංකල්පගත කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සිසුන් පුහුණු කරනු ලැබේ. ඒ අනුව මෙම උපාධියේ විෂය මාලාව ඔවුන්ගේ අනාගත රැකියා ස්ථානයේ තොරතුරු පද්ධතිවල සංකල්ප, ක්‍රම සහ ප්‍රායෝගික යෙදුම් කෙරෙහි අවධානය යොමු කර නිර්මාණය කර ඇත. මේ හරහා ආයතනික තීරණ ගැනීමේදී තොරතුරු පද්ධති භාවිතය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට උපාධිධාරීන්ට අවශ්‍ය කුසලතා ලබා දෙනු ලැබේ.

මෙම උපාධි වැඩසටහන හරහා පරිගණක පාදක විසඳුම් සමග ව්‍යාපාර වැඩිදියුණු කළ හැකි තොරතුරු තාක්ෂණ විශේෂඥයින් සඳහා ඇති ඉල්ලුම සපුරාලීම NSBM හි අරමුණයි. මෙම සිව් අවුරුදු උපාධි වැඩසටහන පළමු වසර දෙක තුළ පූර්ණ කාලීන අධ්‍යයනයෙන් සහ අවසාන වසර දෙක තුළ අර්ධ කාලීන, නම්‍යශීලී පැය ගණනකින් සමන්විත වන අතර එමඟින් උපාධි අපේක්ෂකයින්ට වෘත්තීය පුහුණුවට යොමුවීමට හැකි වේ. එබැවින්, උපාධි වැඩසටහන අවසන් වන විට උපාධිධාරීන් ව්‍යාපාරික ලෝකයේ අතිශයින්ම දක්ෂයින් බවට පත් කරමින් වසර දෙකක ප්‍රායෝගික සේවා පළපුරුද්දක් ලබා ගනු ඇත. තොරතුරු පද්ධති සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල වෘත්තීන්ට අමතරව, උපාධිධාරීන් ක්‍රමලේඛනය, මෘදුකාංග පරීක්ෂාව සහ තත්ත්ව සහතිකකරණය, දත්ත සමුදා පරිපාලනය සහ සංවර්ධනය, ව්‍යාපාර විශ්ලේෂණය සහ පද්ධති ඒකාබද්ධ කිරීම සහ මෘදුකාංග ගෘහ නිර්මාණ ශිල්පය යන ක්ෂේත්‍රවලද රැකියා අවස්ථා විවර වේ.

www.studentloans.mohe.gov.lk

### 5. Bachelor of Science in Business Management (Project Management) (Special) - ව්‍යාපාර කළමනාකරණය (ව්‍යාපෘති කළමනාකරණය) පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය

ව්‍යාපෘති කළමනාකරණය යනු ව්‍යාපාර ලෝකයේ දිනෙන් දින වර්ධනය වන ක්ෂේත්‍රයක් වන අතර එමඟින් කර්මාන්තය තුළ රැකියා අවස්ථා රාශියක් නිර්මාණය වේ. ව්‍යාපෘති කළමනාකරණයේ විෂය පථය ව්‍යාපෘති සැලසුම් කිරීම යන ආරම්භක පියවරේ සිට සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම දක්වා විහිදේ. මෙම උපාධි වැඩසටහන සැලසුම් කර ඇත්තේ ව්‍යාපෘති කළමනාකරණයේ කාර්යයන් පිළිබඳ සමස්ත දැනුමක් ලබා දීම සඳහා වන අතර, සිසුන්ට ව්‍යාපෘති කළමනාකරණ වෘත්තියේ ප්‍රවීණයන් වීමට හැකි වේ. මෙම වැඩසටහන උසස් අධ්‍යාපන අමාත්‍යංශය පිළිගත් වසර 4 ක වැඩසටහනක් ලෙස නිර්මාණය කර ඇති අතර එහි පළමු වසර 2 1/2 කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ පොදු න්‍යායාත්මක අවබෝධය සඳහා වෙන් කර ඇති අතර අවසාන වසර අර්ධකාලීන අධ්‍යයන ලෙස නිර්මාණය කර ඇත. එමඟින් සිසුන්ට තම අත්දැකීම් ප්‍රමාණය විශිෂ්ට ලෙස පෙන්වීමට කර්මාන්තය තුළ ස්ථානගත වීමට ඉඩ සලසයි. උපාධියේ අන්තර්ගතය කර්මාන්තයේ ඉල්ලුමට සරිලන පරිදි යාවත්කාලීන කරන අතර වසර 4 ක අධ්‍යයනයකින් පසු කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් ඇති උපාධිධාරියෙකු නිර්මාණය වේ.

### 6. Bachelor of Science of (Honours) in Software Engineering - මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

NSBM හරිත සරසවියේ පරිගණක පීඨය මඟින් පිරිනමන මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, මෘදුකාංග ඉංජිනේරු උපාධි අපේක්ෂකයන් සඳහා වන නවතම ACM සහ IEEE මාර්ගෝපදේශයන්ට අනුකූලව නිර්මාණය කර ඇත. මේ හරහා සංකීර්ණ මෘදුකාංග පද්ධති 43 ක් සැලසුම් කිරීම සහ නිර්මාණය කළ හැකි දක්ෂ හා නිසි තාක්ෂණික කුසලතා ඇති පරිගණක වෘත්තිකයන් බිහි කිරීම අරමුණු කරයි. පළමු වසර තුළ සිසුන්ට පුළුල් පරිගණක ඉදිරිදර්ශනයක් ලබා දීම සහ දෙවන සහ තෙවන වසරවල මූලික මෘදුකාංග ඉංජිනේරු දැනුම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා මෙම වැඩසටහන ව්‍යුහගත කර ඇත. තෙවන වසර තුළ සිසුන් අනිවාර්ය කර්මාන්ත පුහුණුවක් ද ලබා ගනී. සිව්වන වසර තුළ, විවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ දැනුම සහ අවබෝධය ඇතිව වසර ගණනාවක් පුරා ඔවුන් ලබාගත් දැනුම ඒකපුද්ගල ව්‍යාපෘතියකින් හරහා ප්‍රදර්ශනය කරනු ලැබේ.

මෙම උපාධිය සිසුන්ගේ අනාගත වෘත්තීය අපේක්ෂාවන්ට ගැලපෙන පරිදි තෝරාගත හැකි විවිධාකාර විෂයයන්ගෙන් සමන්විත වන අතර එමඟින් ඔවුන්ගේ අනාගත වෘත්තීන් කරා යොමු වීමට මගපාදයි. මෙම උපාධි වැඩසටහනේ උපාධිධාරීන්ට MSc, MBA සහ PhD මට්ටම දක්වා ඔවුන්ගේ වැඩිදුර අධ්‍යයන කටයුතු කරගෙන යා හැකිය. මෙම වැඩසටහන මඟින් තොරතුරු තාක්ෂණ අංශයේ මෘදුකාංග ඉංජිනේරුවන්, පද්ධති විශ්ලේෂකයින්, තත්ත්ව සහතික ඉංජිනේරුවන්, UI ඉංජිනේරුවන්, පද්ධති සහාය ඉංජිනේරුවන් සහ වෙබ් නිර්මාණකරුවන් බිහි කිරීමට අපේක්ෂා කෙරේ.

### 7. Bachelor of Science (Honours) in Computer Science - පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

NSBM හරිත සරසවියේ පරිගණක පීඨය මඟින් පිරිනමන පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, පරිගණක විද්‍යා උපාධි අපේක්ෂකයන් සඳහා වන නවතම ACM සහ IEEE මාර්ගෝපදේශයන්ට අනුකූලව නිර්මාණය කර ඇත. මෙමඟින් පරිගණක විද්‍යාව පිළිබඳ හොඳ තාක්ෂණික පදනමක් සහ ප්‍රායෝගික ගැටළු සඳහා පරිගණක සහ ඒ ආශ්‍රිත තාක්ෂණයන් නිර්මාණාත්මකව යෙදවීමේ හැකියාව ඇති දක්ෂ පරිගණක වෘත්තිකයන් බිහි කිරීම අරමුණු කරයි. පළමු වසර තුළ සිසුන්ට පුළුල් පරිගණක ඉදිරිදර්ශනයක් ලබා දීම සහ දෙවන සහ තෙවන වසරවල මූලික පරිගණක විද්‍යා දැනුම සමූහය



www.studentloanmohe.gov.lk

කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා මෙම වැඩසටහන ව්‍යුහගත කර ඇත. තෙවන වසර තුළ සිසුන් අනිවාර්ය කර්මාන්ත පුහුණුවක් ද ලබා ගනී. සිව්වන වසර තුළ, සිසුන් විවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ දැනුම සහ අවබෝධය සහ වසර ගණනාවක් පුරා ඔවුන්ගේ ඉගෙනීම ප්‍රදර්ශනය කරමින් ඒකපුද්ගල ව්‍යාපෘතියක නියැලෙයි. මෙම උපාධි වැඩසටහනේ විශේෂත්වයක් ලෙස න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව සංස්ලේෂණය කිරීම සඳහා අනිවාර්ය කර්මාන්ත පුහුණුවක් ඇති අතර සිසුන්ට තමන් තෝරාගත් ක්ෂේත්‍ර මානව ප්‍රගුණ කිරීම සඳහා අවශ්‍ය විවිධ විෂයයන් තෝරා ගැනීමේ හැකියාව ද පවතී. මෙම උපාධි වැඩසටහනේ උපාධිධාරීන්ට MSc, MBA සහ PhD මට්ටම දක්වා ඔවුන්ගේ වැඩිදුර අධ්‍යයන කටයුතු කරගෙන යා හැකිය. මෙම වැඩසටහන මඟින් තොරතුරු තාක්ෂණ අංශයේ මෘදුකාංග ඉංජිනේරුවන්, පර්යේෂකයින්, විශ්ලේෂකයින්, නිර්මාණකරුවන්, සංවර්ධකයින්, පරීක්ෂණ සහ QA විශේෂඥයින්, පද්ධති පරිපාලකයින්, ව්‍යාපාර/තාක්ෂණ විශ්ලේෂකයින් සහ පද්ධති ඒකාබද්ධ කරන්නන් බිහි කිරීමට අපේක්ෂා කෙරේ.

## 8. Bachelor of Science (Honours) in Computer Networks - පරිගණක ජාලකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

NSBM හරිත සරසවියේ පරිගණක පීඨය මඟින් පිරිනමන පරිගණක ජාලකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, පරිගණක ජාල උපාධි සඳහා නවතම විෂය මිණුම් සලකුණු වලට අනුකූලව නිර්මාණය කර ඇති අතර සංකීර්ණ ජාල පද්ධති සංවර්ධනය කිරීමට සහ කළමනාකරණය කිරීමට හැකියාව ඇති දක්ෂ වෘත්තිකයන් බිහි කිරීම අරමුණු කරයි. මෙය වසර හතරක උපාධි වැඩසටහනක් වන අතර එය පරිගණක ජාලවල මූලික හා නැගී එන විෂය ක්ෂේත්‍රවල අවශ්‍ය කුසලතා සහ දැනුම ඇති උපාධිධාරීන් බිහි කිරීම අරමුණු කරයි. තෙවන සහ සිව්වන වසරවල සිසුන්ට අනිවාර්ය කර්මාන්ත පුහුණුවක් ද ලබා දෙන අතර, සිසුන්ට දැනුම සහ විවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ අවබෝධයක් සහ වසර ගණනාවක් පුරා ඔවුන්ගේ ඉගෙනීම ප්‍රදර්ශනය කිරීමට ඉඩ සලසන ඒකපුද්ගල ව්‍යාපෘතියක් ලබා දෙනු ලැබේ. මෙම වැඩසටහන සිසුන්ගේ අපේක්ෂාවන්ට ගැලපෙන පරිදි තෝරාගත හැකි විෂයන්ගෙන් සමන්විත වන අතර එමඟින් ඔවුන් තෝරාගත් වෘත්තීන් වෙත පහසුවෙන් ප්‍රවේශ වීමට සහාය වේ. අනිවාර්ය කර්මාන්ත පුහුණුව මෙම උපාධි පාඨමාලාවේ වැදගත් ලක්ෂණයක් වන අතර එය උපාධි අපේක්ෂකයාට රැකියා හැකියාව වැඩි දියුණු කරයි. මෙම උපාධි පාඨමාලාවේ උපාධිධාරීන්ට MSc, MBA සහ PhD මට්ටම දක්වා ඔවුන්ගේ වැඩිදුර අධ්‍යයන කටයුතු කරගෙන යා හැකිය. මෙම පාඨමාලාව හරහා ජාල පරිපාලකයින්, ජාල ඉංජිනේරුවන්, ජාල විශ්ලේෂකයින්, IT/පද්ධති සහාය ඉංජිනේරුවන්, ජාල ගෘහ නිර්මාණ ශිල්පීන් සහ VoIP ඉංජිනේරුවන් බිහි කිරීමට අපේක්ෂා කරයි.

## 9. Bachelor of Science Engineering (Honours) in Computer Systems Engineering - පරිගණක පද්ධති ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය

පරිගණක පද්ධති ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය යනු නවීන පරිගණක පද්ධතිවල මෘදුකාංග සහ දෘඩාංග සංරචක, පරිගණක පාලිත උපකරණ සහ උපාංග ජාල නිර්මාණය, ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදෙන උපාධියකි. මූලික වශයෙන් පරිගණක ඉංජිනේරු විද්‍යාව යනු විදුලි ඉංජිනේරු විද්‍යාව සහ පරිගණක විද්‍යාව යන දෙකෙහිම එකතුවකි. එය පසුගිය දශක කිහිපය තුළ වෙනම, නමුත් සමීපව සම්බන්ධ වූ විෂයයක් ලෙස පරිණාමය වී ඇත. පරිගණක ඉංජිනේරු විද්‍යාව පරිගණකකරණය, ගණිතය, විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ න්‍යායන් සහ මූලධර්ම මත ස්ථිරව පදනම් වී ඇති අතර පරිගණක දෘඩාංග, මෘදුකාංග, ජාල සහ ක්‍රියාවලීන් නිර්මාණය කිරීම හරහා තාක්ෂණික ගැටළු විසඳීම සඳහා මෙම න්‍යායන් සහ මූලධර්ම යොදයි.

NSBM හරිත සරසවිය මඟින් පිරිනමන උසස් අධ්‍යාපන අමාත්‍යංශය පිළිගත් පරිගණක පද්ධති ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය අරමුණු කරන්නේ තරඟකාරී ඉලක්ක

www.studentloan.mohe.gov.lk

සහ සීමාවන් සමූහයක් ඇතුළත් දෘඩාංග සහ මෘදුකාංග යන දෙකම ඇතුළත් වන පරිගණක, පරිගණක පාදක පද්ධති සහ ජාල නිර්මාණය කිරීමේ හැකියාව සහ නව ඉංජිනේරු ගැටළු විසඳීම සඳහා ඒවායේ ඒකාබද්ධතාවය ඇති උපාධිධාරීන් බිහි කිරීමයි. මෙම සන්දර්භය තුළ, "නිර්මාණය" යන්නෙන් අදහස් කරන්නේ පද්ධති "එකලස් කිරීම" හෝ "සංකල්පනය" කිරීමෙන් ඔබ්බට ගිය හැකියා මට්ටමක් වන අතර, ගණිතය සහ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පුළුල් දැනුමක් ඇති වන අතර, ඉංජිනේරු විද්‍යාවේ පුළුල් විෂය පථය හා සම්බන්ධ වී ඉන් ඔබ්බට ක්ෂේත්‍රයට සහ ඉංජිනේරු විද්‍යාවේ වෘත්තීය පුහුණුව සඳහා සූදානම පවත්වා ගැනීමට අවශ්‍ය වේ.

### 10. Bachelor of Business Management (Honours) in Tourism, Hospitality & Events - සංචාරක, ආගන්තුක සත්කාර හා උත්සව කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය

උසස් අධ්‍යාපන අමාත්‍යංශය පිළිගත් සංචාරක, ආගන්තුක සත්කාර හා උත්සව කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය NSBM හරිත සරසවිය මඟින් පිරිනමනු ලැබේ. මෙම උපාධි වැඩසටහන සංචාරක, ආගන්තුක සත්කාර හා උත්සව කළමනාකරණ යන ක්ෂේත්‍රවල සංකල්පීය හා ප්‍රායෝගික අධ්‍යාපනය ලබා දීම කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කර ඇත. මෙම සිව් අවුරුදු පූර්ණ කාලීන උපාධි වැඩසටහන අධ්‍යයන හා කර්මාන්ත අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කර ඇති අතර, එහි පළමු වසර දෙක තුළ පූර්ණ කාලීන අධ්‍යයන වැඩසටහන් සඳහා මාස 18 කින් සහ අවසාන වසරේදී මාස 6 ක කාර්මික පුහුණු අත්දැකීමක් සඳහා අවස්ථාව ලබා දෙයි. මෙම වැඩසටහන අවසන් වූ පසු, සිසුන්ට අදාළ ක්ෂේත්‍රවල අවශ්‍ය විෂය දැනුම සහ කුසලතා ලබා දෙන අතර ප්‍රායෝගික කර්මාන්ත අත්දැකීම් සහිත ඉහළ රැකියා නියුක්තියකින් යුත් උපාධිධාරීන් ලෙස උපාධි ලබා ගනු ඇත. මෙම උපාධිය හෝටල් සහ නිවාඩු නිකේතන කළමනාකරණය, සංචාරක උපදේශන, සංචාරක ආකර්ෂණ ස්ථාන, උත්සව කර්මාන්තය සහ තවත් බොහෝ ආශ්‍රිත ක්ෂේත්‍රවල විවිධ ඉල්ලුමක් ඇති වෘත්තීන් සඳහා දොරගුළු විවර කරයි.

### 11. BSc in Business Management (Human Resource Management) (Special) - ව්‍යාපාර කළමනාකරණය (මානව සම්පත් කළමනාකරණය) පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය

ව්‍යාපාර කළමනාකරණය (මානව සම්පත් කළමනාකරණය) පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය උසස් අධ්‍යාපන අමාත්‍යංශය පිළිගැනීම යටතේ NSBM හරිත සරසවිය මඟින් පිරිනමනු ලැබේ. මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ ආයතනික පරිසරයන් තුළ මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය කුසලතා සහ දැනුමෙන් සිසුන් සන්නද්ධ කිරීම සඳහා ය. එය උපායමාර්ගික කළමනාකරණය, මානව සම්පත් ක්‍රියාවලීන් සහ පද්ධති, ව්‍යාපාර සහ කාර්මික නීතිය, සේවක සම්පත්, මානව සම්පත් සංවර්ධනය, කාර්ය සාධන කළමනාකරණය, ත්‍යාග කළමනාකරණය, මානව සම්පත් තොරතුරු පද්ධති, උපායමාර්ගික මානව සම්පත් කළමනාකරණය සහ ජාත්‍යන්තර මානව සම්පත් කළමනාකරණය ඇතුළු පුළුල් පරාසයක මානව සම්පත් කාර්යයන් ආවරණය කරයි.

මෙම උපාධි වැඩසටහන වසර හතරක් පුරා විහිදෙන අතර, එහිදී මූලික ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනය විශේෂිත මානව සම්පත් කළමනාකරණ විශේෂඥතාව සමඟ ඒකාබද්ධ කරයි. පළමු වසර දෙක තුළ, සිසුන් ශක්තිමත් අධ්‍යයන පදනමක් ගොඩනැගීම සඳහා පූර්ණ කාලීන දේශනවල නිරත වේ. තුන්වන වසරේ සිට, ඔවුන් තම අධ්‍යයන කටයුතු කරගෙන යන අතරතුර ප්‍රායෝගික සීමාවාසික පුහුණුවට සහභාගී වේ. මෙම සීමාවාසික පුහුණුව සිසුන්ට මානව සම්පත් කළමනාකරණ පිළිබඳ වටිනා ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙන අතර, උපාධිය ලැබීමෙන් පසු ඔවුන් වෘත්තියට සූදානම් බව සහතික කරයි.



www.studentlanka.gov.lk

## 12. BSc in Business Management (Industrial Management) (Special) - ව්‍යාපාර කළමනාකරණය (කාර්මික කළමනාකරණය) පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය

NSBM හරිත සරසවිය විසින් පිරිනමනු ලබන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් ව්‍යාපාර කළමනාකරණය (කාර්මික කළමනාකරණය) පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය, කාර්මික කළමනාකරණ ක්ෂේත්‍රයේ ශක්තිමත් කළමනාකරණ සහ මෙහෙයුම් කුසලතා සහිත අනාගත නායකයින් බිහි කිරීම සඳහා නිර්මාණය කර ඇති සිව් අවුරුදු පූර්ණ කාලීන උපාධියකි. මෙම වැඩසටහන මඟින් නිෂ්පාදන පද්ධති, නිෂ්පාදන සැලසුම්කරණය, තත්ත්ව සහතික කිරීම, තඩත්තු කළමනාකරණය සහ කාර්මික ආරක්ෂාව පිළිබඳ පුළුල් අවබෝධයක් සිසුන්ට ලබා දෙන අතරම කාර්යක්ෂමතාව, තිරසාරභාවය සහ නවෝත්පාදනය කෙරෙහිද අවධාරණය කරයි. කාර්මික පුහුණුව සහ ක්ෂේත්‍ර චාරිකා හරහා සිසුන් ප්‍රායෝගික භාවිතයන් පිළිබඳ දැනුම ලබා දී සැබෑ නිෂ්පාදන පරිසරයන් පිළිබඳ පළමු අත්දැකීම ලබා දෙයි. මෙම උපාධියේ විෂය මාලාව ව්‍යාපාර කළමනාකරණය, ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණයෙන් සංකල්ප ඒකාබද්ධ කර සකසා ඇති අතර, විවිධ කාර්මික සන්දර්භයන් තුළ විශ්ලේෂණාත්මක සහ ගැටළු විසඳීමේ කුසලතා වැඩිදියුණු කිරීමට සිසුන්ට හැකියාව ලබා දෙයි. නිෂ්පාදන සහ සේවා කර්මාන්ත ක්ෂේත්‍ර දෙකෙහිම වෘත්තීය නිපුණත්වය සඳහා අත්‍යවශ්‍ය චින්තනය, නායකත්වය සහ උපායමාර්ගික තීරණ ගැනීම ද මෙම උපාධිය හරහා ප්‍රගුණ කරයි.

## 13. BM (Hons) in International Business - ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් NSBM හරිත සරසවිය විසින් පිරිනමනු ලබන ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය සිව් අවුරුදු පූර්ණ කාලීන උපාධියකි. මෙම උපාධිය සැලසුම් කර ඇත්තේ ගෝලීය ව්‍යාපාර ක්ෂේත්‍රයේ අත්‍යවශ්‍ය දැනුම සහ කුසලතා සිසුන්ට ලබා දීම සඳහා ය. මෙහි විෂය මාලාව ජාත්‍යන්තර අලෙවිකරණය, අන්තර් සංස්කෘතික කළමනාකරණය, ජාත්‍යන්තර මූල්‍ය, සැපයුම් සහ විදේශ වෙළඳ න්‍යාය ඇතුළු පුළුල් පරාසයක විෂයයන් ආවරණය කරන අතරම චීන හෝ ප්‍රංශ භාෂාවෙන් ප්‍රායෝගික භාෂා කුසලතා ද පිරිනමයි. මෙම උපාධි පාඨමාලාවේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස න්‍යායාත්මක දැනුම සමඟ ප්‍රායෝගික අත්දැකීම් සම්මිශ්‍රණය කරන අතරේ සිසුන්ට සීමාවාසික පුහුණුවක් සහ පර්යේෂණ සහ විශ්ලේෂණ හැකියාවන් ඔප් නංවමින් ජාත්‍යන්තර අධ්‍යයන පර්යේෂණයක් හරහා ගෝලීය ව්‍යාපාර භාවිතයන් සහ තත්වය වටහා ගැනීමට අවස්ථාව ලබා දේ. මේ හරහා ජාත්‍යන්තර ව්‍යාපාරික පරිසරයේ තරඟකාරීත්වයට මුහුණ දීමට සූදානම්, පුළුල් පරාසයක ආයතනික කුසලතා ඇති උපාධිධාරීන් NSBM විසින් නිර්මාණය කරනු ලැබේ. ඔවුන්ට ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර බහුජාතික සමාගම් (MNCs), ජාත්‍යන්තර වෙළඳ ආයතන සහ ගෝලීය ව්‍යාපාරයන්ගේ දක්ෂ ව්‍යාපාර කළමනාකරුවන් සහ වෘත්තිකයන් ලෙස වෘත්තීය සාර්ථකත්වය ළඟා කරගත හැකිය.

## 14. Bachelor of Laws (Honours) - නීතිවේදී ගෞරව උපාධිය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විසින් පිළිගත් NSBM හරිත සරසවිය විසින් පිරිනමනු ලබන නීතිවේදී ගෞරව උපාධිය, නීති ක්ෂේත්‍රයට ඔබින දැනුමින් සහ කුසලතාවෙන් යුතු උපාධිධාරීන් බිහිකිරීම සඳහා නිර්මාණය කර ඇත. අපේක්ෂකයින් සඳහා ශක්තිමත් වේදිකාවක් ලෙස මෙම LLB උපාධිය ව්‍යුහගත කර ඇති අතර, ජාතික හා ගෝලීය තලයේ සමකාලීන සමාජ-ආර්ථික අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය න්‍යායාත්මක, පර්යේෂණාත්මක සහ ප්‍රයෝගික දැනුම කෙරෙනි අවධානය යොමුකරමින් විශේෂයෙන් සැලසුම් කර ඇති මෙම ගෞරව වැඩසටහන වසර හතරක් පුරා පවත්වන සම්පූර්ණ විෂය මාලාවකින් සමන්විත වේ. උපාධියේ පළමු වසර දෙක අපරාධ නීතිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, කොන්ත්‍රාත් නීතිය සහ නීති පද්ධති වැනි නීති ක්ෂේත්‍රයේ මූලික දැනුම ලබාදෙමින් ශක්තිමත් පදනමක්

www.studentloans.mohe.gov.lk

නිර්මාණය කරයි. තුන්වන සහ සිව්වන වසර වලදී වාණිජ නීතිය, ජාත්‍යන්තර නීතිය, මානව හිමිකම් නීතිය, බුද්ධිමය දේපළ නීතිය සහ පාරිසරික නීතිය ඇතුළු වඩාත් සංකීර්ණ සහ විශේෂිත විෂයයන් ඇතුලත් වේ. මෙම උපාධියේ ප්‍රධාන ලක්ෂණයක් සහ සැලකිය යුතු වැදගත්කමක් ලෙස න්‍යායාත්මක දැනුමට අමතරව සීමාවාසික පුහුණුවක් සහ අනිවාර්ය සායනික ඒකක විෂය මාලාවට ඇතුළත් කිරීම මඟින් සිසුන්ට වෘත්තීය නීති පරිසරයක අත්‍යවශ්‍ය ප්‍රයෝගික අත්දැකීම ලබා දේ. තවද, නීති පර්යේෂණ සඳහා සිසුන්ගේ හැකියාවන් ඔප් නැංවීම සඳහා නිර්මාණය කර ඇති කැප්ස්ටන් පර්යේෂණ ව්‍යාපෘතියකින් මෙම වැඩසටහන අවසන් වේ.

### 15. Bachelor of Science of Engineering (Honours) in Electrical & Electronics Engineering - විදුලි සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය

NSBM හරිත සරසවියේ විදුලි සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය යනු ඉහළ වෘත්තීය හැකියාවෙන් යුතු වෘත්තීය ඉංජිනේරුවන් නිර්මාණය කිරීම සඳහා නිර්මාණය කර ඇති උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් වැඩසටහනකි. මෙම සිව් අවුරුදු උපාධිය, වොෂින්ටන් ගිවිසුම්වල ප්‍රමිතීන්ට අනුකූලව, වේගයෙන් විකාශනය වන තාක්ෂණික ලෝකයේ විශිෂ්ටත්වය අත්කර ගැනීමට සිසුන්ට දැනුම සහ කුසලතා ලබා දෙයි. මෙහි විෂය මාලාව බල පද්ධති ඉංජිනේරු විද්‍යාව, ඉලෙක්ට්‍රොනික විද්‍යාව, රොබෝ විද්‍යාව, කාර්මික ස්වයංක්‍රීයකරණය, පුනර්ජනනීය බලශක්තිය සහ දේවල් පිළිබඳ අන්තර්ජාල (IoT) තාක්ෂණයන් ඇතුළු අත්‍යවශ්‍ය විෂයයන් රාශියක් ආවරණය කරයි.

මෙම උපාධියේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස නූතන කර්මාන්ත අවශ්‍යතා, කාර්මික ස්ථානගත කිරීම් සහ උසස් රසායනාගාර කටයුතු කෙරෙහි එහි දැඩි අවධානය යොමු කිරීම හරහා පුළුල් ප්‍රායෝගික යෙදුමක් සමඟ න්‍යායාත්මක දැනුමක් ලබාදේ. නවීන ලෝකයේ සංකීර්ණ අභියෝග සඳහා නව්‍ය විසඳුම් නිර්මාණය කර ඒවා නිසි ලෙස ක්‍රියාත්මක කළ හැකි ඉංජිනේරුවන් බිහිකිරීම මෙම උපාධියේ මූලික අරමුණයි. ඒ හරහා උපාධිධාරීන්ව විවිධ කාර්මික හා තාක්ෂණික අංශවල බල පද්ධති ඉංජිනේරු, ඉලෙක්ට්‍රොනික නිර්මාණ ඉංජිනේරු, රොබෝ විද්‍යාව සහ ස්වයංක්‍රීයකරණ විශේෂඥ, විදුලි සංදේශ ඉංජිනේරු සහ පුනර්ජනනීය බලශක්ති උපදේශක වැනි වෘත්තීය භූමිකාවන් සඳහා සූදානම් කරයි.

### 16. Bachelor of Science of Engineering (Honours) in Mechatronics Engineering - මෙකාට්‍රොනික්ස් ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය

NSBM හරිත සරසවියේ මෙකාට්‍රොනික්ස් ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය යනු යාන්ත්‍රික, ඉලෙක්ට්‍රොනික සහ පරිගණක පද්ධති ඒකාබද්ධ කිරීම සඳහා දැනුමැති ඉහළ ඉංජිනේරුවන් සඳහා ඇති ඉහළ කර්මාන්ත ඉල්ලුම සපුරාලීම සඳහා නිර්මාණය කර ඇති උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් උපාධි පාඨමාලාවකි. වොෂින්ටන් ගිවිසුමේ ප්‍රමිතීන්ට අනුකූලව ව්‍යුහගත කර ඇති මෙම සිව් අවුරුදු උපාධිය, නූතන කාර්මික ලෝකයේ පෙරමුණ ගැනීම සඳහා උපාධිධාරීන් සූදානම් කරයි. මෙහි විෂය මාලාව රොබෝ විද්‍යාව, කාර්මික ස්වයංක්‍රීයකරණය, සංවේදක සහ ඩිජිටල් සංඥා සැකසුම් සහ නිෂ්පාදන ක්‍රියාවලි නිර්මාණය ඇතුළු අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර ආවරණය කරයි. එසේම විවිධ අංශ හරහා ස්මාර්ට් පද්ධති ඒකාබද්ධ කිරීමේ ප්‍රායෝගික දැනුම සහ ඒ පිළිබඳ පර්යේෂණාත්මක ප්‍රවේශයන් හරහා නවීන ස්වයංක්‍රීය විසඳුම් නිර්මාණය කළ හැකි ඉංජිනේරුවන් බිහි කරයි. මෙම උපාධිය අවසානයේ වත්මන් ලෝකයේ ඉහළ ඉල්ලුමක් ඇති නවීන ස්මාර්ට් කර්මාන්තවල නවෝත්පාදනයන් මෙහෙයවන, මෝටර් රථ නිෂ්පාදනය, අභ්‍යවකාශය, ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව සහ උසස් කාර්මික ස්වයංක්‍රීයකරණය ඇතුළු විවිධ ක්ෂේත්‍රවල මෙකට්‍රොනික් ඉංජිනේරුවන්, රොබෝ විද්‍යා ඉංජිනේරුවන්, ස්වයංක්‍රීයකරණ විශේෂඥයින් සහ පාලන පද්ධති නිර්මාණකරුවන් ලෙස උපාධිධාරීන්ට විශිෂ්ට වෘත්තීය අවස්ථාවන් පවතී.

www.studentlanka.gov.lk

## 5.3 CINEC ආයතනය මගින් පවත්වනු ලබන උපාධි පාඨමාලා.

**A. <u>කළමනාකරණ සහ සමාජ විද්‍යා පීඨය.</u>**

මෙම අධ්‍යයන පීඨය මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරෙනුයේ, කළමණාකරණ සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් ඇතිව එම ක්ෂේත්‍රයට පිවිසෙන සිසුන් සඳහා වර්තමාන ලෝකයේ පවතින ව්‍යාපාරික භාවිතයන් කෙරෙහි අවධානය යොමු කරමින්,ජාත්‍යන්තර වශයෙන් ව්‍යාපාරික ලෝකයේ නවතම ප්‍රවණතා ඇතුලත් කරමින්, ඔවුන්ට ගෝලීය දෘෂ්ටිකෝණයකින් යුක්තව නවමු ව්‍යාපාරික සංකල්ප ප්‍රගුණ කරමින්, කළමණාකරණ සහ සමාජ විද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රය තුළ ඉදිරියට යාම සඳහා අවස්ථා සලසා දීමයි. සමකාලීනව තිබෙන අනෙකුත් විශ්ව විද්‍යාල හා සමගාමීව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව ඉතා ඉහළ මට්ටමේ සුදුසුකම් සහිතව උපාධි පාඨමාලා පිරිනැමීම තුළින්, අපි මෙම ක්ෂේත්‍රය තුළ විශ්වාසදායක හා ප්‍රශංසනීය නියමුවකු බවට පත්වෙමින් සිටින්නෙමු. මෙම අධ්‍යන පීඨය, දේශයේ සහ ලෝකයේ සංවර්ධන ප්‍රයත්නයන් සඳහා අර්ථාන්විත දායකත්වයක් සැපයිය හැකි දක්ෂ විද්වතුන්, කැපී පෙනෙන වෘත්තිකයන් සහ පුරුෂයන් සහ කාන්තාවන් එක්රැස් කිරීම සඳහා අධ්‍යයන සහ වෘත්තීය ක්ෂේත්‍රවල ඉගෙනීම,ඉගැන්වීම,පුහුණුව ලබාදීම සහ පර්යේෂණ වල විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම යන CINEC විශ්ව විද්‍යාලයෙහි “දැක්ම”/ “දර්ශනයට” අනුකූලව කටයුතු කරයි.

අ.පො.ස උසස් පෙළ සඳහා පෙනී සිටි සියලුම සිසුන් සඳහා ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාලව, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිර්මාණය කර ඇති නවතම උපාධි පාඨමාලා මෙම අධ්‍යන පීඨය මගින් පිරිනමනු ලැබේ. උක්ත පාඨමාලාවන් ජාත්‍යන්තර ප්‍රවාහන කළමනාකරණයේ සිට ප්‍රවර්ධනය, හැසිරවීම, අලෙවිකරණය, ආගන්තුක සත්කාරක කළමනාකරණය, සැපයුම්දාම කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, බැංකුකරණය සහ ගිණුම්කරණය යන පුළුල් පරාසයක් දක්වා විහිදී යයි. නුදුරේදීම මෙම විෂය ක්ෂේත්‍රයට පිවිසෙන නවතම විෂයන් වලින් යුත් පාඨමාලා මෙම පීඨය සඳහා ඇතුලත් කරගැනීමට අප අපේක්ෂා කරන අතර, ඒ තුළින් විශ්ව විද්‍යාලයක් වශයෙන් අප වර්ධනය වන අතරම, සිසුන් වන ඔබව හැකි සෑම අකාරයෙන්ම දැනුමෙන් සහ කුසලතාවන්ගෙන් පෝෂණය කිරීම අපගේ අරමුණයි. තවද මේ වන විට අධ්‍යන පීඨය මගින් අපේක්ෂා කරනු ලබන අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් සඳහා ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි පාඨමාලා අප විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලබන බව ඉතා සතුටින් ඔබහට දැනුම් දෙන්නෙමු. අප විසින් පිරිනමනු ලබන සියලුම අධ්‍යන පාඨමාලා සැලසුම් කර ඇත්තේ, ශ්‍රී ලංකාවේ ආර්ථිකය, දැනට පවතින කාර්මික සහ මූල්‍ය සමූහ ව්‍යාපාර සමග ඒකාබද්ධ වෙමින්, වැඩි දියුණු කිරීමට හැකියාව ඇති කුසලතා වලින් පිරිපුන් දක්ෂ උපාධිදාරීන් සහ පශ්චාත් උපාධිදාරීන් බිහි කිරීමේ අරමුණෙනි.

අප විශ්ව විද්‍යාලය සතුව ඇති කළමනාකරණ සහ සමාජ විද්‍යා පීඨය, එහි අධ්‍යනයෙහි නිරත වන සිසුන් සඳහා ඉහළම ගුණාත්මක ප්‍රමිතීන්ගෙන් යුක්තව අධ්‍යාපනය ලබාදීම සඳහා අවශ්‍ය සම්පත් සහ යටිතල පහසුකම් වලින් සමන්විත වේ. එලෙසම අප භාවිත කරන අධ්‍යාපනික ප්‍රවේශයන් සිසුන්ට න්‍යායික සංකල්ප පමණක් ඉගැන්වීම සඳහා නිර්මාණය කරන ලද ක්‍රමවේදයක් නොවන අතර, එය ක්ෂේත්‍ර කාර්යයන්, සිද්ධි අධ්‍යනයන් මෙන්ම ප්‍රායෝගික සැසි වලින් සමන්විත වන අතර, ඒ තුළින් පන්ති කාමර තුළ පවත්වන දේශන අතරතුර විෂය සම්බන්ධව සිසුන්ගේ කුතුහලය වර්ධනය කරමින්, නව්‍ය අදහස් නිර්මාණය කිරීමට ඉඩ සලසන අතර ක්‍රියාකාරී ඉගැන්වීම් ඉගෙනීමේ ක්‍රියාවලියකට මග පාදයි. අපි අපගේ සිසුන් තුළ පවතින විවිධත්වයන්ට ගරු කරන අතර, ඔවුන්ව සෑමවිටම කණ්ඩායම් වැඩ සඳහා පෙළඹවීමට කටයුතු කරමු. එලෙසම එම කණ්ඩායම් ව්‍යාපෘති සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට ආයතනයක් ලෙස අප සෑමවිටම සැදීපැහැදී සිටින්නෙමු. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි කර්මාන්ත හා වෘත්තීය සංවිධාන සමග අප

www.studentloans.mohe.gov.lk

පවත්වාගෙන යන ශක්තිමත් හා පුළුල් සබඳතා, අපගේ සිසුන්ට ප්‍රායෝගික හා සීමාවාසික පුහුණුවීම් ලබාදීමේදී ඉමහත් දායකත්වයක් සපයයි. ඉතා ඉහළ වෘත්තීය සුදුසුකම්ලත් පළපුරුදු විද්වතුන්ගේ සහ පළපුරුදු බාහිර සම්පත්දායකයන්ගෙන් සමන්විත අප පීඨයේ අධ්‍යන කාර්ය මණ්ඩලය, සිසුන්ගේ අධ්‍යාපනය සහ හැකියාවන් වර්ධනය කරමින් ඔප්නැංවීමට නිරන්තරයෙන් සැදී පැහැදී සිටින අතර ඔවුන් නිර්මාණශීලි සහ සාර්ථක දැනුම ගවේෂණය කරන්නන් බවට පත් කිරීමට කැපවී සිටී. ඔවුන් සැම විටම සිසුන්ගේ දක්ෂතාවයන්, ඔවුන්ව විශිෂ්ඨයන් බවට පත් කරන කුසලතා බවට පරිවර්තන කිරීම සඳහා නිරන්තර උත්සාහයක යෙදී සිටී.

## 1. Bachelor of Science ( Honors) in Logistics & Transportation

මෙම  සිව් අවුරුදු පාඨමාලාව සැලසුම් කර ඇත්තේ වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත්, කුසලතාවයන්ගෙන් හෙබි ප්‍රවාහනය සහ සැපයුම් සේවා වෘත්තිකයන් බිහි කිරීමේ අරමුණෙනි. මෙහිදී සිසුන්හට, ඉන්වෙන්ටර් කළමනාකරුවන්, සැපයුම්දාම සම්බන්ධීකාරකවරුන්, ගබඩා කළමනාකරුවන්, ප්‍රවර්ධන කළමනාකරුවන් සහ ප්‍රවාහන කළමනාකරුවන් ලෙස ප්‍රායෝගිකව කටයුතු කිරීමට අවස්ථාව සැලසේ. වර්තමානෙය් මෙම ක්ෂේත්‍ර තුළ අනාගත අභියෝග වලට මුහුණදීම සඳහා සුදුසුකම්ලත් වෘත්තිකයන්ගෙන් සහ ශ්‍රම බලකායේ හිඟයකට මුහුණපාමින් සිටී.

## 2. Bachelor of Management (Honors) in Supply Chain Management

වෘත්තීය වශයෙන් සුදුසුකම්ලත් සහ කුසලතාවන්ගෙන් පිරිපුන් සැපයුම්දාම කළමනාකරුවන් බිහිකිරීම සඳහා මෙම සිව් අවුරුදු පාඨමාලාව සැලසුම් කර ඇත. මෙම පාඨමාලාව හැදෑරීම තුළින් ප්‍රවර්ධනය, නැව්ගත කිරීම, ගුවන් සේවා, භාණ්ඩ හැසිරවීම, මධ්‍යස්ථාන මෙහෙයුම්, බහුවිධ මෙහෙයුම්, ප්‍රසම්පාදන, ගබඩා කිරීම, ප්‍රවාහනය, විගණනය හා උපදේශනය, පර්යේෂණ සහ සංවර්ධන යන ක්ෂේත්‍රවල ඇති පෞද්ගලික, රාජ්‍ය සහ බහුජාතික සමාගම් හරහා විවිධ කර්මාන්ත වලට සම්බන්ධ වීමට සිසුන්ට අවකාශය සැලසේ.

## 3. Bachelor of Management (Honors) in Tourism & Hospitality Management

සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධිය වසර 04ක උපාධි පාඨමාලාවක් වන අතර, එහිදී සිසුන්ට Cruise Tourism Management (සුඛෝපභෝගී මගී ප්‍රවාහන නෞකාවල සිදුවන සංචාරක කර්මාන්ත කළමනාකරණය) හෝ සංචාරක හා උත්සව කළමනාකරණය යන ක්ෂේත්‍රවල (Travel & Event Management) විශේෂවේදී උපාධියක් හිමිකරගත හැකිය. එලෙසම අප විශ්ව විද්‍යාලය මගින්ම මෙම පාඨමාලාව හදාරන සිසුන්ට අවසාන අධ්‍යන වර්ෂය සඳහා නියමිතව ඇති සීමාවාසික පුහුණුව ලබා ගැනීම සඳහා පිළිගත් ආයතන වලට ඔවුන්ව අනුයුක්ත කිරීම කරනු ලබයි. ජාත්‍යන්තර වශයෙන්, වර්ෂ 2015 දී, සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 7.2ක් උපයා ඇති අතර එය ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් 9.8% වේ. එලෙසම ලොවපුරා පවතින රැකියා වෙළඳපොළ තුළ රැකියා ප්‍රදාන ස්තානයක් සංචාරක ක්ෂේත්‍රයට අයත්වේ. සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාරය ඉතා වේගයෙන් වර්ධනය වන බැවින් මෙම පාඨමාලාව හදාරන සිසුන්හට, දේශීය රැකියා වෙළඳපොළ තුළ මෙන්ම, ජාත්‍යන්තර රැකියා වෙළඳපොළ තුළ ද විශාල ඉල්ලුමක් මේ වන විටත් පවතී.

www.studentloans.mohe.gov.lk

මෙම පාඨමාලාව සාර්ථකව අවසන් කරන උපාධිධාරීන්, තම වෘත්තීය ක්ෂේත්‍රයට පිවිසුන විට ඔවුන්ට සංචාරක සමාගම්, සංචාරක මෙහෙයුම් මධ්‍යස්ථාන, හොටල්, නිවාඩු නිකේතන කළමනාකරණය, උත්සව කළමනාකරණය (Event Management), Cruise Companies, ගුවන් සේවා, දුම්රිය ගමන් සහ මගී සේවා වැනි ක්ෂේත්‍ර වල රැකියා අවස්ථා ලබා ගැනීමට අවකාශය සැලසේ. එලෙසම සම්මේලන මධ්‍යස්ථාන, සංචාරක කාර්යාල, සංචාරක අමාත්‍යාංශය, ආහාරපාන කළමනාකරණය, ප්‍රසංග, රංග ශාලා, කෞතුකාගාර, සත්කාරක උපකරණ නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන්, ස්පා සහ සුවතා කළමනාකරණය සහ උපදේශනය ඔවුන්ට රැකියා අවස්ථා විවෘත වන අනෙකුත් ක්ෂේත්‍රයන් වේ.

## 4. Bachelor of Management ( Honors )in Business Administration

ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව ගෞරව උපාධියක් පිරිනමන මෙම පාඨමාලාව තුළින් ජාතික හා ගෝලීය අවශ්‍යතා සපුරාලීම සඳහා ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රය තුළ දැනුම, කුසලතා, නිවැරදි ආකල්ප සහ වටිනාකම් වලින් යුක්ත උපාධිධාරීන් බිහි කිරීමට අපේක්ෂා කරනු ලබයි. ලෝකයේ තිබෙන ඕනෑම රටක, සංවර්ධනයේදී ව්‍යාපාර පරිපාලන අංශය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර ඒ අනුව අනාගතයේදී ව්‍යාපාර පරිපාලනය හා සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන් තුළ රැකියා අවස්ථා ඉතා සීඝ්‍රයෙන් ඉහළ යනු ඇත.

එබැවින් අපි ශ්‍රී ලංකාවේ තිබෙන ප්‍රමුඛ පෙළේ පෞද්ගලික විශ්ව විද්‍යාලයක් ලෙස ජාතික, කාර්මික සහ කලාපීය අවශ්‍යතා සපුරාලීම සඳහා ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රය තුළ සුදුසුකම්ලත්, කාර්යක්ෂම සහ නිපුණතා වලින් හෙබි මානව සම්පත් නිෂ්පාදනය කිරීමේ ප්‍රමුඛ වගකීම අවබෝධ කරගෙන සිටින්නෙමු. මෙම පාඨමාලාව හදාරන සිසුන්ට අවසන් වසර සඳහා නියමිත රැකියා පුහුණුව ලබා ගැනීමෙන් පසුව කළමනාකරණ අභ්‍යාසලාභීන්, පරිපාලන කළමනාකරණ සහකාර හෝ එම ක්ෂේත්‍රයට අදාල වෙනත් රැකියාවක් සඳහා රැකියා අවස්ථා ලබාගත හැක.

ඔවුන් සුදුසුකම්ලත් වෘත්තිකයන් වශයෙන් මෙම ක්ෂේත්‍රයට පිවිසුන විට සාමාන්‍යාධිකාරීවරුන්, අධ්‍යක්ෂකවරුන්, විකුණුම් හා ව්‍යාපාර සංවර්ධන කළමනාකරුවන්, ව්‍යාපෘති කළමනාකරුවන්, ව්‍යාපාර විශ්ලේෂකයන්, සැපයුම්දාම කළමනාකරුවන්, ප්‍රධාන ව්‍යාපාර මෙහෙයුම්කරුවන් සහ ව්‍යවසායකයන් ලෙස රැකියා ක්ෂේත්‍රයට පිවිසිය හැකිය.

## 5. Bachelor of Management (Honors) in Human Resource Management

අධ්‍යාපනික හා වෘත්තීය විශිෂ්ඨත්වය ඉහළ නැංවීමේ නවතම පියවරක් ලෙස මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධිය, අප ආයතනය විසින් ඔබ වෙත පිරිනමනු ලබන අතර, මේ තුළින් මෙම පාඨමාලාව හදාරන තරුණ තරුණියන්ට නවමු ආකර්ෂණීය අත්දැකීමක් ලබාදීමට සහ වෘත්තිකයන්ගේ විනය, ක්ෂේත්‍රයට අදාල ලෙස හැඩගැස්වීමට අපි අපේක්ෂා කරමු. මෙම උපාධි පාඨමාලාව මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඕනෑම ආයතනයක නියැලීමට අපේක්ෂා කරන උපාධි අපේක්ෂකයන් සඳහා සැලසුම් කර ඇත.

CINEC, ශ්‍රී ලංකාවේ දැනට තිබෙන ප්‍රමුඛ පෙළේ පෞද්ගලික විශ්ව විද්‍යාලයක් ලෙස ජාතික හා කලාපීය අවශ්‍යතා සපුරාලීම සඳහා මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රය තුළ සුදුසුකම්ලත්, කාර්යක්ෂම සහ නිපුණතා වලින් හෙබි පුද්ගලයින් බිහි කිරීමේ ප්‍රමුඛ වගකීම අවබෝධ කරගෙන සිටී.

www.studentloansmohe.gov.lk

උපාධි පාඨමාලාව අවසන් කර මෙම ක්ෂේත්‍රයට පිවිසෙන සිසුන්හට මානව සම්පත් කළමනාකරුවන්, මානව සම්පත් පිළිබඳ සාමාන්‍යාධිකාරීවරුන්, මානව සම්පත් බඳවා ගැනීමේ නිලධාරීන්, මානව සම්පත් පිළිබඳ විශේෂඥයින්, සේවක සම්බන්ධතා පිළිබඳ කළමනාකරුවන්, වන්දි ලබාදීම පිළිබඳ කළමනාකරුවන් සහ සංවර්ධන කළමනාකරුවන් වැනි වෘත්තීන් සඳහා යොමුවිය හැකිය.

## 6. Bachelor of Business Management (Honors) in Banking and Finance

දැනට ලෝකයේ පවතින ඕනෑම රටක, ආර්ථික සංවර්ධනය සඳහා බැංකු සහ මූල්‍ය අංශ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

රටක් තුළ දළ දේශීය නිෂ්පාදිතයට සැලකිය යුතු දායකත්වයක් සපයන ප්‍රධාන සේවා අංශය ලෙස බැංකු සහ මූල්‍ය අංශ සැලකේ. මෑතකාලීනව ශ්‍රී ලංකාවේ ආර්ථිකය දෙස ආපසු හැරී බැලූ කළ මෙම ක්ෂේත්‍ර ඉතා වේගයෙන් වර්ධනය වී ඇති බව පෙනී යයි. එබැවින් බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව උපාධිධාරීන්ට දේශීය හා ගෝලීය වශයෙන් පුළුල් පරාසයක් දක්වා විහිදී ඇති රැකියා අවස්ථා බිහිවී ඇති අතර ඒ සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. ඉහත උපාධි පාඨමාලාව හදාරන සිසුන් වෙත ඉලක්කගත වී ඇති රැකියා වෙළඳපොළට, මූල්‍ය සමාගම්, වානිජ බැංකු, කොටස් තැරව්කාර සමාගම්, ප්‍රාථමික අලෙවිකරුවන්, රක්ෂණ සමාගම්, ව්‍යාපාර සඳහා ප්‍රාග්ධනය ලබාදෙන සමාගම්, අරමුදල් කළමනාකරණය සඳහා වන සමාගම්, විශ්‍රාම වැටුප් අරමුදල් සහ වෙනත් ඕනෑම ආයතනයක ආයතනික මූල්‍ය අංශ ඇතුලත් වේ. කෙසේ වෙතත් දැනට රාජ්‍ය විශ්ව විද්‍යාල වල බැංකු හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඇති උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේදී ඇති සීමිත අවස්ථා හේතුවෙන් මෙම රැකියා අවස්ථාවන් යථාර්ථයක් බවට පත් කිරීමට බාධා පැමිණ ඇත.

CINEC, ශ්‍රී ලංකාවේ දැනට තිබෙන ප්‍රමුඛ පෙළේ පෞද්ගලික විශ්ව විද්‍යාලයක් ලෙස, ජාතික සහ කලාපීය අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකු හා මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රය තුළ සුදුසුකම්ලත්, කාර්යක්ෂම සහ නිපුණතා වලින් හෙබි පුද්ගලයන් සමාජයට දායාද කිරීමේ ප්‍රමුඛ වගකීම අවබෝධ කරගෙන සිටී.

අප විශ්ව විද්‍යාලය මගින් ඔබට පිරිනමා ඇති මෙම උපාධි පාඨමාලාව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පාඨමාලාවක් වන අතර, එය ශ්‍රී ලංකාව තුළ (SLQF) 6 වන මට්ටමට සමාන වේ. මෙම උපාධි පාඨමාලාව බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයන්හි වෘත්තීන්හි නියැලීමට රුචිකත්වයක් දක්වන උපාධි අපේක්ෂකයින් සඳහා නිර්මාණය කර ඇති අතර උපාධි පාඨමාලාව සඳහා ඇතුලත් වීමේ මූලික සුදුසුකම් ලෙස ඕනෑම විෂය ධාරවක් යටතේ අ.පො.ස උසස් පෙළ සාමාර්ථ 03ක් සහිතව සමත් වී තිබීම ප්‍රමාණවත් වේ. එලෙසම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත කරනු ලබන Edexcel / Cambridge වැනි විභාග සඳහා ඕනෑම විෂය ධාරාවක් යටතේ පෙනී සිට සාමාර්ථ 03ක් සහිතව විභාගය සමත්ව තිබීම ද මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට හැකි සුදුසුකමක් ලෙස සලකනු ලබයි.

## 7. Bachelor of Business Management (Honors) in Accounting

වර්තමානය වන විට පෙර නොවූ විරූ ලෙස ගිණුම්කරණ ක්ෂේත්‍රය කෙරෙහි විශාල බලපෑමක් නවීන තාක්ෂණය විසින් සිදු කරමින් සිටින අතර, තාක්ෂණික සහය ඇතිව නිෂ්පාදනය කර ඇති නවෝත්පාදනයන්, අනාගතයේදී ගිණුම්කරණ ක්ෂේත්‍රයට පිවිසෙන වෘත්තිකයන්ට, ඔවුන්ගේ දැනුම සහ කුසලතා යාවත්කාලීන කර ගැනීමට මෙන්ම වර්ධනය කර ගැනීමට ද ඉමහත් පිටුවහලක් වී ඇත.

www.studentloans.mohe.gov.lk

CINEC විශ්ව විද්‍යාලය මගින් හඳුන්වා දී ඇති මෙම පාඨමාලාව සාර්ථක ලෙස අවසන් කර ව්‍යාපාර කළමනාකරණය සහ ගිණුම්කරණ ක්ෂේත්‍රය වෙත පිවිසෙන වෘත්තිකයන්, අභියෝග වලට මුහුණ දිය හැකි, නවීන තාක්ෂණික දැනුමෙන් සන්නද්ධ කුසලතා සපිරි පුද්ගලයින් ලෙස සමාජ ගත කිරීම සඳහා අප සැමවිටම ඇප කැප වී සිටින්නෙමු.

මෙම උපාධි පාඨමාලාව සාර්ථකව අවසන් කර සමාජ ගත වන වෘත්තිකයන්හට ගිණුම් කළමනාකරුවන්, මූල්‍ය ගණකාධිකාරීවරුන්, අයවැය විශ්ලේෂකයන්, බදු පරීක්ෂකයන් සහ මූල්‍ය උපදේශකවරුන් ලෙස ක්ෂේත්‍රය තුළ රැකියා අවස්ථා ලබා ගැනීමට අවකාශය හිමිවේ.

## 8. Bachelor of Business Management (Honors) in Marketing

අප විසින් හඳුන්වා දී ඇති මෙම සිව් අවුරුදු පාඨමාලාව, අලෙවිකරණ ක්ෂේත්‍රයේ බොහෝ රැකියා අවස්ථා සඳහා දොරටු විවර කරනු ලබයි. ලොව තිබෙන ඕනෑම කර්මාන්තයකට කිසියම් හෝ අවස්ථාවක අලෙවිකරණ ක්ෂේත්‍රයේ සහාය අවශ්‍ය වන අතර ගෝලීය වශයෙන් මේ වන විට ද අලෙවිකරණ ක්ෂේත්‍රය තුළ සුදුසුකම්ලත්, කුසලතා පූර්ණ ශ්‍රම බලකායේ හිඟයක් පවතී. ශ්‍රී ලංකාව තුළද මෙම ක්ෂේත්‍රය දියුණු වෙමින් පවතින අතර, මෙම පාඨමාලාව සාර්ථකව නිමකරන සිසුන් සඳහා එම ක්ෂේත්‍රය තුළ ඉතා ඉහළ වැටුප් සහිත රැකියා සඳහා ඉල්ලුමක් පවතී.

මෙම පාඨමාලාව සාර්ථකව අවසන් කර රැකියා වෙළඳපොළ වෙත පිවිසෙන වෘත්තිකයන්ට සුපිරි වෙළඳසල් දාම, සුපිරි සන්නාම නාමයන්ගෙන් යුත් ව්‍යාපාර, වෙළඳ ප්‍රචාරණ සහ පාරිභෝගික අලෙවි ආයතන, නිෂ්පාදන කාර්යයෙහි යෙදෙන සංවිධාන සේවා අලෙවිකරණ ආයතන, පර්යේෂණ ආයතන, හෝටල්, රූපවාහිනී සංස්ථා සහ ජන මාධ්‍ය වැනි ක්ෂේත්‍ර වල රැකියා අවස්ථා සඳහා අයදුම් කිරීමට අවකාශය හිමිවනු ඇත.

## B. <u>ඉංජිනේරු තාක්ෂණ පීඨය.</u>

ශ්‍රී ලංකාවේ දැනට තිබෙන ප්‍රමුඛ පෙළේ පෞද්ගලික විශ්ව විද්‍යාලයක් වන CINEC සතුව පවතින ඉංජිනේරු තාක්ෂණ පීඨය, 2008 දී පිහිටුවන ලදී. ඉංජිනේරු තාක්ෂණ ක්ෂේත්‍රයේ, විශිෂ්ඨයන් බිහිකරන කේන්ද්‍රස්ථානය බවට පත් වෙමින්, කුසලතා වලින් සපිරුණු ඉංජිනේරුවරුන් දැයට දයාද කිරීම අපගේ ප්‍රධාන අරමුණයි. අප විශ්ව විද්‍යාලය සතු මෙම පීඨය ප්‍රධාන උප පීඨය තුනකින් සමන්විත වේ; සිවිල් ඉංජිනේරු උප පීඨය, විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු උප පීඨය, යාන්ත්‍රික හා මෝටර් රථ ඉංජිනේරු උප පීඨය. අප ආයතනය විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව, මෙහි ඉගෙනුම ලබන සිසුන්, දිනෙන් දින අලුත්වන නව තාක්ෂණික කුසලතා හා දැනුමෙන් සන්නද්ධ කිරීමේ අරමුණින්, විවිධ පරාසයන් ඔස්සේ විහිද යන වැඩසටහන් (මෝටර් රථ, සිවිල් ,ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව) නිරන්තරයෙන් ම සිසුන් වෙනුවෙන් සංවිධානය කරනු ලබයි.

අප සතුව ඇති මෙම ඉංජිනේරු තාක්ෂණ පීඨය, ඉංජිනේරු කර්මාන්තයට අදාළවම නිර්මාණය කර ඇති විෂය මාලාවකින්, පළපුරුදු කාර්ය මණ්ඩලයකින් සහ අති නවීන පහසුකම් වලින් සමන්විත වන අතර සිසුන්ට අවශ්‍ය වන, යාවත්කාලීන වූ න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික කුසලතාවන්ගෙන් සිසුන් සන්නද්ධ කිරීම සඳහා නිරන්තරයෙන් ඇප කැප වී සිටී. මෙම පීඨය සෑම විටම ක්ෂේත්‍රයේ සිදුවන නවෝත්පාදන පිළිබඳව අවධානයෙන් පසුවන අතර ක්ෂේත්‍රයේ වෙසෙන අනෙකුත් කර්මාන්ත කොටස්කරුවන් සමග සහයෝගීතාවයෙන් ක්ෂේත්‍රයට අදාල කායීන්හි නියැලෙමින් සිසුන්ව ඒ

www.studentloans.mohe.gov.lk

ඒ අදාල අංශවල වෘත්තීන් සඳහා සූදානම් කිරීමට තම දායකත්වය නොමසුරුව ලබා දෙයි.

මෙම ඉංජිනේරු තාක්ෂණ පීඨය, මෙහි ඉගෙනුම ලබන, උපාධි අපේක්ෂකයින්ගේ ප්‍රායෝගික කුසලතාවන් වර්ධනය සඳහා අවශ්‍යවන නවීන රසායනාගාර පහසුකම්වලින් යුක්ත වේ. මෝටර් රථ ඉංජිනේරු විද්‍යාව, රොබෝ විද්‍යාව, ව්‍යුහාත්මක යාන්ත්‍රික විද්‍යාව, ඉලෙක්ට්‍රොනික හා ද්‍රව විද්‍යාව වැනි ක්ෂේත්‍රවල ප්‍රායෝගික අත් හදා බැලීම් සඳහා අවශ්‍ය, නවතම උපකරණ සහ මෙවලම් වලින් සමන්විතව මෙම විද්‍යාගාර, ඉතාමත් උසස් පහසුකම් සහිතව සැලසුම් කර ඇත. මෙම විද්‍යාගාර තුළින් ලබාගන්නා ප්‍රායෝගික අත්දැකීම් හේතුවෙන්, සිසුන් ක්ෂේත්‍රය තුළ තිබෙන රැකියා වෙළඳපොළ තුළට පිවිසීමේදී, න්‍යායාත්මකව ඔවුන් උගත් දෑ ප්‍රායෝගිකව භාවිත කිරීමට මහඟු පිටුවහලක් වන අතර, ක්ෂේත්‍රය පිළිබඳව ඔවුන්ට තිබෙන අවබෝධය සහ ගැටලු විසඳීමේ කුසලතාවන් වැඩිදියුණු කිරීමට නිරන්තරයෙන් දායකත්වය සපයනු ලබයි. එලෙසම තාක්ෂණයේ සීඝ්‍ර දියුණුවත් සමග, නිරන්තරයෙන් නවීකරණය වන නවතම තාක්ෂණික මෙවලම් සහ උපකරණ භාවිතයෙන් මෙම රසායනාගාර පහසුකම් නිතිපතා යාවත්කාලීන කරනු ලබන අතර, එය ක්ෂේත්‍රය තුළ පවතින රැකියා වෙළඳපොල සඳහා අප පාඨමාලාවන් සාර්ථකව නිම කරන සිසුන් සඳහා වන ඉල්ලුම වැඩිවීමට සෘජුව බලපාඇත.

අපගේ පීඨය, කර්මාන්ත උපදේශන කමිටුව හරහා ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෙසෙන අනෙකුත් කර්මාන්ත හිමිකරුවන් සමග ඉතා ම සමීප සබඳතාවක් පවත්වා ගනිමින්, ඉංජිනේරු කර්මාන්තයට අදාල ලෙස උපාධි පාඨමාලාවන්හි විෂය මාලා නිර්මාණය කිරීම සඳහා ක්ෂේත්‍රය පිළිබඳව ඇති ඔවුන්ගේ දැනුම ,අවබෝධය ලබාගන්නා අතර එය අපගේ අධ්‍යාපනික වැඩසටහන් ක්ෂේත්‍රයේ වත්මන් අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදිම නිර්මාණය වී ඇති බවට සහතික කිරීමට ඉමහත් දායකත්වයක් සපයයි. කර්මාන්ත උපදේශන කමිටුවේ සහයෝගය ඇතිව ශක්තිමත් කර්මාන්ත බිහිකිරීම, අධ්‍යාපනික වශයෙන් අවශ්‍ය වන සහයෝගීතාව වර්ධනය කර ගැනීම, සිසුන් සඳහා සීමාවාසික පුහුණුව සඳහා රැකියා ස්ථාන ලබා ගැනීම, දෛනිකව යාවත්කාලීන වන නව ප්‍රවණතා සහ තාක්ෂණය පිළිබඳව උපදෙස් ලබාගැනීම සහ පීඨය විසින් සිසුන් වෙත පිරිනමනු ලබන අධ්‍යාපනික දැනුම සහ තාක්ෂණික කුසලතා, ඉංජිනේරු වෘත්තීයේ සහ රැකියා වෙළඳපොලේ ඉල්ලුමට සරිලන ලෙස නිර්මාණය කිරීම වඩාත් සාර්ථක ලෙස සිදු කර ගැනීමට අප හට හැකියාව ලැබී ඇත.

ඉංජිනේරු තාක්ෂණයට අදාල වෘත්තීන් ඉතා ම උද්යෝගයෙන්, ඉහල වැටුප සහ වරප්‍රසාද සහිතව නිරත විය හැකි වෘත්තීන් වේ. CINEC පෞද්ගලික විශ්ව විද්‍යාලය, රැකියා වෙළඳපොළ තුළ දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් එම වෘත්තීන් සඳහා වැඩි වන ඉල්ලුම සපුරාලීම සඳහා අදාළ ප්‍රායෝගික අත්දැකීම් සහ ව්‍යාපෘති මත පදනම්ව දැනුම හා කුසලතා වර්ධනය, නවතම අධ්‍යාපන ක්‍රමවේදයන්ට අනුකූලව සිදු කරමින් සිසුන්ගේ න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික කුසලතා සමබරව සංවර්ධනය කිරීම සඳහා නිරන්තර දායකත්වයක් සපයනු ලබයි.

## 9. Bachelor of Science (Honors) in Engineering in Automotive Engineering

මෝටර් රථ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ව ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය **(ඉංග්‍රීසි මාධ්‍ය)**

CINEC විශ්ව විද්‍යාලය මගින් ඔබ වෙත පිරිනමනු ලබන මෙම උපාධිය, සිව් අවුරුදු පාඨමාලාවක් වන අතර අ.පො.ස. උසස්පෙළ සමත් සිසුන් සඳහා, මෙම ක්ෂේත්‍රයට අවැසි වෘත්තිකයින් ලෙස රැකියා වෙළඳපොළ වෙත දායාද කිරීම සඳහා නිර්මාණය කරන ලද්දකි.



www.studentloans.mohe.gov.lk

මෑත කාලීනව, ගෝලීය වශයෙන් සාකච්ඡාවට බඳුන් වූ පොසිල ඉන්ධන හිඟය හේතුවෙන්, නව බල ශක්ති ප්‍රභවයන් සහ ඒ මත පදනම්ව මෝටර් රථ නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ දෙමුහුන් තාක්ෂණයද ඇතුළුව, නව මෝටර් රථ එන්ජින් නිපදවීම පිළිබඳව මාතෘකාව වෙත ක්ෂේත්‍රයේ වෙසෙන ප්‍රවීණයන්ගේ දැඩි අවධානයට යොමු වී ඇත. මෙය, සංචාරක කර්මාන්තය සඳහා භාවිතා කරන සියලුම ආකාරයේ මෝටරරථයන්හි දියුණුවට සහ සහ ප්‍රවාහන මාධ්‍යයන්හි සීඝ්‍ර වර්ධනයට හේතුවී ඇත. මේ හේතුවෙන් දේශීය මෙන්ම, ජාත්‍යන්තර රැකියා වෙළඳපොළ තුළ ද, මෙම ක්ෂේත්‍රයට පිවිසෙන තරුණ තරුණියන්ට, නව රැකියා අවස්ථා දිනෙන් දින විවෘත වෙමින් පවතින අතර, මෙම ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් දක්වන බොහෝ ම තරුණ තරුණියන් වෘත්තීය වශයෙන් මෙය තමන්ට යෝග්‍ය ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන ඇත.

මෙම පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන උපාධිධාරීන්, මෙම ක්ෂේත්‍රය තුළට පිවිසෙන විට, ක්ෂේත්‍රයට අදාල නවතම දැනුමෙන් හා කුසලතාවලින් පරිපූර්ණ වූ මෝටර් රථ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වෘත්තිකයන් ලෙස ක්ෂේත්‍රයට දායාද වන බව, අපි ආයතනයක් වශයෙන් සහතික කරන්නෙමු. එලෙසම මෙම සිව් අවුරුදු පාඨමාලාව, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව හා සම්බන්ධ, විශේෂ විෂය මොඩියුල ඔබ වෙත පිරිනමන අතර, ඒ ඔස්සේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව දැනුම පුළුල් කර ගැනීම සඳහාද ඔබ හට අවස්ථාව හිමි වේ. තෙවන වසර අවසාන වන විට සිසුන්ට කාර්මික පුහුණුව ලබාගැනීම සඳහා එම දැනුම හා කුසලතා වර්ධනය කරන සංවිධානයක් ආයතනයක් සමඟ සම්බන්ධ විය හැකි අතර, එම පුහුණුව, සති 24ක් ආවරණය කරයි.

## 10. Bachelor of Science (Hons) in Engineering in Civil Engineering

CINEC විශ්ව විද්‍යාලය මගින් ඔබ වෙත පිරිනමනු ලබන මෙම ගෞරව උපාධිය, සිව් අවුරුදු පාඨමාලාවක් වන අතර අ.පො.ස. උසස් පෙළ සමත් සිසුන් සඳහා මෙම ක්ෂේත්‍රයට අවැසි වෘත්තිකයන් රැකියා වෙළඳපොළ වෙත දායාද කිරීම ප්‍රමුඛ කොට ගෙන නිර්මාණය කරන ලද්දකි. වර්තමානය වන විට තාක්ෂණික දියුණුවේ තිරසාර සංවර්ධනය වෙත ගෝලීය වශයෙන් අවධානය යොමු වී ම ඇති බැවින්, දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ සමාජ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම උදෙසා සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය ප්‍රධාන කාර්යයක් ඉටු කරමින් සිටී. මෙම ක්ෂේත්‍රය භූතාක්ෂණික ඉංජිනේරු විද්‍යාව හා ජල ප්‍රවාහන වැනි පුළුල් පරාසයක උප ක්ෂේත්‍ර ආවරණය කරනු ලබන අතර එම සියලු ක්ෂේත්‍රයන් වත්මන් සමාජ රටාව හා පරිසරය තුළ අඛණ්ඩ පැවැත්ම සහ සංවර්ධනය උදෙසා අත්‍යවශ්‍ය වේ.

CINEC විශ්ව විද්‍යාලය විසින් ඔබ වෙත පිරිනමා ඇති මෙම ගෞරව උපාධිය, රසායනාගාර පරීක්ෂණ, සමීක්ෂණ කඳවුරු, ක්ෂේත්‍ර චාරිකා සහ ප්‍රායෝගික ව්‍යාපෘති වැනි ක්‍රියාකාරකම් හරහා සිසුන්ට අවශ්‍ය කරන දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් නිරන්තරයෙන් ලබාදීමට කටයුතු කරන අතර, ඒ ඔස්සේ පන්ති කාමරය තුළ සිසුන් විසින් න්‍යායාත්මකව ඉගෙන ගන්නා කරුණු නිවැරදිව, ප්‍රායෝගික ලෙස තම රැකියාව සඳහා යොදා ගැනීමට නිසි පුහුණුවක් ලබා ගනී. ඒ ඔස්සේ ඔවුන් සැබෑ ලෝකයේ අභියෝග සඳහා මුහුණදීමට නිරන්තර පුහුණුවක් ලබා ගනී.

මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වන සිසුන් 3 වන වසර අවසානයේදී, ඔවුන්ට අවශ්‍ය කාර්මික පුහුණුව සහ කුසලතා සංවර්ධනය උදෙසා, එම පුහුණුව නිසියාකාරව සපයන ආයතනයක හෝ සංවිධානයක තම සීමාවාසික පුහුණුව ලබාගත යුතුවේ. එය ඔවුන්ගේ වෘත්තීය කුසලතා ඉහළ නැංවීම සඳහා ඉමහත්

www.studentloans.mohe.gov.lk

දායකත්වයක් සපයයි. ඒ ලබා ගන්නා අත්දැකීම්, දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් අපගේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සහ අඛණ්ඩ පැවැත්ම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාල වෘත්තීන්වල ඉතා උද්යෝගයෙන්, ඉහල වැටුප් සහ වරප්‍රසාද සහිතව නිරත විය හැකි අතර, මෙම ක්ෂේත්‍රයේ පවතින විවිධත්වය සහ පුළුල් පරාසය හේතුවෙන් විවිධ ක්ෂේත්‍ර හරහා රැකියා අවස්ථා රාශියක් හිමිකර ගැනීමට මෙම පාඨමාලාව හදාරණ සිසුන්ට අවකාශය හිමි වේ. ඒ අතර, ඉදිකිරීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය, නාගරික සැලසුම්කරණය, ජල සම්පත් කළමනාකරණය, ප්‍රවාහනය සහ පාරිසරික ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍ර ප්‍රමුඛත්වයක් උසුලයි. වෘත්තිමය වශයෙන් ගත්කල, ව්‍යුහාත්මක ඉංජිනේරු, අඩවි ඉංජිනේරු/කළමනාකරු, ව්‍යාපෘති ඉංජිනේරු/කළමනාකරු, භූ තාක්ෂණික ඉංජිනේරු සහ පාරිසරික ඉංජිනේරු යන වෘත්තීන් මෙම ක්ෂේත්‍රයට පොදු භූමිකාවන් වේ. සාර්ථක ලෙස මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කරනු ලබන උපාධිධාරීන්ට රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන, ඉදිකිරීම් ආයතන, උපදේශන සමාගම් සහ බහුජාතික සමාගම් යන විවිධ අංශයන්හි රැකියා සඳහා අයදුම් කිරීමට අවස්ථාව හිමි වේ. එපමණක් නොව ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පවතින රැකියා අවස්ථා රාශියක් සඳහාද ඔවුන්ට දොරගුළු විවරවන වන අතර, ශාස්ත්‍රීය පරීක්ෂණයන්හි නිරත වීම, ව්‍යවසායකයන් ලෙස ක්ෂේත්‍රය තුළ රැඳී සිටීමට හැකියාව ලැබීම වැනි අවස්ථාවන්ද හිමිවේ. වර්තමානයේ සිදුවන සීඝ්‍ර තාක්ෂණික දියුණුවත් සමඟ, නැඟීඑන ක්ෂේත්‍රයක් වන ස්මාර්ට් නගර, ඉදිකිරීම් හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුවන දැවැන්ත දියුණුවට, සෘජුවම තම වෘත්තීය දායකත්වය සැපයීමට මෙම පාඨමාලාව සාර්ථකව අවසන් කරන උපාධිධාරීන්ට නිතැතින්ම අවස්ථාව හිමි වේ. විශේෂයෙන්ම ගෝලීය වශයෙන් පවතින යටිතල පහසුකම් දියුණු කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලිය හේතුවෙන්, රැකියා වෙළඳපොළ තුළ සිවිල් ඉංජිනේරුවරුන් සඳහා පවතින ඉල්ලුම දිනෙන් දින වර්ධනය වෙමින් ඇත.

## 11. Bachelor of Science (Hons) in Engineering in Electronic & Telecommunication Engineering

ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

CINEC විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව, අ.පො.ස උසස් පෙළ සමත් සිසුන් සඳහා ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු රැකියා වෙළඳපොළ වෙත දායාද කිරීම ප්‍රමුඛ කොටගෙන නිර්මාණය කරන ලද්දකි.

වර්තමානය වන විට, ගෝලීය වශයෙන් පවතින තරගකාරී ව්‍යාපාරික ලෝකය තුළ, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ කර්මාන්තය, ඉතා කෙටි කාලයක් තුළ අඩු පිරිවැයක් දරමින්, වැඩිදියුණු කළ ගුණාත්මක භාවයකින් යුක්තව නව්‍ය නිෂ්පාදන සහ සන්නිවේදන ක්‍රමවේදයන් වෙළඳපොළ වෙත සැපයීමේ දැඩි පීඩනයකට ලක්ව තිබේ. මෙහිලා විදුලි සංදේශ ඉංජිනේරු කර්මාන්තය, පුද්ගලික සන්නිවේදන ක්‍රමවේදයන් සහ ඒකාබද්ධ පණිවුඩකරන ක්‍රමවේදයන් ස්ථාපනය කිරීමෙහිලා, මෙම තාක්ෂණික සංසිද්ධියෙහි ප්‍රමුඛත්වයක් උසුලයි.

www.studentloans.mohe.gov.lk

## 12. Bachelor of Science (Honors) in Engineering in Mechanical Engineering

CINEC විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව, අ.පො.ස. උසස් පෙළ සමත් සිසුන් සඳහා මෙම ක්ෂේත්‍රයට අවැසි වෘත්තිකයන් ලෙස රැකියා වෙළඳපොළ වෙත දායාද කිරීම සඳහා නිර්මාණය කරන ලද්දකි.

මෑත කාලීනව ඇතිවූ බලශක්ති අර්බුදයේ වර්ධනයත් සමග විකල්ප බලශක්ති නිෂ්පාදනය කෙරෙහි ක්ෂේත්‍රය තුළ ඇතිවූ උනන්දුවක් නවීන විද්‍යාවේ දියුණුවත් සමඟ බිහිවූ නව තාක්ෂණික යන්ත්‍රෝපකරණත් හේතුකොට ගෙන, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවට අදාළව, නව තාක්ෂණික උපකරණ නිෂ්පාදනය සහ අත්හදා බැලීම මෙන්ම, විවිධ පර්යේෂණවල නියැළීම සඳහා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පිරිස් වල දැඩි අවධානය යොමු වී ඇත. යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධිධාරියෙකුගේ වගකීම ලෙස, නිෂ්පාදන සැලසුම් කිරීම, පරීක්ෂා කිරීම, උසස් ප්‍රමිතියකින් යුතු ලාභදායී උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා සැලසුම් කිරීම සහ ව්‍යාපාර කළමනාකරණය යනාදිය හුවා දැක්විය හැකිය. වර්තමානයේ අපගේ ජීවන තත්ත්වයට බලපාන බොහෝ ගැටලු සඳහා යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව ප්‍රධාන වගකිවයුතු අංශයක් ලෙස හුවා දැක්විය හැකිය. යාන්ත්‍රික ඉංජිනේරුවන් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ, නිෂ්පාදන සැලසුම් කිරීමේ යාන්ත්‍රණය කෙරෙහි, තම අවධානය යොමු කරමින්, නිෂ්පාදනවල ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කරමින්, සම්පත් අපතේ යාම අවම කිරීම සහ නිෂ්පාදන ක්‍රියාවලිය තුළදී සිදුවන විමෝචනය අවම කිරීම සඳහා යාන්ත්‍රණ සැලසුම් කිරීමේ නිරතව සිටියි. එලෙසම ඔවුන් බලශක්ති අපද්‍රව්‍ය අවම කිරීම සහ විකල්ප බලශක්ති ප්‍රභවය තිරසාර ලෙස එම ක්ෂේත්‍රයේ දියුණුව සඳහා භාවිත කිරීමට සැලසුම් සහ විසඳුම් සෙවීමට නිරන්තරයෙන් උත්සුක වේ.

## 13. Bachelor of Science (Honors) in Engineering in Mechatronics Engineering

මෙම උපාධි පාඨමාලාව සාර්ථකව අවසන් කරන සිසුන්, ඉංජිනේරු විද්‍යා ක්ෂේත්‍රය තුළ විවිධ අංශයන් වෙත තම වෘත්තීය දායකත්වය ලබාදීම සඳහා සුදුසුකම් ලබයි. ඒ අතර රොබෝ ඉංජිනේරු විද්‍යාව, ස්වයංක්‍රීය ඉංජිනේරු විද්‍යාව, පාලන පද්ධති පිළිබඳ ඉංජිනේරු විද්‍යාව, ඉලෙක්ට්‍රොනික සැලසුම්කරණය පිළිබඳ ඉංජිනේරු විද්‍යාව, යාන්ත්‍රික සැලසුම්කරණය පිළිබඳ ඉංජිනේරු විද්‍යාව සහ උපකරණ ඉංජිනේරු විද්‍යාව (instrumentation engineering) ප්‍රමුඛත්වයක් උසුලයි. වර්තමානය වන විට ගෝලීය වශයෙන් පවතින තරගකාරී ව්‍යාපාරික ලෝකය තුළ, වේගවත් සහ කාරයක්ෂම සේවයක්, තම සේවා මිලදී ගන්නා පිරිස් වෙනුවෙන් ලබාදීම උදෙසා බොහෝ කර්මාන්ත ස්වයංක්‍රීය වෙමින් පවතී. එබැවින් ඉලෙක්ට්‍රොනික සහ අනෙකුත් ඉංජිනේරු කර්මාන්ත තුළදී මෙකාට්‍රොනික්ස් ඉංජිනේරු විද්‍යාවේ මැදිහත්වීම අප හට බහුල වශයෙන් දැකගත හැකියි. CINEC විශ්ව විද්‍යාලය මගින් ඔබවෙත පිරිනමන මෙම පාඨමාලාවේ, විෂය නිර්දේශය නිර්මාණය කිරීමේදී දේශීය වශයෙන් මෙම ක්ෂේත්‍රය කෙරෙහි පවතින අවශ්‍යතාවන් සලකා බලා ඇති අතර එය ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වොෂින්ටන් සම්මුතියේ /ගිවිසුමේ මාර්ගෝපදේශයන්ට අනුකූලව නිමවා ඇත. එබැවින් මෙම පාඨමාලාව හදාරන සිසුන් එයට අදාළ රැකියා වෙළඳපොළ තුළ (දේශීය හෝ විදේශීය) දැනුමෙන් පරිපූර්ණ, කුසලතා වලින් සන්නද්ධ වෘත්තිකයන් ලෙස තම රැකියාවන්හි නියැළීමට අප විසින් සූදානම් කරනු ඇත.

www.studentloans.mohe.gov.lk

## Faculty of computing

**පරිගණක පීඨය**

### 14. Bachelor of Science (Hons) in Software Engineering

CINEC පෞද්ගලික විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන මෙම උපාධි පාඨමාලාව, උසස් ප්‍රමිතියකින් යුතුව නිමවා ඇති අතර, අදාළ විශය ක්ශේත්‍රය තුල තුළ ඇති, නවතම විෂය කරුණු උපයෝගී කරගනිමින් දිනෙන් දින යාවත්කාලීන කරනු ලබයි. පාඨමාලාව තුළ පවතින උසස් ප්‍රමිතිය පවත්වා ගනිමින්, ක්ෂේත්‍රයේ පවතින තරගකාරීත්වයට ඔරොත්තු දීමේ හැකියාව ඇතිව, මෙහි විෂය නිර්දේශය නිමවා ඇත. මෙම පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරනු ලබන උපාධිධාරීන්, අදාල රැකියා වෙළඳපොළ තුළ, ඉහළ තරඟකාරීත්වයක් නිර්මාණය කිරීමට සමත් වන අතර, රැකියාවන් තෝරා ගැනීමේදී සහ ස්වයං රැකියාවක නියැලීමේදී වැදගත් වන ස්වාධීන තීරණ ගැනීමේ කුසලතාවය වර්ධනය කර ගැනීම සඳහා උක්ත පාඨමාලාව මහඟු දායකත්වයක් සපයයි. සිසුන්ගේ සන්නිවේදන කුසලතා වර්ධනය, ව්‍යවසායකත්වය පිළිබඳ මනා පුහුණුවක් ලබාදීම, මෙන්ම ඔවුන්ගේ පෞද්ගලික සංවර්ධනය පිළිබඳවද මෙම පාඨමාලාව හරහා අවධානය යොමු කරයි.

## C. Faculty of Health Science

**සෞඛ්‍ය විද්‍යා පීඨය**

### 15. Bachelor of Science (Hons) in Biomedical sciences

CINEC විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන මෙය, සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් වන අතර, ජෛව වෛද්‍ය විද්‍යාවන් පිළිබඳ ව ශක්තිමත් පදනමකින් යුතුව, හසළ දැනුමක් සිසුන් වෙත ලබාදීම සඳහා නිර්මාණය කර ඇත. මෙම පාඨමාලාව ඔස්සේ මානව සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ වන ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ වෛද්‍ය විද්‍යාවේ මූලධර්ම පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ඇත.
වැඩසටහනට අදාළ ප්‍රධාන අංගයන්.

**<u>විෂය මාලාව.</u>**

<u>වසර 1 -2 :</u>

මානව ව්‍යුහ විද්‍යාව, කායික විද්‍යාව, ජෛව රසායන විද්‍යාව, ජාන විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ ප්‍රතිශක්තිකරණ විද්‍යාව වැනි මූලික විෂයන් කෙරෙහි අවධානය යොමු කරයි.

<u>වසර 3-4:</u>

අණුක ජීව විද්‍යාව, ඖෂධ වේදය, වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යාව(Medical Microbiology) සහ පර්යේෂණ ක්‍රමවේදය වැනි සංකීර්ණ මාතෘකා කෙරෙහි අවධානය යොමු කරයි.

www.studentloans.mohe.gov.lk

පර්යේෂණ ව්‍යාපෘතිය

මෙම පාඨමාලාව හැදෑරීමේදී සිසුන්ට, පීඨ සාමාජිකයන්ගේ අධීක්ෂණය යටතේ ස්වාධීන පරීක්ෂණ ව්‍යාපෘතියක් සම්පූර්ණ කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙම ව්‍යාපෘතිය සිදුකිරීම මගින් සිසුන්ගේ දත්ත විශ්ලේෂණය, විද්‍යාත්මක පර්යේෂණ හා විමසීම් සිදු කිරීම මෙන්ම තාර්කික චින්තනය දියුණු කිරීම වැනි කුසලතා වර්ධනය කිරීම අරමුණු කර ඇත.

ප්‍රායෝගික අත්දැකීම්:

මෙම උපාධි පාඨමාලාව සඳහා විද්‍යාගාර තුළ ප්‍රායෝගික පරීක්ෂණ සිදු කිරීම, සීමාවාසික පුහුණුව හෝ සායනික පුහුණු ලබාදීම ඇතුළත් වන අතර, එය සිසුන්ව ජෛව විද්‍යා විශය ක්ශේත්‍රය තුළට නිරාවරණය කර ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම අරමුණු කරගෙන සිදුකොට ඇත.

වෘත්තීය අවස්ථා:

සාර්ථක ලෙස මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කරන සිසුන්ට, වෛද්‍ය පර්යේෂණ ව්‍යාපෘති, සායනික රසායනාගාර විද්‍යාව, ඖෂධ කර්මාන්තය සහ මහජන සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රයන් සඳහා දොරගුලු විවර වේ. ඇතැම් සිසුන් තම පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වෙත යොමුවිය හැකි අතර අනෙකුත් සිසුන් සඳහා රැකියා වෙළඳපොළ තුළ ජෛව වෛද්‍ය විද්‍යාඥ, ජෛව වෛද්‍ය පර්යේෂණ නිලධාරී, රසායනාගාර විද්‍යාඥ, ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය, ජාන තාක්ෂණවේදී සහ ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඖෂධ විද්‍යාඥ යන වෘත්තීන් කෙරෙහි යොමුවීමට අවකාශය සැලසේ. දැනට අප විශ්ව විද්‍යාලයේ මෙම උපාධි පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලද උපාධිධාරීන්ගේ රැකියා අනුපාතය 100% වන අතර, ඔවුන් සෑම විටම මෙම ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමින් සිටී.

උපාධිය සඳහා තිබෙන පිළිගැනීම.

මෙම උපාධි පාඨමාලාව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සැලසුම් කර ඇති අතර, ඔබට විෂය මාලාව පිළිබඳව හෝ උපාධි පාඨමාලාව පිළිබඳව තවදුරටත් වඩාත් නිශ්චිත තොරතුරු දැනගැනීමට අවශ්‍ය නම් CINEC පෞද්ගලික විශ්ව විද්‍යාලය හා සෘජුව සම්බන්ධ වී ඔවුන්ගේ නිලධාරි මහත්ම මහත්මීන්ගෙන් ඔබට අවශ්‍ය ඕනෑම තොරතුරක් ලබාගත හැක.

සීමාවාසික පුහුණුව.

උපාධි පාඨමාලාව අවසන් කිරීමෙන් පසු, මාස හයක කාලයක් සීමාවාසික පුහුණුව සඳහා සිසුන්ව ජෛව වෛද්‍ය රසායනාගාරයක් සඳහා යොමු කරන අතර එය උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අංගයක් වේ.

පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ නිර්ණායක.

මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීම සඳහා අ.පො.ස. උසස් පෙළ UGC නිර්ණායකයන්ට අනුව ජීව විද්‍යා විෂය ධාරාව යටතේ එකවර සාමාර්ථ 03ක් සහිතව සමත්ව තිබීම සහ සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා අවම වශයෙන් 30% ප්‍රතිශතයක් ලබා තිබීම අනිවාර්ය වේ. එලෙසම ජීව විද්‍යා විෂය ධාරාව යටතේ ශ්‍රී ලංකාවේ

www.studentloans.mohe.gov.lk

පවත්වනු ලබන (a) කේම්බ්‍රිජ් උසස් පෙළ විභාගය හෝ (b) එඩෙක්සෙල් (පියර්සන්) උසස් පෙළ හෝ (c) ජාත්‍යන්තර බේකරාලේට් (IB) යන විභාග හදාර සිසුන් 50 දෙනකු අනුමත විෂයන්හි අවම වශයෙන් "S" සාමාර්ථ 03 කට හිමිකම් කීමද මෙම පාඨමාලාව සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලෙස සලකනු ලැබේ. CINEC විශ්ව විද්‍යාලය මගින් ඉදිරිපත් කරනු ලබන නිර්ණායක සමග උපාධි පාඨමාලාව සම්පූර්ණ කරනු ලබන සිසුන් වෙත ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් පිරිනමනු ලැබේ.

## 16. Bachelor of Science (Hons) in Industrial Pharmaceutical Science

CINEC විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන කර්මාන්ත ඖෂධ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය සිව් අවුරුදු පාඨමාලාවක් වන අතර, ඖෂධ කර්මාන්තයේ වෘත්තීන් සඳහා සිසුන් සූදානම් කිරීමේ අරමුණ ඇතිව නිර්මාණය කරන ලද විශේෂිත වූ උපාධි පාඨමාලාවකි. මෙම වැඩසටහන ඖෂධ නිෂ්පාදනය, සංවර්ධනය සහ නියාමනය කෙරෙහි අවධානය යොමු කරමින් කාර්මික ක්‍රමවේදයන් උපයෝගී කරගෙන ඖෂධ විද්‍යාවට අදාළ වන විවිධ අංශයන් ඒකාබද්ධ කරනු ලබයි.

<u>වැඩසටහනට අදාළ ප්‍රධාන අංගයන්</u>.

කාල සීමාව - මෙම වැඩසටහන අවුරුදු 04 ක් පුරා විහිදෙන පාඨමාලාවක් වන අතර, න්‍යායාත්මක ක්‍රමවේදයන් ඉගැන්වීම සහ ප්‍රායෝගික කරුණු ඉගැන්වීම මිශ්‍ර කොට අධ්‍යාන වාර 8කට බෙදා ඇත.

බඳවා ගැනීමේ නිර්ණායක- මෙම පාඨමාලාව සඳහා ඇතුළත් වීමට අපේක්ෂා කරනු ලබන සිසුන් අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණය සහ ජෛව පද්ධති තාක්ෂණය යන විෂය ධාරාවන් යටතේ විභාගයට පෙනී සිට එකවර "S" සාමාර්ථ 03ක් සහිතව සමත්ව තිබීම අනිවාර්ය වේ.

අවශ්‍ය නිර්ණායක සමඟ මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කරන සිසුන් වෙත CINEC විශ්ව විද්‍යාලය මගින් කාර්මික ඖෂධ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් පිරිනමනු ලැබේ.

<u>විෂය මාලාව:</u>

මූලික විෂයන්: මෙහි විෂය මාලාව සඳහා රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ ගණිතය පිළිබඳ මූලික පාඨමාලා ඇතුළත් වන අතර, ඉන් අනතුරුව ඖෂධ රසායන විද්‍යාව, ඖෂධ ඉංජිනේරු විද්‍යාව, ඖෂධවේදය සහ කාර්මික ඖෂධ වේදය පිළිබඳ විශේෂිත පාඨමාලා ඇතුළත්වේ. මෙම විෂයයන් නිර්මාණය වී ඇත්තේ ඖෂධ සොයා ගැනීමේ සහ සැකසීමේ ක්‍රියාවලියේ සිට නිෂ්පාදනය, තත්ව පාලනය නියාමනය දක්වා සමස්ත ඖෂධ සංවර්ධන ක්‍රියාවලිය ආවරණය වන පරිදිය.

මෙම පාඨමාලාව සඳහා විෂයන් තෝරාගැනීමේ දී සිසුන්ට ජෛව ඖෂධවේදය, ඖෂධ පිළිබඳ ජෛව තාක්ෂණය හෝ උසස් ඖෂධ විශ්ලේෂණය වැනි විෂයයන් අතුරින් ඔවුන්ගේ අවශ්‍යතා සහ රුචිකත්වය පරිදි විෂයයන් තෝරා ගැනීමට අවකාශය හිමි වේ.

www.studentloans.mohe.gov.lk

ප්‍රායෝගික පලපුරුද්ද සහ අත්දැකීම්:

රසායනාගාර ක්‍රියාවලිය පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්ද ලබා දීම, ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලිය විශ්ලේෂණය පිළිබඳ ශිල්පීය ක්‍රම හා තත්ව පාලනය පිළිබඳ ක්‍රියා පටිපාටිය සිසුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම සඳහා පුළුල් රසායනාගාර සැසි මෙම පාඨමාලාව තුළට ඇතුළත් කර ඇත.

කාර්මික පුහුණුව:

මෙම පාඨමාලාවට අදාළව ලබාදෙන කාර්මික පුහුණුව සීමාවාසික පුහුණුවක් ලෙස හෝ කාර්මික ක්ෂේත්‍රය තුළ ස්ථානගත කිරීමේ පුහුණුවක් ලෙස ලබාදෙන අතර, ඖෂධ නිෂ්පාදනය, පර්යේෂණ සහ සංවර්ධන හෝ තත්ව සහතික ලබාදීම පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබා දෙන ක්‍රියාවලියක් ලෙස සිදුවනු ඇත.

පර්යේෂණ ව්‍යාපෘතිය:

අවසන් වසරේ සිසුන් සඳහා කාර්මික ඖෂධ විද්‍යාවට අදාළ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදුකිරීමට සිදුවන අතර, මෙම ව්‍යාපෘතිය මගින් සිසුන්ට ඖෂධ කර්මාන්තය පිළිබඳව සැබෑ ලෝකයේ තිබෙන ගැටලු සඳහා නිරාවරණය වී, ඒවා විසඳීම සඳහා තම දැනුම යෙදවීමට අවකාශය සලසයි.

වෘත්තීය අවස්ථා:

මෙම පාඨමාලාව සාර්ථකව අවසන් කරන උපාධිධාරීන් හට ඖෂධ නිෂ්පාදනය, තත්ව පාලනය, ඖෂධ නියාමනය, ඖෂධ සංවර්ධනය සහ ක්ෂේත්‍රය තුළ පවතින තවත් බොහෝ වෘත්තීන් හැදෑරීමට අවස්ථාව හිමිවේ. ඔවුන්ට ඖෂධ සමාගම්, පර්යේෂණ ආයතන හෝ ඖෂධ නියාමන ආයතන වෙත ද යොමු විය හැකිය. එලෙසම මෙම පාඨමාලාව ෆාමසි සහ ඖෂධ විද්‍යාව හා අදාළ විවිධ ක්ෂේත්‍රයන්හි වැඩිදුර අධ්‍යාපන කටයුතුවල නිරතවීම සඳහාද ශක්තිමත් පදනමක් සපයයි.

උපාධි පාඨමාලාව සඳහා තිබෙන පිළිගැනීම:

මෙම උපාධි පාඨමාලාව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිමවා ඇති අතර, ක්ෂේත්‍රය තුළ තිබෙන ඕනෑම වෘත්තීය ආයතනයක් විසින් පිළිගනු ලබයි. මෙම උපාධිය සාර්ථකව අවසන් කිරීම මගින් පවතින රැකියා වෙළඳපොළ තුළ තිබෙන, ක්ෂේත්‍රයට අදාළ වෘත්තීන් වෙත ඉහළ වැටුප් සහිතව යොමු වීමටත්, පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු කරගෙන යාම සඳහාත් අවශ්‍ය කරනු ලබන වපසරිය මනා ලෙස නිර්මාණය කරනු ලබයි.

මෙම පාඨමාලාව සාර්ථක ලෙස අවසන් කරන සිසුන් වෙත, CINEC විශ්ව විද්‍යාලය මගින් කාර්මික ඖෂධ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් පිරිනමනු ලබයි.

www.studentloans.mohe.gov.lk

## 17. Bachelor of Science (Honors) in Cosmetic Sciences

සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් වන මෙය, රූපලාවන්‍ය නිෂ්පාදන සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, අලෙවිකරණය සහ නියාමනය පිළිබඳව පුළුල් අවබෝධයක් සිසුන්ට ලබා දීම අරමුණු කොට ගෙන සැලසුම් කර ඇත. එලෙසම රූපලාවණ්‍ය විද්‍යාවට අදාළ වන තාක්ෂණික දැනුමද සිසුන් වෙත පුළුල් ලෙස ලබාදීම මෙම පාඨමාලාව තුළින් සිදු කරනු ලබයි. මෙම පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, රූපලාවන්‍ය නිෂ්පාදන සැකසීම, සංවර්ධනය සහ පර්යේෂණ කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින්, රූපලාවන්‍ය කර්මාන්ත ක්ෂේත්‍රය තුළ පවතින, විවිධ වෘත්තීන් සඳහා උපාධිධාරීන් සූදානම් කිරීම අරමුණු කරනු ලබයි.

<u>වැඩසටහනට අදාළ ප්‍රධාන අංගයන්.</u>

කාල සීමාව - මෙම වැඩසටහන අවුරුදු 04ක් පුරා විහිද යන පාඨමාලාවක් වන අතර අධ්‍යන වාර 08කට බෙදා ඇත. මෙම සෑම අධ්‍යයන වාරයක් සඳහාම දේශන, ප්‍රායෝගික සැසි සහ ව්‍යාපෘති ඇතුළත් වේ.

<u>පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය</u>

මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරනු ලබන සිසුන් අ.පො.ස. උසස් පෙළ සඳහා ජීව විද්‍යාව, භෞතික විද්‍යා, ඉංජිනේරු තාක්ෂණය සහ ජෛව පද්ධති තාක්ෂණය යන විෂය ධාරාවන්හි විෂයන් සඳහා අවම වශයෙන් (S) සාමාර්ථ තුනක් ලබාගත යුතුවේ. මෙම උපාධි පාඨමාලාව සාර්ථක ලෙස අවසන් කරන සිසුන්ට CINEC විශ්ව විද්‍යාලය මඟින් රූපලාවන්‍ය නිෂ්පාදන විද්‍යාව පිළිබඳ ව ගෞරව උපාධියක් පිරිනමනු ලබයි.

<u>විෂය මාලාව:</u>

මෙම පාඨමාලාවෙහි පළමු වසර 02 තුල රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ මූලික රූපලාවණ්‍ය විද්‍යාව වැනි මූලික විෂයන් සඳහා සිසුන් නිරාවරණය කරනු ලබයි. මෙමඟින් ඉදිරියේදී සිසුන් නිරාවරණය වන වඩාත් ගැඹුරු මාතෘකාවන් සඳහා අඩිතාලම සකසනු ලැබේ.

<u>මූලික විෂයන්:</u>

සම පිළිබඳ ජීව විද්‍යාව, රූපලාවන්‍ය රසායන විද්‍යාව, රූපලාවන්‍ය නිෂ්පාදන සැකසීම, තත්ව පාලනය සහ නියාමන කටයුතු ඇතුළු, රූපලාවන්‍ය නිෂ්පාදන විද්‍යාවට අදාළ විවිධ අංශයන් මෙමගින් ආවරණය කරනු ලබයි. එලෙසම මෙම විෂයයන් ආවරණය කිරීම තුළින් රූපලාවන්‍ය ක්ෂේත්‍රය තුළ භාවිතා වන අමුද්‍රව්‍ය, ඒවායේ ක්‍රියාකාරීත්වය සහ නිෂ්පාදන ක්‍රියාවලිය දියුණු කිරීම පිටුපස ඇති මූලධර්මයන් පිළිබඳව ද සිසුන් දැනුවත් කරනු ලැබේ. උපාධි පාඨමාලාවේ අවසන් කාලසීමාව වන විට චර්ම රෝග, රූපලාවන්‍ය සහ සුවඳ විලවුන් තාක්ෂණය, ඒ සඳහා භාවිතා වන දියුණු කරන ලද තාක්ෂණික ක්‍රමවේදයන් වැනි ගැඹුරු මාතෘකා ඔස්සේ සිසුන්ට අධ්‍යාපනය ලබාදෙනු ලබයි. රූපලාවන්‍ය කර්මාන්තය තුළ පවතින නව ප්‍රවණතා හා තිරසාර භාවිතයන් මෙන්ම රූපලාවණ්‍ය නිෂ්පාදන සංවර්ධනයේ නවෝත්පාදනයන්ද මෙම පාඨමාලාව තුළින් ආවරණය කරනු ලබයි.

www.studentloans.mohe.gov.lk

ප්‍රායෝගික අත්දැකීම්:

රසායනාගාර පුහුණුව:

මෙම උපාධි පාඨමාලාව සඳහා පුළුල් ලෙස රසායනාගාර සැසි ඇතුළත් වන අතර, එහිදී සිසුන් රූපලාවන්‍ය නිෂ්පාදන සකස් කිරීම සහ පරීක්ෂා කිරීම පිළිබඳව අත්දැකීම් ලබා ගනී. මෙම විද්‍යාගාර තුළ ලබාදෙන පුහුණුව, සිසුන්ට ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කර ගැනීම සඳහා ඉමහත් ලෙස දායකත්වයක් සපයන අතර, එය රැකියා වෙළඳපොළ තුළ පවතින අභියෝග සඳහා ඔවුන්ට සාර්ථක ලෙස මුහුණ දීමට මඟ පාදයි. CINEC පෞද්ගලික විශ්ව විද්‍යාලය මගින්, එහි අධ්‍යයනයෙහි යෙදෙන සිසුන් සඳහා රසායනාගාර සංකීර්ණයක්, රූපලාවණ්‍ය නිෂ්පාදන රසායනාගාරයක්, ඇතුළුව අවශ්‍ය සියලු පහසුකම් සපයා ඇති අතර, ක්ෂේත්‍රය තුළ වෙසෙන ප්‍රමුඛ පෙළේ නිෂ්පාදන කර්මාන්ත කරුවන්ගේ සහ හවුල්කරුවන්ගෙන් රූපලාවන්‍ය නිෂ්පාදන පිළිබඳව මනා පුහුණුවක් ලබාදීමට අපි කටයුතු කරන්නෙමු.

සීමාවාසික පුහුණුව:

මෙම උපාධිපාඨමාලාව අතරතුර මාස 06ක කාල සීමාවක් සිසුන් සඳහා සීමාවාසික පුහුණුව ලබාදෙන අතර, එය රූපලාවන්‍ය ක්ෂේත්‍රය තුළ තිබෙන ප්‍රමුඛ පෙළේ ආයතනයක් තුළ සිදුකරනු ලබයි. ඒ තුළින් ලබා ගන්නා අත්දැකීම්, රූපලාවන්‍ය කර්මාන්තය පිළිබඳව සිසුන්ට මනා අවබෝධයක් ලබාදෙන අතර, සිසුන් හට ඔවුන්ගේ දැනුම සහ කුසලතාවන් වෘත්තීය වපසරියක් තුළ ප්‍රායෝගිකව භාවිතයට ගැනෙන ආකාරය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීම සඳහා ඉවහල් වේ. මෙම වෘත්තීය පුහුණුවෙන් පසුව අපගේ බොහෝ සිසුන්ට රැකියා වෙළඳපොළ තුළ රැකියා අවස්ථා ලැබී ඇත.

පර්යේෂණ ව්‍යාපෘතිය:

මෙම පාඨමාලාව හදාරන සිසුන්ට, උපාධි පාඨමාලාවේ අවසන් වසර තුළදී, රූපලාවණ්‍ය විද්‍යාවට අදාළව මාතෘකාවක් පිළිබඳව පර්යේෂණ ව්‍යාපෘතියක් හෝ නිබන්ධනයක් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම මගින් සිසුන්ගේ දත්ත විශ්ලේෂණය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම සහ ස්වාධීන පරීක්ෂණවල නියැලීම මෙන්ම ඔවුන්ගේම සොයා ගැනීම් ඉදිරිපත් කිරීම සඳහා ඉඩ සලසයි. එමඟින් සිසුන් තුළ පවතින ගැටලු විසඳීමේ කුසලතාවන් සහ තාර්කික චින්තනය වැඩි දියුණු කිරීමට අවකාශය ලැබේ.

වෘත්තීය අවස්ථා:

මෙම පාඨමාලාව සාර්ථකව අවසන් කරනු ලබන උපාධිධාරීන් හට නිෂ්පාදන ක්‍රියාවලිය සංවර්ධනය, තත්ව සහතික පිරිනැමීම, පර්යේෂණ සංවර්ධනය හා නියාමනය, රූපලාවන්‍ය නිෂ්පාදන අලෙවිකරණය වැනි භූමිකාවන් සඳහා ක්ෂේත්‍රය තුළ යොමු විය හැකිය. ඔවුන් රූපලාවන්‍ය නිෂ්පාදකයින් ලෙස, සම පිළිබඳ ආරක්ෂණ සමාගම්, රූපලාවන්‍ය නිෂ්පාදන නියාමන ආයතන, ස්වාධීන පරීක්ෂණවල නියැලෙන්නෙකු ලෙස, මෙන්ම රූපලාවන්‍ය විද්‍යාඥයෙකු ලෙසද වෘත්තීය ක්ෂේත්‍රය තුළ රැකියාවන්හි නියැලීමට අවස්ථා උදාකර ගනී.එලෙසම මෙම උපාධි පාඨමාලාව රූපලාවණ්‍ය විද්‍යාවට හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර තුළ පශ්චාත් උපාධි සඳහා යොමුවීමට අපේක්ෂා කරන සිසුන් සඳහාද ශක්තිමත් පදනමක් සපයයි.

උපාධි පාඨමාලාව සඳහා තිබෙන පිළිගැනීම.

මෙම උපාධි පාඨමාලාව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිමවා ඇති අතර, ක්ෂේත්‍රය තුළ තිබෙන ඕනෑම වෘත්තිය ආයතනයක් විසින් පිළිගනු ලබයි. මෙම උපාධිය සාර්ථකව අවසන් කිරීම මගින් පවතින රැකියා

www.studentloans.mohe.gov.lk

වෙළඳපොල තුළ තිබෙන ක්ෂේත්‍රයට අදාළ වෘත්තීන් වෙත ඉහළ වැටුප් සහිතව යොමු වීමටද සිසුන්ට දොරගුළු විවර වනු ඇත.

## 18. Bachelor of Science (Honors) in Medical & Health Product Management

CINEC විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන මෙම ගෞරව උපාධිය, සෞඛ්‍ය නිෂ්පාදන කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකාව තුළ විශ්ව විද්‍යාලයක් මගින් පිරිනමනු ලබන එකම උපාධිය වේ. මෙය සිව් අවුරුදු පාඨමාලාවක් වන අතර, එය වෛද්‍ය සහ සෞඛ්‍ය නිෂ්පාදන ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතාවන්ගෙන් සිසුන් සන්නද්ධ කිරීම සඳහා නිර්මාණය කර ඇත. මෙම උපාධි පාඨමාලාව, වෛද්‍ය සහ සෞඛ්‍ය නිෂ්පාදන පිළිබඳව ව්‍යාපාර කළමනාකරණය, නියාමනය සහ එහි ඇති විද්‍යාත්මක පැතිකඩ කෙරෙහි අවධානය යොමු කරයි. ඒ තුළින් කුසලතා වලින් පරිපූර්ණ වූ උපාධිධාරී වෘත්තිකයන් මෙම ක්ෂේත්‍රය තුළට දායාද කිරීම විශ්වවිද්‍යාලයක් ලෙස අපගේ අරමුණයි.

<u>වැඩසටහනට අදාළ ප්‍රධාන අංගයන්.</u>
කාල සීමාව: මෙම වැඩසටහන අවුරුදු 04 ක් පුරා විහිද යන පාඨමාලාවක් වන අතර, අධ්‍යයන වාර 08 කට බෙදා ඇත. මෙම සෑම අධ්‍යයන වාරයක් සඳහාම, දේශන, ප්‍රායෝගික සැසි සහ ව්‍යාපෘති ඇතුළත්වේ.

<u>පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය:</u>
මෙම උපාධි පාඨමාලාව SLQF - 6 වන මට්ටමට අයත් වන අතර, ඒ සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරනු ලබන සිසුන් අ.පො.ස උසස් පෙළ සඳහා ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හෝ තාක්ෂණික විෂය ධාරාව තුළින් අවම වශයෙන් "S" සාමාර්ථ 03ක් ලබාගත යුතු වේ.

<u>විෂය මාලාව:</u>
අධ්‍යයන වැඩසටහන ආරම්භ කිරීමට පෙර GPA නොවන සම්මාන ඇතුළත් කර ඇති අතර, පළමු වසර දෙක තුළ සිසුන්ට ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ මානව ව්‍යුහ විද්‍යාව ඇතුළු මූලික විද්‍යාවන්ද ඒ සමග ව්‍යාපාර කළමනාකරණය, අලෙවිකරණය සහ සෞඛ්‍ය ආරක්ෂණ පද්ධති පිළිබඳව පදනම් පාඨමාලාව ද හඳුන්වා දෙනු ලැබේ.

<u>මූලික විෂයන්:</u>
වෛද්‍ය නිෂ්පාදන සංවර්ධනය, සෞඛ්‍ය නිෂ්පාදන නියාමනය, තත්ව සහතික නියාමනය, සැපයුම් දාම කළමනාකරණය සහ සෞඛ්‍ය සේවා අංශයන්ට විශේෂිත වූ අලෙවිකරණ උපායමාර්ග වැනි අත්‍යවශ්‍ය මාතෘකා මෙහි විෂය මාලාව තුළින් ආවරණය කරනු ලබයි.

උපාධි පාඨමාලාවේ අවසන් කාලසීමාව වන විට, සායනික අත්හදා බැලීම් කළමනාකරණය, ඖෂධ රෙගුලාසි, සෞඛ්‍ය පිළිබඳ ආර්ථික විද්‍යාව සහ ඩිජිටල් සෞඛ්‍ය තාක්ෂණය වැනි විශේෂිත විෂයන් ගවේෂණය කිරීම සඳහා සිසුන්ව යොමු කරයි. සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රය තුළ පවතින සදාචාරාත්මක ගැටලු සහ අනුකූලතාවන් පිළිබඳ පාඨමාලාවද මෙම වැඩසටහන සඳහා ඇතුළත්වේ.

<u>ප්‍රායෝගික අත්දැකීම්:</u>
සිසුන්ව කර්මාන්ත ක්ශේත්‍රය සඳහා නිරාවරණය කිරීම:

www.studentloans.mohe.gov.lk

වෛද්‍ය සහ සෞඛ්‍යය නිෂ්පාදන කළමනාකරණය කිරීමේදී, සිසුන්ට සැබෑ ලෝකයේදී මෙම ක්ෂේත්‍රයන් හැසිරෙන ආකාරය පිළිබඳ අත්දැකීම් ලබාදීම සඳහා සිද්ධි අධ්‍යයන සහ සීමාවාසික පුහුණු වැනි ප්‍රායෝගික සංරචක මෙම වැඩසටහනට ඇතුළත් කර ඇත. මෙම අත්දැකීම් සිසුන්ට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අභියෝග සහ අවස්ථා අවබෝධ කරගැනීමට උපකාරී වේ.

රසායනාගාර කටයුතු:

මෙහිදී කළමනාකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතර, නිෂ්පාදන පරීක්ෂණ, තත්ව පාලන සහ නියාමනය ආවරණය වන රසායනාගාර සැසි හරහා සිසුන් වෛද්‍ය නිෂ්පාදනවල විද්‍යාත්මක අංශ පිළිබඳ සිසුන්ට අවබෝධයක් ලබාදීම සිදුකරනු ලබයි.

පර්යේෂණ ව්‍යාපෘතිය:

අවසන් වසරේ සිසුන් සඳහා පර්යේෂණ ව්‍යාපෘතියක් හෝ නිබන්ධනයක් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වන අතර එම ව්‍යාපෘතිය තුළින් සිසුන්ට වෛද්‍ය සහ සෞඛ්‍ය නිෂ්පාදන කළමනාකරණය හා අදාළ මාතෘකාවන් පිළිබඳව ගැඹුරු පරීක්ෂණයක් කිරීමට ඉඩ සලසයි. ඒ ලැබෙන අත්දැකීම් තුළින් ඔවුන් රැකියා වෙළඳපළට පිවිසීමෙන් අනතුරුව සැබෑ ලෝකයේ ගැටලු විසඳීම සඳහා අවශ්‍ය කරන දැනුම සහ කුසලතා ඔප්නැංවීම සිදුකරනු ලබයි.

වෘත්තීය අවස්ථා:

මෙම පාඨමාලාව සාර්ථකව අවසන් කරනු ලබන උපාධිධාරීන් හට, නිෂ්පාදන කළමනාකරණය, නියාමනය, තත්ව සහතික පාලනය, අලෙවිකරණය, සැපයුම් දාම කළමනාකරණය සහ සෞඛ්‍ය ආරක්ෂණ උපදේශනය ඇතුළු සෞඛ්‍ය සේවා කර්මාන්තයේ විවිධ වෘත්තීන් සඳහා උපාධිධාරීන්ව සූදානම් කරනු ලබයි. ඔවුන්ට පසු කාලීනව රැකියා වෙළඳපොළ තුළ ඖෂධ සමාගම්, වෛද්‍ය උපකරණ නිෂ්පාදකයින්, සෞඛ්‍ය සේවා සපයන්නන් හෝ නියාමන ආයතන තුළ සේවය කරන්නන් ලෙස තම වෘත්තීය ක්ෂේත්‍රය තුළ සේවය කළ හැක. මෙම උපාධි පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන සිසුන්ට, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ඕනෑම ජාත්‍යන්තර ඖෂධ නියාමනය සහ කළමනාකරණ ආයතනයක, ඖෂධ සැලසුම් විද්‍යාඥයකු ලෙස හෝ සායනික අත්හදාබැලීම් කළමනාකරුවෙකු ලෙස, සේවයේ නිරත විය හැකි පරිදි තම සුදුසුකම් සැකසේ. දැනුමට අමතරව සුදුසු පයේෂණ ව්‍යාපෘතියක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ කුසලතා ඔප්නංවා ගැනීමට ද ඔවුන්ට අවකාශය උදාවනු ඇත. එලෙසම මෙම උපාධි පාඨමාලාව සෞඛ්‍ය කළමනාකරණය, මහජන සෞඛ්‍ය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල වැඩිදුර අධ්‍යාපනයෙහි යෙදීමට කැමති සිසුන් සඳහා අවශ්‍ය ශක්තිමත් පදනමක් සපයයි.

උපාධි පාඨමාලාව සඳහා තිබෙන පිළිගැනීම සහ ක්ෂේත්‍රයට ඇති අදාලත්වය:

මෙම උපාධි පාඨමාලාව සැලසුම් කර ඇත්තේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අතර, ශ්‍රී ලංකාව තුළ හෝ ජාත්‍යන්තර වශයෙන් පවතින ඕනෑම වෘත්තීය ආයතනයක් විසින් පිළිගනු ලබයි. එලෙසම මෙම උපාධිධාරීන් අයත් වන රැකියා වෙළඳපොළ තුළ පවතින තරගකාරී බවට අනුකූලව මෙය නිමවා ඇති අතර, සෞඛ්‍ය කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීම තහවුරු කරයි.

මේ වන විට අප විශ්වවිද්‍යාලය මගින් කණ්ඩායම් 02 ක් මෙම උපාධි පාඨමාලාව සඳහා බඳවාගෙන ඇති අතර, තෙවන කණ්ඩායම අධ්‍යාපන අමාත්‍යාංශයේ 8 වන අදියරේ බඳවාගැනීම් තුළදී සිදු කරනු ලබයි.



www.studentloans.mohe.gov.lk

## E. Faculty of Science

CINEC විශ්ව විද්‍යාලය මඟින් අභිනවයෙන් පිහිටුවන ලද මෙම පීඨය, විද්‍යාත්මක ක්ෂේත්‍රයේ නව මානයන් සොයා යාම සඳහා එහි අධ්‍යාපනය ලබන සිසුන්ට අවකාශය ලබා දීම සඳහා නිර්මාණය කරන ලද්දකි. රසායන විද්‍යා දෙපාර්තමේන්තුව මෙහි මූලිකත්වය හිමිකරගන්නා අතර, ගෝලීය අභියෝගවලට මුහුණ දිය හැකි දැනුමෙන් හා කුසලතාවන්ගෙන් පිරිපුන්, විද්‍යාඥයින් මීළඟ පරම්පරාව වෙත දායාද කිරීම සඳහා මෙම පීඨය ඇපකැප වී සිටී. රසායන විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් පිරිනැමීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබීම, මෑත කාලීනව අප ආයතනයක් ලෙස ලැබූ ජයග්‍රහණයක් ලෙස සලකන අතර, එය අපගේ උපාධි පාඨමාලා නියමිත ප්‍රමිතීන්ට අනුකූලව නිමවා ඇති බවට ලබාදෙන හොඳම සාක්ෂියකි.

විද්‍යා විෂය ක්ෂේත්‍රයේ ගෞරවනීය චරිතයක් වන පීඨාධිපති මහාචාර්ය සමන්ත වීරසිංහ සහ රසායන විද්‍යා අංශයේ ප්‍රධානී ආචාර්ය නිම්ෂි ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන්ගේ නායකත්වයෙන් මෙම පීඨය පවත්වාගෙන යනු ලබන අතර, සහයෝගීතාවයෙන් යුතු නව්‍ය පරිසරයක් පෝෂණය කිරීමට ඇප කැපවී සිටී. මෙම පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලාවන්හි ප්‍රධාන අරමුණ රසායන විද්‍යා ක්ෂේත්‍රයේ දියුණුව පමණක්ම නොවන අතර, අන්තර් විෂය පර්යේෂණ, කර්මාන්ත හවුල්කාරිත්වයේ සහ ප්‍රජා සහභාගිත්වය වැනි අංශයන්හි ද දියුණුව අපේක්ෂා කරයි. අපි ආයතනයක් වශයෙන් මෙම නව විද්‍යා පීඨය ආරම්භ කරන අවස්ථාවේ, ශ්‍රී ලංකාවේ සහ ඉන් ඔබ්බට විද්‍යාත්මක විමර්ශන සඳහා කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමටත්, විද්‍යා ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය උදෙසා උත්ප්‍රේරණයක් බවට පත්වීමටත් සූදානමින් සිටිමු.

## 19. Bachelor of Science (Honors) in Chemistry

ස්වභාවික විද්‍යාවන්හි කේන්ද්‍රීය විෂය ලෙස සැලකෙන රසායන විද්‍යාව, ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තරය තුළ බොහෝ විශ්වවිද්‍යාල විසින් පිරිණමනු ලබන වඩාත් ජනප්‍රිය සහ රැකියා අවස්ථා උදාකර දෙනු ලබන උපාධි පාඨමාලාවකින් එකකි. මෙම පාඨමාලාවට ශ්‍රී ලංකාවේ තිබෙන රාජ්‍ය විශ්ව විද්‍යාල තුළ, විද්‍යා පීඨවල වල ඉතා ඉහළ ඉල්ලුමක් තිබෙන අතර, එය භෞතික විද්‍යා සහ ජීව විද්‍යා යන දෙඅංශයෙන්ම, සිසුන්ට රැකියා වෙළඳපොළ තුළට ප්‍රවේශ විය හැකි පාඨමාලාවකි. CINEC විශ්ව විද්‍යාලය මඟින් මෙම ඉල්ලුම සපුරාලීමේ අරමුණින් මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත.

මෙම වැඩසටහන නිර්මාණය කිරීමේදී CINEC විශ්ව විද්‍යාලය මඟින් "ඇමරිකානු උසස් අධ්‍යාපන ආකෘතීන්ගේ"සහාය ලබාගෙන ඇති අතර, එය නම්‍යශීලී සහ පුළුල් දැනුම් සම්භාරයකින් යුතු විද්‍යාඥයකු බිහිකිරීම සඳහා ඉවහල් වේ. සිසුන්ට රැකියා වෙළඳපොළ තුළ පවතින තරගකාරීත්වය සඳහා අවශ්‍ය කරන කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් නිර්මාණය කර ඇති මෙම පාඨමාලාව, ඔවුන්ගේ දැක්ම පුළුල් කිරීම සහ ඔවුන්ගේ අධ්‍යයන ක්ෂේත්‍රයන්හි පවතින සමාජ හා ආර්ථික වටපිටාව පිළිබඳව දැනුම ලබාදීම සහ දියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු කරනු ලබයි. උපාධි පාඨමාලාවෙහි අවසන් වසර තුළදී, කැප්ස්ටෝන් ව්‍යාපෘතියකට අමතරව, සිසුන්ට ඔවුන්ගේම කැමැත්ත පරිදි විෂයන් තෝරාගැනීම සඳහා අවකාශය සලසා දෙනු ඇත.

www.studentloans.mohe.gov.lk

## F. Faculty of Humanities and Education

## 20. Bachelor of Arts in English - General (English Medium)/ Bachelor of Arts (Honors) in English (English Medium)

මානව ශාස්ත්‍ර හා අධ්‍යාපන පීඨය විසින් Bachelor of Arts in English (General) සහ Bachelor of Arts in English (Honours) යන උපාධි පාඨමාලා දෙක පිරිනමනු ලැබේ.

ඉහත උපාධි පාඨමාලා දෙක පිරිනැමීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා ඇති එකම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනය වන්නේ CINEC විශ්වවිද්‍යාලය වේ.

මෙම පීඨය යටතේ මානව ශාස්ත්‍ර හා අධ්‍යාපනය සම්බන්ධ විවිධ අධ්‍යාපනික හා වෘත්තීය වැඩසටහන් සිසුන් වෙත පිරිනමන අතර, අධ්‍යාපන කටයුතු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් 05 දෙනෙකුගේ සහ කථිකාචාර්යවරුන් 04 දෙනෙකුගේ මඟපෑමෙන් සිදු කරනු ලැබේ.

මීට අමතරව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ ගුරු අභ්‍යාස විද්‍යාල නියෝජනය කරන, මානව ශාස්ත්‍ර හා අධ්‍යාපනය පිළිබඳ විශාල දැනුම සහ අත්දැකීම් ඇති බාහිර කථිකාචාර්ය මණ්ඩලයක් ද අපගේ අධ්‍යාපන කටයුතු සඳහා සහය පළ කරයි.

<u>වෘත්තීය අවස්ථා:</u>

රට තුළ ඉංග්‍රීසි භාෂා උපාධිධාරීන්ගේ හිඟයක් පවතින බැවින්, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ගැඹුරු දැනුමක් සහිත සුදුසුකම්ලත් පුද්ගලයින් සඳහා ඉල්ලුම වැඩි වේ. මෙම ඉල්ලුම අධ්‍යාපන ක්ෂේත්‍රයට පමණක් නොව, පුවත්පත් කලාව, අලෙවිකරණය, ලේකම් හා පරිපාලන සේවා, නාවික ක්ෂේත්‍රය, සහ නීතිය වැනි විවිධ ක්ෂේත්‍රවලද පවතී.

මෙම උපාධි පාඨමාලාව සාර්ථකව අවසන් කරන සිසුන්ට රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල රැකියා අවස්ථා ලබා ගැනීමේ හැකියාව ඇත. ඔවුන්ට සිවිල් සේවය, තරුණ කටයුතු, පුවත්පත් කලාව, සහ අධ්‍යාපන ක්ෂේත්‍රය යන අංශයන්හි රැකියාවන් සඳහාද ඉදිරිපත් විය හැක. එසේම, පාසල් පරිපාලනය, සම්බන්ධීකරණය, හා අධ්‍යාපන කළමනාකරණය වැනි විශේෂිත වෘත්තීන්වලටද පිවිසීමේ අවස්ථා ලැබේ.

### 1. Bachelor of Education (Honors) in Information Technology

මෙම උපාධි පාඨමාලාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ගුරුවරුන් සඳහන් පමණක් නිර්මාණය කර ඇති සිව් අවුරුදු පාඨමාලාවක් වන අතර, අපොස උසස් පෙළ විභාගය සඳහා ඕනෑම විෂය ධාරාවක් යටතේ "S" සාමාර්ථ 03ක් ලබා තිබීම උපාධිය සඳහා ඇතුළත් වීමට අවශ්‍ය අවම සුදුසුකම වේ. මෙම උපාධි පාඨමාලාව සඳහා වෘත්තීය කුසලතා සංවර්ධනය මෙන්ම, න්‍යායාත්මක කරුණු ඉගැන්වීම යන අංශ 02 ම ඇතුලත් වන අතර, ශ්‍රී ලංකාව තුළ මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද රැකියා අවස්ථා හිමිකර ගැනීමට සිසුන්ට අවකාශය හිමි වේ.

www.studentloans.mohe.gov.lk

රැකියා අවස්ථා:

මෙම උපාධි පාඨමාලාව හදාරන සිසුන් සඳහා දේශීය මෙන්ම ජාත්‍යන්තර පාසල් සඳහා ඉහල ඉල්ලුමක් පවතී. එබැවින් මෙම උපාධිධාරීන්ට දේශීයව මෙන්ම ජාත්‍යන්තර අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තීය වශයෙන් ඉහළ ඉල්ලුමක් නිර්මාණය වේ. මෙම උපාධි පාඨමාලාව හදාරන සිසුන්ට තෘතීයික ආයතන වල සහ උසස් අධ්‍යාපන ආයතන වල පුහුණු කරන්නන් ලෙස සේවයේ යෙදිය හැකිය.

පාඨමාලාව හරහා අපි අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරුන් දැයට දායාද කිරීම අරමුණු කරන්නෙමු.

## 5.4 ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය (SIBA කැම්පස්) විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්

### 1. තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය - (BSc. in IT)

**හැඳින්වීම (Introduction)**

තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc. IT) වැඩසටහන ගතික තාක්‍ෂණ ලෝකයේ ත්‍යාගශීලී වෘත්තියක් සඳහා සූදානම් වන පුළුල් හා ඉදිරිගාමී විෂය මාලාවක් ඉදිරිපත් කරයි. තාක්‍ෂණය ලොව පුරා කර්මාන්ත විප්ලවීයකරණය කරමින් සිටින බැවින්, අපගේ වැඩසටහන මඟින් ඔබ නවෝත්පාදනයේ ඉදිරියෙන්ම සිටින බවත් ඩිජිටල් යුගයේ අභියෝගවලට මුහුණ දීමට සූදානම් බවත් සහතික කෙරේ.

**පාඨමාලාවේ අරමුණු (Course Objectives)**

අවශ්‍යතා සපුරාලන අයට උසස් අධ්‍යයන කටයුතු සඳහා ඇතුළත් වීමට සහ BSc IT උපාධියක් ලබා ගැනීමට අවස්ථාව ලබාගත හැකිය. මෙමගින්

- රැකියා ස්ථානයේ තොරතුරු තාක්ෂණය භාවිතයට සිසුන්ගේ හැකියාව වර්ධනය කිරීම.
- මෘදුකාංග නිර්මාණය, දත්ත පද්ධති නිර්මාණය, වෙබ් සහ ජාල සංවර්ධනය ඇතුළු තොරතුරු තාක්ෂණ ක්ෂෙත්‍රයේ අවබෝධයක් සහ එම දැනුම සුදුසු අවස්ථාවන්හිදී භාවිතයේ හැකියාව ඇති උපාධිධාරීන් බිහි කිරීම.
- විශේෂයෙන් ව්‍යාපාර ක්ෂේත්‍රවල තොරතුරු තාක්ෂණ චින්තනය සහ භාවිතය භාවිතා කිරීමට.
- තොරතුරු තාක්ෂණයේ සුදුසු වෘත්තීය තනතුරු ලබා ගැනීමට සහ වෘත්තීය නායකත්ව අවස්ථා දක්වා වර්ධනය වීමට, IT උපාධිධාරීන්ට රැකියා ක්ෂෙත්‍රය තුල කුසලතා, දැනුම සහ හැකියාවන් ලබා දීමට.
- වැඩිදුර අධ්‍යයනයන් සහ පර්යේෂණ සිදු කර ක්ෂේත්‍රයේ උසස් පශ්චාත්උපාධි අධ්‍යයන් සඳහා අවශ්‍ය මඟ නිර්මාණය කිරීමට අවකාශ සැළසේ.

www.studentloans.mohe.gov.lk

**වැඩසටහනේ ප්‍රධාන මොඩියුල (Key Modules of the Programe)**

මෘදුකාංග සංවර්ධනය

ජාලකරණය

කෘතිම බුද්ධිය

වලාකුළු පරිගණකකරණය (Cloud Computing)

පරිගණක ක්‍රමලේඛනය

තොරතුරු ආරක්ෂාව

දත්ත පද්ධති කළමනාකරණය

දත්ත විද්‍යාව සහ විශ්ලේෂණය

Digital රූප සැකසීම

ලිනක්ස් සමඟ පද්ධති පරිපාලනය

**වැඩසටහනේ විශේෂ මොඩියුල (Special Modules)**

SIBA කැම්පස් හි BSc. IT උපාධිය ක්‍රියාත්මක කරනු ලබන්නේ සුතත්‍ය (Authentic) ඉගෙනුම් මූලධර්ම මත වන අතර, එමඟින් උපාධි අපේක්ෂකයෙකු සෑම අධ්‍යයන වාරයකම ව්‍යාපෘති සැලසුම් කිරීමක් භාර ගත යුතු අතර, උපාධිය ලබා ගැනීම සඳහා අවම වශයෙන් ව්‍යාපෘති පහක්වත් සම්පූර්ණ කළ යුතුය. SIBA IT උපාධිධාරියෙකුටම කර්මාන්තයේ ක්ෂෙත්‍ර රැකියා සඳහා කුසලතා සහතික කරනු ලැබේ.

එසේම, "ශිෂ්‍ය වෘත්තීය සංවර්ධන (SPD)" සැසි, "මෘදු කුසලතා" පුහුණු සැසි සහ වාර්ෂික නායකත්ව කඳවුරු යටතේ උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ පෞරුෂය වර්ධනය කර ගැනීමට පහසුකම් සපයයි.

**සීමාවාසික පුහුණුව (Internship)**

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සියලුම උපාධි අපේක්ෂකයින්ට පිළිගත් තොරතුරු තාක්ෂණ ආයතනයක මාස හයක සීමාවාසික පුහුණුවක් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

**උපාධියෙන් පසු රැකියා අවස්ථා (Graduate Opportunities)**

සියලුම තොරතුරු තාක්ෂණ උපාධි අපේක්ෂකයින්ට, ප්‍රසිද්ධ තොරතුරු තාක්ෂණ සමාගම්වල තම සීමාවාසික පුහුණුව ලබා ගත හැකිය. ඒ ඔස්සේ පසුගිය වසර කිහිපය තුළ SIBA IT උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය 100% වේ.

SIBA උපාධි ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සංගමය (IAU) සහ පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්ව විද්‍යාල සංගමය (ACU) විසින් පිළිගෙන ඇති බැවින් උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු SIBA IT උපාධිධාරීන්ට ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල හෝ විදේශයන්හි පශ්චාත් උපාධි හැදෑරීමට හැකි වි ඇත.

## 2. තොරතුරු තාක්ෂණය සහ සන්නිවේදනය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය - (BTech.)

### හැඳින්වීම (Introduction)

තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය (BTech.) යනු ඉහළ ඉල්ලුමක් ඇති තොරතුරු තාක්ෂණය සහ සන්නිවේදන ඉංග්‍රීසි ක්ෂේත්‍රවල úYhdබද්ධ පාඨමාලා මත පදනම් වූ Credit අනූවක් (90) සහ අධ්‍යයන වාර 06ක වැඩසටහනකි.

මෙය තාක්ෂණික හා පරිගණක ආශ්‍රිත සන්නිවේදනය, නවීන පරිගණක තාක්ෂණයන්, සැලසුම් කුසලතා, සංවිධානය කිරීම, කළමනාකරණය, කළමනාකරණ තොරතුරු පද්ධති, ආයතනික පුහුණුව සැලසුම් කිරීම සහ ලබා දීම සහ විවිධ ක්ෂේත්‍රව සහ මාධ්‍යවල සහ ආයතනික මට්ටමින් එදිනෙදා සමාජ හා වෘත්තීය අන්තර්ක්‍රියා වලදී තාක්ෂණික හා තාක්ෂණික නොවන තොරතුරු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය ආධාරක පද්ධති, දත්ත කළමනාකරණ පද්ධති සහ ඉංග්‍රීසි භාෂා කුසලතා සංවර්ධනය කිරීමේ නිපුණතාවය පෙන්නුම් කරයි.

#### පාඨමාලාවේ අරමුණු (Course Objectives)

වැඩසටහන අවසන් වන විට BTech උපාධිධාරීන්ට හැකි විය යුත්තේ:

· තොරතුරු තාක්ෂණ කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා පරිගණකකරණය, මෘදුකාංග සහ නැගී එන තාක්ෂණයන්හි ශක්තිමත් තාක්ෂණික කුසලතා ඇති උපාධිධාරියෙකු සංවර්ධනය කිරීම.

· උසස් අධ්‍යාපනය, ව්‍යාපාර සන්නිවේදනය සහ ආයතනික මට්ටමින් පුහුණුව සඳහා අවශ්‍ය ඵලදායී සමාජ අන්තර්ක්‍රියා, විවේචනාත්මක චින්තනය සහ නිරවද්‍ය ප්‍රකාශනය සඳහා ඉංග්‍රීසි භාෂා කුසලතා භාවිතා කිරීම.

#### වැඩසටහනේ ප්‍රධාන මොඩියුල (Key Modules of the Program)

සන්නිවේදන ඉංග්‍රීසි

තොරතුරු තාක්ෂණ කර්මාන්තය සඳහා සන්නිවේදන පර්යේෂණ කුසලතා

වෙබ් නිර්මාණය සහ සංවර්ධනය

මෘදුකාංග සංවර්ධන

ජාලකරණය



www.studentloans.mohe.gov.lk

කෘතිම බුද්ධිය

වලාකුළු පරිගණකකරණය

පරිගණක ක්‍රමලේඛනය

තොරතුරු ආරක්ෂාව

දත්ත සමුදා කළමනාකරණ පද්ධති

දත්ත විද්‍යාව සහ විශ්ලේෂණය

Digital රූප සැකසීම

ලිනක්ස් සමඟ පද්ධති පරිපාලනය

**වැඩසටහනේ විශේෂ මොඩියුල (Special Modules)**

SIBA කැම්පස් හි BTech. උපාධිය ක්‍රියාත්මක කරනු ලබන්නේ සුනත්‍ය (Authentic) ඉගෙනුම් මූලධර්ම මත වන අතර, එමඟින් උපාධි අපේක්ෂකයෙකු සෑම අධ්‍යයන වාරයකම ව්‍යාපෘති සැලසුම් කිරීමක් භාර ගත යුතු අතර, සන්නිවේදන ඉංග්‍රීසි මොඩියුල සඳහා උපාධිය සහ ස්වයං-උගත් ඉදිරිපත් කිරීම් ලබා ගැනීම සඳහා අවම වශයෙන් ව්‍යාපෘති පහක්වත් සම්පූර්ණ කළ යුතුය. SIBA BTech. උපාධිධාරියෙකුටම කර්මාන්තයේ රැකියා කළ හැකි බව සහතික කරයි.

එසේම, “ශිෂ්‍ය වෘත්තීය සංවර්ධන (SPD)” සැසි, “මෘදු කුසලතා” පුහුණු සැසි සහ වාර්ෂික නායකත්ව කඳවුරු යටතේ උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ පෞරුෂය වර්ධනය කර ගැනීමට පහසුකම් සලසාදෙනු ලැබේ.

**සීමාවාසික පුහුණුව (Internship)**

සියලුම BTech උපාධි අපේක්ෂකයින් කීර්තිමත් තොරතුරු තාක්ෂණ ආශ්‍රිත සංවිධානයක මාස හයක සීමාවාසික පුහුණුවක් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

**උපාධියෙන් පසු රැකියා අවස්ථා (Graduate Opportunities)**

සියලුම BTech උපාධි අපේක්ෂකයින්ට, ප්‍රසිද්ධ IT සමාගම්වල තම සීමාවාසික පුහුණුව ලබා ගත හැකිය. ඒ ඔස්සේ පසුගිය වසර කිහිපය තුළ SIBA BTech උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය 100% ක් වේ.

SIBA උපාධි ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සංගමය (IAU) සහ පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්ව විද්‍යාල සංගමය (ACU) විසින් පිළිගෙන ඇති බැවින් SIBA BTech උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු උපාධිධාරීන්ට ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල හෝ විදේශයන්හි පශ්චාත් උපාධි හැදෑරීමට හැකි වී ඇත.

www.studentloans.mohe.gov.lk

## 3. ව්‍යාපාර කළමනාකරණ උපාධිය (ගෞරව) – (BBM)

### හැඳින්වීම (Introduction)

ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පුළුල් අවබෝධයකින් යුතුව සිසුන් සන්නද්ධ කිරීම සඳහා, ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) උපාධිය නිර්මාණය කර ඇත. මෙම උපාධි වැඩසටහනේ අන්තර්ගත නව්‍ය ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම ප්‍රවේශය මඟින් සිසුන්ට සැබෑ ලෝක අවස්ථා, සිද්ධි අධ්‍යයන සහ ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරීව සහභාගී වීමෙන් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට හැකියාව ලැබේ. මෙම අවස්ථාවන්ට නැඹුරුවීමේ අත්දැකීම උපාධි අපේක්ෂකයින්ගේ විවේචනාත්මක චින්තනය, ගැටළු විසඳීම, විශ්ලේෂණාත්මක සහ තීරණ ගැනීමේ කුසලතා වැඩි දියුණු කරයි.

### වැඩසටහන් ව්‍යුහය (Program Structure)

ව්‍යාපාර කළමනාකරණ උපාධිය (ගෞරව) යනු මානව සම්පත් කළමනාකරණය, ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය, අලෙවිකරණ කළමනාකරණය සහ මෙහෙයුම් කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ඇතුළු කළමනාකරණ අධ්‍යයනයන්හි සියලුම ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් ආවරණයක් සපයන Credit 126 කින් යුත් උපාධි වැඩසටහනකි. විෂය මාලාව සකස් කර ඇත්තේ කාලීන ආයතනික අවශ්‍යතා සපුරාලීමට සහ වර්තමාන වෙනස් වීම්වලට ලක්වන ව්‍යාපාරික පරිසරය තුළ ක්‍රියාත්මකවීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ ප්‍රායෝගික අත්දැකීම් වලින් සිසුන් සන්නද්ධ කිරීමට ය.

### සීමාවාසික පුහුණුව (Internship)

SIBA කැම්පස් හි ව්‍යාපාර කළමනාකරණ උපාධියේ (ගෞරව) සීමාවාසික වැඩසටහන අත්‍යාවශ්‍ය අංගයකි. එය සිසුන්ට තමන් ලබාගත් දැනුම සහ කුසලතා සැබෑ ව්‍යාපාරික පරිසරයක දී අත්හදා බැලීමට අවස්ථාව ලබා දීම සඳහා සීමාමාසික පුහුණුව නිර්මාණය කර ඇත. සියලුම සිසුන් මාස හයක පූර්ණ කාලීන සීමාවාසික පුහුණුවක් සම්පූර්ණ කළ යුතුය.

සිසුන්ගේ කාර්ය සාධනය සහ වෘත්තීය සංවර්ධනය නිරීක්ෂණය කිරීම සඳහා සෑම මාස තුනකට වරක් ප්‍රගති සමාලෝචනයක් පවත්වනු ලැබේ. අවසාන තක්සේරුව ශිෂ්‍යයාගේ සීමාවාසික දිනපොත, අවසාන ව්‍යාපෘති වාර්තාව, කර්මාන්ත අධීක්ෂකගේ ප්‍රතිපෝෂණ වාර්තාව සහ ශිෂ්‍යයාගේ අවසාන ඉදිරිපත් කිරීම සහ සජීවීකරණය ඇතුළු බහු සංරචක මත පදනම් වේ.

www.studentloans.mohe.gov.lk

**උපාධියෙන් පසු රැකියා අවස්ථා (Graduate Opportunities)**

සියලුම BBM උපාධි අපේක්ෂකයින්ට ප්‍රසිද්ධ පිළිගත් ව්‍යාපාරික සමාගම්වල තම සීමාවාසික පුහුණුව ලබා ගත හැකිය. පසුගිය වසර කිහිපය තුළ SIBA BBM උපාධිධාරීන්ට 100% රැකියා අවස්ථා තිබේ.

මෙම උපාධි පාඨමාලාව, මූල්‍ය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර විශ්ලේෂණය, අලෙවිකරණ කළමනාකරණය, අවස්ථා කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය වැනි වෘත්තීන් සඳහා දොරටු විවර කරයි.

ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සංගමය (IAU) සහ පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්ව විද්‍යාල සංගමය (ACU) විසින් SIBA උපාධි පිළිගෙන ඇති බැවින්, SIBA BBM උපාධිධාරීන්ට ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල හෝ විදේශයන්හි පශ්චාත් උපාධි හැදෑරීමට අවස්ථා සැළසේ.

## 5.5 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්

ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

- සාමාන්‍ය උපාධිය: ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (අවුරුදු 3)
- ගෞරව උපාධිය: ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (අවුරුදු 4)

ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය යනු අධ්‍යාපන අමාත්‍යාංශය (MOE) විසින් පිළිගත් උපාධි වැඩසටහනකි. ගිණුම්කරණයේ සාර්ථක වෘත්තීන් ගොඩනැගීම සඳහා අවශ්‍ය කුසලතා, නිපුණතා සහ කර්මාන්ත දැනුම සහිත රැකියා කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම සඳහා එය නිර්මාණය කර ඇත. සම්පූර්ණ කිරීමෙන් පසු, සිසුන්ට ගිණුම්කරණ භාවිතයන් පිළිබඳ පුළුල් දැනුමක් සහ අවශ්‍ය කුසලතා ලැබෙනු ඇත, මන්ද මෙය "ව්‍යවහාරික ගිණුම්කරණය" ක්ෂේත්‍රයේ විශේෂිත දැනුම සපයන ශ්‍රී ලංකාවේ එකම උපාධි වැඩසටහන වන බැවිනි.

www.studentloans.mohe.gov.lk

විෂයමාලාව:

ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය/ගෞරව උපාධි වැඩසටහනේ විෂයමාලාව සාමාන්‍ය උපාධි වැඩසටහන සඳහා වසර තුනක් පුරා අධ්‍යයන වාර පදනමක් මත ක්‍රියාත්මක වන පරිදි නිර්මාණය කර ඇති අතර එය ණය 90 කින් සමන්විත වේ. වසර හතරක් පුරා විහිදෙන ගෞරව උපාධි වැඩසටහන ණය 120 කින් සමන්විත වේ. සෑම වසරකම අධ්‍යයන වාර දෙකක් ඇති අතර, සෑම අධ්‍යයන වාරයක්ම සති 15 කින් සමන්විත වේ. මෙම උපාධි වැඩසටහන ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලැබේ.

ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය/ගෞරව උපාධි වැඩසටහන ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ වාර්තාකරණය, සහතික කිරීම, ආචාර ධර්ම සහ අවදානම් කළමනාකරණය, ව්‍යාපාර උපායමාර්ග, මූල්‍ය විශ්ලේෂණය, බදු සහ නියාමන, දැනුම උත්පාදනය සහ ව්‍යාප්තිය, ගිණුම්කරණය පිළිබඳ සීමාවාසික පුහුණුව සහ වෘත්තීය කුසලතා වැනි මූලික විෂය විෂයයන් මත ය.

**සීමාවාසික පුහුණුව**:

පිළිගත් පුහුණු හවුල්කරුවන් 900 කට වැඩි සංඛ්‍යාවක් සමඟ සහයෝගයෙන් උපාධි වැඩසටහන් සඳහා අනිවාර්ය සීමාවාසික පුහුණුවක් ඇතුළත් වේ.

සාමාන්‍ය උපාධිය සඳහා වසරක පුහුණුවක් සහ ගෞරව උපාධිය සඳහා වසර දෙකක පුහුණුවක් මත පදනම්ව සිසුන් ඇගයීමට ලක් කෙරේ.

නිදහස් කිරීම්:

මෙම උපාධිය සම්පූර්ණ කරන සිසුන්ට CA Sri Lanka, ACCA සහ CIMA වෙතින් වෘත්තීය ගිණුම්කරණ සුදුසුකම් ලබා ගැනීම සඳහා නිදහස් කිරීම් ලැබේ.

වෘත්තීය අවස්ථා:

ගණකාධිකාරී, මූල්‍ය කළමනාකරු, විගණක, මූල්‍ය උපදේශක, කොටස් වෙළඳපොළ විශ්ලේෂක, අවදානම් ගණකාධිකාරී, මූල්‍ය විශ්ලේෂක, පර්යේෂණ විශ්ලේෂක, ආයෝජන විශ්ලේෂක, ආදායම් සහ වෙළඳපොළ විශ්ලේෂක, අවදානම් සහ පාලන නිලධාරී

**ව්‍යාපාර විශ්ලේෂණ පිළිබඳ කළමනාකරණ උපාධිය**

• සාමාන්‍ය උපාධිය: ව්‍යාපාර විශ්ලේෂණ පිළිබඳ කළමනාකරණ උපාධිය (අවුරුදු 3)



www.studentloans.mohe.gov.lk

• ගෞරව උපාධිය: ව්‍යාපාර විශ්ලේෂණ පිළිබඳ කළමනාකරණ උපාධිය (අවුරුදු 4)

ව්‍යාපාර විශ්ලේෂණ පිළිබඳ විද්‍යාවේදී උපාධිය යනු ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් සහ අධ්‍යාපන අමාත්‍යාංශය (MOE) විසින් අනුමත කරන ලද උපාධි වැඩසටහනකි. එය සංඛ්‍යානමය, විශ්ලේෂණාත්මක, තාක්ෂණික සහ විවේචනාත්මක චින්තන කුසලතා වලින් සන්නද්ධ උපාධිධාරීන් බිහි කිරීම සඳහා නිර්මාණය කර ඇත. අවසන් වූ පසු, සිසුන් ව්‍යාපාර විශ්ලේෂණ සහ සංඛ්‍යානමය ආකෘති නිර්මාණය ප්‍රගුණ කරනු ඇත, එමඟින් දත්ත බලපෑම්කාරී අවබෝධයක් බවට පරිවර්තනය කිරීමට ඔවුන්ට බලය ලැබේ. දත්ත මත පදනම් වූ විසඳුම් මෙහෙයවීමට සහ සංකීර්ණ සොයාගැනීම් සාර්ථකත්වය සහ නවෝත්පාදනය පෝෂණය කරන උපායමාර්ගික ව්‍යාපාරික තීරණ බවට පත් කිරීමට ඔවුන් සන්නද්ධ වනු ඇත.

විෂය මාලාව:

ව්‍යාපාර විශ්ලේෂණ පිළිබඳ කළමනාකරණ සාමාන්‍ය/ගෞරව උපාධි වැඩසටහනේ විෂය මාලාව, සාමාන්‍ය උපාධි වැඩසටහන සඳහා වසර තුනක් පුරා අධ්‍යයන වාර පදනමක් මත ක්‍රියාත්මක වීමට සැලසුම් කර ඇති අතර, එයට ණය 90 ක් ඇතුළත් වේ. වසර හතරක් පුරා විහිදෙන ගෞරව උපාධි වැඩසටහන, ණය 125 කින් සමන්විත වේ. සෑම වසරකම අධ්‍යයන වාර දෙකක් ඇති අතර, සෑම අධ්‍යයන වාරයක්ම සති 15 කින් සමන්විත වේ. මෙම උපාධි වැඩසටහන ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලැබේ.

විස්තීර්ණ විෂය මාලාව දත්ත විද්‍යාව, විශ්ලේෂණ, ව්‍යාපාර උපාය මාර්ග, තොරතුරු පද්ධති, වාර්තාකරණය, දැනුම උත්පාදනය සහ ව්‍යාප්තිය, වෘත්තීය කුසලතා සහ සීමාවාසික පුහුණුව ඇතුළු පුළුල් පරාසයක මාතෘකා ආවරණය කරයි. තවද, සිසුන්ගේ මෘදු කුසලතා වැඩි දියුණු කිරීම සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන් ද පවත්වනු ලැබේ. මෙම උපාධි වැඩසටහන්වල කැපී පෙනෙන ලක්ෂණ අතර දත්ත විද්‍යාව, තොරතුරු පද්ධති සහ ව්‍යාපාර කළමනාකරණය යන විෂයයන් යටතේ යාවත්කාලීන මොඩියුල එකතුවක්, ශක්තිමත් පර්යේෂණ අවධානයක් සහ කීර්තිමත් සංවිධානවල සැබෑ ලෝක අත්දැකීම්, සීමාවාසික පුහුණුව සහ ස්ථානගත කිරීම් හරහා කර්මාන්ත නිරාවරණයක් සහිත පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම ඇතුළත් වේ.

www.studentloans.mohe.gov.lk

වෘත්තීය අවස්ථා:

දත්ත විශ්ලේෂක, ව්‍යාපාර බුද්ධි විශ්ලේෂක, දත්ත විද්‍යාඥ, අලෙවිකරණ විශ්ලේෂක, මෙහෙයුම් විශ්ලේෂක, මූල්‍ය විශ්ලේෂක, නිෂ්පාදන කළමනාකරු, අවදානම් විශ්ලේෂක, දත්ත උපදේශක, විශ්ලේෂණ කළමනාකරු/අධ්‍යක්ෂ.

## 5.6 හොරයිසන් කැම්පස් මගින් පවත්වනු ලබන උපාධි පාඨමාලා

### තොරතුරු තාක්ෂණ පීඨය

**1. තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය**
**කාලය වසර 4 යි (අධ්‍යයන සම්භාර 120 යි)**

**2. ජාලකරණය සහ ජංගම පරිගණනය පිළිබඳ තොරතුරු තාක්ෂණවේදී (ගෞරව) උපාධිය**
**කාලය වසර 4 යි (අධ්‍යයන සම්භාර 120 යි)**

තොරතුරු තාක්ෂණ අංශවල විශේෂඥතාවක් ලබා තිබීම අවශ්‍ය වන බොහෝ ක්ෂේත්‍ර ඔස්සේ කටයුතු කිරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවශ්‍ය වන නම්‍යශීලිබව ලබා දීම සඳහා මෙම උපාධි වැඩසටහන් දෙකම සැලසුම් කර ඇත. ව්‍යාපාරවල, රජයේ සෞඛ්‍ය සේවයේ පාසල්වල සහ වෙනත් සංවිධානවල පරිගණක තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම සඳහා ශිෂ්‍යයන් සූදානම් කිරීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍රවල සංවර්ධන කටයුතු සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් පෙළඹවීම සඳහා මෙම අධ්‍යයන වැඩසටහන් සැලසුම් කර තිබේ. අමතර ප්‍රයත්නයක් දැරීමකින් තොරව සංවිධානයක මෙම අවශ්‍යතා සඳහා සාර්ථකව විසඳුම් ලබා දීමට හොරයිසන් කැම්පස් ආයතනයේ තොරතුරු තාක්ෂණ උපාධිධාරීන්ට හැකි වනු ඇත.

**3. දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය** (*පරිපූර්ණ විස්තරය සඳහා ඉංග්‍රීසි පරිවර්තනය බලන්න*)

දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය වර්තමාන රැකියා වෙළඳපොලේ ඉහළ වැටුප් සහිත හා වැඩිම රැකියා ස්ථාවරත්වයක් සහිත නවීනතම පාඨමාලාවකි. උපාධි පාඨමාලාව යටතේ කෘතිම බුද්ධිය, ව්‍යාපාර විශ්ලේෂණය, යාන්ත්‍ර ඉගෙනීම, සංඛ්‍යානය සහ විශාල දත්ත විශ්ලේෂණ යන ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව හිමිවෙයි. උපාධි වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ දත්ත විද්‍යාවට අදාළ දැනුම හා කුසලතා වර්ධනය කර ගනිමින් කාර්මික හා ව්‍යාපාරික ක්ෂේත්‍රවලට ඵලදායී ලෙස දායක විය හැකි පුද්ගලයන් සූදානම් කිරීමයි. උපාධි පාඨමාලාවේ පළමු වසර දෙක ඇතුළත මූලික දැනුම ලබාදීම සඳහා පහත සඳහන් විෂයන් අධ්‍යයනය කිරීමට අවස්ථාව සැලසේ.

Fundamentals of Programming, Introduction to Data Science, Systems Analysis and Design, Mathematics for Computing, Introduction to Databases, Advanced Mathematics for Computing, Probability & Introduction to Statistics, Digital Entrepreneurship, Data Analysis with Computer, Data Structures and

www.studentloans.mohe.gov.lk

Algorithms, Object Oriented Design and Programming, Data Visualization, Artificial Intelligence, Information Systems in Organizations and Research Methods for Computing

මෙම උපාධි පාඨමාලාව මගින් Artificial Intelligence, Machine Learning හා Data Science යන අංශයන් ඒකාබද්ධවෙන්නේ විශේෂිත්ත විද්‍යාඥයන් ට බිහිකිරීමට සැලසුම් කෙරේ ඒ සඳහා ඇතුළත් විශේෂිත විෂයයන් කිහිපයක් පහත දැක්වේ.

Advanced Topics in Data Science, Big Data Management, Machine Learning for Cyber Security, Machine Learning and Intelligence Data Analysis, Applications of Information Systems in Business, Advanced Database Systems, Information Retrieval, Data Analytics and Mining, Data Science for Business, Distributed Computing for Data Science and Social Media Mining.

මෙම උපාධිය සඳහා මාස හයක වෘත්තීය පුහුණුවක් සහිත අවසන් වසර තුලින් පර්යේෂණ ව්‍යාපෘතියක් ද අන්තර්ගත වේ. Python, Perl, C/C++, SQL, and Java වැනි පරිගණකවැඩසටහන් භාෂා සඳහාවන දැනුම වර්ධනය කර ගැනීමට මෙම කාලයේදී වැඩි අවස්ථාවක් හිමිවේ

මෙම ක්ෂේත්‍රයේ සිටින විවිධ විද්‍යාඥයන් වනුයේ;

- Statistician
- Mathematician
- Data Engineers
- Digital Analytics Consultant
- Machine Learning Scientists
- Business Analytic Practitioners
- Software Programming Analysts

මෙම ක්ෂේත්‍රයේ වඩාත් ඉල්ලුමක් සහිත රැකියා වනුයේ;

- Data Analyst
- Data Scientist
- Data Engineer
- Data Architect
- Machine Learning Scientist
- Machine Learning Engineer
- Business Intelligence Developer

## උපාධි වැඩසටහන්වල ව්‍යුහය

හොරයිසන් කැම්පස් ආයතනයේ BSc Hons in සහ IT BIT in Hons NMC යන උපාධි පාඨමාලාවල ව්‍යුහය තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ ප්‍රවණතා හා මාතෘකාවලින් පරිපූර්ණ වී ඇත. පළමු වසර දෙක තුළ

www.studentloans.mohe.gov.lk

වැඩසටහන් දෙකම පොදු පාඨමාලා මොඩියුලවලින් සමන්විත වන අතර එක් එක් උපාධි වැඩසටහනේ විශේෂීකරණ වැඩසටහන තුන්වන වසරේ දී ආරම්භ වේ.

## වෘත්තීය ගමන් මඟ හා සේවා නියුක්ති කාණ්ඩ

වර්තමාන තොරතුරු තාක්ෂණ කර්මාන්තය ව්‍යවසාය හා පාරිභෝගිකයා වෙත දිශානුගත වී ඇති අතර මෘදුකාංග සංවර්ධනය, ජංගම යෙදුම් සංවර්ධනය, තොරතුරු තාක්ෂණික සහාය, උපකරණ සැලසුම්, ව්‍යවසාය මෘදුකාංග නිෂ්පාදනය ඇතුළත් වන විවිධාකාර ව්‍යාපාරික අංශ තොරතුරු තාක්ෂණ කර්මාන්තයට ඇතුළත් ව තිබේ.

ඉහත උපාධි වැඩසටහන් සාර්ථකව සම්පූර්ණ කළ උපාධිධාරීන්ට තොරතුරු තාක්ෂණ කර්මාන්තයෙන් ලබා ගත හැකි රැකියා කාණ්ඩ මෙම කර්මාන්තයේ තාක්ෂණික ව්‍යාපාර අංශ මෙන් ම විවිධත්වයකින් යුක්ත වේ. වැඩසටහන්කරු, මෘදුකාංග සංවර්ධකයන්, මෘදුකාංග ඉංජිනේරුවන්, විසඳුම් නිර්මාණ ශිල්පීන්, පරීක්ෂණ විශ්ලේෂකයන්, පද්ධති ඉංජිනේරුවන්, දත්ත සමුදාය පරිපාලකයන්, ජාල පරිපාලකයන්, ජංගම යෙදවුම් සංවර්ධකයන්, මෘදුකාංග ව්‍යාපෘති කළමනාකරුවන්, තාක්ෂණික ව්‍යාපෘති කළමනාකරුවන් වැනි රැකියා ප්‍රභේද වඩාත් සුලබ මෙන්ම ජනප්‍රිය රැකියාවන් අතරින් සමහරක් වේ.

හොරයිසන් කැම්පස් ආයතනයේ තොරතුරු තාක්ෂණ පීඨයෙන් යම් පුද්ගලයකු ලබා ගන්නා කුසලතා හා සුදුසුකම් අන්තර්ජාතික මට්ටමින් පිළිගැනේ. එමෙන්ම, මෙම උපාධිධාරීන් විදේශ රටවල රැකියාවල නිරතවීමට අපේක්ෂා කරන්නේ නම් එම විකල්පය ද ඉටු කර ගැනීමට මෙම උපාධිධාරීන්ට හැකියාවක් පවතී.

## කළමනාකරණ පීඨය

### 4. ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (මානව සම්පත් කළමනාකරණය) කාලය වසර 4 යි (අධ්‍යයන සම්භාර 127)

### 5. අලෙවිකරණය පිළිබඳ කළමනාකරණවේදී උපාධිය කාලය වසර 4 යි (අධ්‍යයන සම්භාර 123 යි)

මෙම උපාධි අපේක්ෂකයන් මානව සම්පත් කළමනාකරණ වෘත්තිකයන් හෝ අලෙවි කළමනාකරණ වෘත්තිකයන් බවට පත් කිරීමට හැකිවන පරිදි මෙම උපාධි ව්‍යුහගත කර ඇත. ආරම්භයේ සිටම උපාධිධාරීන්ට පිරිනැමෙන වැඩසටහන් මගින් දේශීය වශයෙන් තීරණය කර ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වීමේ හැකියාව උපාධිධාරීන්ට ලබා දීම හේතුවෙන් අලෙවිකරණය හා මානව සම්පත් යන මෙම වැඩසටහන් දෙකම විශාල ප්‍රසිද්ධියක් ලබා ගැනීමට සමත්ව තිබේ.

කළමනාකරණ පීඨයේ උපාධි අපේක්ෂක වැඩසටහනේ අද්විතීය ලක්ෂණය වන්නේ සාමාසික අටකින් සමන්විත වැඩසටහනේ හයවන සමාසිකයේ දී මෙම උපාධි වැඩසටහනට කාර්මික පුහුණුවක් ඇතුළත් කර තිබීමයි. සය මසක් පුරා පැවැත්වෙන කාර්මික පුහුණුව තුළ දීල ශිෂ්‍යයන් කාර්යයන් පිළිබඳව ඉතා වටිනා පළපුරුද්දක් හා කළමනාකරණ ශිල්ප ක්‍රම පිළිබඳව දැනුවත්භාවයක් ලබා ගනිමින් පූර්ණකාලීනව කටයුතු කරයි. ශිෂ්‍යයන්ට ඔවුන්ගේ වැඩසටහන අවසන් වීමට පෙර පවා පුද්ගලික අංශය පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට මෙම සැලසුම තුළින් අවස්ථාව සැලසේ.



www.studentloans.mohe.gov.lk

දිවයිනේ ප්‍රමුඛ සමාගම්වල සීමාවාසික පුහුණු අවස්ථා ලබා ගැනීමට පවා අප ආයතනයේ උපාධි අපේක්ෂකයන් සමත්ව තිබීම මගින් කළමනාකරණ පීඨය මගින් බිහි කරන උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ප්‍රබල සාක්ෂියක් සැපයේ.

මෙම උපාධි වැඩසටහන් සාර්ථකව සම්පූර්ණ කරන උපාධිධාරීන් සඳහා කළමනාකරණ ක්ෂේත්‍රයේ පවතින රැකියා ප්‍රභේද කළමනාකරණ අංශයේ පවතින රැකියා අවස්ථා මෙන්ම විවිධත්වයෙන් යුක්ත වේ. අලෙවි කළමනාකරු, විකිණුම් කළමනාකරු, අලෙවි සන්නිවේදන කළමනාකරු, වෙළඳ නාම කළමනාකරු, අලෙවි උපදේශක, වෙළඳපල පර්යේෂකයන්, මානව සම්පත් කළමනාකරු, වන්දි විශේෂඥයන්, මානව සම්පත් උපදේශක, සංස්ථාපිත පුහුණුකරු, සේවකයන් සේවයේ නිරත කරවීමේ හා අභිප්‍රේරණය කිරීමේ විශේෂඥයන් සහ රැකියා විශ්ලේෂක හා සැලසුම් විශේෂඥ වැනි රැකියා ඒ අතරින් වඩාත් සුලභ හා ජනප්‍රිය රැකියා ප්‍රභේද වේ.

## 6. ගිණුම් හා මූල්‍යකරණය පිළිබඳව කළමණාකරන ගෞරව උපාධිය

පාඨමාලා කාළය: වසර 4 (ක්‍රෙඩිට් 124)

හොරයිසන් විශ්වවිද්‍යාලය මගින් ප්‍රධානය කරන මෙම ගිණුම්කරණ හා මූල්‍ය කළමනාකරණ උපාධි පාඨමාලාව ඔබට න්‍යායික සහ ප්‍රයෝගික යන අංශ දෙකෙන්ම සමබර දැනුමක් ලබා ගැනීමට උපකාරී වනු ඇත. පලපුරුදු කථිකාචාර්යවරුන් මෙන්ම මූල්‍ය හා ගිණුම් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් ගෙන් සැදුම් ලත් ආචාර්ය මණ්ඩලය සිසුන්ගේ ශාස්ත්‍රීය දැණුම වඩවමින් ඔවුන්ගේ වෘත්තීය අරමුණු කරා යාමට මග පෙන්වනු ඇති අතර, එමඟින් මූල්‍ය රැකියා වෙළඳපොළේ තරඟ කිරීමට ඔබට අවශ්‍ය න්‍යායික හා ප්‍රයෝගික දැනුමෙන් සන්නද්ධ වීමට හැකි වනු ඇත.

ගිණුම්කරණය හා මූල්‍ය කටයුතුවලට අදාළ මූලික ක්‍රමවේදයන් උගන්වමින් පාඨමාලාව ආරම්භ වන අතර, ඉන් අනතුරුව ක්‍රමානුකූලව සිසු-සිසුවියන්ව ගිණුම් හා මූල්‍ය ක්ෂේත්‍රයේ ගැඹුරු න්‍යායන් වෙත ගෙන යන අතර, එම න්‍යායන් ප්‍රයෝගිකව භාවිතා වන අයුරු, ප්‍රයෝගික අභ්‍යාස මගින් නිරන්තරව ප්‍රගුණ කරවනු ලැබේ.

එමෙන්ම මූල්‍ය කළමණාකරණයේදී අත්‍යවශ්‍ය විවේචනාත්මක විශ්ලේෂණ (critical analysis) කුසලතා වැඩිදියුණු කිරීම සඳහාද විශේෂිත විෂයන් මෙම උපාධි වැඩසටහන තුල අඩංගුකර ඇත. එමෙන්ම ව්‍යාපාරික ලෝකයේ දක්නට ලැබෙන අන්තර්ක්ෂේත්‍ර ස්වභාවය (interdisciplinary nature) සැලකිල්ලට ගෙන ගිණුම් හා මූල්‍ය ශිෂ්‍යයන් , එම ක්ෂේත්‍රය ව්‍යාපාරයේ අලෙවිකරණය, නිෂ්පාදනය, මානව සම්පත් කළමණාකරණය වැනි වෙනත් අංශ කෙරෙහිද බලපාන ආකාරයද මනාව අවබෝධ කරවනු ලැබේ. ඒ අනුව වඩාත් පරිපූර්ණ ගිණුම් හා මූල්‍ය විශේෂඥයෙකු බිහිකිරීමට මෙම උපාධි පාඨමාලාව සමත්වෙනු ඇත.

තවද, ගිණුම් හා මූල්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ප්‍රධාන වරලත් වෘත්තීයමය ආයතන වන CIMA, ACCA, CMA වැනි ආයතන මගින් පවත්වනු ලබන විභාගවලින් උපරිම නිදහස් කිරීම් (exemptions) ගත හැකි වන පරිදි මෙම පාඨමාලාව සකස් කර ඇත.

හොරයිසන් ගිණුම් හා මූල්‍යකරණය පිළිබඳව කළමණාකරණ ගෞරව උපාධිය හරහා ඔබට විවරවෙන රැකියා හා වෘත්තීයමය අවස්ථා

www.studentloansmohe.gov.lk

- ගණකාධිකාරී
- මූල්‍ය කළමණාකරු
- විගණන නිළධාරීන්
- මූල්‍ය උපදේශක
- කොටස් වෙළඳපොල විශ්ලේෂක
- අවදානම් හා පිරිවැය පිලිබඳ ගණකාධිකාරී
- ව්‍යාපාර විශ්ලේෂක
- මූල්‍ය විශ්ලේෂක
- ව්‍යාපාරික සැළසුම්කරණය හා උපායමාර්ගික කළමණාකරණය
- පර්යේෂණ හා ආයෝජන විශ්ලේෂණ විශේෂඥ
- වෙළඳපොල විශ්ලේෂණ විශේෂඥ
- අවදානම් පාලන විශේෂඥ

## අධ්‍යාපන පීඨය

### 7. අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව

*ඉංග්‍රීසි* මාධ්‍යය / කාලය: අවුරුදු 04/ ක්‍රෙඩිට් ගණන: 120

අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන 21 වෙනි ශත වර්ෂයේ ඉගෙනුම ලබන ඉගෙනුම් ලාභීන් හට ඉගෙන්වීමට සමත්,කාර්යශූර, වෘත්තිමය ගුරුවරුන් පුහුණු කරවන බහු විෂය ක්ෂේත්‍ර අන්තර්ගත වන විස්තීර්ණ වූ උපාධි වැඩසටහනකි. මෙම වැඩසටහනට අධ්‍යයන, වෘත්තිමය, සාමාන්‍ය හා ප්‍රයෝගික සංරචක ඇතුලත් වන අතර තේරීම් විෂය මොඩියුල දෙකක් සමග එම සංරචක සියල්ල ඉගෙනීම අනිවාර්ය වේ. මෙම උපාධි වැඩසටහන අවුරුදු හතරක් පුරා රජයේ හෝ පුද්ගලික අංශයේ පාසලක ඉගැන්වීම් පුහුණුව සම්පූර්ණ කිරීමෙන් සහ ක්‍රෙඩිට් 15 ක නිබන්ධනයකින් උපාධිය අවසන් කිරීමට නියමිතය. උපාධිලාභීන් රාජ්‍ය අංශයේ (රජයේ හෝ අර්ධ රජයේ) පාසලක හෝ රාජ්‍ය නොවන අංශයේ (පුද්ගලික හෝ අන්තර්ජාතික) පාසලක ඉගෙන්වීම සදහා සුදුසුකම් ලබයි. මීට අමතරව එම උපාධිලාභීන් විදේශ රටක අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියාවක් සදහාද සුදුසුකම් ලබයි.

අධ්‍යාපන පීඨයෙන් පිරිනමනු ලබන මෙම උපාධි වැඩසටහනේ විශේෂ ලක්ෂණයක් වන්නේ උපාධි අපේක්ෂකයන් ලෙස අධ්‍යාපන කටයුතු කරන කාලය අතරතුරදීම සති 10 ක පූර්ණ කාලීන ගුරු පුහුණුවක් තෝරාගත් පාසලක ඉගැන්වීම සදහා පහසුකමත් මෙම වැඩසටහනට අන්තර්ගත කර ඇති බවයි. මෙම කාලය තුලදී ශිෂ්‍යයන් හට උගත් පළපුරුදු උපදේශකයන්ගේ මගපෙන්වීම සමග ඉගැන්වීම පිලිබදව අගනා ප්‍රයෝගික පුහුණුවක් ලබාගත හැකිවනු ඇත. ඒ අනුව ඔවුන්හට උපාධිය සම්පූර්ණ කිරීමට ප්‍රථම වෘත්තිය ඉගැන්වීම් නිපුණත සංවර්ධනය කරගැනීමට ලැබීම විශේෂත්වයකි. මෙම උපාධිය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සමග සමපාත වන නිසා ගුරු වෘත්තීයට උගත් වෘත්තීය පළපුරුදු අයදුම්කරුවන් බදවා ගැනීමේදී ඉහල සැලකිල්ලට භාජනය වේ.

අධ්‍යාපන ගෞරව වේදීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ - 2 ශ්‍රේණියේ පත්වීමකට අයදුම් කිරීමට සහ ප්‍රාථමික සහ ද්විතීයක පාසල් වල ඉගෙන්වීමට සුදුසුකම් ලබයි. මෙලෙස රජයේ ගුරු සේවයේ පත්වීම ලබන අධ්‍යාපන වේදී ගුරු භාවතුන්හට, අධ්‍යාපන පරිපාලන සේවයට සම්බන්ධ වීම මෙන්ම රාජ්‍ය නොවන පාසලක හෝ අන්තර්ජාතික පාසලක සේවය කිරීම සඳහා ද අවස්ථාව සැලසේ. ඉන්පසු වැඩිදුර අධ්‍යාපන ලැබීම සඳහා බලාපොරොත්තු වන ගුරුභවතුන් සඳහා ශාස්ත්‍රපති (Masters) හෝ දර්ශන ආචාර්ය (PhD) උපාධි වැඩසටහන් වලට සම්බන්ධ වීමට සහ ඉන් ඉදිරියට ශ්‍රී ලංකා රාජ්‍ය හෝ



www.studentloans.mohe.gov.lk

රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවල මෙන්ම විදේශ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට ද අවස්ථාව සැලසෙනු ඇත.

**8. ජීව විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය**
**ඉංග්‍රීසි මාධ්‍යය / කාලය: අවුරුදු 04/ Credit ගණන: 120**

**9. භෞතික විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය**
**ඉංග්‍රීසි මාධ්‍යය / කාලය: වසර 4/ Credit ගණන: 124**

මෙම උපාධිය වසර 4 ක පිළිගත් උපාධියක් වන අතර එය හදාරන ශිෂ්‍යයන් විසින් අධ්‍යයන සම්භාර 15 කින් සමන්විත ශාස්ත්‍රීය නිබන්ධනයක් සම්පූර්ණ කිරීම අවශ්‍ය වන අතර රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ පාසලක ඉගැන්වීමේ පුහුණුව ද සම්පූර්ණ කළ යුතුය. උපාධිධාරියාගේ අභිමතය පරිදි රජයේ පාසලක හෝ පෞද්ගලික අංශයේ ඉගැන්වීමට උපාධිධාරියා සුදුසුකම් ලබයි. ඉතිහාසය, භූගෝල විද්‍යාව, ගණිතය, සංඛ්‍යාලේඛන යනාදී පුළුල් පරාසයක විහිදුණු විෂයයන් රාශියක් මෙම උපාධි පාඨමාලාව වෙනුවෙන් උගන්වනු ලබන අතර රාජ්‍ය / රාජ්‍ය නොවන පාසල් පද්ධතියේ ඉහළ ශ්‍රේණිවල ඉගැන්වීමට අවශ්‍ය ප්‍රවීණතාව සිසුන්ට ලබා දෙයි. අධ්‍යාපන පීඨයේ උගන්වනු ලබන උපාධි අපේක්ෂක වැඩසටහනේ සුවිශේෂී ලක්ෂණය වන්නේ වැඩසටහනේ හත්වන සමාසිකයේ දී පවත්වනු ලබන මෙම විෂයමාලාවට ඇතුළත් කරන ලද ඉගැන්වීමේ පුහුණු වැඩසටහනයි. සති 10 ක කාලයක් තුළ, සිසුන් අර්ධකාලීනව පාසලක ඉගැන්වීමේ කාර්යයේ නිරත වීම තුළින් වටිනා සේවා පළපුරුද්දක් ලබා ගැනීමට මෙන්ම ඉගැන්වීම සිදු කරන ආකාරය පිළිබඳව දැනුවත් වීමට ද ශිෂ්‍යයන්ට අවස්ථාව සැලසේ. මෙම අවස්ථාව සැලසීම මඟින් සිසුන්ට තම උපාධි වැඩසටහන අවසන් කිරීමටත් පෙර අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව පළපුරුද්දක් ලබා ගත හැකි වේ. මෙම උපාධිධාරීහු ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

**10. අධ්‍යාපනවේදී (ගෞරව) - තොරතුරු තාක්ෂණය**
**ඉංග්‍රීසි මාධ්‍යය / කාලය: අවුරුදු 04/ Credit ගණන: 120**

අධ්‍යාපනවේදී ගෞරව තොරතුරු තාක්ෂණ උපාධි වැඩසටහන හොරයිසන් විශ්වවිද්‍යාලයේ විශේෂ අධ්‍යයන වැඩසටහනකි. එය Credit 120 ක උපාධි පාඨමාලාවක් වන අතර එයට වෘත්තීය අධ්‍යාපනය සඳහා Credit 18 ක්, සාමාන්‍ය සහ ප්‍රායෝගික විෂයන් සඳහා Credit 16 ක් සහ තොරතුරු තාක්ෂණ විෂයන් සඳහා Credit 86 ක් වෙන් කොට ඇත.

මෙම Credit 86 නැවතත් තොරතුරු තාක්ෂණයට Credit 60ක් ගුරු පුහුණුව සඳහා Credit 03ක්, පර්යේෂණ නිබන්ධනය සඳහා Credit 23 ක් වශයෙන් බෙදා ඇත. තොරතුරු තාක්ෂණය සඳහා අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය, පරිගණක වැඩසටහන්කරණය (Programming) හඳුන්වාදීම, පරිගණක තාක්ෂණය සඳහා ගණිතය, පරිගණක ග්‍රැෆික්ස්., පරිගණක පද්ධති, තොරතුරු පද්ධති, දත්ත ආකෘති නිර්මාණය., පරිගණක ජාල පද්ධති, බහුමාධ්‍ය (Multimedia) මෘදුකාංග ක්‍රියාවලිය සහ ආකෘති නිර්මාණය වෙබ් යෙදුම් සංවර්ධනය ඇල්ගොරිදම නිර්මාණය සහ විශ්ලේෂණය, උසස් වැඩසටහන් කරණය, දත්ත සමුදා කළමනාකරණ පද්ධති මෙහෙයුම් පද්ධති, ජාල සැකසුම් සහ කළමණාකරණය, ජංගම යෙදුම් සංවර්ධනය සහ තොරතුරු තාක්ෂණය, වෙනත් නවීන මාතෘකා වැනි විෂයයන් අධ්‍යයනය කරනු ලැබේ.

www.studentloans.mohe.gov.lk

සීමාවාසික පුහුණු අවශ්‍යතා සඳහා රජයේ, අර්ධ රජයේ, පුද්ගලික සහ අන්තර්ජාතික පාසල්වල අවශ්‍යතාවය අනුව පහසුකම් සලසා ඇත.

මෙම පාඨමාලාව හදාරණ උපාධි ලාභීන්ට රජයේ, අර්ධ රජයේ, පුද්ගලික සහ අන්තර්ජාතික පාසල්වල තොරතුරු තාක්ෂණ ගුරුවරුන්, ගුරු පරිපාලකයන් සහ විදුහල්පතිවරුන් වශයෙන් රැකියා අවස්ථා ලබා ගත හැකිය. රජයේ සේවයට බැඳෙන තොරතුරු තාක්ෂණ උපාධිධාරීන්ට අධ්‍යාපන පරිපාලන සේවයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබෙනු ඇත. හොරයිසන් විශ්වවිද්‍යාලයේ උපාධි ලබන අධ්‍යාපනවේදී ගෞරව තොරතුරු තාක්ෂණ උපාධිධාරීන්ට විදේශ රටවල අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියාවක් ලබා ගත හැකිය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩිදුර අධ්‍යාපනය ලබා ගන්නා මෙම උපාධිධාරීන්ට විශ්වවිද්‍යාල මට්ටමේ කථිකාචාර්ය වරුන් ලෙස රජයේ සහ රජයේ නොවන විශ්වවිද්‍යාල පත්වීම් ලබා ගැනීමට පහසු මග සැලැසී ඇත.

ශ්‍රී ලංකාව ඉහළ ආදායම් සහිත ආර්ථිකයක් බවට පත් කිරීම සඳහාත් අප ජාතිය කාර්යක්ෂමතාවයෙන් සේවයකරන, නව්‍ය සොයාගැනීම් වලට පෙළඹීම් සහිත ඉහළ මානව ප්‍රාග්ධනය යක් වෙත සංවර්ධනය කිරීම සඳහාත් උසස් කුසලතාවලින් පරිපූර්ණ මනා පුහුණුව ලත් ගුරු භවතුන්, තොරතුරු තාක්ෂණය ඉගැන්වීම සඳහා ද්විතීයක පාසල් වලට අන්තර්ග්‍රහණය කල යුතුව ඇත. එම නිසා මෙම අධ්‍යාපනවේදී තොරතුරු තාක්ෂණ වැඩසටහන උක්ත ජාතික අවශ්‍යතාව සඵල කරගැනීමට ඉතාමත්ම ඉවහල් වන බව වැඩිදුරටත් දැනුම් දීමට කැමැත්තෙමු.

## විද්‍යා පීඨය-

### 11. ජෛව තාක්‍ෂණය පිළබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

### උපාධිය හා සිසුන්ට රැකියා අවස්ථා ආවරණය වන දේ පිළිබඳ විස්තරය

මෙම ජෛව තාක්‍ෂණ ගෞරව උපාධි වැඩසටහන මඟින් සිසුන්ට නවීන ජෛව තාක්‍ෂණය පිළිබඳ පුළුල් දැනුමක් වසර 4 ක් තුළ අධ්‍යයන සම්භාර 120 ක් මඟින් ලබා දෙයි. ජෛව තාක්‍ෂණය පිළිබඳ සම්ප්‍රදායික අධ්‍යයනයකට අතිරේකව වෙනත් අංශවලින් විශේෂිත දැනුම ගෙන ඒම සමඟ විෂයයෙහි බහුවිධ ස්වභාවය කෙරෙහි මෙම උපාධිය අවධානය යොමු කර තිබේ. ඊට අමතරව, නව නිර්මාණාත්මක ආකාරවලින් ජෛව තාක්‍ෂණික ක්‍රියා පටිපාටි සඳහා අවැසි අති නවීන තාක්ෂණයන් මෙම උපාධියට ඇතුළත් කර තිබේ.

1) ජාන විද්‍යාව සහ අණුක ජීව විද්‍යාව; සෛල ව්‍යුහය, ජාන උරුමය සහ හැසිරවීම්, ප්‍රතිසංයෝජිත ඩී.එන්.ඒ. තාක්ෂණයන්, ජෛව තොරතුරු තාක්ෂණය, ජාන විද්‍යාව හා ප්‍රෝටීන අධ්‍යයනය, අධිකරණ වෛද්‍ය විද්‍යාව හා සමකාලීන න්‍යායන් පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සහිත ප්‍රයෝගික කරුණු ආවරණය කරයි.

2) ශාක සෛල හා පටක රෝපණය; පර්යේෂණ හා වාණිජමය යෙදීම් සඳහා මෙවලමක් ලෙස ශාක පුනර්ජනනය හා ක්ෂුද්‍ර ප්‍රසාරණය, පරිවෘත්තීය ද්‍රව්‍ය අධ්‍යයනය හා නවීන ශාක ජෛව තාක්ෂණය පිළිබඳ දැනුවත් කෙරෙන අත්‍යවශ්‍ය ක්ෂේත්‍රයකි.

3) ඖෂධ හා ස්වාභාවික නිෂ්පාදන ජෛව තාක්‍ෂණය; නව ඖෂධ නිෂ්පානය කිරීමේ පොදු තේමාවක් සහිත මූලික රසායන විද්‍යාව, කාබනික රසායන විද්‍යාව, ජෛව රසායන විද්‍යාව, ඖෂධවේදය යන අංශ රාශියක් ආවරණය වන පරිදි සිද්ධාන්ත හා පර්යේෂණ පිළිබඳ අන්තර්ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්මක් මෙහි ඇතුළත් වේ.

4) ආහාර හා පෝෂණ ජෛව තාක්ෂණය; ආහාර නිෂ්පාදනය හා සැකසුම් තාක්ෂණයන්, පෝෂණය හා සෞඛ්‍යය, ගුණාත්මකභාවය සහ නව්‍යකරණය, ව්‍යවසායකත්වය සහ අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ ආහාරමය කර්මාන්ත සඳහා අවශ්‍ය තරඟකාරී හා දැනුමැති විශේෂඥභාවයන් මත විහිදේ.

5) ක්ෂුද්‍රජීවී ජෛව තාක්ෂණය; මූලික අණුක, වෛද්‍ය සහ පාරිසරික ක්ෂුද්‍රජීව විද්‍යාව අතර අතුරු මුහුණතක් ලබා දීමෙන් එදිනෙදා ජීවිතයේ හා පරිසරයේ සකසනයන් ලෙස ක්ෂුද්‍ර ජීවීන්ගේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනය කෙරේ.

6)පාරිසරික ජෛව තාක්ෂණය; පරිසර පද්ධතිවල ගැටළු නිරාකරණය කිරීම සඳහා ජීවීන් හෝ ජීවීන්ගේ පරිවෘත්තීය කාර්යයන්හි නිෂ්පාදනවල ප්‍රයෝජන හා විභවයන් පැහැදිලි කරන ව්‍යවහාරික වපසරියකි. තවද, ක්ෂේත්‍ර ප්‍රයෝගික විනෝද චාරිකා සහ සොබාදහමේ ගවේෂණවලින් පිරී ඇති මෙම අංශයේ, ජෛව විවිධත්ව සංරක්ෂණය හා කළමනාකරණ අධ්‍යයනයන් පිළිබඳ අති නවීන ජීව විද්‍යාත්මක දැනුමක් ලබා දේ.

අවසාන වසරේ ව්‍යාපෘතිය මඟින් සිසුන්ට තම අභිමතය පරිදි සුදුසු මාතෘකාවක් පිළිබඳ පර්යේෂණ කිරීම, ස්වාධීන චින්තනය සහ විශ්ලේෂණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අදාළ විෂයයන් පිළිබඳ විද්වත් කතිකාවන් ඇති කරගැනීමද උපාධියට ඇතුළත් වේ. අවසාන වශයෙන්, විවිධ වෘත්තිකයන් සමඟ කාර්මික පරිසරයක වැඩ කිරීමට (මාස 6ක සීමාවාසික පුහුණුව), යම් අත්දැකීම් ලබා ගැනීමට, විශ්ව විද්‍යාලය තුළ ලබාගත් දැනුම භාවිතයට හා ගවේෂණය කිරීමට අවස්ථාවක් මෙම උපාධිය මඟින් සැලසේ.

ජෛව තාක්ෂණ උපාධි සලකා බැලීමේදී, පොදු ජෛව තාක්ෂණ වෘත්තීය මාර්ගයක් වන රසායනාගාර වෘත්තීය සිසුන්ගේ එකම අරමුණ නොවේ. පර්යේෂණ හා සංවර්ධනය, තත්ත්ව සහතික කිරීම / නියාමන කටයුතු, නිෂ්පාදන, සායනික පර්යේෂණ, ප්‍රතිපත්ති සම්පාදනය, ආහාර, සත්ව හා පාරිසරික විද්‍යාව, විකුණුම් සහ තාක්ෂණික සහාය, ව්‍යාපාර සහ ව්‍යාපෘති කළමනාකරණ අංශ කෙරෙහි ඉහළ ඉල්ලුමක් ජෛව තාක්ෂණ උපාධිධාරීන් වෙත පවතී. උදාහරණ කිහිපයක් ලෙස, වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ විද්‍යාඥයින්, ජෛව රසායන විද්‍යාඥයින්, ක්ෂුද්‍රජීව විද්‍යාඥයින්, ජෛව නිෂ්පාදන විද්‍යාඥයින්, ව්‍යාපාර සංවර්ධන කළමනාකරුවන්, ව්‍යවසායකයින්, කථිකාචාර්යවරුන්, යනු සිසුන්ගේ අනාගතය හැඩගස්වන, ඉල්ලුමට සරිලන ජෛව තාක්ෂණ වෘත්තීන් ය.

## තාක්ෂණ පීඨය

### 12. ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය (ගෞරව)

මාධ්‍යය: ඉංග්‍රීසි , කාලය: අවුරුදු 4

තාක්ෂණ පීඨය විසින් පරිසර ජෛව සම්පත් (පස, ජලය, ශාක, මාළු, සත්ව, වනාන්තර, ක්ෂුද්‍ර ජීවීන්, පරිසරය, දේශගුණය) සහ ආහාර සහ පුනර්ජනනීය අමුද්‍රව්‍ය තිරසාර ලෙස නිෂ්පාදනය කිරීම සඳහා පද්ධතිවල පුද්ගලයින් අතර අන්තර්ක්‍රියා ගවේෂණය කිරීම සඳහා සිව් අවුරුදු ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය (ගෞරව) වැඩසටහනක් හඳුන්වා දෙයි.

රසායනාගාර පහසුකම් සඳහා හොඳ නිරාවරණයක් සහිතව ස්මාර්ට් ජෛව පද්ධතිවල උසස් විද්‍යාත්මක දැනුම, කුසලතා සහ දැනුම ලබා ගැනීමට මෙම වැඩසටහන සිසුන්ට උපකාරී වේ. දේශීය හා විදේශීය ජෛව තාක්ෂණ කාර්මික හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් සිසුන්ගේ පර්යේෂණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් තවදුරටත් පීඨය සපයයි. ගෝලීය පිළිගැනීමක් ලබා ගැනීම සඳහා ඉතා නව්‍ය හා නිර්මාණශීලී තාක්ෂණික විශේෂඥයින් බිහි කිරීම වැඩසටහනේ

www.studentlanka.moe.gov.lk

ප්‍රධාන කාර්යයකි. අභියෝගාත්මක වැඩ ලෝකයෙන් අපේක්ෂා කරන ඉහළ කුසලතා සහිත සේවා ස්ථාන හැකියාව සපුරාලීම සඳහා සිසුන් විසින් නව්‍ය හා පර්යේෂණ කුසලතා ලබා ගැනීමේ වැදගත්කම ද එය අවධාරණය කරයි.

BBST (ගෞරව) උපාධි වැඩසටහන වඩාත් ප්‍රයෝගික සහ පර්යේෂණ-නැඹුරු වේ. එය උසස් අධ්‍යාපන අමාත්‍යංශය (MOHE) විසින් ජාතික වශයෙන් පිළිගැනීමට ලක්ව ඇති අතර ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගෙන ඇත. ජාතික පිළිගැනීමට අමතරව, සමහර ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන දැනටමත් BBST (ගෞරව) වැඩසටහන හඳුනාගෙන ඇති අතර ණය හුවමාරු අවස්ථා ලබා දෙන අතරම සිසුන් සඳහා සීමාවාසික පුහුණුව ලබා දීමට පිළිගෙන ඇත. ගෝලීය ජීව විද්‍යාත්මක තාක්ෂණ වෙළඳපොළ ප්‍රමාණය 2022 දී ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 1.37 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය 2023 - 2030 සිට 13.96% (ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 3.88) ක සංයුක්ත වාර්ෂික වර්ධන වේගයකින් (CAGR) වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, මෙම ජෛව පද්ධති තාක්ෂණ උපාධිධාරීන් සඳහා දේශීය හා ගෝලීය රැකියා වෙළඳපොළ සම්පූර්ණයෙන්ම විවෘත බව අවධාරණය කළ යුතුය.

BBST (ගෞරව) වැඩසටහන ප්‍රධාන විශේෂතා තුනක් සපයයි, එනම්;

- කෘෂිකර්ම ජෛව තාක්‍ෂණය පිළිබඳ BBST (ගෞරව)
- කෘෂි විද්‍යාව සහ වාරිමාර්ග තාක්‍ෂණය පිළිබඳ BBST (ගෞරව)
- ජෛව සම්පත් කළමනාකරණය සහ තාක්‍ෂණය පිළිබඳ BBST (ගෞරව)

ජෛව පද්ධති තාක්‍ෂණයේ මෙම විශේෂතා තුන තිරසාර ජෛව සම්පත් සංරක්ෂණය සහ ජෛව විවිධත්ව කළමනාකරණය, කෘෂිකර්ම ජෛව පද්ධති, ජෛව තාක්‍ෂණය සහ ජාන ඉංජිනේරු සංකල්ප හඳුන්වාදීම, කාර්මික ජෛව තාක්‍ෂණ සංකල්ප සහ කාර්මික සැකසුම් යෙදීම, කෘෂි විද්‍යාව, තිරසාර වාරිමාර්ග පද්ධති, ආරක්ෂිත කෘෂිකර්මාන්තය, AI සහ විශාල දත්ත විද්‍යාව, GIS සහ දුරස්ථ සංවේදනය සහ ඩිජිටල් සහ නිරවද්‍ය කෘෂිකර්ම යෙදුම් ආදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. තවද, උපාධි වැඩසටහනට කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව, ඩිජිටල් සහ උසස් කෘෂිකර්ම යෙදුම්, බෝග සහ සත්ව නිෂ්පාදනය, ජලජ ජෛව සම්පත් කළමනාකරණය සහ තාක්ෂණයන්, ජෛව වෛද්‍ය ශාක-ඖෂධ තාක්ෂණයන්, ඖෂධීය ශාක නිෂ්පාදනය, කෘෂිකර්ම ජෛව තාක්‍ෂණය, සත්ව ජෛව තාක්‍ෂණය, ජලජ ජෛව තාක්‍ෂණය, පෝෂක ජෛව තාක්‍ෂණය, අණුක ජීව විද්‍යාවේ උසස් පිළිවෙත්, ජෛව තොරතුරු විද්‍යාව, ස්මාර්ට් කෘෂිකර්මය සහ කාර්මික යෙදුම් සඳහා ජෛව ස්කන්ධය, පැසවීම තාක්ෂණය, කෘෂි ව්‍යාපාර සහ නවෝත්පාදනය වැනි විශේෂිත ජෛව පද්ධති අධ්‍යයන ක්ෂේත්‍ර රාශියක් ඇතුළත් වේ.

ඉහත ප්‍රධාන අධ්‍යයන  ක්ෂේත්‍ර වලට අමතරව, ජෛව පද්ධති පාරිසරික ජෛව සම්පත් හඳුන්වාදීම, විද්‍යාත්මක භාවිතය, තිරසාර කළමනාකරණය සහ සංරක්ෂණය, SDG සංකල්පය සහ ආහාර සුරක්ෂිතතා වැඩිදියුණු කිරීම, පාරිසරික ජෛව තාක්‍ෂණ අධ්‍යනයන්, පාරිසරික බලපෑම් තක්සේරුව, පාරිසරික ජෛව සම්පත් නැවත භාවිතා කිරීම, ඒකාබද්ධ ජෛව පද්ධති කළමනාකරණය සහ චක්‍රලේඛ ආර්ථිකය යනාදිය හඳුන්වා දෙයි. අවසාන වසර අවසාන පර්යේෂණ
ව්‍යාපෘතිය සිසුන්ට නව්‍ය හා පර්යේෂණ කුසලතා සහ නිර්මාණශීලිත්වය, ගැටළු විසඳීමේ කුසලතා සහ බුද්ධිමය ස්වාධීනත්වය වර්ධනය කිරීමට, සන්නිවේදන කුසලතා වැඩිදියුණු කිරීමට, රැකියා ස්ථානයේ කුසලතා ලබා ගනිමින් අදහස් ඉදිරිපත් කිරීමට සහ ප්‍රකාශයට පත් කිරීමට අවස්ථා සොයා ගැනීමට උපකාරී වේ.

www.studentloans.mohe.gov.lk

| කෘෂිකර්ම ජෛව තාක්‍ෂණ | කෘෂි විද්‍යාව සහ වාරිමාර්ග තාක්‍ෂණය | ජෛව සම්පත් කළමනාකරණය සහ තාක්‍ෂණය |
|---|---|---|
| ක්ෂුද්‍රජීව විද්‍යාඥ | කෘෂි විද්‍යාඥ | ජෛව විවිධත්ව විද්‍යාඥ |
| ජෛව රසායන විද්‍යාඥ | වාරිමාර්ග විශේෂඥ | තිරසාර කෘෂි. සංවර්ධක |
| පර්යේෂණ සහකාර | කෘෂි. ඉංජිනේරු | පරිසර සහ ජෛව සම්පත් කළමනාකරණ විශේෂඥ |
| කෘෂිකාර්මික. උපදේශක | ආහාර තාක්ෂණවේදියා | කලාපීය සම්පත් සංවර්ධන විශේෂඥ |
| ආහාර ජෛව තාක්‍ෂණ විද්‍යාඥ | කෘෂි රසායන විද්‍යාඥ | සම්පත් සංරක්ෂණ විද්‍යාඥ |
| ඖෂධීය ජෛව තාක්‍ෂණ විද්‍යාඥ | ශාක අභිජනනය සහ බීජ නිෂ්පාදන තාක්ෂණවේදියා | ජෛව සම්පත් කළමනාකරු සහ සංවර්ධන පර්යේෂකයා |
| ආහාර ක්ෂුද්‍රජීව විද්‍යාඥ | කෘෂිකර්ම. ක්ෂුද්‍රජීව විද්‍යාඥ | |
| ජාන විද්‍යා තාක්ෂණවේදියා | ගොවිපල කළමනාකරු | |
| ක්‍රියාවලි සංවර්ධන විද්‍යාඥ | ජල සම්පත් කළමනාකරණ විශේෂඥ/ තාක්ෂණවේදියා | |
| ව්‍යාපාර සංවර්ධන කළමනාකරු | තිරසාරභාවය කෘෂි. සංවර්ධක | |
| රසායනාගාර විශේෂඥ | සත්ව ගොවිපල විශේෂඥ | |
| ජෛව වෛද්‍ය විද්‍යාඥ | පශ්චාත් අස්වනු තාක්ෂණවේදියා | |
| සමුද්‍ර ජෛව තාක්ෂණවේදියා | කෘෂිකර්ම. පර්යේෂකයා | |
| ශාක අභිජනන විද්‍යාඥ | ව්‍යාප්ති විශේෂඥ | |
| බීජ නිෂ්පාදන තාක්ෂණවේදියා | | |
| ජෛව තාක්ෂණවේදියා | | |

## 5.7 KIU කැම්පස් (පුද්ගලික) සමාගම විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්

### 1. <u>කටු චිකිත්සාව පිළිබඳ වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය</u>

2016 වසරේ ආරම්භ වූ මෙම අධ්‍යයන සම්භාර 120 උපාධි වැඩසටහන වෘත්තීය නායකත්වය කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇති අතර අඛණ්ඩ අධ්‍යාපන පාඨමාලා, මූලික සහ හැසිරීම් විද්‍යාවන්ගෙන් සහාය පාඨමාලා, කටු චිකිත්සාව පිළිබඳ මූලික පාඨමාලා සහ කටු චිකිත්සාව පිළිබඳ සායනික පුහුණුව ඇතුළත් වේ. විකිරණශීලී, ජෛව රසායනික සහ රක්තපාත පරීක්ෂණ අර්ථ නිරූපණය කිරීමේ හැකියාව ඇතුළුව විවිධ වෛද්‍ය, ශල්‍ය, ළමා, මනෝචිකිත්සක සහ නාරිවේද තත්වයන් සිසුන්ට උගන්වනු ලැබේ. අවසාන වසරේදී, සිසුන් කටු චිකිත්සාව පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කරයි. තුන්වන වසරේ සිට KIU සායනික පුහුණු මධ්‍යස්ථානයේ කටු චිකිත්සාව



www.studentloans.mohe.gov.lk

පිළිබඳ කුසලතා වැඩි දියුණු කිරීමට සිසුන්ට සහාය වන අතර, මෙම ක්ෂේත්‍රයේ කැපවූ වෘත්තිකයන්ගේ උපදේශකත්වය ලබා දෙනු ඇත. උපාධි වැඩසටහන සාර්ථකව නිම කිරීමෙන් පසු, කටු චිකිත්සක වෘත්තිකයන් ලෙස ජාත්‍යන්තර රැකියා වෙළඳපොලේ නව අවස්ථා සඳහා අවශ්‍ය අධ්‍යයන සුදුසුකම් සිසුන් උපයා ගනු ඇත.

## 2. ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

KIU විසින් පිරිනමනු ලබන ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය 2016 දී හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකාවට නව්‍යතාවයක් වුවද, ජෛව වෛද්‍ය විද්‍යාව ලොව පුරා බෙහෙවින් අගය කරන උපාධි වලින් එකක් වන අතර එය බොහෝ රැකියා අවස්ථා විවෘත කරයි. ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය KIU විසින් පිරිනමනු ලබන වසර 4 ක උපාධියක් වන අතර එයට පර්යේෂණ අංගයක් සහිත අධ්‍යයන සම්භාර 120 ක් ඇතුළත් වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. මෙම උපාධිය සිසුන්ගේ විශ්ලේෂණාත්මක චින්තනය උත්තේජනය කිරීමට සහ ජෛව වෛද්‍ය විද්‍යාඥයින් ලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් ඇති කරන විද්‍යාත්මක පර්යේෂණ සඳහා ඔවුන් යොමු කිරීමට සැලසුම් කර ඇත. සෞඛ්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ දක්ෂ හා දැනුමැති විද්‍යාඥයෙකු වීමට අත්‍යවශ්‍ය සියලුම ක්ෂේත්‍ර ආවරණය කිරීම මෙම වැඩසටහන සහතික කරයි. දේශන අන්තර්ක්‍රියාකාරීව පවත්වනු ලැබේ. විභාගවලදී භාවිතා කරන විවිධ තක්සේරු ක්‍රම උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරයි. ජෛව වෛද්‍ය විද්‍යාඥ, ජෛව රසායන විද්‍යාඥ, ක්ෂුද්‍රජීව විද්‍යාඥ, වෛද්‍ය පිටපත් කරන්නා, අණුක ජීව විද්‍යාඥ, පර්යේෂණ නිලධාරීන්, තත්ත්ව පාලක, කථිකාචාර්යවරුන් ශ්‍රී ලංකාවේ ඇති රැකියා අවස්ථා කිහිපයකි.

විදේශ රටවල බොහෝ වෘත්තීය අවස්ථා ඇති අතර, ජෛව වෛද්‍ය විද්‍යාවේ සිට වෛද්‍ය විද්‍යාව දක්වා විදේශ රටවල සංක්‍රමණය වීම සඳහා උපාධි විෂය මාලාව පිළිගනු ලබන්නේ එයට ව්‍යුහ විද්‍යාව, කායික විද්‍යාව සහ ජෛව රසායන විද්‍යාව වැනි පූර්ව සායනික විෂයයන් මෙන්ම ඖෂධවේදය, පරපෝෂිත විද්‍යාව, ක්ෂුද්‍රජීව විද්‍යාව, අණුක ජීව විද්‍යාව, රක්තවේදය, රුධිර පාරවිලයන වෛද්‍ය විද්‍යාව සහ ව්‍යාධි විද්‍යාව වැනි පැරා-සායනික විෂයයන් ද ඇතුළත් වන බැවිනි. පර්යේෂණ ක්‍රමවේදයට සහාය වීම සඳහා, ජෛව සංඛ්‍යාලේඛන සහ වසංගත රෝග විද්‍යාව වැනි පර්යේෂණ අධ්‍යයන මොඩියුල ද ඇතුළත් වේ. උපාධිය ලැබීමට පෙර අත්දැකීම් ලබා ගැනීම සඳහා, සිසුන් KIU පිරිනමන අමතර ප්‍රතිලාභයක් වන පුහුණු වැඩසටහනකට ඇතුළත් කරනු ලැබේ. අවසාන වසරේදී සිසුන්ට සීමාවාසික අවස්ථා සඳහා ද මඟ පෙන්වනු ලැබේ.

www.studentloans.mohe.gov.lk

## 3. මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

KIU විසින් 2016 දී ආරම්භ කළ මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, මනෝවිද්‍යාව සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල විවිධ වෘත්තීන් සඳහා සිසුන් සූදානම් කිරීම සඳහා නිර්මාණය කර ඇති වසර 4 ක පුළුල් වැඩසටහනකි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන මෙම අධ්‍යයන සම්භාර 120 උපාධියට ශක්තිමත් පර්යේෂණ අවධානයක් සහ ප්‍රායෝගික පුහුණුවක්, විවේචනාත්මක චින්තනය පෝෂණය කිරීම සහ සැබෑ ලෝකයේ අභියෝග සඳහා මනෝවිද්‍යාත්මක මූලධර්ම යෙදීම ඇතුළත් වේ.

මනෝවිද්‍යාවේ මූලික ක්ෂේත්‍ර, මනෝවිද්‍යාවේ හැඳින්වීම සහ ඉතිහාසය, හැසිරීම් වල ජීව විද්‍යාත්මක පදනම්, සංවර්ධන මනෝවිද්‍යාව, අසාමාන්‍ය මනෝවිද්‍යාව, සමාජ මනෝවිද්‍යාව, සංජානන මනෝවිද්‍යාව සහ උපදේශන මනෝවිද්‍යාව යන විෂය මාලාවන් මෙම විෂය මාලාවට ඇතුළත් වේ. ඊට අමතරව, සායනික මනෝවිද්‍යාව, ස්නායු මනෝවිද්‍යාව, අධිකරණ මනෝවිද්‍යාව, ක්‍රීඩා මනෝවිද්‍යාව, මනෝ සමාජීය වැඩ, සෞඛ්‍ය මනෝවිද්‍යාව, අධ්‍යාපනික මනෝවිද්‍යාව සහ කාර්මික හා සංවිධානාත්මක මනෝවිද්‍යාව වැනි විශේෂිත මොඩියුල මඟින් සිසුන්ට විෂය තුළ න්‍යායාත්මක රාමු සහ ව්‍යවහාරික භාවිතයන් යන දෙකටම පුළුල් නිරාවරණයක් ලබා දේ. පර්යේෂණ ක්‍රමවේදය, මනෝමිතික විද්‍යාව සහ සංඛ්‍යාලේඛන ඇතුළු ක්‍රමවේද සංරචක, විද්‍යාත්මක පර්යේෂණ සහ දත්ත විශ්ලේෂණය සඳහා අවශ්‍ය අත්‍යවශ්‍ය කුසලතා සිසුන්ට ලබා දෙයි. මෙම වැඩසටහනට අවසාන වසරේ පර්යේෂණ ව්‍යාපෘතියක් තවදුරටත් ඇතුළත් වන අතර, එමඟින් සිසුන්ට ස්වාධීන ආනුභවික විමර්ශනයක නිරත වීමට සහ පුළුල් මනෝවිද්‍යාත්මක දැනුමට දායක වීමට හැකියාව ලැබේ. එපමණක් නොව, අනිවාර්ය වෘත්තීය පුහුණුව ඇතුළත් කිරීම ප්‍රායෝගික ක්ෂේත්‍ර අත්දැකීම් සහතික කරයි, එමඟින් වෘත්තීය නිපුණතා වැඩි දියුණු කිරීම සහ මනෝවිද්‍යාත්මක සහ ඒ ආශ්‍රිත සැකසුම් තුළ විවිධ භූමිකාවන් සඳහා උපාධිධාරීන් සූදානම් කිරීම.

අන්තර්ක්‍රියාකාරී දේශන, සිද්ධි අධ්‍යයන, භූමිකා රංගනයන්, ප්‍රායෝගික පුහුණු සැසි සහ කණ්ඩායම් සාකච්ඡා ආකර්ශනීය හා පරිවර්තනීය ඉගෙනුම් අත්දැකීමක් පෝෂණය කරයි. පැවරුම්, ඉදිරිපත් කිරීම් සහ ලිඛිත විභාග ඇතුළු විවිධ තක්සේරු ක්‍රම අධ්‍යයන දැඩි බව සහතික කරන අතර විවේචනාත්මක චින්තනය සහ වෘත්තීය නිපුණතාවය අඛණ්ඩව වර්ධනය කිරීමට සහාය වේ. තවද, සායනික, අධ්‍යාපනික සහ සංවිධානාත්මක සැකසුම් තුළ ව්‍යුහගත සීමාවාසික වැඩසටහන් සිසුන්ට ප්‍රායෝගික ක්ෂේත්‍ර නිරාවරණයක් ලබා දෙන අතර, උපාධිය ලැබීමට පෙර සැබෑ ලෝක සන්දර්භයන් තුළ න්‍යායාත්මක දැනුම යෙදවීමට ඔවුන්ට හැකියාව ලබා දෙයි.



www.studentloans.mohe.gov.lk

මෙම වැඩසටහනේ උපාධිධාරීන් සායනික මනෝවිද්‍යාඥයින්, උපදේශකයින්, පර්යේෂකයින්, අධිකරණ වෛද්‍ය මනෝවිද්‍යාඥයින්, අධ්‍යාපනික මනෝවිද්‍යාඥයින්, කථිකාචාර්යවරුන් සහ මනෝවිද්‍යාව ආශ්‍රිත අනෙකුත් ක්ෂේත්‍රවල වෘත්තිකයන් ලෙස වෘත්තීන් හැදෑරීමට සුදුසු ස්ථානයක සිටිති. මෙම උපාධිය මනෝවිද්‍යාව සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

KIU හි මනෝවිද්‍යාව පිළිබඳ (ගෞරව) උපාධිය උපාධිධාරීන් අධ්‍යයනමය වශයෙන් ප්‍රවීණයන් පමණක් නොව, දේශීය හා ජාත්‍යන්තර සන්දර්භයන් දෙකෙහිම සදාචාරාත්මක, පරාවර්තක සහ දක්ෂ වෘත්තිකයන් ලෙස විශිෂ්ටත්වය දැක්වීමට අවශ්‍ය අන්තර් පුද්ගල නිපුණතා සහ වෘත්තීය කුසලතා වලින් ද සන්නද්ධ බව සහතික කරයි.

## 4. <u>මානව සම්පත් කළමනාකරණ ගෞරව උපාධිය</u>

KIU හි මානව සම්පත් කළමනාකරණ උපාධිය (ගෞරව) යනු මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය දැක්වීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ නිපුණතා වලින් සිසුන් සන්නද්ධ කිරීම සඳහා නිර්මාණය කර ඇති සිව් අවුරුදු පුළුල් උපාධි වැඩසටහනකි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා දෙන මෙම වැඩසටහනට අධ්‍යයන සම්භාර 120 ක් ඇතුළත් වන අතර පැය 500 ක වෘත්තීය පුහුණුවක් ලබා දෙන අතර එමඟින් සිසුන්ට අත්‍යවශ්‍ය ප්‍රායෝගික අත්දැකීම් සහ කර්මාන්ත නිරාවරණය ලබා දේ. මෙම උපාධිය දේශීය හා ගෝලීය මානව සම්පත් භාවිතයන් දෙකෙහිම ශක්තිමත් පදනමක් ලබා දෙන අතර ලොව පුරා විවිධ කර්මාන්ත හරහා විවිධ මානව සම්පත් භූමිකාවන්හි සැරිසැරීමට සහ නායකත්වය දීමට උපාධිධාරීන් සූදානම් කරයි.

මානව සම්පත් කළමනාකරණ ගෞරව උපාධිය සඳහා වන විෂය මාලාව ආයතනික හැසිරීම, වාණිජ හා කාර්මික නීතිය, වැඩ මනෝවිද්‍යාව සහ උපදේශනය, කාර්ය සාධන කළමනාකරණය, වන්දි කළමනාකරණය, පුහුණුව සහ සංවර්ධනය, ජාත්‍යන්තර මානව සම්පත් කළමනාකරණය, සේවක සබඳතා සහ උපායමාර්ගික මානව සම්පත් කළමනාකරණය ඇතුළු පුළුල් පරාසයක විෂයයන් ඇතුළත් වේ. මීට අමතරව, මෙම වැඩසටහන මානව සම්පත් විශ්ලේෂණ සහ අතථ්‍ය සේවා ස්ථාන කළමනාකරණය වැනි සමකාලීන ක්ෂේත්‍ර ආවරණය කරන අතර එමඟින් සිසුන්ට වෙළඳපල ප්‍රවණතා සහ තාක්ෂණ සංවර්ධනය පිළිබඳ වත්මන් දැනුම ලබා දේ.

මානව සම්පත් කළමනාකරණ ගෞරව උපාධිධාරීන්ට මානව සම්පත් කළමනාකරුවන්, මානව සම්පත් විශ්ලේෂකයින්, කුසලතා අත්පත් කර ගැනීමේ විශේෂඥයින්, සේවක සම්බන්ධතා කළමනාකරුවන් සහ වන්දි විශ්ලේෂකයින් වැනි භූමිකාවන් ඇතුළු බොහෝ වෘත්තීය අවස්ථා වෙත

www.studentloans.mohe.gov.lk

ප්‍රවේශ විය හැකිය. න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික කුසලතා යන දෙකෙහිම ශක්තිමත් පදනමක් ඇතිව, බහුජාතික සමාගම්, මානව සම්පත් උපදේශන ආයතන, රජයේ ආයතන සහ ලාභ නොලබන සංවිධානවල වෘත්තීන් හැදෑරීමට ඔවුන් හොඳින් සූදානම් ය.

ආයතනික සාර්ථකත්වය සඳහා මානව ප්‍රාග්ධනයේ වැඩිවන වැදගත්කම දක්ෂ මානව සම්පත් වෘත්තිකයන් සඳහා ඇති ඉල්ලුම ඉහළ නංවා ඇති අතර, මෙම උපාධිය ආරක්ෂිත සහ ප්‍රතිලාභදායක වෘත්තියකට දොරටුවක් බවට පත් කර ඇත. සිසුන්ට වටිනා නිදහස් කිරීම්, ශිෂ්‍යත්ව සහ කර්මාන්තය විසින් පිළිගත් සුදුසුකම් ලබා දීම සඳහා KIU විශ්ව විද්‍යාලය කර්මාන්ත නායකයින් සහ වරලත් පුද්ගල කළමනාකරණ ආයතනය (CIPM) වැනි වෘත්තීය ආයතන සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ඇති කර ගෙන ඇත. මෙම සහයෝගීතාවයන් KIU උපාධිධාරීන් දේශීයව සහ ගෝලීය වශයෙන් තරඟකාරී මානව සම්පත් භූ දර්ශනය තුළ විශිෂ්ටත්වය දැක්වීමට හොඳින් ස්ථානගත වී ඇති බව සහතික කරයි.

## 5. අලෙවිකරණය පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධිය

වර්තමානයේ පවතින ගතික ව්‍යාපාරික පරිසරය තුළ, අලෙවිකරණ ක්ෂේත්‍රය නවෝත්පාදනය, පාරිභෝගික සහභාගීත්වය සහ ආයතනික සාර්ථකත්වය මෙහෙයවීමේදී ඉදිරියෙන්ම සිටී. අලෙවිකරණය පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධි වැඩසටහනක් හැදෑරීමෙන් සිසුන්ට අලෙවිකරණ මූලධර්ම, උපාය මාර්ග, භාවිතයන් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙන අතර කර්මාන්ත හරහා විවිධ අලෙවිකරණ භූමිකාවන්හි විශිෂ්ටත්වය දැක්වීමට සිසුන් සූදානම් කරයි. මෙම උපාධි වැඩසටහන න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික කුසලතා පිළිබඳ පුළුල් සම්මිශ්‍රණයක් ලබා දෙන අතර, විවිධ ප්‍රේක්ෂකයින් සමඟ අනුනාද වන බලගතු අලෙවිකරණ උපාය මාර්ග නිර්මාණය කිරීමට උපාධිධාරීන්ට බලය ලබා දෙයි. ව්‍යාපාර වැඩි වැඩියෙන් දත්ත මත පදනම් වූ තීක්ෂ්ණ බුද්ධිය සහ ඩිජිටල් අලෙවිකරණ උපක්‍රම මත රඳා පවතින බැවින්, අලෙවිකරණය පිළිබඳ විශේෂිත උපාධියක් තරඟකාරී වාසියක් ලබා දෙන අතර, සාම්ප්‍රදායික අලෙවිකරණයේ සිට ඩිජිටල් අලෙවිකරණය දක්වා භූමිකාවන්හි විශිෂ්ටත්වය දැක්වීමට සහ ගෝලීය ව්‍යාපාරයේ අනාගතය හැඩගැස්වීමට සිසුන් සූදානම් කරයි.

ශක්තිමත් කර්මාන්ත සම්බන්ධතා සහ හවුල්කාරිත්වයන් සමඟින්, KIU සිසුන්ට වෘත්තීය සංවර්ධනය සඳහා වටිනා අවස්ථා ලබා දෙයි, ඒවාට උපදේශක වැඩසටහන්, ජීව දත්ත ගොඩනැගීමේ වැඩමුළු සහ රැකියා ස්ථානගත කිරීමේ සහාය ඇතුළත් වේ. උපාධි වැඩසටහනේ

www.studentloans.mohe.gov.lk

විෂය මාලාව පාරිභෝගික හැසිරීම, ඩිජිටල් අලෙවිකරණය, වෙළඳ නාම කළමනාකරණය, වෙළඳපල පර්යේෂණ, වෙළඳ දැන්වීම්, උපායමාර්ගික අලෙවිකරණය, සේවා අලෙවිකරණය සහ සැපයුම් දාම කළමනාකරණය වැනි අත්‍යවශ්‍ය මාතෘකා ආවරණය කරමින් න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික භාවිතය යන දෙකම ලබා දෙයි. ගෝලීය අලෙවිකරණ ප්‍රවණතා, උපායමාර්ගික අලෙවිකරණ කළමනාකරණය සහ අලෙවිකරණයේ ආචාර ධර්ම සහ තිරසාරභාවය පිළිබඳ කාර්යභාරය පිළිබඳ අවබෝධයක් ද සිසුන් ලබා ගනී. ඊට අමතරව, අපගේ උපාධිධාරීන් පැය 500 ක වෘත්තීය පුහුණුවකට සහභාගී වේ. අපගේ උපාධි වැඩසටහන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර අධ්‍යයන සම්භාර 120 ක් ආවරණය කරයි. වැඩසටහනේ විශිෂ්ටත්වය සහ ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වීම පිළිගැනීමක් ලෙස, අපි ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ (SLIM) කීර්තිමත් වෘත්තීය ආයතනයක් සමඟ අවබෝධතා ගිවිසුමක් (MOU) ස්ථාපිත කළෙමු. SLIM අවබෝධතා ගිවිසුම් හරහා, සිසුන්ට නිශ්චිත විෂයයන් සඳහා නිදහස් කිරීම් වලින් ප්‍රතිලාභ ලබා ගත හැකි අතර, එමඟින් ඔවුන්ට SLIM සුදුසුකම් වඩාත් කාර්යක්ෂමව ලබා ගැනීමට හැකි වේ.

## 6. ගිණුම්කරණය පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධිය

KIU හි ගිණුම්කරණය පිළිබඳ කළමනාකරණ උපාධිය (ගෞරව) යනු ගිණුම්කරණය සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ගතික වෘත්තීන් සඳහා සිසුන් සූදානම් කිරීම අරමුණු කරගත් දැඩි සිව් අවුරුදු වැඩසටහනකි. මෙම වැඩසටහන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර අධ්‍යයන සම්භාර 120 ක් ආවරණය කරයි. එපමණක් නොව, උපාධි වැඩසටහනේ අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස, කර්මාන්ත නිරාවරණය ලබා ගැනීම සඳහා සිසුන්ට පැය 500 ක වෘත්තීය පුහුණුවක් ආවරණය කිරීමට හිමිකම් ඇත. මෙය තීරණාත්මක ගිණුම්කරණ දැනුම සහ කුසලතා ලබා දීම සඳහා නිර්මාණය කර ඇති ශක්තිමත් අධ්‍යයන වැඩසටහනක් වන අතර එමඟින් සිසුන්ට වේගයෙන් විකාශනය වන ගෝලීය ව්‍යාපාරික පරිසරය තුළ විශිෂ්ටත්වය අත්කර ගැනීමට හැකි වේ. මෙම උපාධිය මූල්‍ය හා ගිණුම්කරණය පිළිබඳ ශක්තිමත් පදනමක් ලබා දෙන අතර, ලොව පුරා විවිධ ගිණුම්කරණ සහ මූල්‍ය කර්මාන්තවල සැරිසැරීමට සහ නායකත්වය දීමට උපාධිධාරීන් සූදානම් කරයි. මෙම වැඩසටහන ගිණුම්කරණ උපාධි වැඩසටහන් සඳහා ගෝලීය මිණුම් සලකුණු වලට අනුකූලව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල පුරා සමාන උපාධි වැඩසටහන් වල අධ්‍යාපන ප්‍රමිතීන්ට අනුකූල වේ.

ගිණුම්කරණය පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධිය සඳහා වන විෂය මාලාව ගිණුම්කරණයේ සහ මූල්‍ය කළමනාකරණයේ මූලික අංශ ආවරණය වන පුළුල් පරාසයක විෂයයන් ආවරණය කරයි. ගිණුම්කරණය පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධිධාරීන්ට දේශීය හා ගෝලීය ව්‍යාපාරික

පරිසරයන්හි පුළුල් පරාසයක වෘත්තීය අවස්ථා සඳහා ප්‍රවේශය ඇත. මූල්‍ය විශ්ලේෂකයින්, විගණකවරුන්, බදු උපදේශකයින් සහ කළමනාකරණ ගණකාධිකාරීවරුන් වැනි භූමිකාවන්හි විශිෂ්ටත්වය දැක්වීමට ඔවුන් හොඳින් සන්නද්ධ වී සිටිති. මූල්‍ය වාර්තාකරණය, ආයතනික පාලනය, අධිකරණ වෛද්‍ය ගිණුම්කරණය, මූල්‍ය ආකෘති නිර්මාණය, පරිගණක පාදක ගිණුම්කරණය යන ක්ෂේත්‍රවල ශක්තිමත් පදනමක් ඇතිව, ගිණුම්කරණ මෘදුකාංග සහ ඩිජිටල් මූල්‍ය මෙවලම් සහ ආයෝජන විශ්ලේෂණයන්හි කුසලතා ඇති සිසුන් සන්නද්ධ කරන ඔවුන්ට රාජ්‍ය ගිණුම්කරණ සමාගම්, බහුජාතික සමාගම්, මූල්‍ය ආයතන සහ රජයේ ආයතනවල වෘත්තීන් හැදෑරීමට හැකිය. වැඩිවන නියාමන අවශ්‍යතා සහ නිවැරදි මූල්‍ය තොරතුරු සඳහා ඇති අවශ්‍යතාවය මගින් දක්ෂ ගණකාධිකාරීවරුන් සඳහා ඇති ඉල්ලුම අඛණ්ඩව වර්ධනය වන අතර, මෙම උපාධිය ආරක්ෂිත සහ සමෘද්ධිමත් වෘත්තීය මාර්ගයකට දොරටුවක් බවට පත් කරයි. වැඩසටහනේ විශිෂ්ටත්වය සහ ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වීම පිළිගැනීමක් ලෙස, KIU ACCA, CIMA සහ PW Holdings වැනි කීර්තිමත් වෘත්තීය ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් (MOU) ස්ථාපිත කර ඇත. ACCA, CIMA සහ PW Holdings අවබෝධතා ගිවිසුම් හරහා, සිසුන්ට නිශ්චිත විෂයයන් සඳහා නිදහස් කිරීම් වලින් ප්‍රතිලාභ ලබා ගත හැකි අතර, එමඟින් ඔවුන්ට වෘත්තීය සුදුසුකම් වඩාත් කාර්යක්ෂමව ලබා ගැනීමට හැකි වේ.

7. <u>මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය</u>

**මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මෙම වසර 04ක විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහනේ අරමුණ වන්නේ මෘදුකාංග ඉංජිනේරු මූලධර්ම පිළිබඳව සිසුන්ට ඉගැන්වීම සහ මෘදුකාංග සහ මෘදුකාංග පද්ධති විශ්ලේෂණය කිරීමට, සැලසුම් කිරීමට, සංවර්ධනය කිරීමට සහ නඩත්තු කිරීමට ඔවුන් සූදානම් කිරීමයි. පරිගණක මෘදුකාංග ඉංජිනේරු විෂය මාලාව ප්‍රධාන වශයෙන් මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව කෙරෙහි අවධානය යොමු කර ඇතත්, එය ව්‍යාපාරික සංරචක කෙරෙහි ද සැලකිය යුතු අවධානයක් යොමු කරයි.**

**මෙම උපාධි වැඩසටහන අනුගමනය කරන සිසුන් කොටස්කරුවන් විසින් අපේක්ෂා කරන ඉහළ ප්‍රමිතීන්ට අනුකූල වන සහ නිශ්චිත කාල සීමාවක් තුළ ලබා දෙන පරිගණක මෘදුකාංග ගොඩනඟා නඩත්තු කරන්නේ කෙසේදැයි ඉගෙන ගනු ඇත. සිසුන් තුළ ගැටළු විසඳීමේ හැකියාවන් සහ කුසලතා වර්ධනය කිරීම මෙම උපාධි වැඩසටහනේ ප්‍රධාන අංග වේ. මෘදුකාංග ව්‍යාපෘතිවල නිරත වීමෙන් ඔවුන්ගේ පාඨමාලා මොඩියුලවල ඉගෙන ගත් සංකල්ප යෙදීමෙන් ඔවුන් සැබෑ මෘදුකාංග පද්ධති සහ ගැටළු ආමන්ත්‍රණය කරනු ඇත. මෙම ගතික උපාධිය සිසුන්ගේ ගැටළු විසඳීමේ**



www.studentloans.mohe.gov.lk

හැකියාවන් ශක්තිමත් කරන අතර විශ්ලේෂණාත්මක හා තාක්ෂණික කුසලතා මුවහත් කරනු ඇත. පාඨමාලාව අතරතුර ශිෂ්‍යයා වර්ධනය කරන වෙනත් ක්ෂේත්‍ර වලට යොදාගත හැකි කුසලතා අතර තාර්කික සහ විවේචනාත්මක චින්තනය, ක්‍රමලේඛන සහ මෘදුකාංග සංවර්ධන කුසලතා, දත්ත විශ්ලේෂණය සහ ගැටළු ආකෘති නිර්මාණය, ඵලදායී සන්නිවේදනය සහ කණ්ඩායම් වැඩ, ව්‍යාපෘති සැලසුම් කිරීම සහ කාල කළමනාකරණය, ස්වාධීන පර්යේෂණ සහ නවෝත්පාදන ඇතුළත් වේ.

**සීමාවාසික අවස්ථා:** 3 වන අධ්‍යයන වර්ෂයේ 2 වන අධ්‍යයන වාරයේ ආරම්භයේදී, පැය 900 කට නොඅඩු සීමාවාසික පුහුණුවක් සඳහා මාස 6 සිට වසර 1 දක්වා සීමාවාසික කාලයක් සම්පූර්ණ කිරීම සඳහා සිසුන් මුදා හරිනු ලැබේ. මෙම කාල පරිච්ඡේදය තුළ ශිෂ්‍යයා තාක්‍ෂණ සමාගම් තුළ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවෙකුගේ/කළමනාකරුවෙකුගේ අධීක්ෂණය යටතේ සෘජුවම කටයුතු කරන අතර නිතිපතා KIU සම්බන්ධීකාරකවරයෙකු හමුවී ශිෂ්‍යයාගේ වාර්තා පොත සමාලෝචනය කරනු ඇත. කාර්මික සීමාවාසික පුහුණුව හෝ වැඩ පදනම් කරගත් ව්‍යවසාය ස්ථානගත කිරීම සඳහා අධ්‍යයන සම්භාර 9 ක් හිමි වේ.

**වෘත්තීය අපේක්ෂාවන්:**

අපගේ උපාධිධාරීන්ගෙන් සමහරක් ඔවුන්ට විවෘතව ඇති විශේෂඥ අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගනී. ඔවුන් වෘත්තීන් තෝරා ගන්නේ:

- මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව සහ සංවර්ධනය
- දත්ත විද්‍යාව, කෘතිම බුද්ධිය සහ යන්ත්‍ර ඉගෙනීම
- පද්ධති සහ ජාල පරිපාලනය
- සයිබර් ආරක්ෂාව සහ තොරතුරු ආරක්ෂක භූමිකාවන්
- විශ්වවිද්‍යාලවල පර්යේෂණ සහ ඉගැන්වීම (වැඩිදුර අධ්‍යයනයෙන් පසුව)

අනෙකුත් උපාධිධාරීන් වෘත්තීන් සඳහා යාමට තෝරා ගන්නේ:

- මූල්‍ය සහ බැංකු කර්මාන්තය
- තොරතුරු තාක්ෂණ උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණය
- රජයේ සහ සිවිල් සේවා භූමිකාවන්
- ව්‍යාපාර විශ්ලේෂණය සහ කර්මාන්ත පාදක තාක්ෂණික විසඳුම්

www.studentloans.mohe.gov.lk

• ව්‍යවසායකත්වය සහ තාක්ෂණික ආරම්භක ව්‍යාපාර

8. පරිගණක ජාල සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

**දළ විශ්ලේෂණය**

KIU හි පරිගණක ජාල සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ වසර 04 ක BSc (ගෞරව) වැඩසටහන මගින් සිසුන්ට ජාල යටිතල පහසුකම්, සයිබර් ආරක්ෂණ මූලධර්ම සහ අවදානම් කළමනාකරණ උපාය මාර්ග පිළිබඳ ගැඹුරු දැනුමක් ලබා දේ. විෂය මාලාවට ජාල වින්‍යාසය, විනිවිද යාම පරීක්ෂා කිරීම, ගුප්ත ලේඛන විද්‍යාව සහ සයිබර් ආරක්ෂක යාන්ත්‍රණයන් පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ඇතුළත් වේ.

ශිෂ්‍යයා රැහැන් සහිත සහ රැහැන් රහිත ජාල දෙකම අධ්‍යයනය කරන අතර ඒ සමගම සර්වසම්පූර්ණ පරිගණකකරණය පිළිබඳ අගය කිරීමක් වර්ධනය කරනු ඇත. මෙම පාඨමාලාව සිසුන්ට ගැටළු විසඳීම, විශ්ලේෂණය සහ සැලසුම් කිරීම මෙන්ම තාක්ෂණිකව සම්බන්ධ වන විෂයයක් තුළ කළමනාකරණය පිළිබඳ කුසලතා වර්ධනය කිරීමට අවස්ථාවක් ලබා දෙයි. මෙම විශේෂඥ උපාධිය සිසුන්ගේ තාක්ෂණික විශේෂඥතාව ශක්තිමත් කරන අතර විශ්ලේෂණාත්මක චින්තනය තියුණු කරයි. පාඨමාලාව තුළ ශිෂ්‍යයා වර්ධනය කරන වෙනත් ක්ෂේත්‍ර වලට යොදාගත හැකි කුසලතා අතර ගැටළු විසඳීම සහ විවේචනාත්මක ඇගයීම, උසස් ජාලකරණය, සයිබර් ආරක්ෂණ ශිල්පීය ක්‍රම සහ නීතිමය පරිසරය, සංකීර්ණ තාක්ෂණික අදහස් පැහැදිලිව හා ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම, ව්‍යාපෘති සැලසුම් කිරීම, සංවිධානය සහ කාල කළමනාකරණය, කණ්ඩායම් වැඩ සහ සහයෝගී ගැටළු විසඳීම, ස්වාධීන පර්යේෂණ සහ නවෝත්පාදන කුසලතා ඇතුළත් වේ. මෙම වැඩසටහනට වසරක ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘතියක් ද ඇතුළත් වේ.

**සීමාවාසික අවස්ථා:** 3 වන අධ්‍යයන වර්ෂයේ 2 වන අධ්‍යයන වාරයේ ආරම්භයේදී, පැය 900 කට නොඅඩු සීමාවාසික පුහුණුවක් සඳහා මාස 6 සිට වසර 1 දක්වා සීමාවාසික කාලයක් සම්පූර්ණ කිරීම සඳහා සිසුන් මුදා හරිනු ලැබේ. මෙම කාල පරිච්ඡේදය තුළ ශිෂ්‍යයා තාක්ෂණ සමාගම් තුළ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවෙකුගේ/කළමනාකරුවෙකුගේ අධීක්ෂණය යටතේ සෘජුවම කටයුතු කරන අතර නිතිපතා KIU සම්බන්ධීකාරකවරයෙකු හමුවී ශිෂ්‍යයාගේ වාර්තා පොත සමාලෝචනය කරනු ඇත. කාර්මික සීමාවාසික පුහුණුව හෝ වැඩ පදනම් කරගත් ව්‍යවසාය ස්ථානගත කිරීම සඳහා අධ්‍යයන සම්භාර 9 ක් හිමි වේ.

www.studentloans.mohe.gov.lk

**වෘත්තීය අපේක්ෂාවන්:** පරිගණක ජාල සහ සයිබර් ආරක්ෂණ උපාධිධාරීන්ට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විවිධ වෘත්තීය අවස්ථා තිබේ. ජාල නිර්මාණය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සහ තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ අධිකරණ වෛද්‍ය විද්‍යාව යන ක්ෂේත්‍ර මෙයට ඇතුළත් වේ. මෙම අධ්‍යයන ක්ෂේත්‍රයේ දැනුමේ ගැඹුර කොටස්කරුවන්ට වැඩි වැඩියෙන් ආකර්ශනීය වන අතර ජාල වෘත්තිකයන්, පද්ධති පරිපාලකයින් සහ සයිබර් ආරක්ෂණ විශේෂඥයින් ලෙස පමණක් නොව තොරතුරු ආරක්ෂණ උපදේශනය, රජය සහ ආරක්ෂක ආශ්‍රිත තාක්‍ෂණ භූමිකාවන්, බැංකු හා මූල්‍ය තාක්‍ෂණ ආරක්ෂාව, මෘදුකාංග සහ පද්ධති සංවර්ධනය, ව්‍යාපෘති කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණ උපදේශනය, තාක්‍ෂණ හා සයිබර් ආරක්ෂණ අංශයේ ව්‍යවසායකත්වය ඇතුළු තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ පුළුල් ක්ෂේත්‍රවල වෘත්තීන් කරා යොමු කරයි.

## 9. කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

**දළ විශ්ලේෂණය**

කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) පිළිබඳ මෙම වසර 04ක විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහන තොරතුරු පද්ධතිවල හැසිරීම් විද්‍යාව සහ තාක්ෂණික අංග කෙරෙහි අවධානය යොමු කරයි. කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහනේ පාඨමාලා හැදෑරීම තුළින් සිසුන් සමකාලීන ජීවිතයේ ඓතිහාසික හා විද්‍යාත්මක සන්දර්භයන් පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා අතර විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර ගවේෂණය කරයි. තොරතුරු කර්මාන්ත වර්ණාවලිය ආවරණය වන පාඨමාලා හරහා ඔවුන් ගැඹුරු දැනුමක් ලබා ගනී. ඔවුන් තොරතුරු භාවිතා කරන්නන්ගේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරයි, විවිධ ආකාරයේ කළමනාකරණ කුසලතා සමඟ මිශ්‍ර වූ තොරතුරු මෙන්ම තාක්ෂණයේ වටිනාකම ඉගෙන ගන්නා අතර කොටස්කරුවන්ට අවශ්‍ය නම්‍යශීලී සහ ඉතා පහසුවෙන් ගෙන යා හැකි කුසලතා සමූහයක් වර්ධනය කරයි.

කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිධාරීන්ට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විවිධ වෘත්තීය අවස්ථා තිබේ. උපාධිධාරීන්ට සාමාන්‍ය සිට විශේෂිත දක්වා පරාසයක තොරතුරු කළමනාකරණ සහ තාක්ෂණික භූමිකාවන්හි වැඩ කිරීමට සුදුසුකම් ලැබෙනු ඇත. විභව වෘත්තීය අවස්ථා අතරට තොරතුරු පද්ධති කළමනාකරු, පරිගණක පරිශීලක සහාය

www.studentloans.mohe.gov.lk

විශේෂඥ, ප්‍රධාන තොරතුරු නිලධාරී, ව්‍යාපාර විශ්ලේෂණය, ව්‍යාපාර තාක්ෂණවේදියා සහ තොරතුරු පද්ධති ව්‍යාපාර උපදේශක ඇතුළත් වේ. දැනුමේ ගැඹුර කර්මාන්තයේ සියලුම කොටස්කරුවන්ට වැඩි වැඩියෙන් ආකර්ශනීය වන අතර එබැවින් කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විශේෂඥ උපාධිධාරීන් සඳහා දැඩි ඉල්ලුමක් පවතී.

**සීමාවාසික අවස්ථා:** 3 වන අධ්‍යයන වර්ෂයේ 2 වන අධ්‍යයන වාරයේ ආරම්භයේදී, පැය 900 කට නොඅඩු සීමාවාසික පුහුණුවක් සඳහා මාස 6 සිට වසර 1 දක්වා සීමාවාසික කාලයක් සම්පූර්ණ කිරීම සඳහා සිසුන් මුදා හරිනු ලැබේ. මෙම කාල පරිච්ඡේදය තුළ ශිෂ්‍යයා තාක්‍ෂණ සමාගම් තුළ සමාගමේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවෙකුගේ/කළමනාකරුවෙකුගේ අධීක්ෂණය යටතේ සෘජුවම කටයුතු කරන අතර නිතිපතා KIU සම්බන්ධීකාරකවරයෙකු හමුවී ශිෂ්‍යයාගේ වාර්තා පොත සමාලෝචනය කරනු ඇත. කාර්මික සීමාවාසික පුහුණුව හෝ වැඩ පදනම් කරගත් ව්‍යවසාය ස්ථානගත කිරීම සඳහා අධ්‍යයන සම්භාර 9 ක් හිමි වේ.

වෘත්තීය අපේක්ෂාවන්

අපගේ උපාධිධාරීන්ගෙන් සමහරක් ඔවුන්ට විවෘතව ඇති විශේෂඥ අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගෙන පහත සඳහන් ක්ෂේත්‍රවල වෘත්තීන් තෝරා ගනී:

- ව්‍යාපාර පද්ධති විශ්ලේෂණය සහ තොරතුරු තාක්ෂණ උපදේශනය
- තොරතුරු පද්ධති කළමනාකරණය
- තාක්ෂණය මත පදනම් වූ සංවිධානවල ව්‍යාපෘති කළමනාකරණය
- විශ්වවිද්‍යාලවල පර්යේෂණ සහ ඉගැන්වීම (වැඩිදුර අධ්‍යයනයෙන් පසුව)

අනෙකුත් උපාධිධාරීන් වෘත්තීන් සඳහා යාමට තෝරා ගන්නේ:

- බැංකු සහ මූල්‍ය සේවා තාක්ෂණයන්
- තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් පරිවර්තනයේ රජයේ සහ සිවිල් සේවා භූමිකාවන්
- තොරතුරු තාක්ෂණ විශේෂීකරණය සමඟ කර්මාන්ත සහ ව්‍යාපාර කළමනාකරණය
- මෘදුකාංග සහ ව්‍යවසාය පද්ධති සංවර්ධනය
- දත්ත සහ ව්‍යාපාර බුද්ධි විශ්ලේෂණය
- තාක්ෂණ සහ කළමනාකරණ අංශවල ව්‍යවසායකත්වය

www.studentloans.mohe.gov.lk

10. <u>දත්ත විද්‍යාව පිළිබඳ පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය</u>

**දළ විශ්ලේෂණය**

මෙම දත්ත විද්‍යාව පිළිබඳ වසර 04ක B.Sc (ගෞරව) උපාධි වැඩසටහන (DS) යනු පරිගණක විද්‍යාව, සංඛ්‍යාලේඛන සහ ගණිතය යන ක්ෂේත්‍රවල විවිධ කුසලතා අවශ්‍ය වන අන්තර් විෂය වැඩසටහනකි. මෙම උපාධිය දත්ත සන්දර්භය තුළ මෙම එක් එක් ක්ෂේත්‍රයෙන් අවශ්‍ය සංකල්ප යෙදීම කෙරෙහි අවධානය යොමු කරයි. දත්ත විද්‍යා විශේෂීකරණය අරමුණු කරන්නේ දත්ත විද්‍යා මූලධර්ම සහ ඒවා සැබෑ ලෝක ගැටළු සඳහා යෙදිය යුතු ආකාරය පිළිබඳව පුද්ගලයන්ට ඉගැන්වීමයි. මෙම විෂය මාලාව දත්ත විශ්ලේෂණ, සංඛ්‍යානමය ක්‍රම, ගණිතය සහ පරිගණක විද්‍යාවේ මූලික කරුණු කෙරෙහි ද සැලකිය යුතු අවධානයක් යොමු කරයි.

මෙම උපාධි වැඩසටහන අනුගමනය කරන සිසුන්ට විමර්ශනයක සෑම අදියරකදීම දත්ත සමඟ අන්තර් ක්‍රියා කරන ආකාරය ඉගෙන ගත හැකි අතර කණ්ඩායම් පරිසරයක් තුළ වැඩ කිරීමට හැකි වනු ඇත. එවැනි සිසුන්ගේ ප්‍රධාන නිපුණතා වන්නේ; පරිගණකමය සහ සංඛ්‍යානමය චින්තනය, ගණිතමය පදනම්, ආකෘති ගොඩනැගීම සහ තක්සේරුව, ඇල්ගොරිතම සහ මෘදුකාංග පදනම, දත්ත සැකසීම සහ දැනුම හුවමාරුව - සන්නිවේදනය සහ වගකීම.

මෙම අභියෝගාත්මක සහ ඉහළ ඉල්ලුමක් ඇති උපාධිය සිසුන්ට විශ්ලේෂණාත්මකව සිතීමට සහ දත්ත භාවිතයෙන් සංකීර්ණ ගැටළු විසඳීමට ඇති හැකියාව වැඩි දියුණු කරනු ඇත. පාඨමාලාවේදී සිසුන් වර්ධනය කරන **වෙනත් ක්ෂේත්‍ර වලට යොදාගත හැකි** කුසලතා අතරට විවේචනාත්මක චින්තනය සහ ඇගයීම, සංඛ්‍යානමය විශ්ලේෂණය සහ දත්ත අර්ථ නිරූපණය, ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම සහ සොයාගැනීම් පැහැදිලිව ඉදිරිපත් කිරීම, සංවිධානය සහ කාල කළමනාකරණය, අන් අය සමඟ නිර්මාණශීලීව සහ ඵලදායී ලෙස වැඩ කිරීම, පර්යේෂණ සහ ස්වාධීන ගැටළු විසඳීමේ කුසලතා ඇතුළත් වේ.

සීමාවාසික අවස්ථා 3 වන අධ්‍යයන වර්ෂයේ 2 වන අධ්‍යයන වාරයේ ආරම්භයේදී, පැය 900 කට නොඅඩු සීමාවාසික පුහුණුවක් සඳහා මාස 6 සිට වසර 1 දක්වා සීමාවාසික කාලයක් සම්පූර්ණ කිරීම සඳහා සිසුන් මුදා හරිනු ලැබේ. මෙම කාල සීමාව තුළ ශිෂ්‍යයා **තාක්ෂණ සමාගම් තුළ** ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවෙකුගේ/කළමනාකරුවෙකුගේ අධීක්ෂණය යටතේ සෘජුවම කටයුතු කරන අතර නිතිපතා KIU සම්බන්ධීකාරකවරයෙකු හමුවී ශිෂ්‍යයාගේ වාර්තා පොත සමාලෝචනය කරනු ඇත.



www.studentloans.mohe.gov.lk

කාර්මික සීමාවාසික පුහුණුව හෝ වැඩ පදනම් කරගත් ව්‍යවසාය ස්ථානගත කිරීම සඳහා අධ්‍යයන සම්භාර 9 ක් ඇත.

වෘත්තීය අපේක්ෂාවන්: දත්ත විද්‍යා උපාධිධාරීන්ට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විවිධ වෘත්තීය අවස්ථා ඇති අතර උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු සාමාන්‍ය සිට විශේෂිත දක්වා පරාසයක දත්ත විද්‍යා භූමිකාවන්හි වැඩ කිරීමට සුදුසුකම් ලබනු ඇත. හැකි වෘත්තීය අවස්ථා අතර දත්ත විද්‍යාඥ, දත්ත විශ්ලේෂක, දත්ත විද්‍යා උපදේශක, ජ්‍යෙෂ්ඨ දත්ත ඉංජිනේරු සහ යන්ත්‍ර ඉගෙනුම් ඉංජිනේරු යන තනතුරු ඇතුළත් වේ. මෙම අධ්‍යයන ක්ෂේත්‍රයේ දැනුමේ ගැඹුර සේවා යෝජකයින්ට වැඩි වැඩියෙන් ආකර්ශනීය වන අතර දත්ත විද්‍යාඥ වෘත්තිකයන් ලෙස පමණක් නොව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ පුළුල් ක්ෂේත්‍රවලද වෘත්තීන් සඳහා මඟ පාදනු ඇත.

## 5.7 SLTC ආයතනය විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්

### 1. ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) මූල්‍ය හා ගණකාධිකරණ උපාධිය

ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) මූල්‍ය හා ගණකාධිකරණ උපාධිය, ඩිජිටල්කරණය වූ ගතික ව්‍යාපාරික පරිසරයන් තුළ ගණකාධිකරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුළුල් අවබෝධයක්, දැනුමක් අපේක්ෂා කරන සිසුන් වෙනුවෙන් සකසන ලද පූර්ණ කාලීන උපාධි පාඨමාලාවකි. මෙම පාඨමාලාව යටතේ සිසුන්ට, ව්‍යාපාර විශ්ලේෂණය, ගිණුම්කරණය සහ මූල්‍ය ක්ෂේත්‍රයේ කෘත්‍රිම බුද්ධිය යොදාගැනීම, මූල්‍ය තාක්ෂණය, ESG වාර්තාකරණය, උපායමාර්ගික කළමනාකරණ, ගිණුම්කරණය, විගණනය සහ සහතික කිරීම, අවදානම් කළමනාකරණය සහ මූල්‍ය අනුකූලතාව, සමාගම් මූල්‍ය කළමනාකරණය, ගෝලීය හුවමාරු මිලකරණය, බදුකරණය ඇතුළු ක්ෂේත්‍රයන්හි න්‍යායාත්මක දනුම සහ එකී දැනුම ප්‍රායෝගිකව යොදා ගන්නා ආකරය පිළිබඳව අවබෝධයක් ලබා දෙයි.

පාඨමාලාව යටතේ සිසුන්ට ඩිජිටල්කරණය වූ ව්‍යාපාරික පරිසරයන් තුළ තාක්ෂණය භාවිත කිරීම, ඵලදායී සන්නිවේදනය සහ සදාචාරාත්මක තීරණ ගැනීම සඳහා අවශ්‍ය කරන නිපුණත්වය ලබා දෙයි. ඒ අනුව සංකීර්ණ මූල්‍ය අභියෝගවලට මුහුණ දීම සඳහාත්, ආයතනික මට්ටමේ තීන්දු තීරණ ගැනීම සඳහාත් මෙම කුසලතා අර්ථාන්විතව යොදා ගැනීමේ හැකියාව පවතී.

අවසන් වසරේදී සිසුන්ට වසරක කාලයක් ආයතනික පුහුණුව සහ පර්යේෂණ කටයුතුවල නියැලීමට අවස්ථාව හිමිවන අතර එමගින් ඔවුන්ට වෘත්තිය සහ සුදුසු අධ්‍යාපන ක්ෂේත්‍රයකට යොමුවීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික අත්දැකීම් රැසක් ළඟා කර දෙයි.

මෙම පාඨමාලාවේ උපාධිධාරීන්ට දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් වෘත්තීය ගිණුම්කරණ සහ මූල්‍ය ආයතන පාඨමාලාවලින් නිදහස් වීමේ සුදුසුකම ලැබෙන අතර, එමගින් වෘත්තීමය දියුණුව සඳහා වන අවස්ථා තවදුරටත් වැඩිදියුණු කරගත හැකියි .

තවද උපාධි පාඨමාලාව හරහා විශ්ලේෂකයින්, විගණකවරුන්, ගණකාධිකාරීවරුන්, ආයෝජන බැංකුකරුවන්, මූල්‍ය හා බදු උපදේශකවරුන් වැනි විවිධ වෘත්තීන් සඳහා ද සිසුන් සූදානම් කෙරේ. එසේම මෙම පාඨමාලාව පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා ශක්තිමත් පදනමක් ද සපයයි.

www.studentloans.mohe.gov.lk

## 2. ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) සැපයුම්දාම කළමනාකරණ උපාධිය

සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය සකස් කර ඇත්තේ සිසුන්ට ගෝලීය සැපයුම්දාම සහ ක්‍රම කාර්ය සම්පාදනය පිළිබඳ පුළුල් සහ ගැඹුරු අවබෝධයක් ලබාදීම සඳහායි. මූලාශ්‍ර සහ නිෂ්පාදනයෙන් ආරම්භ වී බෙදාහැරීම සහ අවසන් පාරිභෝගිකයා තෙක් භාණ්ඩ හා සේවා සැපයීම දක්වා වූ සියලු අදියරයන්හිදී තාක්ෂණය, සම්පත් සහ තොරතුරු ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිළිබඳව මෙම උපාධි පාඨමාලාවෙන් අවධානය යොමු කරයි.

සිසුන්ට සැපයුම් දාම විශ්ලේෂණ සහ තාක්ෂණය, තොග සහ ගබඩා කළමනාකරණය, ක්‍රම කාර්ය සම්පාදනය සහ ප්‍රවාහන කළමනාකරණය, ප්‍රසම්පාදන සහ සැපයුම්කරු සම්බන්ධතා කළමනාකරණය, මෙහෙයුම් සහ නිෂ්පාදන සැලසුම්කරණය යනාදී ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳව දැනුම ලබා දෙයි. මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමත්, සැපයුම්දාමය පුරා සිදුවිය හැකි අවදානම් තත්ත්වයන් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය ශක්තිමත්, විශ්ලේෂණාත්මක චින්තනය සහ සාකච්ඡාමය කුසලතා වර්ධනය කිරීම කෙරෙහි ද උපාධි පාඨමාලාවේදී අවධානය යොමු කෙරේ.

ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලයේ විෂය මාලාව නූතන රැකියා වෙළඳපොළ ප්‍රමිතීන්ට අනුකූලව නිර්මාණය කර ඇති අතර අධ්‍යනයේදී සිසුන්ට න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම සහ පිළිගත් ආයතනවල සීමාවාසික අනිවාර්ය පුහුණුව ලබා දේ.

මෙම උපාධිය යටතේ උපාධිධාරීන්ට දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් ක්‍රම කාර්ය සම්පාදන, මෙහෙයුම් සහ සැපයුම්දාම කළමනාකරණය වැනි ක්ෂේත්‍රවල සාර්ථක වෘත්තීන් වෙත ප්‍රවේශවීමට අවශ්‍ය න්‍යායාත්මක දැනුම, තාක්ෂණික විශේෂඥතාව, වෘත්තීය නිපුණතා සහ අත්දැකීම් ලබාදෙයි.

## 3. ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) මෙහෙයුම් කළමනාකරණ උපාධිය

ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) මෙහෙයුම් කළමනාකරණ උපාධි පාඨමාලාව තාක්ෂණය, නිෂ්පාදන, ක්‍රම කාර්ය සම්පාදනය, බැංකුකරණය සහ උපදේශනය ඇතුළු විවිධ අංශ හරහා ව්‍යාපාර මෙහෙයුම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ කුසලතා ලබාදීම අරමුණු කරගනිමින් සකසා ඇත. මෙම පාඨමාලාවේදී නිෂ්පාදන සැලසුම් කිරීම, තත්ත්ව පාලනය, නාස්තිය වළක්වා ගැනීම, තොග සහ ක්‍රම කාර්ය සම්පාදනය සහ සේවා කළමනාකරණය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරයි.

මෙම උපාධි පාඨමාලාවේදී සිසුන්ට නව තාක්ෂණය භාවිතයෙන් ක්‍රියාවලීන් කාර්යක්ෂමව කළමනාකරණය කර උසස් තත්ත්වයේ නිෂ්පාදන සහ සේවාවන් ඵලදායීව ලබාදීම පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දේ. එමෙන්ම, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, ප්‍රසම්පාදනය, සැලසුම් කිරීම සහ තොග පාලනය වැනි ක්ෂේත්‍රවල ප්‍රායෝගික ගැටලු විසඳීම, තීරණ ගැනීම සහ උපායමාර්ගගික සැලසුම්කරණය කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරයි.

අවසන් වසරේදී සිසුන්ට ආයතනික පුහුණුව සහ පර්යේෂණ ව්‍යාපෘතිවලට සම්බන්ධ වී ප්‍රායෝගික දැනුම වැඩිදියුණු කර ගනිමින් අත්දැකීම් ලබාගත හැකියි. තවද උපාධිධාරීන් දත්ත මූලික, ගතික ගෝලීය ව්‍යාපාරික පරිසරයන් තුළ නායකත්ව භූමිකාවන් භාරගෙන මෙහෙයුම් විශිෂ්ටත්වය කරා ගෙන යාමට හොඳින් සූදානම් කෙරේ.

www.studentloansmohe.gov.lk

## 4. ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) මානව සම්පත් කළමනාකරණ උපාධිය

ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) මානව සම්පත් කළමනාකරණ උපාධිය සිසුන්ට අත්‍යවශ්‍ය මානව සම්පත් ක්ෂේත්‍රයන්හි න්‍යායාත්මක මූලධර්ම සහ ප්‍රායෝගික කුසලතා යන දෙඅංශයම ආවරණය කෙරේ. ප්‍රධාන වශයෙන් කුසලතා ළඟා කර ගැනීම, සේවක සබඳතා, ගැටුම් කළමනාකරණය, උපායමාර්ගික මානව සම්පත් සැලසුම්කරණය සහ නායකත්ව සංවර්ධනය යන ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කෙරේ. මෙම උපාධි පාඨමාලාව මගින් දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් රැකියා වෙළඳපොළ ප්‍රමිතීන්ට අනුකූලව මානව සම්පත් කළමනාකරණ වෘත්තීන් සඳහා අවශ්‍ය නිපුණත්වය සිසුන්ට ලබාදෙයි.

මෙම පාඨමාලාවේදී ලොව ඕනෑම සේවා ස්ථානයක ඉහළ ඇගයීමකට ලක්වන ඵලදායී සන්නිවේදනය, කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ හැකියාව , ඉහළ නායකත්ව ගුණාංග වැඩිදියුණු කිරීම, ගැටලු නිරාකරණය සහ තීරණ ගැනීමේ හැකියාව වැනි කුසලතා දියුණු වේ.

මීට අමතරව, මෙම පාඨමාලාවට ප්‍රමුඛ පෙළේ දේශීය ආයතනවල මාස 6ක පුහුණුවක් ඇතුළත් අතර එමගින් සිසුන්ට මානව සම්පත පිළිබඳ ප්‍රායෝගික සහ සේවා ස්ථාන ගතිකත්වයන් පිළිබඳ වටිනා අත්දැකීම් ද ලබා දේ.

මෙම උපාධිය මගින් සිසුන්ට මානව සම්පත් කළමනාකරණයේ පුළුල් පරාසයක වෘත්තීය අවස්ථා සඳහා සූදානම්වීමේ අවකාශය හිමිවන අතර ඊට මානව සම්පත් විශ්ලේෂකයින්, කුසලතා අත්පත් කර ගැනීමේ විශේෂඥයින්, පුහුණු සහ සංවර්ධන නිලධාරීන්, ප්‍රතිලාභ කළමනාකරුවන්, සේවක සබඳතා උපදේශකයින් සහ ආයතනික සංවර්ධන උපදේශකයින් වැනි භූමිකා ඇතුළත් වේ.

මෙම උපාධි පාඨමාලාව මානව සම්පත් කළමනාකරණය හෝ ඒ හා ආශ්‍රිත විෂයන් පිළිබඳ පශ්චාත් උපාධියක් හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් සඳහා ශක්තිමත් අධ්‍යයන පදනමක් ද සපයයි. එසේම මෙම පාඨමාලාවේ උපාධිධාරීන් දේශීය හා ජාත්‍යන්තර වෘත්තීය මානව සම්පත් කළමනාකරණ ආයතනවල පාඨමාලාවලින් නිදහස්වීම සඳහා සුදුසුකම් ලබන අතර, එමගින් ඔවුන්ගේ වෘත්තීය දියුණුව සඳහා ඇති අවස්ථා තවදුරටත් වර්ධනය වේ.

## 5. ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) අලෙවිකරණ උපාධිය

ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) අලෙවිකරණ උපාධිය නිර්මාණය කර ඇත්තේ, නූතන තාක්ෂණය මත පදනම් වූ ගෝලීය ව්‍යාපාරික ලෝකයේ අද්‍යානමය දක්ෂතා සහිත සාර්ථක අලෙවිකරණ වෘත්තියවේදියෙකු වීමට කැමැත්තක් දක්වන සිසුන් සූදානම් කිරීම සඳහායි.

මෙම උපාධි පාඨමාලාව සිසුන්ට දත්ත පදනම් කරගත් අලෙවිකරණය හා විශ්ලේෂණය, තිරසර හා හරිත අලෙවිකරණය, සදාචාරාත්මක අලෙවිකරණය, ඩිජිටල් අලෙවිකරණය, සන්නාම කළමනාකරණය යනාදී ක්ෂේත්‍රවල වෘත්තීන් වෙත පිවිසීමට ඉඩ ප්‍රස්ථාව හිමි වේ.

තව ද මෙම පාඨමාලාව හරහා නිර්මාණාත්මක චින්තනය, නව අලෙවිකරණ ප්‍රවණතා සහ නිෂ්පාදන හා සේවා ඵලදායී ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ශක්තිමත් සන්නිවේදන කුසලතා පිළිබඳව අවධානය යොමු කරයි. අලෙවිකරණ ක්ෂේත්‍රයේ පළපුරුදු හා වෘත්තීය පළපුරුද්දක් ඇති දේශකවරුන්ගෙන් අධ්‍යාපනය ලැබීමට ද අවස්ථාව හිමිවේ.

මෙම පාඨමාලාවේ උපාධිධාරීන් දේශීය (SLIM) සහ ජාත්‍යන්තරව පිළිගත් වෘත්තීය අලෙවිකරණ ආයතනවල පාඨමාලාවලින් නිදහස්වීම් ලබා ගැනීමට සුදුසුකම් ලබන අතර, එමගින් ඔවුන්ගේ වෘත්තීය ප්‍රගතිය සඳහා ඇති අවස්ථාවන් තවත් වර්ධනය වේ.

මෙම උපාධිය අනිවාර්යය ආයතනික පුහුණුවක් සහ පර්යේෂණ අධ්‍යනයකින් සමන්විත අතර එමගින් සිසුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා ගත හැකියි. තව ද උපාධි පාඨමාලාව අවසන් වන විට උපාධිධාරීන් දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් ඕනෑම අලෙවිකරණ ක්ෂේත්‍රයක රැකියා සඳහා පිවිසීමට සූදානම් කෙරේ.

www.studentloans.mohe.gov.lk

## 6. විද්‍යාවේදී (ගෞරව) ඊ - සංචාරක හා ඩිජිටල් අලෙවිකරණ උපාධිය

විද්‍යාවේදී (ගෞරව) ඊ - සංචාරක හා ඩිජිටල් අලෙවිකරණ උපාධිය යනු ඩිජිටල් තාක්ෂණික මෙවලම් භාවිත කරන නවීන සංචාරක කර්මාන්තය මූලික කරගත් උපාධි පාඨමාලාවකි. මෙම පාඨමාලාව යටතේ ඩිජිටල් මාධ්‍ය, ජංගම අලෙවිකරණය, ඊ-සන්නාමකරණය, මාර්ගගත දෘශ්‍යතාව වැඩිදියුණු කිරීම, සමාජ මාධ්‍ය කළමනාකරණය සහ විද්‍යුත් වාණිජ්‍ය කළමනාකරණය වැනි මාතෘකා ආවරණය කරයි.

මෙම උපාධි පාඨමාලාව සැලසුම් කර ඇත්තේ ඊ-සංචාරක කර්මාන්තයේ අනාගත දිශානතිය අවබෝධ කර ගැනීමටත්, තරගකාරී පරිසරයක ඉදිරියෙන් ගමන් කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ග යොදාගැනීමටත් අවශ්‍ය වටිනා දැනුමක් ලබාදීම සඳහායි. සෙවුම් යන්ත්‍ර සන්නිවේදන (SEO) මගින් වෙබ් අඩවි ඉහළ තැනකට ගෙන යාම, මාර්ගගත දැන්වීම් නිර්මාණය කිරීම සහ සංචාරක හා ඩිජිටල් අලෙවිකරණ ක්ෂේත්‍රවල වැදගත් තාක්ෂණ භාවිතය පිළිබඳව කීර්තිමත් ආයතනික හවුල්කරුවන්ගෙන් අත්දැකීම් ලබා ගැනීම වැනි ක්‍රියාකාරකම් හරහා සිසුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා දේ.

ක්ෂේත්‍රයේ පිළිගත් සංවිධාන සමග හවුල්කාරිත්වයෙන් සිදුකරන සීමාවාසික පුහුණුව විෂය මාලාවේ අත්‍යාවශ්‍ය අංගයකි. මෙම පාඨමාලාවේ උපාධිධාරීන් තම අධ්‍යන කාලය තුළදී පීඨය සමග පර්යේෂණ කටයුතුවල නිරත වීමෙන් විවිධ ව්‍යාපෘතිවල අත්දැකීම් ලබා ගනී.

## 7. විද්‍යාවේදී (ගෞරව) සංචරණ හා සංචාරක කළමනාකරණ උපාධිය

ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ගෞරව) සංචරණ හා සංචාරක කළමනාකරණ උපාධි පාඨමාලාව, සංචරණ, උත්සව සහ ආගන්තුක සත්කාර සඳහා උනන්දුවක් දක්වන සිසුන් වෙනුවෙන් සකසා ඇත. මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව වර්තමානයේ වේගයෙන් වර්ධනය වන සංචාරක ක්ෂේත්‍රය තුළ සාර්ථක වීමට අවශ්‍ය කුසලතා, දැනුම සහ ගෝලීය දැක්ම සිසුන්ට ලබාදේ.

කිසියම් සිසුවෙක් සංචාරක උපදේශකවරයෙකු, ගමනාන්ත කළමනාකරුවෙකු, උත්සව සැලසුම්කරුවෙකු හෝ සංචාරක අංශයේ ව්‍යවසායකයෙකු වීමට සිහින දකින්නේ නම්, මෙම උපාධි පාඨමාලාව එකී සිහිනය යථාර්ථයක් බවට පත් කරගැනීම සඳහා කදිම වේදිකාවක් සපයයි. සංචාරක මෙහෙයුම්, ගුවන් සේවා මෙහෙයුම්, ගමනාන්ත කළමනාකරණය, තිරසර සංචාරක ක්‍රියාපටිපාටි සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ පුළුල් අවබෝධයක් සිසුන්ට ලබාදෙනු ඇත. දේශන ශාලා තුළ අධ්‍යාපනයට අමතරව, විෂය මාලාවේ ප්‍රායෝගික අත්දැකීම්, නායකත්වය සහ නවෝත්පාදන වර්ධනය පිළිබඳ අවධානය යොමු කරයි. සිසුන් ව්‍යාපෘති, ක්ෂේත්‍ර චාරිකා සහ ප්‍රසිද්ධ සංචාරක, ආගන්තුක සත්කාර සහ සංචාරක සංවිධාන සමඟ අනිවාර්ය සීමාවාසික පුහුණුව සඳහා සහභාගී කරවයි.

අපගේ පීඨය මගින් උපාධිධාරීන්ට වෘත්තීය සූදානමක් සහ ගෝලීය නිපුණත්වය සහතික කරන අතර සෑම පාඨමාලාවක් සම්බන්ධයෙන් අවබෝධයක් හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙන දේශකවරුන්ගෙන් සහ ක්ෂේත්‍රයේ වෘත්තියවේදීන්ගෙන් සමන්විත වේ.

## 8. විද්‍යාවේදී සංචරණ හා සංචාරක කළමනාකරණ (සාමාන්‍ය) උපාධිය

ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී සංචරණ හා සංචාරක කළමනාකරණ (සාමාන්‍ය) උපාධිය යනු තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක් සමඟින් නවීන ඩිජිටල්කරණ ලෝකයේ සංචරණ, සංචාරක සහ ආගන්තුක සත්කාර කර්මාන්තයේ ආකර්ෂණීය වෘත්තියකට පිවිසීමට අපේක්ෂා කරන ඕනෑම සිසුවෙකුට සුදුසු අවස්ථාවකි. වෘත්තීය සංචරණ හෝ ආගන්තුක සත්කාර සේවා සපයන්නෙකු ලෙස සේවය කිරීමට, තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ ලෝකයේ ඕනෑම ස්ථානයක සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට, කර්මාන්තය පිළිබඳ සාධනීය දැනුමක් අත්‍යවශ්‍ය වේ.

www.studentloans.mohe.gov.lk

මෙම කර්මාන්තය පිළිබඳ ඉගෙන ගැනීමට අමතරව, මෙම පාඨමාලාවේදී සිසුන්ට මෙම කර්මාන්තයේ සාර්ථක වීමට අත්‍යවශ්‍ය වන බොහෝ කුසලතා වර්ධනය කිරීමට ද අවස්ථාව හිමි වේ. අපගේ පීඨය, වඩාත් පළපුරුදු දේශකවරුන් හා වෘත්තියවේදීන්ගෙන් සමන්විත වන අතර, සිසුන්ට සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණයට අදාළ අභියෝගවලට මුහුණ දීමට, වෘත්තීය ආචාරධර්ම පිළිබඳ පුහුණුව ලබා දීමට, සහ මෙම කර්මාන්තයේ විවිධ පැතිකඩ පිළිබඳව මඟපෙන්වයි.

මෙම පාඨමාලාවේදී උපාධිධාරීන් පීඨය සමඟ අවසන් ව්‍යාපෘතියක් සිදුකරන අතර ඔවුන්ගේ අධ්‍යයන කාලය තුළ විවිධ ව්‍යාපෘති සඳහා ආයතන සමඟ සම්බන්ධ විය හැක. සීමාවාසික පුහුණුව විෂය මාලාවේ අංගයක් වන අතර පිළිගත් සංවිධාන සමඟ හවුල්කාරිත්වයෙන් ක්‍රියාත්මක වේ.

www.studentloans.mohe.gov.lk

## <u>පරිගණක හා තොරතුරු තාක්ෂණ පීඨය</u>

### 09. විද්‍යාවේදී (ගෞරව) මෘදුකාංග ඉංජිනේරු ශිල්පය පිළිබඳ උපාධිය

මෘදුකාංග ඉංජිනේරු ශිල්පය පිළිබඳ උපාධිය මගින් සිසුන්ට මෘදුකාංග නිර්මාණය කිරීමේ මූලධර්ම සහ ප්‍රායෝගික භාවිතයන් පිළිබඳ පුළුල් දැනුමක් ලබා දේ. මෙම උපාධි පාඨමාලාව වැඩසටහන්කරණය, දත්ත ව්‍යුහ සහ ඇල්ගොරිතම්, මෘදුකාංග සැලසුම සහ ව්‍යුහගතකරණය, පරීක්ෂා කිරීම සහ තත්ත්ව තහවුරු කිරීම, ව්‍යාපෘති කළමනාකරණය සහ පරිගණක විද්‍යා න්‍යායන්ගෙන් ද සමන්විතයි. තවද විෂය මාලාව සැලසුම් කර ඇත්තේ සිසුන්ට න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික පළපුරුද්ද ලබා දීම සඳහා වන අතර ඒ අනුව සිසුන්ට විවිධ සෘජු ව්‍යාපෘති, සිද්ධි අධ්‍යයන සහ ක්ෂේත්‍රය හා සම්බන්ධ පාඨමාලාවල ද නිරත විය හැකියි.

මීට අමතරව, අපගේ උපාධි පාඨමාලාව හදාරන සිසුන්ට ප්‍රමුඛ පෙළ තාක්ෂණික සමාගම්වල සීමාවාසික පුහුණු වැඩසටහන්, co-op තනතුරු සහ ව්‍යාපෘති හා සම්බන්ධ වීමට ද අවස්ථාව හිමිවේ. මේ හරහා සිසුන්ට ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වයක් අත්කර ගැනීම සඳහා අවශ්‍යකරන කුසලතා සහ ප්‍රායෝගික අත්දැකීම් ළඟා කරගත හැකියි. 7 වන අධ්‍යයන වාරය අවසානයේදී සිසුන් අපගේ ආයතනික හවුල්කරුවන් වෙත යොමු කර අනිවාර්ය පුහුණුව සම්පූර්ණ කිරීම සඳහා අවස්ථාව ලබාදෙයි.

ක්ෂේත්‍රයේ පළපුරුදු වෘත්තිකයන් සහ විශේෂඥයින්ගෙන් අපගේ පීඨය සමන්විත වන අතර ඔවුන් සතු පුළුල් දැනුම් සම්භාරය සහ යාවත්කාලීන වූ අත්දැකීම් හරහා සිසුන්ට සෘජු අධ්‍යාපන අත්දැකීමක් ලබාදෙයි. නවතම ප්‍රවණතා සහ භාවිතයන් සිසුන් සමග බෙදාගැනීමෙන් උපාධිධාරීන් මෘදුකාංග ඉංජිනේරු ක්ෂේත්‍රයේ අනාගත නායකත්ව භූමිකා සඳහා පරිපූර්ණව සූදානම් කිරීම සහතික කිරීමට ද අපි කැපවී සිටිමු.

මෘදුකාංග ඉංජිනේරු ශිල්පය පිළිබඳ උපාධි පාඨමාලාව මගින් තාක්ෂණ, මූල්‍ය, සෞඛ්‍ය, මෝටර් රථ කර්මාන්ත වෘත්තීන් සහ රාජ්‍ය අංශය ඇතුළු විවිධ අංශවල පුළුල් වෘත්තීය අවස්ථා සඳහා උපාධිධාරීන් සූදානම් කරනු ලබයි. අපගේ උපාධිධාරීන් මෘදුකාංග නිර්මාණය, පරීක්ෂා කිරීම සහ තත්ත්ව පාලනය වැනි භූමිකාවන් සඳහා සූදානම් කරන අතර ඒ අනුව නිරන්තරව වෙනස් වන තාක්ෂණික ලෝකයේ විශිෂ්ටයෙකු වීමේ අවස්ථාව ඔවුන්ට හිමිවේ. ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය (SLTC) මෘදුකාංග ඉංජිනේරු ක්ෂේත්‍රයේ සාර්ථක වීම සඳහා සිසුන්ට අවශ්‍ය දැනුම සහ

කුසලතා ලබා දීමට කැපවී සිටී. අපගේ මෙම පාඨමාලාව හා එක්ව ගතික හා නවෝත්පාදනශීලී ක්ෂේත්‍රයේ තෘප්තිමත් සහ ප්‍රතිලාභදායී වෘත්තියක් සඳහා වන ඔබේ පළමු පියවර තබන්න.

### 10. විද්‍යාවේදී (ගෞරව) ක්ලවුඩ් පරිගණකකරණය පිළිබඳ උපාධිය

වැඩි වැඩියෙන් සම්බන්ධතා ගොඩනැගෙමින් පවතින වර්තමානයේ ක්ලවුඩ් පරිගණකකරණය සමස්ත ලෝකයේම දැඩි අවධානයක් දිනාගෙන තිබේ. බොහෝ ආයතන තමන්ගේ පරිගණක අවශ්‍යතා ක්ලවුඩ් පරිගණකකරණය හරහා ලබා ගැනීමේ ප්‍රවණතාවක් දැකගත හැකියි. ස්ථාවර පරිගණක දත්ත පද්ධති නඩත්තු කිරීම සඳහා යන පිරිවැය වැඩිවීම හේතුවෙන් ඉන් ඉවත්වීමේ ප්‍රවණතාවක් ද තිබේ. එම නිසා ක්ලවුඩ් පරිගණකකරණය ඉතා වේගයෙන් ජනප්‍රිය වෙමින් තිබේ. විද්‍යාවේදී (ගෞරව) ක්ලවුඩ් පරිගණකකරණය පිළිබඳ උපාධිය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතනයක් විසින් පිරිනමනු ලබන පළමු සිව් අවුරුදු උපාධි පාඨමාලා අතරින් එකකි.

සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාවක් වන අතර මෙම උපාධි පාඨමාලාව සකස් කර ඇත්තේ පරිගණක විද්‍යාව සහ ඒ ආශ්‍රිත විෂයන් පිළිබඳ ගැඹුරු දැනුමක්, උසස් තාක්ෂණික කුසලතා, සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සැලකිය යුතු අත්දැකීම් සහිත වෘත්තියමය සූදානමක් සහිත උපාධිධාරියෙකු බිහිකිරීම අරමුණු කර ගනිමිනි. 7 වන අධ්‍යයන වාරය අවසානයේ සිසුන්ට ආධුනිකත්ව පුහුණුව සඳහා අදාළ ක්ෂේත්‍රයේ පුරෝගාමී ආයතන තුළදී පුහුණු වීමට අවස්ථාව සපයා දෙනු ඇත.

මෙම පාඨමාලාවේ උපාධිධාරීන්ට නව්‍ය වූ, තිරසර, ඵලදායී, කාර්යක්ෂම සහ දෝෂ අඩු මෘදුකාංග සහ සේවාවන් ලබාදීමට හැකියාව ලැබේ. ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලයේ (SLTC) මෙම ක්ලවුඩ් පරිගණකකරණ උපාධි පාඨමාලාවේ උපාධිධාරීන් මෘදුකාංග නිර්මාණය, පරීක්ෂා කිරීම සහ තත්ත්ව තහවුරු කිරීමේ භූමිකාවන් සඳහා සූදානම් කරයි. ඒ සමඟම ඔවුන් ක්ලවුඩ් පරිගණකකරණය පිළිබඳ මෘදුකාංග ඉංජිනේරුවන්, ක්ලවුඩ් පරිගණකකරණ පද්ධති ඉංජිනේරුවන්, ක්ලවුඩ් පරිගණකකරණ පද්ධති පරිපාලකයින් සහ මෘදුකාංග ඉංජිනේරුවන් ලෙස කටයුතු කිරීමට සූදානම් කෙරෙන අතර නිරතුරුව යාවත්කාලීන වෙමින් ඉදිරියට යන තාක්ෂණික ලෝකයේ විශිෂ්ටතා පෙන්වීමට අවශ්‍ය කරන කුසලතාවලින් ද බලගැන්වේ.

### 11. විද්‍යාවේදී (ගෞරව) සයිබර් ආරක්ෂණය පිළිබඳ උපාධිය

විශේෂඥ මතයට අනුව සයිබර් ආරක්ෂාව පිළිබඳ උපාධියක් හැදෑරීමට මෙය හොඳම කාලයයි. බැංකුකරණය, සංවේදී හෝ රහස්‍ය දත්ත බෙදාගැනීම සඳහා අන්තර්ජාලය භාවිත කරන ජනතාවගේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබීම, ඉහළ මට්ටමේ අනවසර ඇතුළුවීම් පිළිබඳ සිදුවීම් වැඩිවීම, තාක්ෂණයේ වර්ධනය සහ සාම්ප්‍රදායික යුද උපාය මාර්ගවලට විකල්ප ලෙස සයිබර් යුද්ධය සලකා බලන රාජ්‍යයන් වැනි කරුණු නිසා, දැන් ලෝකයට පෙර නොවූ පරිදි විශේෂඥ සයිබර් ආරක්ෂාව පිළිබඳ වෘත්තිකයින් අවශ්‍ය කරයි. ඇමරිකාව මූල්කරගත බහුජාතික ඩිජිටල් සන්නිවේදන තාක්ෂණ සමාගමක් වන Cisco ට අනුව, දැනට ලෝකය පුරා සයිබර් ආරක්ෂාව පිළිබඳ වෘත්තිකයන් සඳහා මිලියනයක් පමණ රැකියා අවස්ථා නිර්මාණය වී ඇති අතර එම ඉල්ලුම අනාගතයේදී තවදුරටත් වැඩිවනු ඇති. තව ද සයිබර් ආරක්ෂාව පිළිබඳ විශේෂඥයින් යනු ලෝකයේ ඉහළම වැටුප් ලබන වෘත්තිකයින් අතර සිටින පිරිසකි. සමාජයේ සයිබර් ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉතා වේගයෙන් වර්ධනය වන අතර කෘත්‍රිම බුද්ධිය (AI) වැනි තාක්ෂණයන්ගෙන් බලගැන්වෙන බුද්ධිමත් ලෝකයකට පිවිසෙන විට, සයිබර් ආරක්ෂාව පිළිබඳ ශක්තිමත් පසුබිමක් සහිත උපාධිධාරීන්ට ව්‍යාපාර, ආරක්ෂාව සහ පාලනය යන සියලු ක්ෂේත්‍රවල විශාල ඉල්ලුමක් පවතී.

ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය (SLTC) විසින් පිරිනමනු ලබන සයිබර් ආරක්ෂණය පිළිබඳ උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත්තේ, පරිගණක විද්‍යාව සහ ඒ ආශ්‍රිත විෂයන් පිළිබඳ ගැඹුරු දැනුමක්, දියුණු කරන ලද තාක්ෂණික කුසලතා සහ ගෝලීය තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සැලකිය යුතු අත්දැකීම්වලින්



www.studentloans.mohe.gov.lk

සමන්විත වෘත්තීය සූදානමක් සහිත උපාධිධාරියෙකු බිහි කිරීම සඳහායි. පාඨමාලාවේ 7 වන අධ්‍යයන වාරය අවසානයේ සිසුන්ට අපගේ ආයතනික හවුල්කරුවන් සමඟ එක්ව අනිවාර්ය ආයතනික පුහුණුව සම්පූර්ණ කිරීම සඳහා අවස්ථාව හිමිවේ.

මෙම පාඨමාලාවේ උපාධිධාරීන්ට සයිබර් තර්ජන අවම කිරීම සහ ක්ලවුඩ් විසඳුම් ඇතුළු මෘදුකාංගවල ආරක්ෂණ මට්ටම වැඩි කිරීමේ හැකියාව ඇති අතර අපගේ උපාධිධාරීන් හොඳම විශේෂඥ කණ්ඩායමක් විසින් පුහුණු කරනු ලබන අතර ඒ අනුව පාඨමාලාවේ මුල් අදියරේ සිටම ක්ෂේත්‍රය පිළිබඳ සැලකිය යුතු අත්දැකීම් ලබා ගනී. උපාධිය ලබා ගැනීමට පෙර සෑම සිසුවෙකුම දේශීය සහ විදේශීය ඉහළම තොරතුරු තාක්ෂණ සහ තාක්ෂණික සමාගම්වල සීමාවාසික පුහුණුව සඳහා ද යොමු කෙරේ.

### 12. විද්‍යාවේදී (ගෞරව) දත්ත විද්‍යාව පිළිබඳ උපාධිය

මෙම උපාධි පාඨමාලාව සිසුන්ට දත්ත විද්‍යාව පිළිබඳ විශේෂඥතාවක් සහිත තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ගැනීමට මාවත සකසයි. දත්ත විද්‍යාව යනු දත්ත සහ තොරතුරු අධ්‍යයනය කිරීම, සංවිධානවලට සංකීර්ණ අභියෝගයන්ට මුහුණ දීමට, දැනුම්වත් උපායමාර්ගික තීරණ ගැනීමට සහ කාර්ය සාධනය වැඩිදියුණු කිරීමට උපකාරී වන ප්‍රයෝජනවත් බුද්ධියක් බවට පරිවර්තනය කිරීමයි. මෙම විෂය ක්ෂේත්‍රය සඳහා තාක්ෂණික විශේෂඥතාව මෙන්ම ව්‍යාපාරික නිපුණත්වය ද අවශ්‍ය වේ.

යාන්ත්‍රික ඉගෙනීමේ ක්‍රමය (Machine Learning) සහ කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) ඇතුළු දත්තවල විශ්ලේෂණාත්මක අංශය පිළිබඳ ශක්තිමත් පදනමක් මෙම විෂය අධ්‍යයනය කරන විද්‍යාර්ථයෙකුට අත්‍යවශ්‍ය වේ. මෙම පීඨයේ ඉගැන්වීම් සිදු කරන්නේ, විෂය පිළිබඳ විශේෂඥතාවක් සහිත පිළිගත් වෘත්තිකයින්, පර්යේෂකයින් සහ පළපුරුදු දේශකවරුන් විසිනි. ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය (SLTC) යෙන් දත්ත විද්‍යාව හැදෑරීමෙන් සිසුන්ට ඔවුන්ගේ තාක්ෂණික කුසලතා නිරතුරුව දියුණු කිරීමට, පුළුල් දැනුමක් ලබා ගැනීමට සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට සුවිශේෂී අවස්ථාවක් ලැබේ. දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් සිදු කරන ඉහළ මට්ටමේ පර්යේෂණ ව්‍යාපෘතිවලට දායක වීමට ද සිසුන්ට අවස්ථාව හිමිවේ. ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය (SLTC) යේදී ඔවුන් පර්යේෂණවලින් බලගැන්වුණු නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව සංස්කෘතියකට පිළිගනු ලැබේ. 7 වන අධ්‍යයන වාරය අවසානයේදී, සිසුන්ට ඔවුන්ගේ ආධුනිකත්ව පුහුණුව සම්පූර්ණ කිරීම සඳහා අපගේ හවුල්කාර ආයතනවලදී පුහුණු වීමට ද අවස්ථාව ලැබේ.

## <u>ඉංජිනේරු පීඨය</u>

### 13. විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

මෙම සිව් අවුරුදු ඉංජිනේරු උපාධි පාඨමාලාව මගින් උපාංග සහ පද්ධති සැලසුම්කරණය, පරීක්ෂා කිරීම සහ දෝෂ නිරාකරණය සඳහා විද්‍යුත් තාක්ෂණය යෙදවීම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන දැනුම සිසුන්ට ලබා දෙයි. මෙම පාඨමාලාව තුළින් සිසුන් මූලික විද්‍යුත් න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික යෙදවුම් පිළිබඳ පුහුණුවක් ලබන අතර, පසුව වඩාත් සංකීර්ණ විද්‍යුත් පද්ධති, වේදිකා, විදුලි සංදේශ පද්ධති සහ පරිපථ සැලසුම් පිළිබඳ අධ්‍යයනයකට ද යොමු කෙරේ. ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය (SLTC) විසින් පිරිනමන විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය, ශ්‍රී ලංකාවේ හොඳම විදුලි සංදේශ උපාධි පාඨමාලා අතරින් එකකි.

විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂඥතාවක් සහිත ඉංජිනේරු උපාධිධාරීන්ට, විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු ක්ෂේත්‍රයේ නිරන්තරව යාවත්කාලීන වන තාක්ෂණික විශේෂඥතාවක් ලබා ගත හැකියි. මෙම



www.studentloans.mohe.gov.lk

උපාධිධාරීන් සදාචාරාත්මක මාර්ගෝපදේශයන්ට අනුකූලව, ශබ්ද මූලධර්ම මත පදනම් වූ නව්‍ය, තිරසර හා පරිසර හිතකාමී නිර්මාණ නිපදවීම සඳහා සූදානම් කෙරේ. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු උපාධිය හැදෑරීමෙන් සිසුන්ට විෂයට අදාළ විදුලි සංදේශ පද්ධති පිළිබඳ න්‍යායාත්මක සහ තාක්ෂණික දැනුම වැඩිදියුණු කර ගැනීමේ ඉඩ ප්‍රස්ථාව ද හිමිවේ.

පාඨමාලාවේ 6 වන අධ්‍යයන වාරය අවසානයේදී අනිවාර්ය ප්‍රායෝගික පුහුණුව සඳහා අපගේ ආයතනික හවුල්කරුවන් හා එක්වීමට ද අවස්ථාව ද හිමිවේ

## 14. විද්‍යුත් සහ බල පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

SLTC විසින් පිරිනමනු ලබන විද්‍යුත් සහ බල පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය සඳහා උපාධි අපේක්ෂකයෙකු ලෙස, ඔබට ඉංජිනේරු විද්‍යාව, භෞතික විද්‍යාව සහ ගණිත විෂයන් පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබෙන අතර, එමගින් විද්‍යුත් සහ බල පද්ධති ඉංජිනේරු ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සඳහා ඔබව සූදානම් කරනු ඇති.

විද්‍යුත් සහ බල පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලාව උසස් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් සහ අනුමත කරන ලද පාඨමාලාවකි. මෙම පාඨමාලාවේ උපාධිධාරීන් ඩිජිටල් සංඥා සැකසීම, විද්‍යුත් යාන්ත්‍රික පද්ධති සහ රැහැන් රහිත සංරචක හා පද්ධති යන ක්ෂේත්‍රවල විශිෂ්ට තාක්ෂණික දක්ෂතාවලින් සමන්විත වන අතර මූලධර්ම මත පදනම් වූ නව්‍ය ඉංජිනේරු නිර්මාණ නිෂ්පාදනය කිරීමත්, සදාචාරාත්මක මාර්ගෝපදේශ සහ තිරසර පාරිසරික ප්‍රමිතීන්ට අනුකූල වීමත් මෙම පාඨමාලාවේදී තීරණාත්මක භූමිකාවක් ඉටු කරයි. මෙම උපාධියේ විෂයමාලා අන්තර්ගතය ප්‍රතිඵල පාදක අධ්‍යාපන (OBE) මූලධර්ම මත පදනම් වන අතර වැඩසටහන් ප්‍රතිඵල, මොඩියුල ඉදිරිපත් කිරීම සහ තක්සේරු ක්‍රමයන් යන අංග ඒ යටතේ සැලසුම් කර ඇත.

පාඨමාලාව තාක්ෂණය පදනම් කරගත් ඉගෙනුම් මෙවලම්වල සම්මිශ්‍රණයක් සමඟ ශිෂ්‍ය කේන්ද්‍රීය, මිශ්‍ර ඉගැන්වීම් හා ඉගෙනුම් පරිසරයක් සහිතයි. ඉංජිනේරු විෂයන් පිළිබඳ පුහුණුවට අමතරව, සිසුන්ට ඉංග්‍රීසි, පරිගණක විද්‍යාව සහ මූලික ප්‍රමාණ සමීක්ෂණ විෂයන් පිළිබඳව ද දැනුමක් ලබා දෙන අතර ව්‍යාපෘති සහ කළමනාකරණය, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, කලා සහ වෘත්තීය ආචාර ධර්මය ආදී ක්ෂේත්‍ර ආවරණය කරන අනුපූරක පාඨමාලා සඳහා ද සහභාගී විය හැකියි. පාඨමාලාව අවසානයේ සිසුන්ට පුහුණුවක් ලබා දෙන අතර උපාධිධාරීන්ට ප්‍රමාණ සමීක්ෂණ වෘත්තියේ සාර්ථක වෘත්තිකයෙකු වීමට හෝ උසස් උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශවීමට වීමට අවශ්‍ය විශ්ලේෂණ කුසලතා, මූලික දැනුම සහ වෘත්තියමය නිපුණත්වය ද ලබාදෙයි.

පාඨමාලාව හදාරන සිසුන්ට 6 වන අධ්‍යයන වාරය අවසානයේදී, ඔවුන්ගේ අනිවාර්ය පුහුණුව සම්පූර්ණ කිරීම සඳහා අපගේ හවුල්කාර ආයතන සමඟ පුහුණු වීමට ද අවශ්‍ය පහසුකම් සපයනු ඇත.

## 15. තොරතුරු සහ සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

ශ්‍රී ලංකාවේ පළමු වරට ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය (SLTC) විසින් සුවිශේෂී උපාධි අපේක්ෂක ඉංජිනේරු උපාධි පාඨමාලාවක් වන තොරතුරු සහ සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය පිරිනමනු ලබයි. තවද මෙම පාඨමාලාව, ඉදිරි අනාගතයේ ලෝකය හසුරුවන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන්හි ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස පෙරමුණ ගැනීම සඳහා ඔබ සූදානම් කරවයි.

මෙම සිව් අවුරුදු පාඨමාලාව ශ්‍රී ලංකාවේ වඩාත් යාවත්කාලීන උපාධි පාඨමාලා අතරින් එකක් වන අතර පාඨමාලාව විශේෂයෙන්ම සකසා ඇත්තේ, තොරතුරු තාක්ෂණ හා මෘදුකාංග ක්ෂේත්‍රයන්හි වෘත්තීය අවස්ථා සොයන සිසුන් වෙනුවෙනි. මෙය ඉතා කෙටි කාලයක් තුළ ජනප්‍රිය අධ්‍යයන විෂයක් මෙන්ම ලාභදායී වෘත්තීය මාර්ගයක් බවට පත්ව



www.studentloans.mohe.gov.lk

තිබේ. වර්තමානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වඩා වැදගත් සුවිශේෂී ස්ථානයක් ගෙන ඇති අතර තොරතුරු හා සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව ලොව වේගයෙන්ම වර්ධනය වන ක්ෂේත්‍ර අතරින් එකක් බවට ද පත්ව ඇත.

මූලික විෂය ක්ෂේත්‍රවලට අමතරව, සිසුන්ට ඉංග්‍රීසි, සදාචාරාත්මක පිළිවෙළත් හා කළමනාකරණ විෂයන් පිළිබඳ පූර්ණ අධ්‍යාපනයක් ලබා දෙන අතර තොරතුරු හා සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිධාරියෙකු වීමෙන් ඔබට අනාගත ලෝකයේ මෙන්ම අනාගත තොරතුරු හා සන්නිවේදන ඉංජිනේරු ක්ෂේත්‍රයේ කොටස්කරුවෙකු වීමට ද අවස්ථාව හිමිවේ.

සියලු සිසුන් උපාධිය ලබා ගැනීමට පෙර තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම සඳහා විෂයමාලා අන්තර්ගතයේ අනිවාර්ය කොටසක් වන පුහුණු කාල පරිච්ඡේදය සඳහා ආයතනික හවුල්කරුවන් හා සම්බන්ධ කෙරේ.

### 16. විද්‍යුත් සහ ඉංජිනේරු කළමනාකරණ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

විද්‍යුත් සහ ඉංජිනේරු කළමනාකරණ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලාව සඳහා විද්‍යුත් ඉංජිනේරු විද්‍යාවට අමතරව මූල්‍ය, ගිණුම්කරණය සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පාඨමාලා සහ රසායනාගාර සැසි ඇතුළත් වේ. විද්‍යුත් ඉංජිනේරු පාඨමාලාව තුළ විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව, විදුලි ඉංජිනේරු විද්‍යාව සහ පරිගණක විද්‍යාව යන ක්ෂේත්‍රවල වැදගත් මාතෘකා ආවරණය කරයි. විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව සහ ඉංජිනේරු කළමනාකරණය පිළිබඳ විශේෂඥතාවයක් සහිත ඉංජිනේරු උපාධිධාරියා විදුලි හා විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව මෙන්ම කළමනාකරණය පිළිබඳ ඉහළ මට්ටමේ යාවත්කාලීන තාක්ෂණික දැනුමක් සහ විශේෂඥතාවයකින් සමන්විතයි. එවැනි උපාධිධාරියෙකු විසින් නිර්මාණය කරන නිර්මාණ නව්‍ය ඒවා වන අතර ශක්තිමත් මූලධර්ම මත පදනම්ව තිරසර හා පාරිසරිකව යහපත්, සදාචාරාත්මක මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන්ට අනුකූල වේ.

සිසුන්ට 6 වන අධ්‍යයන වාරය අවසානයේදී අනිවාර්ය පුහුණුව සම්පූර්ණ කිරීම සඳහා අපගේ ආයතනික හවුල්කරුවන් සමඟ පුහුණු වීමට අවස්ථාව ලබා දෙයි.

### 17. සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලාව ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් සහ අනුමත කරන ලද උපාධි පාඨමාලාවකි.

මීට අමතරව, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) මාර්ගෝපදේශ අනුව යමින් ප්‍රතිඵල පාදක අධ්‍යාපන (OBE) මූලධර්මවලට අනුකූලව මෙම උපාධි පාඨමාලාවේ විෂය මාලාව සකස් කර ඇත. මෙම විෂය මාලාව සිවිල් ඉංජිනේරු අධ්‍යාපනයේ සම්පූර්ණ පරාසයම ආවරණය කරන අතර, ව්‍යුහාත්මක, භූ තාක්ෂණික, ජලශක්ති , පාරිසරික සහ ප්‍රවාහන ඉංජිනේරු විද්‍යාව වැනි ක්ෂේත්‍ර ඇතුළත් වේ. සෑම උපාධි අපේක්ෂකයෙකුටම උපාධිය ලබා ගැනීමේ අවසානයේ ක්ෂේත්‍රය සඳහා සූදානම් සිවිල් ඉංජිනේරුවෙකු ලෙස පුහුණුව ලබා ගැනීමට හැකි වන ලෙස විෂයන් සැලසුම් කර ඇත. ඉගැන්වීම් ඒකකය වසර ගණනාවක අධ්‍යයන හා අත්දැකීම් දේශකවරුන් සහිත කීර්තිමත් පීඨයක් වන අතර පූර්ණ ඉංජිනේරු අධ්‍යාපනයක් සඳහා අත්‍යවශ්‍ය සාධකවලින් සමන්විතයි.

6 වන අධ්‍යයන වාරය සාර්ථකව සම්පූර්ණ කරන සියලුම උපාධි අපේක්ෂකයින් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ සංවිධානවල පුහුණුවකට යොමු කෙරේ.

www.studentloans.mohe.gov.lk

<u>විද්‍යා පීඨය</u>

## 18. ජෛව පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

ජෛව පද්ධති ඉංජිනේරු විද්‍යාවේදී (ගෞරව) උපාධිය යනු අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත්, ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලය (SLTC) විසින් පිරිනමනු ලබන සිව් අවුරුදු උපාධි වැඩසටහනකි. මෙම වැඩසටහන ජෛව පද්ධති ඉංජිනේරු ක්ෂේත්‍රය තුළ භෞතික, ජීව විද්‍යාත්මක සහ සමාජීය පද්ධති අතර අන්තර්ක්‍රියා පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙයි. මෙම දෙපාර්තමේන්තුව ආහාර සැකසුම්, රසායන විද්‍යාව සහ ක්ෂුද්‍රජීව විද්‍යාගාර ඇතුළු නවීන රසායනාගාර වලින් සමන්විත වන අතර, පර්යේෂණ සහ කර්මාන්ත-නියැලුම මත පදනම් වූ ඉගෙනුම් පරිසරයකට සහාය වේ.

### මූලික විෂයයන්

වසරකට අධ්‍යයන වාර දෙක බැගින් වසර හතරක් පුරා පැතිරී ඇති මෙම උපාධිය, ආහාර නිෂ්පාදනය, ජෛව ක්‍රියාවලි තාක්ෂණය, පාරිසරික තාක්ෂණය සහ තිරසාර කෘෂිකාර්මික කළමනාකරණය වැනි පුළුල් පරාසයක විෂයයන් ආවරණය කරයි. නවෝත්පාදනය සහ තිරසාරභාවය අවධාරණය කරමින්, මෙම වැඩසටහන මූලික ඉංජිනේරු විද්‍යාව සහ විද්‍යාත්මක මූලධර්ම තාක්‍ෂණ යෙදුම් සමඟ ඒකාබද්ධ කරයි. තුන්වන වසරේ සිට, සිසුන් ආහාර සහ ජෛව සැකසුම්, පාරිසරික ඉංජිනේරු විද්‍යාව හෝ කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව යන වසම් තුනෙන් එකක තේරීම් තෝරා ගන්නා අතර එමගින් කර්මාන්තයට අදාළ ක්ෂේත්‍රවල විශේෂඥතාව ලබා ගනී.

මෙම විෂය මාලාව දේශන, නිබන්ධන, ප්‍රායෝගික පන්ති, පුළුල් සැලසුම් ව්‍යාපෘතියක්, පර්යේෂණ ව්‍යාපෘතියක් සහ සීමාවාසික ස්ථානගත කිරීමක් ඒකාබද්ධ කරමින් සාමාර්ථ 125 කින් පමණ සමන්විත වේ.

### කාර්මික පුහුණුව

මෙහි කාර්මික පුහුණු මොඩියුලය මගින් ජෛව පද්ධති සහ ජෛව තාක්‍ෂණ කර්මාන්තයන්වල වෘත්තීය සැකසුම් පිළිබඳ ව්‍යුහගත අත්දැකීම් සපයයි. මෙහිදී ජෛව ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව, ජෛව සම්පත් කළමනාකරණය, පාරිසරික ජෛව තාක්‍ෂණය, ආහාර තාක්‍ෂණය සහ කෘෂිකාර්මික නවෝත්පාදනයන් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් සිසුන් ලබා ගනී. පුහුණු මොඩියුලයට රසායනාගාර සහ ක්ෂේත්‍ර කටයුතු, ක්‍රියාවලි අධීක්ෂණය, දත්ත විශ්ලේෂණය, උපකරණ භාවිතය සහ තිරසාරභාවය පිළිබඳ පිළිවෙත් ඇතුළත් වේ. තවද, කණ්ඩායම් වැඩ, ගැටළු විසඳීම, සන්නිවේදනය සහ සදාචාරාත්මක භාවිතයන් වැනි වෘත්තීය කුසලතා ද සිසුන් වර්ධනය කරනු ලබන අතර, මෙය න්‍යායාත්මක දැනුම ප්‍රායෝගික අත්දැකීම් සමඟ ඒකාබද්ධ කිරීම පෙන්නුම් කෙරෙන පරාවර්තක වාර්තාවකින් අවසන් වේ.

### වෘත්තීය අවස්ථා

මෙම වැඩසටහන මගින් උපාධිධාරීන් කෘෂිකර්මාන්තය, ආහාර සහ ජෛව සැකසීම, ජෛව බලශක්තිය, පාරිසරික කළමනාකරණය සහ තිරසාර තාක්ෂණ ආදී කර්මාන්තවල විවිධ වෘත්තීන් සඳහා සන්නද්ධ කරනු ලබයි. ජෛව තාක්‍ෂණය, ඉංජිනේරු නිර්මාණය, ස්වයංක්‍රීයකරණය සහ දත්ත විශ්ලේෂණ පිළිබඳ ඔවුන්ගේ බහුවිධ පුහුණුව, බුද්ධිමත්, පරිසර-කාර්යක්ෂම සහ චක්‍රීය ජෛව-ආර්ථික විසඳුම් ඉදිරියට ගෙන යන ඉංජිනේරුවන්, තාක්ෂණවේදීන්, උපදේශකයින් හෝ නවෝත්පාදකයින් වැනි භූමිකාවන් සඳහා ඔවුන්ව සූදානම් කරයි. උපාධිධාරීන්ට කෘෂිකාර්මික රොබෝ විද්‍යාව, ජෛව ක්‍රියාවලි ප්‍රශස්තිකරණය, දේශගුණික වශයෙන් ස්මාර්ට් පද්ධති සහ පුනර්ජනනීය සම්පත් ඉංජිනේරු විද්‍යාව ඇතුළු නැගී එන ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයන හෝ පර්යේෂණ හැදෑරීමට ද හැකි

අතර, එමඟින් දේශීයව සහ ගෝලීය වශයෙන් නවෝත්පාදන හා තාක්ෂණික සංවර්ධනයට දායක වීමට හැකියාව ලැබේ.

### 19. විලාසිතා වෙළඳ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

විලාසිතා වෙළඳ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය යනු අධ්‍යයන වාර හයක් ඔස්සේ වසර තුනක් පුරා විහිදෙන පුළුල් උපාධි වැඩසටහනක් වන අතර, එහි SLQF සාමාර්ථ 90 ක් ඇත. මෙම වැඩසටහන සිසුන්ට රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ විලාසිතා කර්මාන්තයන් කෙරෙහි අවධානය යොමු කරන විද්‍යාවන්, තාක්ෂණය, කළමනාකරණය සහ නිර්මාණාත්මක කුසලතා පිළිබඳ ශක්තිමත් පදනමක් සපයයි.

#### මූලික විෂයයන්

මෙම වැඩසටහන ලෝක රෙදිපිළි සහ ඇඳුම් වෙළඳාම, රෙදිපිළි විද්‍යාව, රසායනික සංකල්ප සහ විලාසිතා නිර්මාණ මූලධර්ම පිළිබඳ මූලික අවබෝධයක් ගොඩනඟයි. මෙය නිෂ්පාදන ක්‍රියාවලීන්, ඇඟලුම් සායම් කිරීම, ගෝලීය රෙදිපිළි ප්‍රවණතා සහ ඇඳුම් නිෂ්පාදනය සංවිධානය කිරීම ආවරණය කරයි.

#### වෘත්තීමය යෙදුම්

මෙම වැඩසටහනේ පසු අදියරයන් හීදී, සිසුන් සමකාලීන විලාසිතා, රෙදිපිළි පරීක්ෂණ සහ තත්ත්ව සහතික කිරීම, රටා නිර්මාණය, සැපයුම් දාමය සහ සිල්ලර කළමනාකරණය, ඇඟලුම් පිරිවැය සහ වෘත්තීය ආචාර ධර්ම වැනි විශේෂිත ක්ෂේත්‍ර සමඟ සම්බන්ධ වේ. තවද, ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා කාර්මික පුහුණුව සහ පර්යේෂණ ව්‍යාපෘතියක් මගින් තිරසාර සංවර්ධනය සහ නවෝත්පාදනය කෙරෙහි ද අවධාරණය කෙරේ.

#### කාර්මික පුහුණුව

මෙම වැඩසටහනට සාමාර්ථ 6 කින් යුත් කාර්මික පුහුණු සංරචකයක් ඇතුළත් වන අතර, එය රෙදිපිළි නිෂ්පාදන අවධීන් වන නූල් කැටීම, රෙදි විවීම, ගෙතීම සහ රසායනික සැකසුම් කම්හල් හි කාර්යයන් වැනි ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙයි. අවසාන අධ්‍යයන වාරය තුළ නිෂ්පාදන ක්‍රියාකාරකම්, තත්ත්ව පාලනය, අමුද්‍රව්‍ය මූලාශ්‍ර සපයාගැනීම, ආරක්ෂාව සහ පාරිසරික ගැටළු පිළිබඳ සෘජු දැනුමක් සිසුන්ට ලබා දීම අරමුණු කරයි. සිසුන් සැබෑ ලෝකයේ කර්මාන්ත ගැටළු විමර්ශනය කිරීමට සහ විසඳීමට ඉඩ සලසන පර්යේෂණ ව්‍යාපෘතියක් ද සිදු කරයි.

#### වෘත්තීය අවස්ථා

උපාධිධාරීන් පහත සඳහන් භූමිකාවන්ට සුදුසු සියුම් තාක්ෂණික නිපුණතා සහ කළමනාකරණ කුසලතා ලබා ගනී:

- රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත
- විලාසිතා වෙළඳාම සහ මිලදී ගැනීම
- නිෂ්පාදන සැලසුම සහ තත්ත්ව සහතිකය
- සැපයුම් දාමය සහ සිල්ලර කළමනාකරණය



www.studentloans.mohe.gov.lk

• පර්යේෂණ සහ නිෂ්පාදන සංවර්ධනය

• විලාසිතා සහ රෙදිපිළි ක්ෂේත්‍රයේ තිරසාරභාවය සහ අනුකූලතා කළමනාකරණය

මෙම උපාධිය ගෝලීය හා බහු-සංස්කෘතික පරිසරයන්හි නායකත්වය සහ කණ්ඩායම් හැඟීම් ද, විලාසිතා වෙළඳ ව්‍යාපාරයට සහ ප්‍රජාවට අදාළ වන ශක්තිමත් සන්නිවේදන කුසලතා ද ඇති වෘත්තිකයන් බිහි කරයි. මෙම වැඩසටහන තිරසාර සංවර්ධනය, සදාචාරාත්මක භාවිතයන් සහ යාවජීව ඉගෙනීම අවධාරණය කරන අතර, නිතර වෙනස් වන විලාසිතා කර්මාන්තයී ගතික හා වගකිවයුතු වෘත්තීන් සඳහා උපාධිධාරීන් සූදානම් කරයි.

## 20. රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය යනු අධ්‍යයන වාර හයක් පුරා විහිදෙන තුන් අවුරුදු උපාධි වැඩසටහනක් වන අතර, එහි මුළු SLQF සාමාර්ථ ගණන 90 කි. මෙය සිසුන්ට රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්තයට විශේෂිත වූ විද්‍යාත්මක හා ඉංජිනේරු මූලධර්ම, තාක්ෂණය සහ කළමනාකරණ කුසලතා පිළිබඳ ශක්තිමත් පදනමක් ලබා දෙයි.

### මූලික විෂයයන්

මෙම වැඩසටහන මගින් තන්තු විද්‍යාව හා තාක්ෂණය, කැටිනූල් නිෂ්පාදනය, වියන ලද සහ ගෙතූ රෙදි තාක්ෂණය, රෙදිපිළි රසායනික සැකසුම්, නිමාව පිරියම් කිරීම, රෙදිපිළි පරීක්ෂණ, ඉලෙක්ට්‍රොනික හා දෘෂ්ටි විද්‍යාව, මූලික යාන්ත්‍රන විද්‍යාව සහ කළමනාකරණ මූලධර්ම ඇතුළු අත්‍යවශ්‍ය මාතෘකා ආවරණය කෙරේ.

### වෘත්තීමය යෙදුම්

පසු අදියරයන් හීදී, සිසුන් ඇඟලුම් නිෂ්පාදනය සහ උපාංග, මහන මැෂින් තාක්ෂණය, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, සැපයුම් දාම කළමනාකරණය, මූල්‍ය ගිණුම්කරණය, නැනෝ තාක්‍ෂණ යෙදුම්, වෘත්තීය ආචාර ධර්මවලට අනුකූල වීම, සම්පූර්ණ තත්ත්ව කළමනාකරණය, රෙදිපිළි වෙළඳාම සහ පර්යේෂණ ක්‍රමවේදය අධ්‍යයනය කරනු ලබයි. මෙම විෂය මාලාව රෙදිපිළි සහ ඇඟලුම් අංශ තුළ තිරසාර සංවර්ධනය ද අවධාරණය කරයි.

### කාර්මික පුහුණුව

කාර්මික පුහුණුව අවසාන අධ්‍යයන වාරයේ සාමාර්ථ 6 ක අනිවාර්ය අංගයක් වන අතර, මෙය රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන කම්හල්වල ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙයි. මෙහිදී නිෂ්පාදන ක්‍රියාවලීන්, තත්ත්ව සහතික කිරීම, අමුද්‍රව්‍ය මූලාශ්‍ර සපයාගැනීම, ආරක්ෂක පිළිවෙත් සහ පාරිසරික කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් සිසුන් ලබා ගනී. මෙම පුහුණුවට ගැටළු විසඳීම සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැකසුනු පර්යේෂණ ව්‍යාපෘතියක් ද අඩංගු වේ.

www.studentloans.mohe.gov.lk

වෘත්තීය අවස්ථා

මෙහිදී රෙදිපිළි නිෂ්පාදනය, ඇඟලුම් නිෂ්පාදන කළමනාකරණය, තත්ත්ව පාලනය, සැපයුම් දාමය සහ භාණ්ඩ ලේඛන කළමනාකරණය, නිෂ්පාදන සංවර්ධනය සහ තිරසාර කළමනාකරණය යන ක්ෂේත්‍රවල විවිධ භූමිකාවන් සඳහා උපාධිධාරීන් සූදානම් කරවනු ලැබේ.

මෙම වැඩසටහන මඟින් රෙදිපිළි සහ ඇඟලුම් අංශයේ නිතර වෙනස් වන අභියෝගයන්ට මුහුණ දීම සඳහා ආචාර ධර්ම ප්‍රමිතීන්, සන්නිවේදනය සහ යාවජීව ඉගෙනීම කෙරෙහි අවධාරණය කරමින් බහු-සංස්කෘතික, ගෝලීය පරිසරයන්හි ඵලදායී ලෙස නායකත්වය දීමට සහ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔවුන් සන්නද්ධ කරවයි.

<u>**තාක්ෂණ පීඨය**</u>

**21. කෘෂිකර්ම තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය**

ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලයේ (SLTC) කෘෂිකාර්මික තාක්ෂණ දෙපාර්තමේන්තුව, කෘෂිකාර්මික විද්‍යාවන් සහ තාක්ෂණය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමෙන් සිසුන් සන්නද්ධ කිරීම සඳහා නිර්මාණය කර ඇති පුළුල් උපාධි වැඩසටහනක් ලෙස කෘෂිකර්ම තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය පිරිනමයි.

මෙම වැඩසටහන මගින් නවීන කෘෂිකාර්මික පිළිවෙත්, තිරසාර ගොවිතැන සහ කෘෂිකර්මාන්තයේ තාක්ෂණය භාවිතය, ආහාර සුරක්ෂිතතාව, පාරිසරික සංරක්ෂණය සහ ග්‍රාමීය සංවර්ධනයේ වෙනස් වන අභියෝගවලට මුහුණ දීම සඳහා උපාධිධාරීන් සූදානම් කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරයි. අධ්‍යයනයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් අතරට බෝග නිෂ්පාදනය, සත්ව නිෂ්පාදන තාක්ෂණය, කෘෂිකාර්මික ඉංජිනේරු තාක්ෂණය සහ ආහාර තාක්ෂණය, පාංශු විද්‍යාව, පළිබෝධ කළමනාකරණය, ජෛව තාක්‍ෂණය සහ කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව ඇතුළත් වේ.

ප්‍රායෝගික ක්ෂේත්‍ර වැඩ, විද්‍යාගාර සැසි සහ පන්ති කාමර උපදෙස්වල සංකලනයක් හරහා, සිසුන් බෝග ආකෘති නිර්මාණය, නිරවද්‍ය කෘෂිකර්මාන්තය සහ ගොවිතැන් පද්ධතිවල IoT සහ GIS වැනි ඩිජිටල් මෙවලම් ඒකාබද්ධ කිරීම පිළිබඳ වටිනා කුසලතා ලබා ගනී.

කෘෂිකර්මාන්තයේ නැගී එන ප්‍රවණතා සහ තාක්ෂණයන් ඇතුළත් කිරීම සඳහා විෂය මාලාව නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම මගින් මෙම වැඩසටහනේ උපාධිධාරීන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට දායක වීමට හෝ වැඩිදුර අධ්‍යයනයන් සහ පර්යේෂණ කිරීමට සූදානම් කරයි. මෙය කෘෂිකර්මාන්තයේ නවෝත්පාදනය, තිරසාරභාවය සහ තාක්ෂණික දියුණුව පෝෂණය කිරීම සඳහා SLTC හි කැපවීම තහවුරු කෙරෙන වැඩසටහනකි

**22. ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය**

ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලයේ (SLTC) ඉලෙක්ට්‍රොනික තාක්ෂණ දෙපාර්තමේන්තුව ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධි වැඩසටහන පිරිනමයි. එහි අරමුණ වන්නේ සිසුන් ඉලෙක්ට්‍රොනික තාක්ෂණය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමෙන් සන්නද්ධ කිරීමයි.

මෙම වැඩසටහන නවීන විදුලි හා ඉලෙක්ට්‍රොනික භාවිතයන් සහ යෙදුම්, සහ විදුලි හා ඉලෙක්ට්‍රොනික කර්මාන්තයේ තාක්ෂණය භාවිතය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, විදුලි හා ඉලෙක්ට්‍රොනික කර්මාන්තයේ වෙනස්වන අභියෝගවලට මුහුණ දීම සඳහා උපාධිධාරීන් සූදානම් කරයි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර අතරට ඉලෙක්ට්‍රොනික හා විදුලි තාක්ෂණය සහ යෙදුම්, උපකරණ සහ ස්වයංක්‍රීයකරණ තාක්ෂණය, කළමනාකරණ විද්‍යාව, ගණිතය සහ මූලික විද්‍යාවන් සහ පරිගණකකරණය ඇතුළත් වේ. මෙහිදී ව්‍යාපෘති මාලාවක්, රසායනාගාර සැසි සහ දේශන හරහා, සිසුන්ට ඉලෙක්ට්‍රොනික තාක්ෂණය පිළිබඳ ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට හැකිවන අතර එම කර්මාන්තයට සම්බන්ධ වීමට සූදානම් වෘත්තීය උපාධිධාරීන් බවට පත්විය හැකිය.

ඉලෙක්ට්‍රොනික විද්‍යාවේ නැගී එන ප්‍රවණතා සහ තාක්ෂණයන් ඇතුළත් කිරීම සඳහා විෂය මාලාව නිරන්තරයෙන් යාවත්කාලීන වන අතර, උපාධිධාරීන් ලෝකයේ ඉලෙක්ට්‍රොනික කර්මාන්තයට දායක වීමට හෝ වැඩිදුර අධ්‍යයනයන් සහ පර්යේෂණ දිගටම කරගෙන යාමට යාමට ඇති සූදානම මෙම වැඩසටහන තුළින් සහතික කරයි. මෙම වැඩසටහන ඉලෙක්ට්‍රොනික තාක්ෂණයේ නවෝත්පාදනය, තිරසාරභාවය සහ තාක්ෂණික දියුණුව පෝෂණය කිරීම සඳහා SLTC හි කැපවීම තවත් තහවුරු කරයි.

**23. පාරිසරික තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය**

තාක්ෂණ පීඨයේ කොටසක් වන පාරිසරික තාක්ෂණ දෙපාර්තමේන්තුව, පාරිසරික ආරක්ෂාව සහ තිරසාරභාවය පිළිබඳ උත්සාහයන් මෙහෙයවීම සඳහා උපාධිධාරීන් සූදානම් කිරීම සඳහා පාරිසරික තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය පිරිනමයි.

මෙම වැඩසටහන යටතේ, සිසුන් පාරිසරික අභියෝග අවබෝධ කර ගැනීම සහ ඒවාට මුහුණ දීම සඳහා ශක්තිමත් පදනමක් ලබා ගැනීම සඳහා විද්‍යාව, තාක්ෂණය සහ ඉංජිනේරු විද්‍යාව යන විෂයයන් සංකලනය කරන ලද විෂය මාලාවක් අධ්‍යයනය කරයි. පාරිසරික තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධි වැඩසටහන පාරිසරික ගැටළු වලට අදාළ ජීව විද්‍යාත්මක, රසායනික සහ භෞතික ක්‍රියාවලීන් පිළිබඳ ගැඹුරු ගවේෂණයක් සපයයි. මෙම වැඩසටහන යටතේ, අදාළ නීති, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට අනුකූලව විද්‍යාත්මක හා තාක්ෂණික මැදිහත්වීම් හරහා මෙම ගැටළු නිරීක්ෂණය කිරීමට, තක්සේරු කිරීමට සහ කළමනාකරණය කිරීමට සිසුන් කුසලතා වර්ධනය කරනු ඇත. ඔවුන්ගේ අධ්‍යයන කාලය පුරාවට, සිසුන් නිතිපතා පාරිසරික සහ තිරසාර ගැටළු නිරීක්ෂණය සහ තක්සේරු කරමින් ප්‍රායෝගික ඉගෙනීමේ නිරත වනු ඇත.

මෙම දෙපාර්තමේන්තුව මගින් උපාධි අපේක්ෂකයින්ට සංකීර්ණ පාරිසරික අභියෝග විවේචනාත්මකව විශ්ලේෂණය කිරීමට සහ අධ්‍යයන හා කර්මාන්ත සැකසුම් දෙකෙහිම විද්‍යාඥයින් සහ ඉංජිනේරුවන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීමට පුහුණු කිරීමට පහසුකම් සපයයි. මෙම වැඩසටහනේ උපාධිධාරීන් නාගරීකරණය, ජනගහන වර්ධනය සහ පාරිසරික හායනය වැනි සාධක මගින් මෙහෙයවනු ලබන අනපේක්ෂිත පාරිසරික ගැටළු විසඳීමට පුහුණු වේ. තවද, තාක්ෂණික හා විද්‍යාත්මක අංශවලට අමතරව, සිසුන් පාරිසරික ගැටළු විසඳීමේදී සමාජ විද්‍යාවන්, ප්‍රතිපත්ති, පාලනය සහ මානව ශාස්ත්‍රවල තීරණාත්මක කාර්යභාරය අධ්‍යයනය කරනු ඇත. මෙම වැඩසටහන වෘත්තීය සන්නිවේදනය, නායකත්වය, ව්‍යවසායකත්වය, තාක්ෂණික ලිවීම සහ ව්‍යාපෘති කළමනාකරණ කුසලතා වර්ධනය පිළිබඳව ද වැඩි අවධානයක් යොමු කරයි. පර්යේෂණ ව්‍යාපෘති, පීඨයෙන් ලැබෙන උපදේශන සහ කර්මාන්තයේ ප්‍රමුඛ සංවිධාන තුළින් ලබාගන්නා සීමාවාසික පුහුණුව තුළින් සිසුන් වටිනා අත්දැකීම් ලබා ගන්නා අතර, පාරිසරික තාක්ෂණවේදීන් සහ නවෝත්පාදකයින් යන වෘත්තීන් සඳහා හොඳ සූදානමක් ලබාගනියි.

යාවජීව, බහුවිධ ඉගෙනීම පෝෂණය කිරීම, නැගී එන පාරිසරික අභියෝගවලට අනුවර්තනය වීමට සහ ප්‍රතිචාර දැක්වීමට සහ තිරසාර සංවර්ධනයට නායකත්වය දීමට උපාධිධාරීන් සූදානම් කිරීම සඳහා මෙම විෂය මාලාව නිර්මාණය කර ඇත.

www.studentloans.mohe.gov.lk

## 5.8 SAEGIS කැම්පස් හි පවත්වනු ලබන උපාධි වැඩසටහන්

### කළමනාකරණ, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය

ඇතුළත් වීමේ සුදුසුකම්: කරුණාකර මාර්ගෝපදේශ පොතේ 02 කොටස අනුගමනය කරන්න.

1. **ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය**
   **(Bachelor of Business Administration -BBA)**

**කාලය: අවුරුදු 3 (අධ්‍යයන සම්භාර (ක්‍රෙඩිට්) 90)**

මෙම අධ්‍යයන වැඩසටහන සැලසුම් කර ඇත්තේ ව්‍යාපාර සහ කළමනාකරණයේ මූලික ක්ෂේත්‍රවල සිසුන්ට ශක්තිමත් පදනමක් ලබා දීම සඳහා ය. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සමඟ සමපාත වන මෙම වැඩසටහන, වර්තමාන තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ දියුණු වීමට අවශ්‍යය දැනුම, කුසලතා සහ මානසිකත්වයෙන් සිසුන් සන්නද්ධ කරයි. කළමනාකරණය, අලෙවිකරණය, මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර සන්නිවේදනය වැනි ප්‍රධාන විෂයයන් හරහා සිසුන්ගේ පුළුල් ව්‍යාපාරික දැනුම වර්ධනය කිරීම එහි අරමුණයි, ඒ සමඟම ශක්තිමත් නායකත්වය, ව්‍යාවසායක චින්තනය සහ තීරණාත්මක ගැටළු විසඳීමේ කුසලතා පෝෂණය කරයි. සැබෑ ලෝකයේ ව්‍යාපාරික අභියෝගවලට මුහුණ දීම සඳහා විශ්ලේෂණාත්මක හැකියාවන් සහ ප්‍රායෝගික නිරාවරණය තුළින් වෘත්තීය සංවර්ධනය ප්‍රවර්ධන කිරීම සඳහා විෂය මාලාව ද අවධාරණය කරයි, උපාධිධාරීන් නායකත්ව භූමිකාවන් භාර ගැනීමට සහ ගතික ව්‍යාරික පරිසරයන් තුළ දැනුවත් තීරණ ගැනීමට සූදානම් බව සහතික කරයි.

**වැඩසටහන් ව්‍යුහය**

මෙම උපාධි පාඨමාලාව කළමනාකරණ මූලධර්ම, අලෙවිකරණ උපාය මාර්ග, මූල්‍ය කළමනාකරණය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ව්‍යාපාර නීතිය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර සන්නිවේදනය සහ ව්‍යාවසායකත්වය වැනි මූලික විෂයයන් රාශියක් ආවරණය කරයි. අධ්‍යයන පාඨමාලා කටයුතු වලට අමතරව, සිසුන්ට ක්ෂේත්‍ර චාරිකා, වැඩමුළු, සම්මන්ත්‍රණ සඳහා ද නිරාවරණය වන අතර එමඟින් ඔවුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට සහ සැබෑ ව්‍යාපාරික පරිසරයන් තුළ ඔවුන් ඉගෙන ගත් දේ අදාළ කර ගැනීමට ඉඩ සලසයි. මෙම පුළුල් ප්‍රවේශය න්‍යාය සහ භාවිතය අතර පරතරය පියවන අතර, උපාධිධාරීන් ගතික ව්‍යාපාරික භූමිකාවන් සඳහා හොඳින් සූදානම් බව සහතික කරයි.

**වෘත්තීය අවස්ථා**

ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරීන් විවිධ අංශවල පුළුල් පරාසයක වෘත්තීය අවස්ථා හඹා යාමට මෙම අධ්‍යයන වැඩසටහන සිදු කරයි. මෙමඟින් කළමනාකරණ භූමිකාවන්, අලෙවිකරණ සහ වෙළඳ

www.studentloans.mohe.gov.lk

දැන්වීම් ක්ෂේත්‍රයේ තනතුරු, මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය, විකුණුම් සහ සිල්ලර කළමනාකරණය සඳහා සිසුන් සූදානම් කරයි. උපාධිධාරීන්ට සාමාන්‍ය කළමනාකරුවන්, අලෙවිකරණ කළමනාකරුවන්, මානව සම්පත් කළමනාකරුවන්, මූල්‍ය විශ්ලේෂකයින් හෝ ව්‍යාවසායකයින් ලෙස සේවය කළ හැකිය. ව්‍යාපාර පරිපාලනය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු කරගෙන යාමට කැමති සිසුන් සඳහා මෙම වැඩසටහන ශක්තිමත් පදනමක් ද සපයයි. ඊට අමතරව, උපාධිධාරීන්ට විවිධ අංශවල ව්‍යාපාර සඳහා විශේෂඥ මග පෙන්වීමක් ලබා දෙමින් උපදේශන හෝ උපදේශන භූමිකාවන් භාර ගත හැකිය.

## 2. ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය
**Bachelor of Business Management (Hons) Accounting & Finance**

**කාලය: අවුරුදු 4 (අධ්‍යයන සම්භාර (ක්‍රෙඩිට්) 120)**

මෙම උපාධි වැඩසටහන සිසුන්ට ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය යන දෙකම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දීම සඳහා නිර්මාණය කර ඇත. ගිණුම්කරණය සහ මූල්‍ය යන ගතික ක්ෂේත්‍රවල දියුණු වීමට අවශ්‍ය න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික කුසලතා මෙම වැඩසටහන සිසුන්ට ලබා දෙයි. ඕනෑම ආයතනික පසුබිමක වගකිවයුතු සහ දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට උපාධිධාරීන් හොඳින් සූදානම් බව සහතික කිරීම සඳහා සංකීර්ණ මූල්‍ය අභියෝග සහ ව්‍යාපාරික පරිසරයන් තුළ සැරිසැරීමට සිසුන් සූදානම් කිරීම, විවේචනාත්මක චින්තනය, විශ්ලේෂණාත්මක හැකියාවන් සහ තීරණ ගැනීමේ කුසලතා වර්ධනය කිරීම කෙරෙහි විෂය මාලාව අවධානය යොමු කරයි.

### වැඩසටහන් ව්‍යුහය

මෙම වැඩසටහන මූල්‍ය ගිණුම්කරණය, කළමනාකරණ ගිණුම්කරණය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, මූල්‍ය කළමනාකරණය, පරිගණකගත ගිණුම්කරණය, විගණනය සහ සහතික කිරීම, බදුකරණය, ආයතනික මූල්‍ය, මූල්‍ය වාර්තාකරණය සහ උපායමාර්ගික මූල්‍ය කළමනාකරණය වැනි ප්‍රධාන විෂයයන් ආවරණය වන මූලික සහ තේරීම් විෂය ඒකක වලින් සමන්විත වේ. සිසුන් ඔවුන්ගේ අවසාන වසරේදී පර්යේෂණ ව්‍යාපෘතියක් සහ ව්‍යාපාර සීමාවාසික පුහුණුවක් ද සම්පූර්ණ කරන අතර එමඟින් ඔවුන්ගේ අධ්‍යයන දැනුම ප්‍රායෝගික, සැබෑ ලෝක සැකසුම් තුළ යෙදවීමට ඉඩ සලසයි.

### සීමාවාසික පුහුණුව

මෙම වැඩසටහනේ සීමාවාසික පුහුණුව, සැබෑ ලෝකයේ ව්‍යාපාරික පරිසරයන් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් සිසුන්ට ලබා දීම සඳහා නිර්මාණය කර ඇති විෂය මාලාවේ අනිවාර්ය අංගයකි. සිසුන් තම අවසන් වසරේ දෙවන අධ්‍යයන වාරය තුළ මාස 6 ක සීමාවාසික පුහුණුවක් සම්පූර්ණ කළ යුතුය. මෙම සීමාවාසික පුහුණුව මඟින් සිසුන්ට වෘත්තීය අවබෝධයක් ලබා ගැනීමට, රැකියා නියුක්තිය පිළිබඳ



www.studentloans.mohe.gov.lk

කුසලතා වර්ධනය කිරීමට සහ කර්මාන්තයේ ගිණුම්කරණ සහ මූල්‍ය මෙහෙයුම් වලදී අධ්‍යයන දැනුම ප්‍රායෝගිකව යෙදීමට හැකියාව ලැබේ.

## වෘත්තීය අවස්ථා

මෙම වැඩසටහනේ උපාධිධාරීන් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම පුළුල් පරාසයක වෘත්තීය අවස්ථා හඹා යාමට හොඳින් සන්නද්ධව සිටිති. මෙම වැඩසටහන ගිණුම්කරණය, මූල්‍ය විශ්ලේෂණය, ආයතනික මූල්‍ය, විගණනය, බදු උපදේශනය සහ ආයෝජන කළමනාකරණය යන ක්ෂේත්‍රවල භූමිකාවන් සඳහා සිසුන් සූදානම් කරයි. උපාධිධාරීන්ට මූල්‍ය විශ්ලේෂකයින්, ආයෝජන උපදේශකයින්, විගණකවරුන් හෝ මූල්‍ය කළමනාකරුවන් ලෙස වෘත්තීන් ගවේෂණය කළ හැකිය. ගිණුම්කරණය, මූල්‍ය සහ ව්‍යාපාර නීතිය පිළිබඳ ශක්තිමත් පදනමක් ඇතිව, උපාධිධාරීන් මූල්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි හෝ මූල්‍ය අංශයේ උපදේශක භූමිකාවන් වැනි පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ද සුදුසු ය.

## 3. අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය
**Bachelor of Business Management (Hons) Marketing**

**කාලය: අවුරුදු 4 (අධ්‍යයන සම්භාර (ක්‍රෙඩිට්) 120)**

මෙම උපාධි වැඩසටහන, නවීන අලෙවිකරණ මූලධර්ම සහ භාවිතයන් පිළිබඳ ශක්තිමත් පදනමක් සිසුන්ට ලබා දීම සඳහා නිර්මාණය කර ඇත. වෘත්තීය ගෝලීය අලෙවිකරණයක් බවට පත්වීමට අපේක්ෂා කරන සහ උපායමාර්ගික අලෙවිකරණ කළමනාකරණය හෝ වෙළඳපල පර්යේෂණ, නිෂ්පාදන සංවර්ධනය, වෙළඳ නාම කළමනාකරණය, ඒකාබද්ධ අලෙවිකරණ සන්නිවේදනය සහ සිල්ලර වෙළඳාම වැනි අලෙවිකරණයේ වෙනත් අංශ කෙරෙහි උනන්දුවක් දක්වන අයට මෙම වැඩසටහන පහසුකම් සපයනු ඇත.

## වැඩසටහන් ව්‍යුහය

මෙම වැඩසටහනට වෙළඳපල පර්යේෂණ, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, පාරිභෝගික හැසිරීම, ඩිජිටල් අලෙවිකරණය, උපායමාර්ගික අලෙවිකරණය සහ සන්නාම කළමනාකරණය වැනි මූලික සහ තේරීම් මොඩියුල ඇතුළත් වේ. අලෙවිකරණයේ න්‍යායාත්මක අංශ සහ අලෙවිකරණයට අදාළ නව්‍ය අවස්ථා වලදී ඒවායේ ප්‍රායෝගික යෙදුම් යන දෙකම සිසුන් ඉගෙන ගනු ඇත. වේගයෙන් විකාශනය වන ව්‍යාපාරික පරිසරයක අභියෝග සඳහා සිසුන් සූදානම් කිරීමට සහ වෙළඳපොළේ ගතිකත්වය තේරුම් ගැනීමට සහ ඒවා ප්‍රයෝජනයට ගැනීමට ඔවුන්ට හැකි වන පරිදි විෂය මාලාව නිර්මාණය කර ඇත. අධ්‍යයන පාඨමාලා වලට අමතරව, සිසුන් ඔවුන්ගේ අවසාන වසර තුළ පර්යේෂණ ව්‍යාපෘතියක් සහ ව්‍යාපාර සීමාවාසික පුහුණුවක් සම්පූර්ණ කළ යුතුය.



www.studentloans.mohe.gov.lk

## සීමාවාසික පුහුණුව

මෙම වැඩසටහනේ සීමාවාසික පුහුණුව විෂය මාලාවේ අනිවාර්ය අංගයක් වන අතර එය සිසුන්ට අලෙවිකරණ සහ විකුණුම් මෙහෙයුම් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා නිර්මාණය කර ඇත. සිසුන් තම අවසන් වසරේ දෙවන අධ්‍යයන වාරය තුළ මාස 6 ක සීමාවාසික පුහුණුව සම්පූර්ණ කළ යුතුය. මෙම සීමාවාසික පුහුණුව මඟින් සිසුන්ට අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ අවබෝධය පුළුල් කිරීමට, වෘත්තීය අවබෝධයක් ලබා ගැනීමට, රැකියා නියුක්තිය පිළිබඳ කුසලතා වර්ධනය කිරීමට සහ නවීන අලෙවිකරණය, වෙළඳ නාමකරණය සහ විකුණුම් මෙහෙයුම් වලදී අධ්‍යයන දැනුම ප්‍රායෝගිකව යෙදීමට හැකියාව ලැබේ.

## වෘත්තීය අවස්ථා

මෙම වැඩසටහනේ උපාධිධාරීන් අලෙවිකරණ ක්ෂේත්‍රයේ පුළුල් පරාසයක වෘත්තීය අවස්ථා සඳහා හොඳින් සූදානම්ව සිටිති. විකුණුම්, වෙළඳ නාමකරණය, පාරිභෝගික හැසිරීම සහ ඩිජිටල් අලෙවිකරණය වැනි ක්ෂේත්‍රවල විශේෂඥතාව ඇති උපාධිධාරීන්ට අලෙවිකරණ කළමනාකරුවන්, වෙළඳ නාම කළමනාකරුවන්, ඩිජිටල් අලෙවිකරණ විශේෂඥයින්, වෙළඳපල පර්යේෂණ විශ්ලේෂකයින් සහ වෙළඳ දැන්වීම් විධායකයින් ලෙස වෘත්තීන් හැදෑරීමට හැකිය. තවද, මෙම වැඩසටහන අලෙවිකරණය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා මෙන්ම ව්‍යවසායකත්වයේ අවස්ථා සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

## 4. මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය **Bachelor of Business Management (Hons) HRM**

### කාලය: අවුරුදු 4 (අධ්‍යයන සම්භාර (ක්‍රෙඩිට්) 120)

මෙම උපාධි වැඩසටහන මානව සම්පත් කළමනාකරණය (HRM) පිළිබඳ විශේෂිත දැනුම සහ ප්‍රායෝගික කුසලතා ඇති අනාගත වෘත්තිකයන් සංවර්ධනය කිරීම සඳහා නිර්මාණය කර ඇති අතර, සංවිධාන තුළ සේවකයින් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහ සහාය වීමට ඔවුන් සන්නද්ධ කරයි. එය න්‍යායාත්මක පදනම් ප්‍රායෝගික යෙදුම් සමඟ ඒකාබද්ධ කරයි, සැබෑ ලෝකයේ මානව සම්පත් අභියෝග හැසිරවීමට සිසුන් සූදානම් කරයි. කුසලතා අත්පත් කර ගැනීම, සේවක සංවර්ධනය, සේවක කළමනාකරණය, කම්කරු සබඳතා සහ ආයතනික හැසිරීම වැනි අත්‍යවශ්‍ය මානව සම්පත් කාර්යයන් මෙම වැඩසටහන ආවරණය කරයි.

## වැඩසටහන් ව්‍යුහය

මෙම සිව් අවුරුදු වැඩසටහන මඟින් සේවක සබඳතා, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ආයතනික හැසිරීම, කාර්ය සාධන කළමනාකරණය, මානව සම්පත් විශ්ලේෂණ, මානව සම්පත් තොරතුරු පද්ධති සහ උපායමාර්ගික මානව සම්පත් සැලසුම්කරණය වැනි මානව සම්පත් කළමනාකරණයේ ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කෙරේ. මෙම විෂය මාලාව සැලසුම් කර ඇත්තේ සිසුන්ට මානව සම්පත් න්‍යායන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දීම සඳහා වන අතරම මෙම සංකල්ප සැබෑ ව්‍යාපාර ව්‍යුහය තුළ යෙදීම අවධාරණය කිරීම සඳහා ය. අධ්‍යයන පාඨමාලා වලට අමතරව, සිසුන් ඔවුන්ගේ අවසාන වසරේදී පර්යේෂණ ව්‍යාපෘතියක් සහ ව්‍යාපාර සීමාවාසික පුහුණුවක් සම්පූර්ණ කළ යුතුය. මෙම සංරචක සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන ඉගෙනීම සැබෑ ලෝක පරිසරයන් තුළ ප්‍රායෝගික යෙදුම් බවට පරිවර්තනය කිරීමට හැකියාව ලබා දෙයි.

## සීමාවාසික පුහුණුව

මෙම වැඩසටහනේ සීමාවාසික පුහුණුව විෂයමාලාවේ අනිවාර්ය අංගයක් වන අතර එය සිසුන්ට මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා නිර්මාණය කර ඇත. සිසුන් තම අවසන් වසරේ දෙවන අධ්‍යයන වාරය තුළ මාස 6 ක සීමාවාසික පුහුණුව සම්පූර්ණ කළ යුතුය. මෙම සීමාවාසික පුහුණුව මඟින් සිසුන්ට වෘත්තීය අවබෝධයක් ලබා ගැනීමට, රැකියා නියුක්තිය පිළිබඳ කුසලතා වර්ධනය කිරීමට සහ කාර්මික පසුබිමක මානව සම්පත් කළමනාකරණය හි අධ්‍යයන දැනුම ප්‍රායෝගිකව යෙදීමට හැකියාව ලැබේ.

## වෘත්තීය අවස්ථා

මෙම වැඩසටහනේ උපාධිධාරීන් රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම පුළුල් පරාසයක වෘත්තීය අවස්ථා වල වැඩ කිරීමට ඉගෙන ගනී. බඳවා ගැනීම් සහ තේරීම්, වන්දි සහ ප්‍රතිලාභ, සේවක සබඳතා, කාර්ය සාධන කළමනාකරණය සහ ආයතනික සංවර්ධනය වැනි ක්ෂේත්‍රවල භූමිකාවන් සොයා ගැනීමට උපාධිධාරීන්ට අපේක්ෂා කළ හැකිය. විභව රැකියා මාතෘකා අතරට මානව සම්පත් කළමනාකරු, බඳවා ගැනීමේ විශේෂඥ, පුහුණු සහ සංවර්ධන කළමනාකරු, සේවක සබඳතා උපදේශක සහ ආයතනික සංවර්ධන විශේෂඥ ඇතුළත් වේ. මානව සම්පත් කළමනාකරණයේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික අංශ දෙකෙහිම ශක්තිමත් පදනමක් ඇති උපාධිධාරීන් මානව සම්පත්, ව්‍යාපාර කළමනාකරණය හෝ අදාළ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ද හොඳින් සූදානම් වේ.

www.studentloans.mohe.gov.lk

## 5. ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය

**Bachelor of Business Management (Hons)**

### කාලසීමාව: අවුරුදු 4 (අධ්‍යයන සම්භාර (ක්‍රෙඩිට්) 120)

මෙම උපාධි වැඩසටහන සැලසුම් කර ඇත්තේ සිසුන්ට මූලික ව්‍යාපාර කළමනාකරණ මූලධර්ම පිළිබඳ ශක්තිමත් අවබෝධයක් ලබා දීම සඳහා ය. වර්තමාන තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ සංවිධාන ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහ මෙහෙයවීමට අවශ්‍ය කුසලතා සහ පුළුල් දැනුම වර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. සමකාලීන කළමනාකරණ භාවිතයන් විශ්ලේෂණය කිරීමට සහ ආයතනික හැසිරීම් තේරුම් ගැනීමට, විවිධ කළමනාකරණ භූමිකාවන්හි සාර්ථකත්වය සඳහා ඔවුන් සන්නද්ධ කිරීම මෙමගින් සිදු කරයි.

### වැඩසටහන් ව්‍යුහය

මෙම විෂය මාලාව උපායමාර්ගික කළමනාකරණය, අලෙවිකරණය, මානව සම්පත්, මූල්‍ය කළමනාකරණය සහ ආයතනික හැසිරීම් ඇතුළු අත්‍යවශ්‍ය ව්‍යාපාරික විෂයයන් ආවරණය කරයි. සිසුන් නායකත්ව න්‍යායන්, තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සහ ව්‍යාපාර ආචාර ධර්ම මෙන්ම අනෙකුත් තීරණාත්මක කළමනාකරණ සංකල්ප ගවේෂණය කරයි. වැඩසටහනේ අවසාන අධ්‍යයන වාරය සඳහා සිසුන්ට ව්‍යාපාර සීමාවාසික පුහුණුවක් හරහා ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට අවශ්‍ය වන අතර, එහිදී ඔවුන් අධ්‍යයන උපදේශකයින්ගේ සහ පත් කරන ලද කළමනාකරුවන්ගේ අධීක්ෂණය යටතේ සැබෑ ලෝකයේ ව්‍යාපාරික අවස්ථා වලට නිරාවරණය වීමට කටයුතු කරනු ඇත. මීට අමතරව, සිසුන්ට පර්යේෂණ ව්‍යාපෘතියක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන අතර, එමඟින් ප්‍රායෝගික ව්‍යාපාරික ගැටළු විශ්ලේෂණය කිරීමට සහ විසඳීමට ඔවුන්ගේ ඉගෙනීම යෙදවීමට ඉඩ සලසයි, ඔවුන්ගේ අධ්‍යයන හා වෘත්තීය සංවර්ධනය තවදුරටත් වැඩි දියුණු කරයි.

### සීමාවාසික පුහුණුව

මෙම වැඩසටහනේ සීමාවාසික පුහුණු අංගය විෂයමාලාවේ අනිවාර්ය අංගයක් වන අතර එය සිසුන්ට සැබෑ ලෝකයේ ව්‍යාපාරික පරිසරයන්හි ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා නිර්මාණය කර ඇත. සිසුන් තම අවසන් වසරේ දෙවන අධ්‍යයන වාරය තුළ මාස 6 ක සීමාවාසික පුහුණුව සම්පූර්ණ කළ යුතුය. සීමාවාසික පුහුණුව මඟින් සිසුන්ට වෘත්තීය අවබෝධය ලබා ගැනීමට, රැකියා නියුක්තිය පිළිබඳ කුසලතා වර්ධනය කිරීමට සහ කාර්මික පසුබිමක අධ්‍යයන දැනුම ප්‍රායෝගිකව යෙදීමට හැකියාව ලැබේ.

### වෘත්තීය අවස්ථා

මෙම වැඩසටහනේ උපාධිධාරීන් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම කළමනාකරණ භූමිකාවන් රාශියක් හැදෑරීමට හොඳින් සන්නද්ධව සිටිති. විභව වෘත්තීය මාර්ග අතරට ව්‍යාපාර කළමනාකරු,

www.studentloans.mohe.gov.lk

අලෙවිකරණ කළමනාකරු, මානව සම්පත් කළමනාකරු, මෙහෙයුම් කළමනාකරු සහ කළමනාකරණ උපදේශක වැනි තනතුරු ඇතුළත් වේ. මීට අමතරව, ව්‍යාපාර කළමනාකරණය, අලෙවිකරණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයන සමඟ අධ්‍යාපනය දිගටම කරගෙන යාමට කැමති සිසුන්ට මෙම වැඩසටහන ශක්තිමත් පදනමක් සපයයි.

## 6. සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය

**Bachelor of Business Management (Hons) Tourism & Hospitality**

**කාලය: අවුරුදු 4 (අධ්‍යයන සම්භාර (ක්‍රෙඩිට්) 120)**

වේගයෙන් වර්ධනය වන සහ ගෝලීය වශයෙන් සම්බන්ධිත සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තයේ විශිෂ්ටත්වය අත්කර ගැනීමට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික කුසලතා සිසුන්ට ලබා දීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. එය සමකාලීන කළමනාකරණ භාවිතයන් ගවේෂණය කිරීම සහ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සංචාරක හා ආගන්තුක සත්කාර හැඩගස්වන ගතිකතාවයන් පිළිබඳ ශක්තිමත් අවබෝධයක් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කරයි. න්‍යායාත්මක අවබෝධය සහ ප්‍රායෝගික භාවිතය යන දෙකම අවධාරණය කරමින්, මෙම උපාධිය සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තයේ සංකීර්ණතා ආමන්ත්‍රණය කිරීමට උපාධිධාරීන් සූදානම් කරයි.

### වැඩසටහන් ව්‍යුහය

මෙම වැඩසටහන සංචාරක හා ආගන්තුක සත්කාර හැඳින්වීම, විශේෂ උනන්දුවක් දක්වන සංචාරක ව්‍යාපාරය, ආහාර පාන කළමනාකරණය, විනෝදාස්වාද කළමනාකරණය, සංචාරක ආර්ථික විද්‍යාව, භාෂා සහ සංචාරක ව්‍යාපාරයේ සෞඛ්‍ය සහ ආරක්ෂාව ඇතුළු විවිධ මූලික විෂය ඒකක ආවරණය කරයි. අධ්‍යයන පාඨමාලා සමඟින්, සිසුන්ට කර්මාන්ත චාරිකා, වැඩමුළු, සම්මන්ත්‍රණ සඳහා වැඩි වශයෙන් නිරාවරණය වන අතර එමඟින් සංචාරක හා ආගන්තුක සත්කාර මෙහෙයුම්වල ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට සහ ඔවුන් ඉගෙන ගත් දේ අදාළ කර ගැනීමට ඉඩ සලසයි. මෙම සංරචක සිසුන්ට තම අධ්‍යයන ඉගෙනීම සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තය තුළ ප්‍රායෝගික යෙදුම් බවට පරිවර්තනය කිරීමට හැකියාව ලබා දෙයි.

### සීමාවාසික පුහුණුව

මෙම වැඩසටහනේ සීමාවාසික පුහුණුව, නවීන සංචාරක සහ ආගන්තුක සත්කාර මෙහෙයුම් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් සිසුන්ට ලබා දීම සඳහා නිර්මාණය කර ඇති විෂය මාලාවේ අනිවාර්ය අංගයකි. සිසුන් තම අවසන් වසරේ දෙවන අධ්‍යයන වාරය තුළ මාස 6 ක සීමාවාසික පුහුණුවක් සම්පූර්ණ කළ



www.studentloans.mohe.gov.lk

යුතුය. මෙම සීමාවාසික පුහුණුව මඟින් සිසුන්ට අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ අවබෝධය ගැඹුරු කිරීමට, වෘත්තීය අවබෝධයක් ලබා ගැනීමට, රැකියා නියුක්තිය පිළිබඳ කුසලතා වර්ධනය කිරීමට සහ සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ අධ්‍යයන දැනුම ප්‍රායෝගිකව යෙදීමට හැකියාව ලැබේ.

### වෘත්තීය අවස්ථා

මෙම වැඩසටහනේ උපාධිධාරීන් හෝටල් කළමනාකරණය, උත්සව සැලසුම්කරණය, සංචාරක උපදේශනය සහ සංචාරක අලෙවිකරණය ඇතුළු පුළුල් පරාසයක භූමිකාවන්හි වෘත්තීන් හැදෑරීමට හොඳින් සූදානම්ව සිටිති. සංචාරක හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ කළමනාකරණ සහ මෙහෙයුම් අංශ දෙකෙහිම ශක්තිමත් පදනමක් ඇතිව, උපාධිධාරීන්ට ආගන්තුක සත්කාර කළමනාකරුවන්, සංචාරක ක්‍රියාකරුවන්, සංචාරක සම්බන්ධීකාරකවරුන්, ආහාර පාන කළමනාකරුවන්, උත්සව සංවිධායකයින් සහ සැලසුම්කරුවන් සහ අවන්හල් ක්‍රියාකරුවන් වැනි භූමිකාවන් භාර ගත හැකිය. වර්ධනය වන ගෝලීය සංචාරක අංශය උපාධිධාරීන්ට ජාත්‍යන්තර සැකසුම්වල වැඩ කිරීමට අවස්ථා විවෘත කරන අතර, මෙම ගතික කර්මාන්තය තුළ ඔවුන්ගේ වෘත්තීය අපේක්ෂාවන් වැඩි දියුණු කරයි.

## 7. කාර්යෝපාය සහ සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය

**Bachelor of Business Management (Hons) Logistics & Supply Chain Management**

### කාලය: අවුරුදු 4 (අධ්‍යයන සම්භාර (ක්‍රෙඩිට්) 120)

මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ සමුච්චිත දැනුම සහ දියුණු කරන ලද දෘඪ කුසලතා සහ මෘදු කුසලතා හරහා කාර්යෝපාය සහ සැපයුම් දාමයේ විශිෂ්ට වෘත්තීන් බිහි කිරීම සඳහා ය. ජාත්‍යන්තර සහ දේශීය වෙළඳපල හරහා භාණ්ඩ, සේවා සහ තොරතුරු ගලායාම කළමනාකරණය කිරීමේදී සිසුන්ගේ විශේෂඥතාව වර්ධනය කිරීම කෙරෙහි එය අවධානය යොමු කරයි. න්‍යායාත්මක අවබෝධය සහ ප්‍රායෝගික භාවිතය යන දෙකම අවධාරණය කරමින්, මෙම උපාධිය නවීන කාර්යෝපාය සහ සැපයුම් දාම මෙහෙයුම්වල සංකීර්ණතා ආමන්ත්‍රණය කිරීමට උපාධිධාරීන් සූදානම් කරයි.

### වැඩසටහන් ව්‍යුහය

මෙම වැඩසටහනට සැපයුම් සහ ප්‍රවාහනය, සැපයුම් දාම කළමනාකරණය, ප්‍රසම්පාදන සහ මූලාශ්‍ර, බහුමාධ්‍ය ප්‍රවාහන ජාල, මෙහෙයුම් කළමනාකරණය, සැපයුම් සහ ප්‍රවාහන රෙගුලාසි සහ සමුද්‍රය සහ ගුවන් සේවා සැපයුම් වැනි මූලික විෂය ඒකක ඇතුළත් වේ. මෙම විෂය ඒකක මඟින් ජාත්‍යන්තර සහ දේශීය වෙළඳපොළවල් හරහා භාණ්ඩ චලනය පාලනය කරන සැපයුම්, ප්‍රවාහන පද්ධති, ප්‍රසම්පාදන



www.studentloans.more.gov.lk

උපාය මාර්ග, සැපයුම්දාම මෙහෙයුම් සහ නීතිමය රාමු පිළිබඳ ශක්තිමත් පදනමක් සිසුන්ට ලබා දේ. ඊට අමතරව, සිසුන්ට ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා, වැඩමුළු, සම්මන්ත්‍රණ සඳහා ද නිරාවරණය වන අතර එමඟින් ඔවුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට සහ සැබෑ ව්‍යාපාරික පරිසරයන් තුළ ඔවුන් ඉගෙන ගත් දේ අදාළ කර ගැනීමට ඉඩ සලසයි.

### සීමාවාසික පුහුණුව

මෙම වැඩසටහනේ සීමාවාසික පුහුණුව විෂය මාලාවේ අනිවාර්ය අංගයක් වන අතර එය සැපයුම් සහ සැපයුම් දාම මෙහෙයුම් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් සිසුන්ට ලබා දීම සඳහා නිර්මාණය කර ඇත. සිසුන් තම අවසන් වසරේ දෙවන අධ්‍යයන වාරය තුළ මාස 6 ක සීමාවාසික පුහුණුව සම්පූර්ණ කළ යුතුය. මෙම සීමාවාසික පුහුණුව මඟින් සිසුන්ට වෘත්තීය අවබෝධය ලබා ගැනීමට, රැකියා නියුක්තිය පිළිබඳ කුසලතා වර්ධනය කිරීමට සහ නවීන සැපයුම් සහ සැපයුම්දාම මෙහෙයුම්වල අධ්‍යයන දැනුම ප්‍රායෝගිකව යෙදීමට හැකියාව ලැබේ.

### වෘත්තීය අවස්ථා

මෙම වැඩසටහනේ උපාධිධාරීන් වෙළඳ නවීකරණය, ඊ-වාණිජ්‍යය සහ සැපයුම් සේවා වැනි විවිධ කර්මාන්තවල වෘත්තීන් හැදෑරීමට හොඳින් සූදානම්ව සිටිති. සංකීර්ණ සැපයුම් දාම ජාල කළමනාකරණය කිරීමේ විශේෂඥතාව ඇති උපාධිධාරීන්ට සැපයුම් කළමනාකරුවන්, සැපයුම් දාම විශ්ලේෂකයින්, ප්‍රසම්පාදන විශේෂඥයින්, මෙහෙයුම් කළමනාකරුවන් සහ ප්‍රවාහන සම්බන්ධීකාරකවරුන් වැනි භූමිකාවන් භාර ගත හැකිය. මීට අමතරව, සැපයුම්, සැපයුම් දාම කළමනාකරණය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඇතුළු වැඩිදුර අධ්‍යයන සඳහා මෙම වැඩසටහන ශක්තිමත් පදනමක් සපයයි.

## 8. ඉංග්‍රීසි භාෂාවෙන් ශාස්ත්‍රවේදී උපාධිය
**Bachelor of Administration in English**

### කාලය: අවුරුදු 3 (අධ්‍යයන සම්භාර (ක්‍රෙඩිට්) 94)

සේජිස් කැම්පස් හි ඉංග්‍රීසි භාෂාවෙන් ශාස්ත්‍රවේදී උපාධිය (BA) සිසුන්ට භාෂා හා සන්නිවේදන ලෝකය ගවේෂණය කිරීමට උපකාරී වේ. මෙම තුන් අවුරුදු උපාධිය භාෂා විද්‍යාව, සාහිත්‍යය සහ විවේචනාත්මක චින්තනය පිළිබඳ ශක්තිමත් කුසලතා ගොඩනඟන අතර, පුළුල් පරාසයක වෘත්තීය සහ අධ්‍යයන මාර්ග සඳහා උපාධිධාරීන් සූදානම් කරයි.

www.studentloans.mohe.gov.lk

**වැඩසටහන් ව්‍යුහය**

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය වසර තුනයි අධ්‍යයන වාර හයක් පුරා විහිදේ. සෑම අධ්‍යයන වාරයකම වාග් විද්‍යාව, සාහිත්‍යය සහ ව්‍යවහාරික වාග් විද්‍යාව යන පාඨමාලා ඒකාබද්ධ වේ. සිසුන් වාග් විද්‍යාව හැඳින්වීම, ඉංග්‍රීසි සඳහා තොරතුරු තාක්ෂණය සහ අධ්‍යයන ලිවීම ඇතුළු මූලික විෂයයන්ගෙන් ආරම්භ වේ. අතරමැදි පාඨමාලා අතරමැදි පාඨමාලා සඳහා වාක්‍ය ඛණ්ඩය සහ අර්ථ විද්‍යාව, සමාජ භාෂා විද්‍යාව, ශබ්ද විද්‍යාව සහ ශබ්ද විද්‍යාව ඇතුළත් වේ. උසස් මොඩියුල ව්‍යවහාරික වාග් විද්‍යාව, භාෂා ඉගැන්වීමේ ක්‍රමවේදය සහ දේශන විශ්ලේෂණය ආවරණය කරයි.

වාග් විද්‍යා පාඨමාලා මොඩියුල භාෂාව පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනය හඳුන්වා දෙයි, මිනිසුන් භාෂාව ඉගෙන ගන්නා සහ භාවිතා කරන ආකාරය, වචන සහ ශබ්ද සෑදෙන ආකාරය සහ අර්ථය වර්ධනය වන ආකාරය ගවේෂණය කරයි. TESL සංරචක සිසුන් වෙනත් භාෂා කතා කරන්නන්ට ඉංග්‍රීසි ඵලදායී ලෙස ඉගැන්වීමට සූදානම් කරයි.

**අනන්‍යතාවය**

මෙම උපාධිය අද්විතීය වන්නේ එහි න්‍යාය සහ භාවිතයේ සමතුලිතතාවයයි. භාෂාව අදහස්, සංස්කෘතීන් සහ අනන්‍යතා හැඩගස්වන ආකාරය සිසුන් ඉගෙන ගනී. මෙම වැඩසටහන පන්ති කාමර ඉගෙනීම සැබෑ ලෝක යෙදුම් සමඟ සම්බන්ධ කරයි, සිසුන්ට චින්තකයින්, සන්නිවේදකයින් සහ අධ්‍යාපනඥයින් ලෙස වර්ධනය වීමට උපකාරී වේ.

**වෘත්තීය අවස්ථා**

සේජිස් කැම්පස් හි ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය බොහෝ වෘත්තීය මාර්ග සඳහා දොරටු විවර කරයි. උපාධිධාරීන්ට ගුරුවරුන්, සංස්කාරකවරුන්, ලේඛකයින්, පරිවර්තකයින්, ශාස්ත්‍රඥයින් හෝ සන්නිවේදන විශේෂඥයින් ලෙස සේවය කළ හැකිය. මෙම වැඩසටහන ඉංග්‍රීසි, භාෂා විද්‍යාව හෝ ඒ ආශ්‍රිත අධ්‍යයන විෂයයන් පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ශක්තිමත් පදනමක් ද සපයයි.

*පරිගණක හා තාක්ෂණ පීඨයේ වැඩසටහන්*

*ඇතුළත් වීමේ අවශ්‍යතාවය: කරුණාකර මාර්ගෝපදේශ පොතේ 02 කොටස අනුගමනය කරන්න.*

9. **තොරතුරු තාක්ෂණ උපාධිය**

   **Business Information Technology (BIT)**

**කාලසීමාව වසර 3 (ණය 90)**



www.studentloans.mohe.gov.lk

මෙම උපාධි වැඩසටහන සැලසුම් කර ඇත්තේ ගතික තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සාර්ථක වෘත්තියක් දියත් කිරීමට අවශ්‍ය මූලික ප්‍රායෝගික කුසලතා සහ න්‍යායාත්මක දැනුමෙන් සිසුන් සන්නද්ධ කිරීම සඳහා ය. මෙම වැඩසටහන ව්‍යාපාරික පරිසරයන් තුළ තාක්‍ෂණය යෙදීම අවධාරණය කරයි, නවීන සංවිධාන රඳා පවතින තොරතුරු තාක්ෂණ පද්ධති ක්‍රියාත්මක කිරීමට, කළමනාකරණය කිරීමට සහ සහාය වීමට උපාධිධාරීන් සූදානම් කරයි. ඵලදායී තාක්‍ෂණික විසඳුම් හරහා සැබෑ ලෝකයේ ව්‍යාපාරික ගැටළු විසඳීම කෙරෙහි නිරන්තර අවධානයක් යොමු කරමින් එය ශක්තිමත් පදනමක් සපයයි.

## වැඩසටහන් ව්‍යුහය

ක්‍රමලේඛනය, වෙබ් සංවර්ධනය, දත්ත සන්නිවේදනය සහ ජාලකරණය, තොරතුරු ආරක්ෂාව සහ පද්ධති පරිපාලනය ඇතුළු අත්‍යවශ්‍ය විෂය ආවරණය වන පරිදි ප්‍රායෝගික යෙදුම් සඳහා විෂය මාලාව නිර්මාණය කර ඇත. විධිමත් ව්‍යුහය මඟින් සිසුන්ට වත්මන් මෙවලම් සහ තාක්ෂණයන් සමඟ කාර්යක්ෂමව ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම සහතික කෙරේ. අවසාන වසරේ ප්‍රධාන අංගයක් වන්නේ ප්‍රායෝගික කර්මාන්ත පාදක ව්‍යාපෘතියක් සහ අධ්‍යයන වාරයක් පුරා අනිවාර්ය සීමාවාසික පුහුණුවක් වන අතර එමඟින් සිසුන්ට ඔවුන්ගේ ඉගෙනීම තහවුරු කර ගැනීමට සහ වටිනා වෘත්තීය අත්දැකීම් ලබා ගැනීමට ඉඩ සලසයි.

## සීමාවාසික පුහුණුව

තොරතුරු තාක්ෂණ උපාධිය (BIT) විෂය මාලාවේ අනිවාර්ය අංගයක් වන සීමාවාසික පුහුණුව, තාක්ෂණික සහාය, තොරතුරු  තාක්ෂණය, යටිතල පහසුකම් කළමනාකරණය සහ ව්‍යාපාර යෙදුම් සංවර්ධනය වැනි සැබෑ ලෝක කාර්යයන් සඳහා ඔවුන්ගේ අධ්‍යයන දැනුම යෙදවීම සඳහා වෘත්තීය තොරතුරු තාක්ෂණ  පරිසරයන්හි ප්‍රායෝගික අත්දැකීම් සිසුන්ට ලබා දීම සඳහා නිර්මාණය කර ඇත. වටිනා වෘත්තීය අවබෝධයක් ලබා ගැනීම, ප්‍රධාන රැකියා නියුක්ති කුසලතා වර්ධනය කිරීම සහ පද්ධති විශ්ලේෂණය, ජාල පරිපාලනය සහ මෘදුකාංග සංවර්ධනය වැනි ක්ෂේත්‍රවල ඔවුන්ගේ ඉගෙනීමේ ප්‍රායෝගික යෙදුම ප්‍රගුණ කිරීම සඳහා මෙම සෘජු නිරාවරණය ඉතා වැදගත් වේ.

## වෘත්තීය අවස්ථා

මෙම වැඩසටහනේ උපාධිධාරීන් තොරතුරු තාක්ෂණ අංශයේ ආරම්භක මට්ටමේ සහ මධ්‍යම මට්ටමේ තනතුරු රාශියක් සඳහා හොඳින් සූදානම්ව සිටිති. ඔවුන්ට තොරතුරු තාක්ෂණ සහාය විශේෂඥ, ජාල පරිපාලක, වෙබ් සංවර්ධක, දත්ත සමුදා පරිපාලක, පද්ධති විශ්ලේෂක සහ තොරතුරු තාක්ෂණ

www.studentloans.mohe.gov.lk

ව්‍යාපෘති සම්බන්ධීකාරක වැනි භූමිකාවන් ඉටු කළ හැකිය. මෙම වැඩසටහන අනාගත වෘත්තීය දියුණුව සහ තවදුරටත් විශේෂිත පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ශක්තිමත් පදනමක් ද සපයයි.

### 10. පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව)

**Bachelor of Science (Hons) in Computer Science**

**කාලය අවුරුදු 4 (ක්‍රෙඩිට් 120)**

පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව) යනු ඊළඟ පරම්පරාවේ පරිගණක වෘත්තිකයන් වගා කිරීම සඳහා නිර්මාණය කර ඇති පුළුල් සිව් අවුරුදු උපාධි වැඩසටහනකි. එය මූලික පරිගණක මූලධර්ම, නවීන තාක්ෂණයන් සහ උසස් ක්‍රමලේඛන කුසලතා පිළිබඳ ගැඹුරු සහ ක්‍රමානුකූල අවබෝධයක් ලබා දෙයි. මෙම වැඩසටහන දැඩි න්‍යායාත්මක දැනුම පුළුල් ප්‍රායෝගික, ප්‍රායෝගික අත්දැකීම් සමඟ මුසු කරයි, සංකීර්ණ සැබෑ ලෝකයේ ගැටළු සඳහා නව්‍ය මෘදුකාංග විසඳුම් සැලසුම් කිරීමට, සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සිසුන් සූදානම් කරයි. විෂය මාලාව මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, කෘතිම බුද්ධිය, දත්ත ව්‍යුහයන්, ඇල්ගොරිතම, දත්ත සමුදා පද්ධති සහ ජාල ආරක්ෂාව වැනි මූලික ක්ෂේත්‍ර ආවරණය කරයි.

**වැඩසටහන් ව්‍යුහය**

මෙම සිව් අවුරුදු වැඩසටහන මූලික පරිගණක සංකල්පවල සිට විශේෂිත උසස් මාතෘකා දක්වා විහිදෙන නිපුණතාවය ක්‍රමානුකූලව ගොඩනැගීම සඳහා ව්‍යුහගත කර ඇත. විෂය මාලාවට මූලික මොඩියුල සහ තේරීම් මාර්ගවල සමතුලිත මිශ්‍රණයක් ඇතුළත් වන අතර එමඟින් දත්ත විද්‍යාව, සයිබර් ආරක්ෂාව හෝ කෘතිම බුද්ධිය වැනි නැගී එන ක්ෂේත්‍රවල ඔවුන්ගේ විශේෂඥතාව සකස් කර ගැනීමට සිසුන්ට ඉඩ සලසයි. අධ්‍යයනයේ ප්‍රධාන ක්ෂේත්‍ර අතර වස්තු-නැඹුරු වැඩසටහන්කරණය, වෙබ් සහ ජංගම යෙදුම් සංවර්ධනය, යන්ත්‍ර ඉගෙනීම සහ වලාකුළු පරිගණකකරණය ඇතුළත් වේ. අවසාන වසරේ සැලකිය යුතු අංගයක් වසරක් පුරා පර්යේෂණ ව්‍යාපෘතියක් සහ කාර්මික සීමාවාසික පුහුණුවක් සඳහා කැප කර ඇත. මෙය සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන දැනුම සංස්ලේෂණය කර එය වෘත්තීයමය වශයෙන් යෙදිය හැකි බව සහතික කරයි.

**සීමාවාසික පුහුණුව**

කාර්මික පුහුණු මොඩියුලය වැඩසටහනේ වැදගත් අංගයක් වන අතර, සිසුන්ට මෘදුකාංග සංවර්ධන ජීවන චක්‍ර සහ උසස් පරිගණක පරිසරයන් සඳහා අගනා නිරාවරණයක් ලබා දෙයි. සාමාන්‍යයෙන් අවසාන වසරේ දී සිදු කරනු ලබන මෙම සීමාවාසික පුහුණුව සඳහා සිසුන්ට නිශ්චිත කාලයක් සඳහා අදාළ සංවිධානයක් තුළ වැඩ කිරීමට අවශ්‍ය වේ. මෙම ස්ථානගත කිරීම අතරතුර, සිසුන් මූලික පරිගණක විද්‍යා ක්‍රියාකාරකම්වල නිරත වේ. තාක්ෂණික කණ්ඩායමක් තුළ කේතනය, නිදොස්කරණය

සහ සහයෝගී ගැටළු විසඳීම පිළිබඳ වෘත්තීය කුසලතා ඔප් නංවා ගැනීම සඳහා මෙම ප්‍රායෝගික අත්දැකීම ඉතා වැදගත් වේ.

**වෘත්තීය අවස්ථා**

විද්‍යාවේදී BSc (ගෞරව) පරිගණක විද්‍යා වැඩසටහනේ උපාධිධාරීන් ගෝලීය රැකියා වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් පවතී. ඔවුන් මෘදුකාංග සංවර්ධනය, දත්ත විශ්ලේෂණය, පද්ධති ගෘහ නිර්මාණ ශිල්පය සහ IT උපදේශනය ඇතුළු තාක්ෂණ අංශයේ විවිධ භූමිකාවන් සඳහා හොඳින් සූදානම් ය. විභව රැකියා මාතෘකා අතරට මෘදුකාංග ඉංජිනේරු, වෙබ් සංවර්ධක, දත්ත විද්‍යාඥ, පද්ධති විශ්ලේෂක, ජාල පරිපාලක සහ AI විශේෂඥ ඇතුළත් වේ. පරිගණක විද්‍යාවේ න්‍යාය සහ භාවිතය යන දෙකෙහිම ශක්තිමත් පදනමක් ඇති උපාධිධාරීන් පරිගණකකරණය සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන සහ පර්යේෂණ හැදෑරීමට ද විශිෂ්ට ලෙස ස්ථානගත වී සිටිති.

1. **මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව)**
   **Bachelor of Science (Hons) in Software Engineering**

**කාලසීමාව වසර 4 (සම්මාන 120)**

මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව) යනු ශක්තිමත්, පරිමාණය කළ හැකි සහ උසස් තත්ත්වයේ මෘදුකාංග පද්ධති සැලසුම් කිරීමට, සංවර්ධනය කිරීමට සහ නඩත්තු කිරීමට හැකියාව ඇති ඉහළ කුසලතා ඇති මෘදුකාංග ඉංජිනේරුවන් බිහි කිරීම සඳහා නිර්මාණය කර ඇති විශේෂිත සිව් අවුරුදු උපාධි වැඩසටහනකි. සාමාන්‍ය පරිගණක විද්‍යාව මෙන් නොව, මෙම වැඩසටහන සමස්ත මෘදුකාංග සංවර්ධන ජීවන චක්‍රයට ඉංජිනේරු මූලධර්ම ක්‍රමානුකූලව යෙදීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. එය දැඩි ප්‍රායෝගික ක්‍රමවේද සමඟ න්‍යායාත්මක පදනම් ඒකාබද්ධ කරයි, අවශ්‍යතා විශ්ලේෂණය සහ නිර්මාණයේ සිට ක්‍රියාත්මක කිරීම, පරීක්ෂා කිරීම සහ යෙදවීම දක්වා සංකීර්ණ මෘදුකාංග ව්‍යාපෘති කළමනාකරණය කිරීමට සිසුන් සූදානම් කරයි.

**වැඩසටහන් ව්‍යුහය**

මෙම සිව් අවුරුදු වැඩසටහනට මූලික මොඩියුල සහ විශේෂිත තේරීම් වලින් සමන්විත ව්‍යුහගත විෂය මාලාවක් ඇතුළත් වන අතර, මුළු ණය 120 කි. මෙම වැඩසටහන මෘදුකාංග අවශ්‍යතා ඉංජිනේරු විද්‍යාව, පද්ධති නිර්මාණය සහ ගෘහ නිර්මාණ ශිල්පය, මෘදුකාංග ඉදිකිරීම, පරීක්ෂා කිරීම සහ තත්ත්ව සහතික කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳව සොයා බලයි. කඩිනම් ක්‍රමවේද, DevOps භාවිතයන් සහ පරිශීලක කේන්ද්‍රීය නිර්මාණය කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කෙරේ. අවසාන වසරේදී, සිසුන් සැලකිය යුතු මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව වසරක් පුරා



www.studentloans.mohe.gov.lk

පර්යේෂණ ව්‍යාපෘතියක් සහ අනිවාර්ය කාර්මික සීමාවාසික පුහුණුවක් ලබා ගැනීමට අවශ්‍ය වේ. අධ්‍යයන දැනුම තහවුරු කිරීම සහ වෘත්තීය සන්දර්භයක් තුළ ඉංජිනේරු මූලධර්ම යෙදීම සඳහා මෙම සංරචක ඉතා වැදගත් වේ.

### සීමාවාසික පුහුණුව

කාර්මික සීමාවාසික පුහුණුව යනු මෘදුකාංග ඉංජිනේරු වැඩසටහනේ මූලික අංගයක් වන අතර එය සිසුන්ට වෘත්තීය මෘදුකාංග සංවර්ධන පරිසරයන්හි අත්‍යවශ්‍ය අත්දැකීම් ලබා දෙයි. අවසාන වසරේ මෙම ස්ථානගත කිරීම සිසුන් තොරතුරු තාක්ෂණ සමාගම් හෝ කැපවූ මෘදුකාංග ඉංජිනේරු කණ්ඩායම් තුළට ඇතුළත් කරයි. මෙම කාල පරිච්ඡේදය තුළ, සිසුන් සජීවී ව්‍යාපෘති සඳහා දායක වන අතර, වැඩසටහන පුරා ඉගෙන ගත් විධිමත් මෘදුකාංග ඉංජිනේරු ක්‍රමවේද, මෙවලම් සහ සහයෝගීතා භාවිතයන් යොදවයි. ඔවුන්ගේ සහභාගීත්වය සංවර්ධන ජීවන චක්‍රයේ ප්‍රධාන අවධීන් දක්වා විහිදේ, විශ්ලේෂණය, පද්ධති නිර්මාණය, ක්‍රියාත්මක කිරීම, පරීක්ෂා කිරීම සහ යෙදවීමේ අවශ්‍යතා ඇතුළුව.

### වෘත්තීය අවස්ථා

BSc Honours මෘදුකාංග ඉංජිනේරු වැඩසටහනේ උපාධිධාරීන් තාක්ෂණ කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් ඇති පුළුල් පරාසයක භූමිකාවන් සඳහා සන්නද්ධ වේ. ඔවුන් මෘදුකාංග ඉංජිනේරුවන්, පූර්ණ-ස්ටැක් සංවර්ධකයින්, මෘදුකාංග ගෘහ නිර්මාණ ශිල්පීන්, තත්ත්ව සහතික (QA) ඉංජිනේරුවන්, DevOps ඉංජිනේරුවන් සහ පද්ධති විශ්ලේෂකයින් ලෙස වෘත්තීන් සඳහා සූදානම් වේ. ඉංජිනේරු මූලධර්ම පිළිබඳ ඔවුන්ගේ දැඩි පුහුණුව විශ්වාසදායක, කාර්යක්ෂම සහ මහා පරිමාණ මෘදුකාංග පද්ධති ගොඩනැගීම අවශ්‍ය වන භූමිකාවන් සඳහා ඔවුන් විශේෂයෙන් වටිනා කරයි. ශක්තිමත් පදනම් දැනුම මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, පරිගණක විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා විශිෂ්ට වේදිකාවක් ද සපයයි.

### 2. තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව)
**Bachelor of Science (Hons) in Information Technology**

### කාලය අවුරුදු 4 (ක්‍රෙඩිට් 120)

තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව) යනු ව්‍යාපාරික අභියෝග විසඳීම සඳහා තාක්ෂණය ඵලදායී ලෙස කළමනාකරණය කර ඒකාබද්ධ කළ හැකි බහුකාර්ය තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් බිහි කිරීම සඳහා නිර්මාණය කර ඇති ගතික සිව් අවුරුදු උපාධි වැඩසටහනකි. මෙම වැඩසටහන ආයතනික සන්දර්භයන් තුළ පරිගණක තාක්ෂණයන් යෙදීම කෙරෙහි අවධානය යොමු කරයි, තාක්ෂණික විශේෂඥතාව සහ ව්‍යාපාරික අවශ්‍යතා අතර පරතරය අඩු කරයි. එය IT යටිතල පහසුකම්, පද්ධති පරිපාලනය, වෙබ් තාක්ෂණයන් සහ දත්ත කළමනාකරණය පිළිබඳ ශක්තිමත් පදනමක් සපයන අතරම, ආයතනික සාර්ථකත්වයට හේතු වන ශක්තිමත් IT විසඳුම් සැලසුම් කිරීම,

www.studentloansmore.gov.lk

ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීම අවධාරණය කරයි.

## වැඩසටහන් ව්‍යුහය

මෙම පුළුල් සිව් අවුරුදු වැඩසටහන මූලික සහ තේරීම් මොඩියුලවල ණය 120 ක් වටා ව්‍යුහගත කර ඇත. විෂය මාලාව ජාලකරණය, දත්ත සමුදා කළමනාකරණය, වෙබ් සංවර්ධනය, සයිබර් ආරක්ෂාව, වලාකුළු පරිගණකකරණය සහ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරණය වැනි අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර ආවරණය කරයි. ප්‍රධාන වෙනස්කමක් වන්නේ ව්‍යාපාර තොරතුරු පද්ධති සහ තොරතුරු තාක්ෂණ පාලනය පිළිබඳ මොඩියුල ඇතුළුව ව්‍යාපාරයේ තොරතුරු තාක්ෂණයේ උපායමාර්ගික භූමිකාව කෙරෙහි එහි අවධානය යොමු කිරීමයි. ඔවුන්ගේ අවසාන වසරේදී, සිසුන් සැලකිය යුතු වසරක පර්යේෂණ ව්‍යාපෘතියක් සහ කාර්මික සීමාවාසික පුහුණුවක් සම්පූර්ණ කළ යුතුය. සැබෑ ලෝකයේ ව්‍යාපාර සහ තොරතුරු තාක්ෂණ පරිසරයන්ට න්‍යායාත්මක දැනුම යෙදීම සඳහා මෙම ප්‍රායෝගික අත්දැකීම ඉතා වැදගත් වේ.

## සීමාවාසික පුහුණුව

කාර්මික සීමාවාසික පුහුණුව වැඩසටහනේ වැදගත් අංගයක් වන අතර, සිසුන්ට වෘත්තීය තොරතුරු තාක්ෂණ පරිසරයන්ට අත්‍යවශ්‍ය නිරාවරණයක් ලබා දෙයි. සාමාන්‍යයෙන් අවසන් වසරේ දී සිදු කරනු ලබන සීමාවාසික පුහුණුව මඟින් සිසුන් සංවිධානයක තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව තුළ ස්ථානගත කෙරේ. ජාල පරිපාලනය, පද්ධති සහාය, දත්ත සමුදා කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණ සේවා මෙහෙයුම්, කර්මාන්ත-සම්මත මෙවලම් සහ ක්‍රමවේද යෙදීම වැනි ක්ෂේත්‍රවල ප්‍රායෝගික අත්දැකීම් ඔවුන් ලබා ගනු ඇත. තාක්ෂණික ප්‍රවීණතාවය, ගැටළු විසඳීමේ කුසලතා සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය පිළිබඳ ගැඹුරු අවබෝධයක් වර්ධනය කිරීම සඳහා මෙම ප්‍රායෝගික සහභාගීත්වය ඉතා වැදගත් වේ.

## වෘත්තීය අවස්ථා

BSc (ගෞරව) තොරතුරු තාක්ෂණ වැඩසටහනේ උපාධිධාරීන් සංවිධාන තුළ තාක්ෂණයට සහාය වන සහ කළමනාකරණය කරන පුළුල් පරාසයක ඉල්ලුමක් ඇති වෘත්තීන් සඳහා සූදානම් වේ. විභව භූමිකාවන් අතර IT කළමනාකරු, පද්ධති පරිපාලක, ජාල ඉංජිනේරු, දත්ත සමුදා පරිපාලක, IT සහාය විශේෂඥ, වෙබ් සංවර්ධක සහ ව්‍යාපාර විශ්ලේෂක ඇතුළත් වේ. ඔවුන්ගේ තාක්ෂණික සහ ව්‍යාපාර-නැඹුරු කුසලතාවල අද්විතීය මිශ්‍රණය ඔවුන් තාක්ෂණික සම්පත් කළමනාකරණය කිරීම සහ ව්‍යාපාරික අරමුණු සමඟ IT උපාය මාර්ග පෙළගැස්වීම අවශ්‍ය වන භූමිකාවන් සඳහා වඩාත් සුදුසු වේ. ශක්තිමත් පදනම් දැනුම තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා විශිෂ්ට වේදිකාවක් ද සපයයි.

www.studentloans.mohe.gov.lk

## 5.10 AQUINAS ආයතනය විසින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

## 1.Bachelor of Science (Honours) in Agro Industry Management

ප්‍රධාන විෂය

කෘෂිකාර්මික ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නව උත්පාදන , ව්‍යාපාරිකත්වය ජාත්‍යන්තර ව්‍යාපාර මෙහෙයුම් කෘෂිකාර්මික මූල්‍ය කෘෂි කර්මාන්ත කළමනාකරණය ගිණුම් ප්‍රතිදානශීල මනව සම්පත් කළමනාකරණය පර්යේෂණ ක්‍රමවේදය කෘෂි සංචාරක ව්‍යාපාරය සහ අනෙකුත් අදාල විෂයයන් ඇතුළත් පාඨමාලා පිරිනමයි.

පශු කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කිරි විද්‍යාව සහ තාක්ෂණය මස් විද්‍යාව සහ තාක්ෂණය කිරි නිෂ්පාදනය ඌරු පාලනය කුකුළු පාලනය සත්ව සෞඛ්‍යය සහ පිරිසිදුකම සත්ව පෝෂණය සහ අනෙකුත් සම්බන්ධ විෂයයන් ඇතුළත් පාඨමාලා පිරිනමයි බෝග කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් බෝග ජීවවිද්‍යාව ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය පාංශු විද්‍යාව වගා බෝග නිෂ්පාදනය පැළ සංශ්ලේෂණය බෝග නිෂ්පාදනයේ ගොවි පුරුදු කෘෂි විද්‍යාව සහ අනෙකුත් සම්බන්ධ විෂයයන් ඇතුළත් පාඨමාලා පිරිනමයි.

සීමාවාසික පුහුණුව

සැලසුම් කරන ලද කර්මාන්තයන් පිළිබඳ පුහුණු අංශයක් ඇතුළත් කර ඇති අතර එක් එක් ශිෂ්‍යයෙකුට රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ කීර්තිමත් සමාගම් සහ සංවිධාන දී නියමිත කාලයක් :අවම මාස 6ක් කර්මාන්තයන් පිළිබඳ පුහුණුවක් ලබන අතර මෙම පුහුණුව ආධාරයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් මඟ පෙන්වීමක් ලැබෙන අතර සම්බන්ධ කර්මාන්තයේ පිටතින් වෘත්තීයවේදීකරුගේ සහායද ලබා දෙනු ලබයි.

වෘත්තීය අවස්ථා

ව්‍යාපාරික පරිසරයක කළමනාකරණ භූමිකාවන් අපේක්ෂා කරන අයට මෙම වැඩසටහන වඩාත් සුදුසුය. වෘත්තීය අවස්ථා අතරට උපදේශක ව්‍යාපාර විධායක කළමනාකරු ව්‍යාපාර සංවර්ධන නිලධාරී ල කෘෂි ව්‍යාපාර කළමනාකරල නිෂ්පාදන කළමනාකරු ල මෙහෙයුම් කළමනාකරු :විශාල ගොවිපලවල් වතු සහ කෘෂි ව්‍යාපාර සමාගම් විකුණුම් විධායක ල ව්‍යාපාර සංවර්ධන විධායක , පර්යේෂණ විධායක හෝ අධ්‍යයන කථිකාචාර්ය ඇතුළත් වේ. ක්‍රමයෙන් දියුණු වෙන පශු සම්පත් අංශයේ ගොවිපල කළමනාකරු ව්‍යාපෘති නිලධාරල මස් සැකසුම් සහ අලෙවිකරණ විධායක, ආහාර නිෂ්පාදන නිලධාරී අභිජනන කාර්මික ලගොවිපල අධීක්ෂක, අභිජනනාගාර කළමනාකරු කිරි තාක්ෂණවේදියෙකු ල තත්ත්ව නිලධාරී සහ තවත් බොහෝ තනතුරු සඳහා අවස්ථා තිබේ.

දේශීය හා විදේශීය වශයෙන් :විශේෂයෙන් ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ඩෙන්මාර්කය, කැනඩාව, නෙදර්ලන්තය සහ ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල්වලල කිරි ගොවිපල කළමනාකරු හෝ අධීක්ෂක, පශු සම්පත් නිෂ්පාදන විශේෂඥ, රංචු සෞඛ්‍ය සම්බන්ධීකාරක සහ කිරි තත්ත්ව සහතික නිලධාරී වැනි තනතුරුවල ඉහළ වැටුප් සහිත වෘත්තීය අවස්ථා තිබේ.

තවද, ව්‍යාප්ති නිලධාරී ල කෘෂිකර්ම නිලධාරී :රජයේ ගොවිජන සේවා, කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥ හා ප්‍රතිපත්ති විශ්ලේෂකල ශාක අභිජනන විද්‍යාඥ ල බීජ නිෂ්පාදන තාක්ෂණවේදී, කෘෂිකාර්මික උපදේශක :ස්වාධීන හෝ වැවිලි, සමුපකාර සඳහා සහ ශාක සමඟ වැඩ කිරීමට කැමති පුද්ගලයින් සඳහා තවත් බොහෝ රැකියා තිබේ.

www.studentloans.mohe.gov.lk

2. Bachelor of Science in Psycology and Counselling

3. Bachelor of Information Technology

## 5.11 ESOFT UNI (PVT) LTD විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්

**1. තොරතුරු තාක්ෂණවේදී ගෞරව උපාධිය - (BIT - Honors)**

**පාඨමාලාවේ මාධ්‍ය:** **ඉංග්‍රීසි**
**කාල සීමාව:** **අවුරුදු 4 (ක්‍රෙඩිට් 124)**

**ඇතුළත් වීමේ සුදුසුකම්**:
ශ්‍රී ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් සාමාන්‍ය සාමාර්ථ 3 ක් තිබීම.

**ව්‍යුහය:**
ESOFT UNI (ESU) හි තොරතුරු තාක්ෂණ ගෞරව උපාධිය, න්‍යාය සහ ප්‍රායෝගික යෙදීම්වල සමබර මිශ්‍රණයක් සැපයීම උදෙසා නිර්මාණය කර ඇති අතර, පරිගණක තාක්ෂණය විසින්, සිසුන්ව, ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකටම බලපෑම් කරන, නිරන්තරයෙන් විකාශනයට ලක්වන තාක්ෂණික තලයකට රැගෙන යනු ඇත.
**Association for Computer Machinery (ACM)** විසින් පරිගණකකරණයේ අර්ථ දක්වා ඇති උප විෂයයන් පහක් සඳහා උපාධි අපේක්ෂක විෂයමාලා මාර්ගෝපදේශ මත පදනම්ව, **Institute of Electrical and Electronics Engineers (IEEE), Institute of Electrical and Electronics Engineers Computer Society (IEEE CS)** ඇතුළු ලොව පුරා ප්‍රමුඛ වෘත්තීය හා විද්‍යාත්මක පරිගණක සංගම් සමගින්, **Sri Lanka Qualifications Framework (SLQF)** හි මාර්ගෝපදේශවලට අනුකූලව විෂයය මාලාව සකසා ඇත.

අනාගතය හැඩගස්වනු ඇතැයි අපේක්ෂා කරන තාක්ෂණයන්හි වේගවත් දියුණුවත් සමඟ, ESU හි BIT (ගෞරව උපාධි) විෂයය මාලාව විසින් සිසුන්ව ඔවුන්ගේ ජීවිත කාලය පුරාවටම ඉගෙනීමට සූදානම් කරවනු ඇත. තොරතුරු තාක්ෂණයේ න්‍යායාත්මක අංශවල ශක්තිමත් පදනමක් පමණක් නොව නායකත්වය, සන්නිවේදනය, ව්‍යවසායකත්වය සහ ඉදිරිපත් කිරීම වැනි අත්‍යවශ්‍ය මෘදු කුසලතා ද මෙහිදී පෝෂණය කරයි. මෙම උපාධි පාඨමාලාවේ ඉහත කී ප්‍රධාන අංග ඒකාබද්ධ කර ඇත්තේ, කුසලතාවයන්ගෙන් හෙබි තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් බිහි කිරීම සඳහායි.

සිසුන්ගේ අධ්‍යයන ගමන සඳහා අවශ්‍ය සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය, පරිගණකකරණය සහ ගණිතය යන ක්ෂේත්‍රවල ශක්තිමත් පදනමක් පළමු වසරේදී ලැබෙනු ඇත.

දෙවන වසරේදී මෙම මූලික කරුණු වඩාත් දියුණු මූලික මොඩියුල හරහා ගොඩනැගෙන අතර එමගින් සිසුන්ගේ න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික කුසලතා තවදුරටත් ශක්තිමත් වේ.

තෙවන වසරේදී විශේෂීකරණය; මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, තොරතුරු පද්ධති ආරක්ෂාව, පරිගණක ජාල, රොබෝ තාක්ෂණය සහ ස්මාර්ට් පද්ධති යන විශේශිත මොඩියුල මගින් ඔවුන් තෝරාගත් ක්ෂේත්‍ර

තුළ සැබෑ ලෝකයේ අභියෝගවලට මුහුණ දෙන තනි ව්‍යාපෘති හරහා, තෝරාගත් ක්ෂේත්‍රවල තාක්ෂණික නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා අවස්ථාව ඇත.

අවසාන වසරේදී, සිසුන් තෝරාගත් මොඩියුලවල නිරත වීමෙන් ඔවුන් විසින් තෝරාගත් ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් හා ගැඹුරු අවබෝධයක් සහතික කර ඇත.

## වෘත්තීය මාර්ග සහ අවස්ථා:

මෙම උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ උපාධිධාරීන් සඳහා විවිධ ක්ෂේත්‍රයන්හි, තාක්ෂණය, මූල්‍ය, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය මෙන්ම රාජ්‍ය අංශයේ ද රැකියා අවස්ථා ඇත.

තවද, BIT ගෞරව උපාධි පාඨමාලාව විසින්, දත්ත සමුදා පරිපාලක, ක්ලවුඩ් විසඳුම් ගෘහ නිර්මාණ ශිල්පීන්, UI/UX ඉංජිනේරු, තත්ත්ව සහතික ඉංජිනේරු, ජාල පරිපාලක, පද්ධති පරිපාලක, DevOps ඉංජිනේරු, ජාල ඉංජිනේරු සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ තවත් බොහෝ අදාළ භූමිකාවන් ඇතුළු පුළුල් පරාසයක වෘත්තීන් සඳහා සිසුන් සූදානම් කිරීම සඳහා නිර්මාණය කර ඇත. සිසුන් සඳහා උසස් තත්ත්වයේ කාර්මික වෘත්තිමය පුහුණුවක් ලබා දීම සඳහා, ESU විසින්, **Virtusa, John Keells IT, Xiteb, HCL, OrelIT, Azend Technologies (Pvt) Ltd** සහ **Cloud Solution International (Pvt) Ltd** සමඟ අවබෝධතා ගිවිසුම් **(MOU)** වලට එළඹ ඇත.

නවෝත්පාදනය, ගැටළු විසඳීම සහ තාක්ෂණයේ පරිවර්තනීය බලය කෙරෙහි ඇල්මක් දක්වන සිසුන්ට **ESOFT UNI** තුළින් ඔවුන්ගේ වෘත්තිමය අභිලාෂයන් සපුරා ගැනීමට හැකි පරිසරයක් නිර්මාණය කර ඇත

## 2. ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය

**පාඨමාලා මාධ්‍යය: ඉංග්‍රීසි**
**කාලසීමාව: අවුරුදු 4 යි**

ESU BBM වැඩසටහන සැලසුම් කර ඇත්තේ දිනෙන් දින නව්‍යකරණය වන ව්‍යාපාරික පරිසරය තුළ විශිෂ්ටත්වයට පත්වීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප සහ මානසිකත්වය ඔබට ලබා දීම සඳහා ය. එය, ප්‍රායෝගික, සැබෑ ලෝකයේ භාවිතා වන යෙදුම් සමග, ශක්තිමත් න්‍යායාත්මක පදනමක් හා ඒකාබද්ධ වෙමින්, පළමු දිනයේ සිටම ඔබව වෘත්තීය ජීවිතය සඳහා සූදානම් කරවනු ඇත.

## මූලික විෂයයන්:

කළමනාකරණය, අලෙවිකරණය, ගිණුම්කරණය, මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය
ව්‍යාපාර විශ්ලේෂණ, ව්‍යවසායකත්වය

BBM විෂයය මාලාව නැගී එන ව්‍යාපාරික අවශ්‍යතා සමග සමානුපාතික වන පරිදි සකසා ඇති අතර, ප්‍රධාන විෂයයන්ට ඇතුළත් වන්නේ:

- ❖ ආයතනික කළමනාකරණයේ ශක්තිමත් පදනමක් ගොඩනැගීම සඳහා - කළමනාකරණයේ සහ නායකත්වයේ මූලධර්ම
- ❖ අලෙවිකරණය සහ පාරිභෝගික හැසිරීම් - පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගන්නේ කෙසේද සහ රඳවා ගන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීම
- ❖ ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය - ව්‍යාපාරයේ භාෂාව ප්‍රගුණ කිරීම

www.studentloans.mohe.gov.lk

- ❖ මානව සම්පත් කළමනාකරණය - පුද්ගලයින් කළමනාකරණය කිරීම සහ කාර්‍යසාධනය සඳහා දිරිමත් කරවීම
- ❖ ව්‍යාපාර විශ්ලේෂණය කිරීම සහ තීරණ ගැනීම - වඩා දක්ෂ ව්‍යාපාරික උපාය මාර්ග මෙහෙයවීම සඳහා දත්ත භාවිතා කිරීම;
- ❖ ව්‍යවසායකත්වය සහ නවෝත්පාදනය - අදහසක්, සාර්ථක ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන්නේ කෙසේද;
- ❖ උපායමාර්ගික කළමනාකරණය - ඇනුම්වත් නායකත්වයක් තුළින් ආයතනයේ අනාගතය හැඩගස්වන ආකාරය

**වෘත්තිමය අවස්ථා ;**

ඕනෑම ක්ෂේත්‍රයක,; **Business Executives , Marketing and HR Professionals , Financial Analysts Entrepreneurs, Consultants Future Business Leaders** යන තනතුරු සඳහා මෙම උපාධි පාඨමාලාව හදාරණ ඔබව සූදානම් කරනු ඇත.

ESU යනු නායකයින් බිහි කරන තෝතැන්නකි. අපගේ BBM උපාධිධාරීන් ජාතික හා කලාපීය වර්ධනයට දායක වන අතරම ගෝලීය ප්‍රමිතීන් ද සපුරාලීමට සමත් ය. නවීන ඉගෙනුම් ප්‍රවේශයන් සහ ශක්තිමත් කර්මාන්ත අවබෝධයක් සමගින්, මෙම උපාධි පාඨමාලාව ඔබට ගණනය කළ නොහැකි අවස්ථාවන් ප්‍රමාණයකට

## 5.12 ඉන්ටර් නැෂනල් කොලේජ් ඔෆ් බිසිනස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් - ICBT

### 01. ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ ව්‍යාපාරයේ සැබෑ වෙනසක් ඇති කිරීම සඳහා කළමනාකරණ දැනුම, කුසලතා සහ නිපුණතා පිළිබඳපුළුල් දැනුමක් හා දැඩි අවබෝධයක් ඇති උපාධිධාරීන් බිහි කිරීමයි. ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) උපාධිධාරීන්ට ඔවුන්ගේ කළමනාකරණ තීරණ ගැනීමට, තම අදහස්, ගැටළු සහ විසඳුම් වඩාත් පැහැදිලිව සන්නිවේදනය කිරීමට, පුළුල් ගැටලු විසඳීමට සහ සංවිධාන වැඩිදියුණු කිරීම සඳහා විමර්ශනාත්මක ඉදිරි දර්ශන ගෙන ඒමට අවශ්‍ය දැනුම සහ පුහුණුව මෙයින් ඔබට ලබා දෙනු ඇත. කාලීන ව්‍යාපාරික ගැටළුවලට පිළියම් සැපයීමේ පුළුල් අවබෝධයක් සහිත විනය ගරුක උපාධිධාරී නායකයින් බිහි කිරීම අපගේ බලාපොරොත්තුවයි.

**වැඩසටහන් ව්‍යුහය**

මෙම පාඨමාලාව් අධ්‍යයන විෂය හතරකින් සමන්විත වන අතර පර්ගේෂණ ව්‍යාපෘතිය සහ සීමාවාසික පුහුණුව් ඇතුලුව අනිවාර්ය විෂයයන් 39 ක් ඇත. ගමම පාඨමාලාවේ පළමු වසර මූලික කළමනාකරණ සංකල්පවලට අදාළ න්‍යායාත්මක අංශ ආවරණය කරයි. මීට අමතරව, එම විෂය පථයට අවශ්‍ය භාෂාව සහ මානව කුසලතා ද ආවරණය කරයි. මූලික සංකල්ප සිසුන්ට දැනුම ග්‍රහණය කර ගැනීමට උපකාරී වන අතර, භාෂාව හා මානව කුසලතා සේවා යෝජකයින් අපේක්ෂා කරන නිපුණතා හා කුසලතා වර්ධනය කර ගැනීමට උපකාරී වේ. දෙවන සහ තෙවන වසර වලදී, කළමනාකරණගේ අනික් සංකල්පවලට අමතරව, වර්තමාන ව්‍යාපාරික ලෝකය තුළ ඉහළ ඉල්ලුමක් ඇති ව්‍යවසායකත්වය, නායකත්ව්‍ය සහ සදාචාරාත්මක භාව්‍ය පිළිබඳ වැදගත් ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම අපගේ අරමුණයි. අවසාන වර්ෂයේදී, ගෝලීය ආර්ථිකයට ගැලපෙන න්‍යායාත්මක අධ්‍යයන ඇතුලත් කිරීමෙන් ජාත්‍යන්තර රැකිය වෙළඳපළට ගැලපෙන උපාධිධාරීන් බිහි කිරීම අපගේ

ඉලක්කයයි. අවසාන වර්ෂයේදී පර්යේෂණ ව්‍යාපෘතිය සහ සීමාවාසික පුහුණුව සමඟ සිසුන් අනාගත රැකියාව සඳහා සූදානම් කිරීම මෙහි විශේෂත්වයයි.

### ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම

එක් එක් විෂය සම්පූර්ණ වූ පසු, ශිෂ්‍යයා එම විෂය සඳහා අදාළ පැවරුම සම්පූර්ණ කර අවම සාමාර්ථ ලකුණ 40 ක් ගත යුතුය. අසමත් වූ අවස්ථාවකදී, විෂය සම්පූර්ණ කිරීම සඳහා ඔහුට/ ඇයට අමතර අවස්ථා දෙකක් ලැබෙනු ඇත. සමස්තයක් ලෙස ගත් තුන්වන උත්සාහය, ශිෂයයා විසින් කරන ලද අවසාන උත්සාහය ලෙස සැලකේ. අවසාන වසරේදී සිසුන්ට සීමාවාසික පුහුණුව සඳහා ස්ථානයක් සොයා ගැනීමට අවස්ථාව ලබා දෙන අතර එම පුහුණුව මාස 6 ක් පුරා ක්‍රියාත්මක වේ. ඊට අමතරව අවසාන වර්ෂයේ පර්යේෂණ ව්‍යාපෘතියට අවම වශයෙන් අනිවාර්ය අධීක්ෂණ සැසි පහක් ඇතුළත් වේ. ශිෂ්‍යයා සියළුම අධීක්ෂණ සැසිවාරවලට සහභාගී විය යුතු අතර ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීම සඳහා අධීක්ෂකගේ කැමැත්ත ලබා ගත යුතුය. අධීක්ෂක විසින් අත්සන් කිරීමක් නොමැති නම්, එය වලංගු ඉදිරිපත් කිරීමක් ලෙස නොසැලකේ.

### රැකියා අවස්ථා

මෙම පාඨමාලාව අවසන් වූ පසු උපාධිධාරීන්ට කළමනාකරණ අභ්‍යාසලාභීන්, කළමනාකරණ සහායකයින්, විධායකයින්, අලෙවිකරණ, මානව සම්පත් වැනි ක්‍රියාකාරී කාණ්ඩවල පරිපාලන කළමනාකරුවන් ලෙස විවිධ රාජය හා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා සොයා ගැනීමට හැකි වේ.

## 5.13 ICHEM ආයතනය විසින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

### 1.රසායනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය.

1941 වර්ෂයේ පිහිටුවා ලූ ලංකා රසායන විද්‍යා සංගමයේ අනුප්‍රාප්තික සංවිධානය වන ලංකා රසායන විද්‍යා ආයතනය, ශ්‍රී ලංකාවේ පැරණිතම විද්‍යානුබද්ධ ආයතනයක් වේ. ශ්‍රී ලංකා ප්‍රමිති රාමුවෙහි 6 වන මට්ටමට අනුකූල වන, සිව් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවක් වන රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, සියලු විද්‍යාර්ථයන් හට රසායන විද්‍යාව පිළිබඳ පුළුල් අධ්‍යාපනයක් ලබා දිය හැකි පරිදි නිර්මාණය කොට ඇත. මෙම උපාධි පාඨමලාවේ ප්‍රධානතම අරමුණ වනුයේ (1) නිෂ්පාදනය හා අගය එකතු කිරීම තුළින් තිරසාර සංවර්ධනයක් හා ආර්ථික ප්‍රතිලාභ රටට ළඟා කර දීම සහ (2) රසායන විද්‍යාව හා සම්බන්ධ ගෝලීය පර්යේෂණ සඳහා දායක වීම වේ. මෙම පාඨමාලාව සකස් කොට ඇත්තේ රසායන විද්‍යාව හා උපයෝගී කළමනාකරණ විෂය පථයක් අන්තර්ගත වන පරිදිය. අතිශය තරඟකාරී රැකියා වෙළඳපොළ තුළ සාර්ථකව කටයුතු කළ හැකි, දැඩි ඉල්ලුමක් සතු දක්ෂ උපාධිධාරියෙකු බිහිකිරීමට රසායන විද්‍යාවත්, කළමනාකරණයත්, අද්විතීය සංයෝජනයක් වනු ඇත. එවන් විෂය සංයෝජනයකින් යුත් පාඨමාලාවක් පිරිනමන දකුණු ආසියාවේ එකම උසස් අධ්‍යාපන ආයතනය වනුයේ ලංකා රසායන විද්‍යායතනයයි. රසායන විද්‍යාවේ සවිමත් පසුබිමක් තුළ, විශිෂ්ඨ කළමනාකරණ කෞශල්‍යයන්ගෙන් හෙබි රසායන විද්‍යාඥයන් බිහිකරලීම අපගේ මුඛ්‍යතම අරමුණයි.

**<u>පාඨමාලාවේ ව්‍යුහය</u>**

කාබනික රසායනය, අකාබනික රසායනය, භෞතීය රසායනය, විශ්ලේෂණ රසායනය සහ ජෛව රසායනයට අදාළ මූලික හා අතරමැදි මට්ටමේ විෂයන් පළමු වසර ද්විත්වය තුළ පිරිනැමේ.



www.studentloans.mohe.gov.lk

පාඨමාලාවේ මූලික අන්තර්ගතය රසායන විද්‍යාව වුවද, පසුකාලීනව පිරිනැමෙන ගැඹුරු රසායන විද්‍යා විෂයන් පහසුවෙන් ග්‍රහණය කරගැනීම සඳහා, ගණිතය, ජීවවිද්‍යාව, භෞතික විද්‍යාව, ඉලෙක්ට්‍රොනික විද්‍යාව හා සංඛ්‍යානය ආදී අමතර විෂයන් විෂය මාලාවට එක්කොට ඇත. තෙවන හා සිව්වන වසර වලදී රසායන විද්‍යාවේ උසස් සංකල්ප මෙන්ම කළමනාකරණ විෂයන් ද ශිෂ්‍යයන් හට පිරිනැමෙනු ඇත. මෙම අනිවාර්යය විෂය ඒකක අධ්‍යයනය කරන අතරවාරයේම, සිය කැමැත්ත පරිදි කර්මාන්ත අනුබද්ධ විෂය තෝරා ගැනීමටද ශිෂ්‍යයන් හට අවස්ථාව තිබේ. කාර්මික පසුබිම තුළ ක්‍රියා කරන රසායන විද්‍යාඥයෙකු හට තම ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය දැනුම උකහා ගැනීමට හැකි වන පරිදි පුළුල් විකල්ප විෂයන් ගණනාවක් මෙම පාඨමාලාව තුළ අන්තර්ගත වේ.

විද්‍යාඥයෙකු හට අත්‍යාවශ්‍ය ප්‍රායෝගික දැනුම පළපුරුද්ද සහ අත්දැකීම් ලබා ගැනීමට හැකි වන ලෙස, රසායන විද්‍යාවේ සියළුම අංශ ආවරණය වන පරිදි සැකසූ ප්‍රායෝගික විෂයන් ගණනාවක්ද මෙම විද්‍යාවේදී ගෞරව උපාධියෙහි පළමු වසර තුන තුළ අන්තර්ගත වේ. එමෙන්ම, අවසන් වසර තුළදී ශිෂ්‍යයන් හට පර්යේෂණ ව්‍යාපෘතියක් හෝ සීමාවාසික පුහුණුවක් තෝරා ගැනීමට හැකි අතර, එහිදී තෙවසරක් තුළ තමා ලබා ගත් දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීම පිළිබඳව පුහුණුවක් ලබා ගැනීමට ද ඔවුන් හට අවකාශය හිමිවනු ඇත. අප විද්‍යාර්ථයන් හට, රසායන විද්‍යාඥයන් ලෙස ඔවුන් සතු විය යුතු ප්‍රවීණතාවය, තාර්කික හා විවේචනාත්මක චින්තනය දියුණු කිරීමට අවැසි, පර්යේෂණ ක්‍රමවේදයන්ට නිරාවරණය වීමටත්, පර්යේෂණ ශිල්පීය ක්‍රම ප්‍රගුණ කිරීමටත්, ශක්තිමත් අඩිතාලමක් සකස් කර දී ඇත.

**<u>උපාධිය ලබා ගැනීමෙන් පසු හිමි කර ගත හැකි අවස්ථා</u>**

මෙම සිව් වසරක උපාධි පාඨමාලාව හැදෑරීමෙන්, රසායන විද්‍යාඥයෙකු ලෙස විශ්වවිද්‍යාල සහ උසස් පර්යේෂණ ආයතන වලට සම්බන්ධ වීමට ද, විද්‍යාපති, දර්ශනපති, ආචාර්ය ආදී වූ දෙස් විදෙස් සම්භාවනීය විශ්වවිද්‍යාල වල පශ්චාත් උපාධි අධ්‍යයන වරම් හිමිකර ගැනීමට ද, ගුරු, කථිකාචාර්ය ආදී වූ ශාස්ත්‍රීය ක්ෂේත්‍ර වලට සම්බන්ධ වීමට ද, පර්යේෂණායතන, විවිධ රසායනාගාර, ඛනිජ තෙල්, රූපලාවන්‍ය, තීන්ත, සිමෙන්ති, ආහාර හා ඖෂධ නිෂ්පාදනය ආදී වූ රසායන විද්‍යාව මූලික කොට ගත් විවිධ අංශ හා කර්මාන්ත වල රැකියා අවස්ථා හිමි කර ගැනීමට ද හැකියාවක් ඇත.

## 5.14 Benedict XVI Catholic International Institute Of Higher Education

### ව්‍යාපාර විද්‍යා පීඨය

BCI හි ව්‍යාපාර විද්‍යා පීඨය මගින් වෘත්තීය මූලිකත්වය සහ නවෝත්පාදනය පදනම් කරගත් විවිධ උපාධි පාඨමාලා පිරිනමයි. ඒ අතරින් ව්‍යාපාර කළමනාකරණය ගණන් හා මූල්‍ය කළමනාකරණය වෙළෙඳ ප්‍රචාරණ කළමනාකරණය සහ මනුෂ්‍ය සම්පත් කළමනාකරණය ආදි පාඨමාලා අන්තර්ගත වේ. අපගේ අරමුණ වන්නේ ශිෂ්‍යයින්ට විසි එක්වන සියවසේ ශ්‍රම වෙළඳපොලේ අභියෝගයන්ට සූදානම් වීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබාදීමයි. නවෝත්පාදනශීලී ඉගැන්වීම් හා ඉගැන්වීමේ පරිසරයක් තුළින් ශිෂ්‍යයන්ට තම වෘත්තීය අරමුණු ඉටු කර ගැනීමට උපකාර කිරීම අපගේ මූලික අරමුණයි. අපගේ පලපුරුදු ආචාර්ය මණ්ඩලයේ උසස් තත්ත්වයේ අධ්‍යාපනයන් ලබාදීමට කැපවී සිටින අතර ශිෂ්‍යයන්ගේ සම්පූර්ණ හැකියාවන් විකාශනය කිරීමට හැකියාව ලැබේ.

www.studentloans.mohe.gov.lk

## 1. ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධි පාඨමාලාව

### පාඨමාලා ව්‍යුහය

මෙම උපාධි පාඨමාලාව අවුරුදු හතරක අධ්‍යයන කාලයක් සඳහා නිර්මාණය කර ඇත. සෙමිස්ටර් අටක් ලෙස වසර හතරක් තුල එය සම්පූර්ණ කල යුතුය. එක් වසරකදී සෙමෙස්ටර් දෙකක් පවත්වනු ලබයි. උපාධිය සඳහා සුදුසු වීමට ශිෂ්‍යයකු විසින් අධ්‍යයන අංශ එකසිය විස්සක් ලබා ගත යුතු අතර මුල් අවුරුදු තුන තුළ අධ්‍යයන අංශ අනූවක් සහ අවසන් අවුරුද්දේ අධ්‍යයන අංශ 30ක් ලබා ගත යුතුය.

මෙම පාඨමාලාව "2 + 2" ලෙස හැඳින්වෙන ව්‍යුහයක් අනුගමනය කරයි. එනම් පළමු වසර සහ දෙවන වසර තුළ සියලුම ශිෂ්‍යයන් පොදු පාඨමාලාවක් අනුගමනය කරති. මෙම පොදු පාඨමාලාව සියළුම ක්ෂේත්‍රවල මූලික දැනුම ලබාදීම අරමුණ වී ඇත.

තුන්වන වසරේ ශිෂ්‍යයින්ට ව්‍යාපාර කළමනාකරණ සාමාන්‍ය උපාධිය ලබා ගත හැකි අතර සිව්වන වසර අවසානයේදී ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය ලබාගත හැක.

### ප්‍රධාන විෂයන්

ව්‍යාපාර කළමනාකරණය ව්‍යාපාර සඳහා තොරතුරු තාක්ෂණය පිරිවැය හා කළමනාකරණ ගණන් කරණය ව්‍යාපාර සංඛ්‍යානය මෘදු කුසලතා සංවර්ධනය මූල්‍ය හා තාක්ෂණ තාක්ෂණ මෙනෙහි කළමනාකරණයේ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදයේ ව්‍යාපාර ආරම්භකත්වය පරිගණක මූලික දත්ත විශ්ලේෂණය හා අනෙකුත් සම්බන්ධිත විෂයයන් මේ සඳහා අයත් වේ.

### කාර්මික පුහුණුව

ශිෂ්‍යයකු වන සෑම අයෙකුටම ප්‍රායෝගික අත්දැකීමක් ලබාදීම අරමුණු කර ගත් කාර්මික පුහුණුවක් මූලික කොටසක් ලෙස ඇතුළත් කර ඇත. ඒ අනුව ශිෂ්‍යයෙකුට සම්මානිත රාජ්‍ය හෝ පුද්ගලික ආයතනයක සීමිත කාලයක් එනම් අවමය මාස හයක් පමණ කාර්මික පුහුණුවක් ලබාගත හැකි අතර ඒ විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර මාර්ග දර්ශනයක් සහ එම ක්ෂේත්‍රයේ පළ පුරුදු වෘත්තීයකුගේ උපදෙස් යටතේ සිදුවේ.

### වෘත්තීමය අවස්ථා

මෙම පාඨමාලාව ව්‍යාපාරික පරිසරයක පාලනමය තනතුරකට රැකියා ලබන බව අපේක්ෂා කරන අයට වඩාත් සුදුසුය. ඒ අනුව වෘත්තීය අවස්ථාව ලෙස, උපදේශක, ව්‍යාපාරික විධායක, කළමනාකරු, ව්‍යාපාර සංවර්ධන විධායක, ව්‍යාපාර සම්බන්ධකරු, ව්‍යාපාර ආරම්භකයෙකු, බැංකු නිළධාරීන්, පර්යේෂණ විධායකයන් සහ අධ්‍යන මණ්ඩල සාමාජිකයෙකු වූ විද්‍යාර්ථයකු ලෙස සේවය කිරීමට අවස්ථාව ඇත.

## 2. ගණනා මූල්‍ය කළමනාකරණයේ ව්‍යාපාර කළමණාකරන ගෞරව උපාධිය

### පාඨමාලා ව්‍යුහය

ගණන් හා මූල්‍ය කළමනාකරණය ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධි පාඨමාලාව අවුරුදු හතරක අධ්‍යන කාලයකට සංවිධානය කර ඇත. මෙහිදී සම්පූර්ණ වන්නේ සෙමෙස්ටර් අටක් වන අතර වසරකට සෙමෙස්ටර් දෙකක් ලෙසය. උපාධිය සඳහා සුදුසු වීමට ශිෂ්‍යයකු විසින් අධ්‍යයන අංශ 120ක් ලබාගත යුතු අතර මුල් අවුරුදු තුන තුළ අධ්‍යයන අංශ අනූවක් සහ අවසන් වසරේ අධ්‍යයන අංශ 30ක් ලබා ගත යුතුය.

www.studentloans.mohe.gov.lk

මෙම පාඨමාලාව ද "2 + 2" ව්‍යුහය අනුගමනය කරයි. ඒ අනුව පළමු වසර සහ දෙවන වසර තුළ සියලුම ශිෂ්‍යයන් පොදු පාඨමාලාවක් අනුගමනය කරති. එහි අරමුණ වන්නේ ව්‍යාපාර කළමනාකරණයේ සියලුම ක්ෂේත්‍රවල මූලික දැනුම හා හැඳින්වීම ලබාදීමයි

තුන්වන වසර සහ සිව්වන වසර ශිෂ්‍යයන්ට සාමාන්‍ය ව්‍යාපාර කළමනාකරණ උපාධිය සහ ගිණුම් හා මූලයේ උසස් ගෞරවය සහිත ව්‍යාපාර කළමනාකරන උපාධිය ලබා ගැනීමේ හැකියාව ඇත.

### ප්‍රධාන විෂයන්

ආර්ථික විද්‍යාව, ව්‍යාපාර තොරතුරු පද්ධති, මෙහෙයුම් කළමනාකරණය, උසස් ගිණුම්කරණය සමාගම් මූල්‍ය, පරිගණක මූලික ගිණුම්කරණය, බදු විද්‍යාව විනිශ්චය ගිණුම්කරණය ආදියයි.

### කාර්මික පුහුණුව

ශිෂ්‍යයන් සඳහා අවම මාස හයක් පමණ කාලයක් පුරා ප්‍රසිද්ධ සහ විශ්වාසදායක රාජ්‍යය හෝ පුද්ගලික ආයතන වල කාර්මික පුහුණු වැඩසටහනක් සකස් කර ඇත. එම පුහුණුව දියත් වන අතර ශිෂ්‍යයන්ගේ විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී උපදේශකයෙකුගේ සහ ආයතනයක අයෙකුගේ මාර්ගෝපදේශනය යටතේ එය සිදුවේ.

### වෘත්තීය අවස්ථා

මෙම උපාධිය සම්පූර්ණ කල පසු ඔබට ලැබිය හැකි රැකියා අවස්ථා බොහෝය. ඒ අතර ගිණුම් විශේෂඥ (තක්සේරුම් බදුව උපදේශන ක්ෂේත්‍රවල විශේෂඥයෙක්ක් ලෙස) සමාගම් හෝ රාජ්‍ය මූල සහ ආයෝජන කළමණාකරු, කළමනාකරණ ගිණුම්කරු, ව්‍යාපාර අගය නිර්ණායක, මූල්‍ය විශ්ලේෂක, බදු විශේෂඥ, අයවැය විශ්ලේෂක, මූල්‍ය විනිශ්චය විශේෂඥ සහ මූල්‍ය සැලසුම්කරු වැනි වෘත්තීය මාර්ගයන් ඇතුළත් වේ.

## 3. වෙළඳපළ කළමනාකරණ උසස් ගෞරව උපාධිය

### පාඨමාලා ව්‍යුහය

මෙම ගෞරව උපාධි පාඨමාලාව වසර හතරක අධ්‍යයන කාලයක් ආවරණය කරන අතර සෙමිස්ටර් අටක් වන අතර වසරකට සෙමෙස්ටර් දෙක බැගින් පවතී. උපාධිය සඳහා සුදුසුකම් ලබන්නාට අධ්‍යයන අංශ එකසිය විස්සක් ලබා ගත යුතු අතර පළමු වසර තුළ අධ්‍යයන අංශ අනූවක් සහ අවසන් වසරේ අධ්‍යයන අංශ තිහක් අවශ්‍ය වේ.

මෙම උපාධිය "2 + 2" යන විශේෂ පාඨමාලා ව්‍යුහය අනුව ක්‍රියාත්මක වේ. පළමු හා දෙවන වසර වලදී සියලුම සිසුන් ව්‍යාපාර පීඨයේ පොදු පාඨමාලාවක් අධ්‍යයනය කළ යුතු යුතුය. එම පාඨමාලාවෙන් ව්‍යාපාර කළමනාකරණයේ මූලික ආධාරක දැනුම හා මූලධර්ම ක්ෂේත්‍ර ලබාදීමට මෙහි අරමුණ කරගෙන ඇත.

තෙවන හා සිව්වන වසර වලදී සිසුන්ට තම විශේෂාංගය අනුව ව්‍යාපාර කළමනාකරණයේ සාමාන්‍ය උපාධිය හෝ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය ලබා ගැනීමට හැකියාව ලැබේ.(වෙළඳපළ කළමනාකරණය පිළිබඳව)

### ප්‍රධාන විෂයන්

වෙළඳපළ කළමනාකරණය, සැපයුම් දාම කළමනාකරණය, ඒකාබද්ධ වෙළඳ සන්නිවේදනය, පාරිභෝගික සබඳතා කළමනාකරණය, වෙළඳපළ ගවේෂණ විශ්ලේෂණ මෙවලම්, ජාත්‍යන්තර වෙළඳපළ කළමනාකරණය, ඩිජිටල් මාර්කටින් වැනි විෂයන් ඇතුලත්ය.

### කාර්මික පුහුණුව

උපාධියේ අංගයක් වන කාර්මික පුහුණු වැඩසටහන යටතේ සිසුන්ට රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නාමයන්ග්‍රාහි ආයතන වලදී කාර්මික අත්දැකීම් ලබා ගැනීමට හැකි වේ. මෙම පුහුණුව අවම මාස හයක් පුරා දිවෙන අතර විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන මණ්ඩල සාමාජයෙකුගේ මග පෙන්වීමක් සහිතව අදාළ ක්ෂේත්‍රයේ කාර්මික විශේෂඥයෙකුගේ උපදේශනය ද ලැබේ.

### වෘත්තීය අවස්ථා

මෙම උපාධිය සම්පූර්ණ කළ ඔබට විවිධ පැතිකඩයන් ඔස්සේ වෘත්තීය මාර්ග විවෘත වේ. වෙළඳ නාම කළමනාකාරීත්වය, විකිණීම් සහ වෙළඳ කළමනාකරණය, වෙළෙඳ උපදේශනය, වෙළඳපළ ගවේෂණය හා විශ්ලේෂණය, ව්‍යාපාර සංවර්ධනයේ ඩිජිටල් මාකටින්, සිල්ලර කළමනාකරණය සහ ව්‍යාපාර ආරම්භකත්වය, වැනි ශ්‍රේෂ්ඨ අතරින් ඔබේ අනාගතය ගොඩනගා ගත හැක. මෙලෙස වේගයෙන් වර්ධනය වන හා තාක්ෂණය සමඟ පරිනත වන ක්ෂේත්‍රය තුළ ඔබට අනාගතයේදී විශාල අවස්ථා සහිත විශිෂ්ට වෘත්තීමය අවස්ථාවක් ගොඩනගා ගත හැක.

## 4. ව්‍යාපාර කළමනාකරණ උසස් ගෞරව උපාධිය මනුෂ්‍ය සම්පත් කළමනාකරණය පිළිබඳව

### පාඨමාලා ව්‍යුහය

මෙම උපාධි පාඨමාලාව වසර හතරක අධ්‍යයන කාලයක් ආවරණය කරන අතර, සෙමෙස්ටර් (8) කි. සෙමෙස්ටර් දෙකක් බැගින් වසරකට පවතී. උපාධිය සඳහා සුදුසුකම් ලබා ගැනීමට සිසුන්ට සමස්ත අධ්‍යයන අංශ 120ක් ලබා ගත යුතු අතර, පළමු වසර තුන තුළ අධ්‍යයන අංශ 90ක් සහ අවසන් වසරේ අධ්‍යයන අංශ 30ක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

මෙම උපාධිය "2 + 2" යන විශේෂ ව්‍යුහයක් අනුව ක්‍රියාත්මක වේ. එහිදී ව්‍යාපාර පීඨයේ සියලුම උපාධි සිසුන් පළමු වසර හා දෙවන වසරවලදී පොදු පාඨමාලාවක් අධ්‍යයනය කරති. එම පොදු පාඨමාලාව මගින් ව්‍යාපාර කළමනාකරණයේ සියලුම ක්ෂේත්‍රවල මූලික ආධාරක දැනුම ලබා දීමට අරමුණු කර ගෙන ඇත.

තෙවන වසර සහ සිව්වන වසර තුළදී සිසුන්ට තම විශේෂාංගය අනුව ව්‍යාපාර කළමනාකරණ සාමාන්‍ය උපාධිය හෝ ව්‍යාපාර කළමනාකරණ උසස් ගෞරව උපාධිය (මනුෂ්‍ය සම්පත් කළමනාකරණය) ලබා ගැනීමට හැකියාව ඇත.

### ප්‍රධාන විෂයයන්

මනුෂ්‍ය සම්පත් කළමනාකරණය, මනුෂ්‍ය ප්‍රතිභා කළමනාකරණය, රැකියා නීතිය හා කාර්මික සම්බන්ධතා, මනුෂ්‍ය සම්පත් තොරතුරු පද්ධතිය, තිරසාර මනුෂ්‍ය සම්පත් කළමනාකරණය, නවීන මනුෂ්‍ය සම්පත් ගැටළු, උසස් කාර්ය සාධන ක්‍රමවේද

මෙම විෂයයන් මගින් සිසුන්ට නවීන සංවිධානික පරිසරයක මනුෂ්‍ය සම්පත් කළමනාකරණය ප්‍රායෝගික හා නායකත්වයෙන් යුතුව දැනුම ලබා ගැනීමට හැකියාව ලැබේ.

### කාර්මික පුහුණුව

උපාධියට අත්‍යවශ්‍ය අනිවාර්යී අංගයක් වන කාර්මික පුහුණු වැඩසටහන යටතේ, සිසුන්ට ප්‍රසිද්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලදී අවම මාස හයක් පුරා කාර්මික පුහුණුවක් ලබා ගැනීමට හැකි වේ. මෙම කාලය තුළ සිසුන්ට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මණ්ඩල සාමාජිකයෙකුගේ මඟපෙන්වීමක් සහිතව, අදාළ ක්ෂේත්‍රයේ කාර්මික

www.studentloans.mohe.gov.lk

විශේෂඥයකුගේ උපදේශනයද ලැබේ. මෙය සිසුන්ට සැබෑ ක්ශ්‍රේතයක අත්දැකීම් ලබා දීමෙන්, ඔවුන්ගේ වෘත්තීය නියමය හා හැකියාව වර්ධනය කරයි.

## වෘත්තීය අවස්ථා

මනුෂ්‍ය සම්පත් කළමනාකරණය යනු, අනෙකුත් අයගේ ජීවිත ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට කැමති අය සඳහා තෘප්තිමත් හා අර්ථවත් වෘත්තියක් ලෙස සැලකේ. ඵලදායී මනුෂ්‍ය සම්පත් කළමනාකරණය මගින් ආයතනවල නීතිමය රැකියා ක්‍රමවේද පවත්වා ගැනීමත්, සේවකයින්ගේ වටිනාකම උදෙසා පරිපූර්ණ සංස්කෘතියක් සෑදීමත් මෙයින් සිදු වේ. මෙම උපාධිය ලබා ගැනීමෙන් ඔබට විවිධ වෘත්තීය මාර්ග විවෘත වේ, ඒ අතර මානව සම්පත් විශේෂඥයන්, මානව සම්පත ්කළමනාකරුවන්, පුහුණු හා සංවර්ධන විශේෂඥයන්, සේවක ආකර්ෂණ හා තේරීමේ විශේෂඥයන්, ප්‍රතිභා කළමනාකරුවන්, සහ සංවර්ධන කළමනාකරුවන් වැනි තනතුරු ඇතුළත් වේ. මනුෂ්‍ය සම්පත් ක්ෂේත්‍රය යනු වර්ධනය වන, සමාජමය හා සංවිධානික වගකීම් ගළපන ඉතා අගනා වෘත්තියක් වන අතර, එය අනාගතයේදීද විශාල ඉල්ලුමක් සහිත ක්ෂේත්‍රයකි.

## ගණකවිද්‍යා පාඨමාලා පීඨය

ගණකවිද්‍යා පාඨමාලා පීඨය මගින් තොරතුරු තාක්ෂණය, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, සහ ගණනාවිද්‍යාව යන ක්ෂේත්‍රවල නවෝත්පාදනශීලී සහ වෘත්තියමය අවධානයකින් යුත් විවිධ උපාධි පාඨමාලා පිරිනමයි.

ඒ අතරින් පහත උපාධි පාඨමාලාව සලසා ඇත.

## 1. විද්‍යා උසස් ගෞරව උපාධිය (තොරතුරු තාක්ෂණය)

### පාඨමාලා ව්‍යුහය

මෙම උපාධි පාඨමාලාව වසර හතරක (4) අධ්‍යයන කාලයකට ආවරණය වන අතර, එක් වසරකදී සෙමෙස්ටර් දෙකක් ((2)) පවතී. එක් සෙමෙස්ටරයකදී සති 15ක කාලයකට දිවෙන අතර, සම්පූර්ණ සමස්ත කාලය අවසන් වූ පසු අධ්‍යයන විවේකයක්ද ලබා දේ. මෙම උපාධි වැඩසටහන උප විෂය මොඩියුල ඇතුළු සමස්ත අධ්‍යයන අංශ 129ක් ලෙස සැලසුම් කර ඇත.

### කාර්මික පුහුණුව

මෙම පාඨමාලාවට අත්‍යවශ්‍ය අංගයක් ලෙස කාර්මික පුහුණු වැඩසටහනක් ඇතුළත් වේ. සිසුන්ට තුන්වන වසරේදී මාස හයක දිගු කාර්මික පුහුණුවක් ලබා ගැනීමට අවස්ථාව ලැබේ. මෙම පුහුණුවට අධ්‍යයන අංශ 6ක අගයක් පවරා ඇත.

### ප්‍රධාන විෂයයන්

මෙම උපාධිය යටතේ අධ්‍යයනයට ලක් විය යුතු ප්‍රධාන විෂයයන් කිහිපයක් මෙසේය,

පරිගණක පද්ධති හැඳින්වීම, වැඩසටහන් රචනයේ මූලධර්ම, පරිගණක විද්‍යාවේ ධාර්මික හා වෘත්තීය ගැටළු, පරිගණක ව්‍යුහය සහ සංවිධානය, විශාල දත්ත විශ්ලේෂණය, උසස් දත්ත ගබඩා පද්ධත, දත්ත ඛනිජ කිරීම හා දත්ත ගබඩා කිරීම, ජංගම යෙදුම් සංවර්ධනය, වස්තු අන්තර්ජාලය හැඳින්වීම, සයිබර් ප්‍රහාර හා අනාවරණය

මීට අමතරව, සිසුන්ට සමූහ මෘදුකාංග ව්‍යාපෘතියක් අධ්‍යයන අංශ(3), කාර්මික පුහුණු ව්‍යාපෘතියක් අධ්‍යයන අංශ(6), සහ වසරක පුරා පැවැත්වෙන පෞද්ගලික ගවේෂණ ව්‍යාපෘතියක් අධ්‍යයන අංශ(8) ද ඇතුළත්ව පවතී

www.studentloans.mohe.gov.lk

### වෘත්තීය අවස්ථා

මෙම උපාධිය සම්පූර්ණ කරන ලද උපාධිධාරීන්ට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විශාල වෘත්තීය අවස්ථා විවෘත වේ. දත්ත විද්‍යාඥයන්, මෘදුකාංග ඉංජිනේරුවන්, තොරතුරු තාක්ෂණ ගුරු/උපාධිධාරී, වෙබ් සංවර්ධකයින්, තොරතුරු තාක්ෂණ කළමනාකරුවන්, මෘදුකාංග සංවර්ධකයින්, මෘදුකාංග නිර්මාපකයින්, පද්ධති සහ දත්ත ගබඩා පරිපාලකයින්, තොරතුරු ආරක්ෂණ විශ්ලේෂකයින්, පරිගණක විශ්ලේෂකයින් සහ තවත් බොහෝ වෘත්තීය අවස්ථා ඇත.

මෙම උපාධිය තොරතුරු තාක්ෂණයේ විශාල ව්‍යාප්තියක් ඇති ක්ෂේත්‍රයකට පිවිසීමට බලාපොරොත්තු වන සිසුන් සඳහා, නවෝත්පාදන හැකියාවන් සහ වෘත්තීය විශිෂ්ටත්වයක් ගොඩනගා ගැනීමට ඉතා සුදුසු මාර්ගයකි.

## 2 විද්‍යා සම්මාන උපාධිය (ගෞරව) - මෘදුකාංග ඉංජිනේරු

### පාඨමාලා ව්‍යුහය

මෙම මෘදුකාංග ඉංජිනේරු ගෞරව විද්‍යා උපාධි පාඨමාලාව වසර හතරක කාලයකට සංවිධානය කර ඇත. (1) වන වසර, (2) වන වසර, (3) වන වසර, සහ (4) වන වසර ලෙසය. එක් වසරකදී සෙමෙස්ටර් දෙකක් (2) පවතින අතර එක් සෙමෙස්ටරයක කාලය සති (15) කි. අධ්‍යයනයේ සති 15ක් අවසන් වූ පසු අධ්‍යයන නිවාඩු කාලයක් ලබා දේ. මෙම පාඨමාලාව අධ්‍යයන අංශ 131 අගයන් සහිතව නිර්මාණය කර ඇති අතර, විකල්ප විෂය මොඩියුලයන් ද ඇතුළත් වේ.

### කාර්මික පුහුණුව සහ පර්යේෂණ ව්‍යාපෘතිය

පාඨමාලාවට කාර්මික පුහුණුවක් අන්තර්ගත වන අතර, ඒ 3 වන වසරේදී මාස (6) ක කාලයක් පුරා ඉටු කළ යුතුය. එය අධ්‍යයන අංශ 6 ක වටිනාකමක් අරගෙන තිබේ. අමතරව, පූර්ණ කාලීන තනි පර්යේෂණ ව්‍යාපෘතියක් වසරක කාලයක් පුරා ඉටු කිරීමට තිබේ. මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ අගය අධ්‍යයන අංශ (8) කට සමාන වේ.

### මූලික විෂයයන්

මෘදුකාංග ඉංජිනේරුවීම සඳහා ගණිතය, වස්තු-මූලික විශ්ලේෂණය සහ සැලසුම, වෙබ් වැඩසටහන් ලිවීම, ජංගම යෙදුම් සංවර්ධනය, මෘදුකාංග ආකෘති හා සැලසුම් රටා, ව්‍යාපාර යෙදුම් සංවර්ධනය, මනුෂ්‍ය පරිගණක අන්තර්ක්‍රියාව, යෙදවුම් යන්ත්‍රික ඉගෙනුම, බෙදාහරින පද්ධති සහ වලාකුළු පරිගණක විද්‍යාව, මෘදුකාංග විකසනය හා නඩත්තු කිරීම.

### වෘත්තීය අවස්ථා

මෙම උපාධියෙන් අනතුරුව ඔබට පහත වෘත්තීන් සඳහා සුදුසුකම් ලැබිය හැකිය:

මෘදුකාංග ඉංජිනේරුවෝ, විසඳුම් ඉංජිනේරුවෝ, මෘදුකාංග නිර්මාණ ශිල්පීන්, ගේම් සංවර්ධකයින්, තත්ත්ව ආරක්ෂණ ඉංජිනේරුවෝ, ජංගම යෙදුම් ඉංජිනේරුවෝ, පරිගණක යෙදුම් ඉංජිනේරුවෝ සහ තවත් බොහෝ තාක්ෂණික වෘත්තීන් සඳහාද දොරගැටුම් විවෘත වේ.

www.studentloans.mohe.gov.lk

## අධ්‍යාපන පීඨය

## ප්‍රාථමික අධ්‍යාපනයේ ගෞරව අධ්‍යාපන උපාධිය

### පාඨමාලා ව්‍යුහය

මෙම ප්‍රාථමික අධ්‍යාපනයේ ගෞරව අධ්‍යාපන උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත්තේ ශ්‍රී ලංකා අධ්‍යාපන සුදුසුකම් රාමුවේ ඛූජ මට්ටම 6 සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලීම සඳහාය. මෙම පාඨමාලාව වසර හතරක 4 කාලයක් පුරා පවතින අතර, එහිදී 122 අධ්‍යයන අංශ අගයන් අධ්‍යයනය කළ යුතුය. එයට වෘත්තීය සහ අධ්‍යයන සහ ඉගැන්වීමේ පුහුණුව ඇතුළත් වේ.

### මූලික විෂය ක්ෂේත්‍ර

**වෘත්තීය අධ්‍යයන**
වෘත්තීය අධ්‍යයන, අධ්‍යාපනයේ දාර්ශනික පදනම, ළමා සංවර්ධනය හා ඉගෙනීම, ප්‍රාථමික පාසල් විෂයමාලා, පංති බද්ධ අධ්‍යාපන රණපිළිවෙළ හා ජාත්‍යන්තර අධ්‍යාපනය

**විෂයමාලා අධ්‍යයන**
සිංහල, දෙමළ හා ඉංග්‍රීසි විෂයමාලා ප්‍රායෝගික අධ්‍යාපන, විද්‍යාව, ගණිතය, පරිසර අධ්‍යාපනය සෞඛ්‍ය විද්‍යාව, ශාරීරික අධ්‍යාපනය, ආගම, නිර්මාණශීලී හා අලංකාර කලා

**ඉගෙනුම් පදනම**
මෘදු කුසලතා, තොරතුරු හා මාධ්‍ය කුසලතා, ඉගෙනුම් කුසලතා හා ඉතිහාසය

**විකල්ප විෂයයන්**
ඉගැන්වීම හා ඉගෙනීම සඳහා පරිගණක තාක්ෂණය, සංවිධානික හැසිරීම්, ළදරු සහ ප්‍රාථමික සමයෙහි සත්කාරය, යාන්ත්‍රික බුද්ධියට හැඳින්වීම, අධ්‍යාපන කළමනාකරණය සහ පාසල් සංවිධානය

**පර්යේෂණය**
අධ්‍යාපන ක්ෂේත්‍රයේ අදාළ පර්යේෂණ ක්‍රියාවලියක් පාඨමාලාවේ අංගයක් ලෙස ඇතුළත් වේ.

**වෘත්තීය සංවර්ධනය සහ පාසල් අත්දැකීම්**

- දෙවැනි වසරේ දෙවැනි සෙමේස්ටරයේදී දින 20ක ගුරු පුහුණුව
- සිව්වැනි වසරේ දෙවැනි සෙමේස්ටරයේදී මාස 6ක ගුරු පුහුණුව

### වෘත්තීය අවස්ථා

මෙම පාඨමාලාවේ උපාධිධාරීන්ට පහත වෘත්තීය මාර්ග රැසක් ලබා ගත හැකිය:

ප්‍රාථමික පාසල් ගුරු, අධ්‍යාපන සහකාරයින්, විෂයමාලා සැලසුම්කරුවන්, ඉගැන්වීම් නායකයින්, දුරස්ථ අධ්‍යාපන ගුරු, ඉගෙනුම් වැඩිදියුණු කිරීමේ ගුරු

www.studentloans.mohe.gov.lk

## ආරම්භක ළමා අධ්‍යාපනයේ ගෞරව අධ්‍යාපන උපාධිය

### පාඨමාලා ව්‍යුහය

ආරම්භක ළමා අධ්‍යාපනයේ ගෞරව අධ්‍යාපන උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත්තේ ශ්‍රී ලංකා අධ්‍යාපන සුදුසුකම් රාමුව් ිබුත මට්ටම 6 සඳහා අවශ්‍ය මට්ටම් සපුරාලීම සඳහාය. මෙම පාඨමාලාව වසර හතරක 4 කාලයක් පුරා පවතින අතර, මෙහිදී 127 ක අධ්‍යයන අංශ අගයන් අධ්‍යයනය කළ යුතුය. පාඨමාලාව වෘත්තීය අධ්‍යයන, විද්‍යාත්මක අධ්‍යයන සහ ගුරු අත්දැකීම් යන අංශ අතුරින් සමන්විත වේ.

### මූලික විෂය ක්ෂේත්‍ර

**වෘත්තීය අධ්‍යයන**
ආරම්භක ළමා අධ්‍යාපනය සහ ළමා සත්කාරය පිළිබඳ දාර්ශනික අදහස්, ළමා සංවර්ධනය සහ වර්ධනය, ළමයෝ සඳහා උපදේශන කාර්යයන්, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයෝ සඳහා අධ්‍යාපනය, ආරම්භක ළමා අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ

**විෂයමාලා අධ්‍යයන**
ආරම්භක ළමා භාෂා සංවර්ධනය, ළමයි සඳහා තාක්ෂණය, ළමා සාහිත්‍ය හා නිර්මාණාත්මක කලා ප්‍රායෝගික අධ්‍යාපන, ළමා සෞඛ්‍යය, පෝෂණය සහ ආරක්ෂාව

**ඉගෙනුම් පදනම**
භාෂා හා පාඨන හැකියාවන්, තොරතුරු හා මාධ්‍ය කුසලතා

**පොදු හා විකල්ප විෂයයන්**
පොදු විෂයයන්: ආගම හා සමාජ ගුණදර්ම අධ්‍යාපනය, පුරවැසි අධ්‍යාපනය, ඉතිහාසය.
විකල්ප විෂයයන්: ඉගැන්වීම සහ ඉගෙනීම සඳහා පරිගණක තාක්ෂණය, ළමයින් සඳහා ග්‍රැෆික් නිර්මාණය ළදරු හා ආරම්භක ළමා සත්කාරය, ළමයින් සඳහා සංගීතය, ජාතික කතා හා නවීන කතා කියවීම

**ව්‍යාපෘති හා පර්යේෂණ අධ්‍යයන**
ආරම්භක ළමා අධ්‍යාපනයට අදාළ පර්යේෂණ හා විද්‍යාත්මක ව්‍යාපෘති අධ්‍යයනය පාඨමාලාවේ අංගයක් ලෙස ඇතුළත් වේ.

**වෘත්තීය සංවර්ධනය සහ පාසල් අත්දැකීම්**

- දෙවැනි වසරේ දෙවැනි සෙමෙස්ටරයේදී දින 10ක ගුරු පුහුණුව
- තුන්වැනි වසරේ දෙවැනි සෙමෙස්ටරයේදී දින 10ක ගුරු පුහුණුව
- සිව්වැනි වසරේ (7) වන සහ (8) වන සෙමෙස්ටර දී කාර්මික පුහුණුවක්

### වෘත්තීය අවස්ථා

මෙම උපාධිය ලබාගත් සිසු-සිසුවියන්ට පහත වෘත්තීය මාර්ග විවෘත වේ:

ප්‍රාථමික පාසල් හෝ පූර්ව පාසල් ගුරු ( රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පුද්ගලික පාසල්), ජාත්‍යන්තර පූර්ව පාසල් ගුරු, ළමා සත්කාර මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරු, විශේෂ අධ්‍යාපන ගුරු, ආරම්භක ළමා අධ්‍යාපන කළමනාකරණ තනතුරු, නියෝජිත පාඨමාලා සම්බන්ධීකාරකවරු, තමාගේම පූර්ව පාසලක් ආරම්භ කිරීමට හැකියාව ආදී පැතිකඩයන් ඔස්සේ ඔබට සම්බන්ධ විය හැක.

www.studentloans.mohe.gov.lk

## මනෝ උපදේශන පීඨය

## උපදේශන මානසික විද්‍යාවේ විද්‍යා උපාධිය (ගෞරව)

### වැඩසටහනේ සංවිධානය

මෙම උපාධි වැඩසටහන අවුරුදු හතරක (4) අධ්‍යයන කාලයකට සූදානම් කර ඇත. එය සමානව සෙමස්ටර් අටක (8) ලෙස වෙන් කර ඇති අතර එක් අවුරුද්දකට සෙමස්ටර් දෙකක් පවතී. උපාධිය සඳහා සුදුසු වීමට, සිසුවෙක් මුළු අධ්‍යයන අංශ 120ක් ලබා ගත යුතුය. මෙහිදී, මුල් අවුරුදු තුනේදී අධ්‍යයන අංශ 90ක් සහ අවසන් අවුරුද්දේ අධ්‍යයන අංශ 30ක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

මෙම උපදේශන මනෝවිද්‍යා උපාධි වැඩසටහනේ පාඨමාලාව, මනෝවිද්‍යාව, උපදේශනය, උපදේශන මනෝවිද්‍යාව, තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි යන අධ්‍යයන ප්‍රදේශ වලට වෙන් කර ඇත.

### මූලික විෂය ක්ෂේත්‍ර

උපදේශන නීති සහ ධර්මය, ජීව විද්‍යාත්මක මානසික විද්‍යාව, සංවර්ධන මානසික විද්‍යාව, ඇබ්බැහිවීමේ මානසික විද්‍යාව සහ උපදේශනය, ප්‍රතිකාරක මානසික විද්‍යාව, පුද්ගලත්ව මානසික විද්‍යාව, උසස් උපදේශන කුසලතා, වෘත්තීය උපදේශනය, සංඛ්‍යාත ක්‍රම, ධනාත්මක මානසික විද්‍යාව, සමාජ මානසික සහාය, පවුල් උපදේශනය, මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම, පාසල් උපදේශනය, පුනර්ස්ථාපන උපදේශනය, ආතති උපදේශනය, උපදේශන කුසලතා පුහුණුව සහ අධීක්ෂණය, උපාධි පර්යේෂණය

මෙය පර්යේෂණ ක්‍රම ෂ සහ ෂෂ වල දිගුවක් වන අතර, එය වැඩසටහනේ වැඩිම අධ්‍යයන ධාරිතාව සහිත කොටසක් ලෙස සැලකේ.

### පුහුණුව

උපාධියට අයත් පුහුණුවේදී සිසුන්ට සම්බන්ධ ක්ෂේත්‍රයක පියවර ගැනීමට හා මානසික සෞඛ්‍ය සහ උපදේශන සේවාවන් ලබාදෙන ආයතනයක අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබාදේ. අමතරව, වෘත්තීය සංවර්ධනයට අදාල සම්මන්ත්‍රණ හා වැඩමුළු වලට සහභාගී වීමත් අත්‍යවශ්‍ය වේ.

### වෘත්තීය අවස්ථා

මෙම උපදේශන මානසික විද්‍යාවේ විද්‍යා උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍යයන්ට විවිධ රැකියා අවස්ථා තිබේ:

ශිෂ්‍ය සහාය සහ මගපෙන්වීමේ නිලධාරීන්, ප්‍රජා සේවා සහායකයින්, පර්යේෂකයන් හෝ අධ්‍යයන විශේෂඥයන්, සෞඛ්‍ය හෝ සමාජ සේවා අංශවල පරිපාලන රැකියා, පුනර්ස්ථාපන සහාය නිලධාරීන් සහ අනෙක් විවිධ මානව සේවා අංශවල වෘත්තීය අවස්ථා ගණනාවක් ඇත.

### “BCI විසින් ලබාදෙන උපාධි වැඩසටහන්වලින් ශිෂ්‍යයාට අපේක්ෂා කළ හැක්කේ කුමක්ද?” යන පාඨය මෙසේ විමසා දක්වමු,

**ඊඝෂ හි උපාධි වැඩසටහන් මූලිකව අවධානය යොමු කරනු ලබන අංශ:**

- ❖ කාර්මික සහකාරීත්වය- විද්‍යාලය හා කාර්මික අංශ අතර ඇති සහයෝගීත්වය මගින්, ශිෂ්‍යයන්ට වෘත්තියමය දැනුම සහ ප්‍රජාමූලික අධ්‍යාපනය හා පුහුණුව ලබා දීමට අවස්ථාව සලසයි.
- ❖ විවිධ ක්ෂේත්‍රවල වෘත්තීය සහ අධ්‍යාපන සුදුසුකම් පරාසයක් විවිධ විෂය ක්ෂේත්‍ර වලට අදාළ පුළුල් සුදුසුකම් පරාසයක් ලබා දීමෙන් ශිෂ්‍යයාගේ දැනුම පුළුල් කරයි.

www.studentloans.mohe.gov.lk

❖ ඵලදායී ඉගෙනීමේ මාර්ගයන්- පෙර අධ්‍යාපන පදනම හඳුනා ගනිමින්, ශිෂ්‍යයන්ට තම සුදුසුකම් ඉදිරියට ගොඩනගා ගන්න උපකාරී වන ඉගෙනීමේ මාර්ග සැලසේ.

❖ නවෝත්පාදනය සහ ව්‍යාපාරශීලීත්වය- තත්ත්වමය දැනුම හා ඉගෙනීම එකට එකතු කරමින්, ශිෂ්‍යයන්ට අත්දැකීම්මය ඉගෙනීම සහ ව්‍යාපාරශීලීත්වය පිළිබඳ අවස්ථා ගණනාවක් ලබා දේ.

**BCI හි අරමුණ,**

BCI ආයතනයෙහි අරමුණ වන්නේ, නවෝත්පාදනශීලී ඉගෙනීමේ හා ඉගැන්වීමේ පරිසරයක් තුළ, උසස්ම තත්ත්වයේ අධ්‍යාපනය ලබා දීමයි. මෙහිදී, ඊක්ෂ ආයතනය විශ්වප්‍රසිද්ධ කාර්මික සහ අධ්‍යාපනික ආයතන සමඟ සම්බන්ධතා පවත්වා ගනී. එමගින් ශිෂ්‍යයන්ට මූලික දැනුම පමණක් නොව, පිළිවෙලින් අත්දැකීම් ලබා ගැනීමටද හැකි වේ. ඒ මගින්, ඔවුන්ගේ අධ්‍යාපනය නවීන යුගයේ අවශ්‍යතා සමඟ යාවත්කාලීන කර තැබීමත්, ඔවුන්ගේ වෘත්තීය ජීවිතය ආරක්ෂිත හා තිරසාර කර ගැනීමත් සහතික වන බව සඳහන් කළ යුතුය.

## 5.15 නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය (NIIBS) මගින් පිරිනැමෙන උපාධි වැඩසටහන්

### තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාසල (School of ICT) මගින් පිරිනැමෙන තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය, ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කර ඇති අතර, විශ්වවිද්‍යාල මන්ත්‍රණ සභාව (UGC) විසින්ද පිළිගැනීම ලැබ ඇත. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ තාක්ෂණික හැකියාවන් සහ ශාස්ත්‍රීය සහ වෘත්තීය දක්ෂතා අත්පත් කරගත් උපාධිධාරීන් බිහි කිරීමයි. එමඟින් දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළවල තොරතුරු තාක්ෂණ විශේෂඥයන් පිළිබඳ වර්තමානය ඉල්ලුම සපුරාලීමට හැකි වන අතර, නාගානන්ද ආයතනයේ බෞද්ධ පරිසරය මගින් ප්‍රවර්ධනය වන සදාචාර සහ සංස්කෘතික අගයන් ඒ සමඟ ඒකාබද්ධ කර ඇත.

**වැඩසටහන් ව්‍යුහය**

මෙම උපාධි වැඩසටහන අවුරුදු හතරක අධ්‍යාපන කාලසීමාවක් තුළ සංවිධානය කර ඇති අතර, සිසුන්ගේ දැනුම හා හැකියාවන් තොරතුරු තාක්ෂණයේ මූලික ක්ෂේත්‍රවල ක්‍රමයෙන් වර්ධනය කරයි. ඒ අතරින් මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, දත්තසමුහ කළමනාකරණය, ජාල හා ජංගම යෙදුම් සංවර්ධනය, දත්ත විශ්ලේෂණය, සයිබර් ආරක්ෂාව, කෘතිම බුද්ධිය, සහ ව්‍යාපෘති කළමනාකරණය ඇතුළත් වේ.

මෙම පාඨමාලාව මූලික සහ විකල්ප විෂයයන් වලින් සමන්විත වන අතර, සිසුන්ට නව තාක්ෂණික ක්ෂේත්‍රවල විශේෂීකරණය කිරීමට හැකිවේ. දේශන පංතිවලට අමතරව, සිසුන් ප්‍රායෝගික විද්‍යාගාර පුහුණු, කණ්ඩායම් ව්‍යාපෘති, පර්යේෂණ, සහ කාර්මාන්තික පුහුණු වැඩසටහන් වලටත් සම්බන්ධ වේ.

www.studentloans.mohe.gov.lk

**සීමාවාසික පුහුණුව**

අවසාන වසරේදී සිසුන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ සීමාවාසික පුහුණුවක් ලබාගැනීමට අවස්ථාව සලසන අතර, එමඟින් සිසුන්ට සැබෑ සේවා පරිසරයක අත්දැකීම් ලබාගැනීමට හැකිවේ. මෙම පුහුණුව විද්‍යාත්මක දැනුම හා ප්‍රායෝගික අත්දැකීම් අතර සම්බන්ධතාවය ඇති කරමින්, උපාධිධාරීන් වෘත්තීය ක්ෂේත්‍රයට සූදානම් කරයි.

අධීක්ෂකයාගේ ප්‍රතිචාරය, පුහුණු වාර්තාව, සහ වාචික විභාගය මතය. එමඟින් සිසුන්ගේ ඉදිරිපත් කිරීමේ හැකියාව, තාක්ෂණික දැනුම, සහ ව්‍යාපාරික අවබෝධය මත සීමාවාසික පුහුණුව විභාග කරයි. තවත් එක් අංගයක් ලෙස සිසුන්ට පර්යේෂණ ව්‍යාපෘතියක් ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය වේ.

**රැකියා අවස්ථා**

තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය ලබන සිසුන් දේශීය සහ ජාත්‍යන්තර තාක්ෂණික ක්ෂේත්‍රයන්හි විවිධ වෘත්තීය මාර්ග සඳහා සූදානම් වේ. පහත සඳහන් වෘත්තීය අවස්ථා උදාහරණ වේ:

- මෘදුකාංග ඉංජිනේරු / වෙබ් සංවර්ධක
- දත්තසමුහ පරිපාලක
- ජාල ඉංජිනේරු / පද්ධති විශ්ලේෂක
- සයිබර් ආරක්ෂණ විශේෂඥ
- කෘතීම බුද්ධිය ඉංජිනේරු / දත්ත විශ්ලේෂක
- තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරු
- ව්‍යාපාර විශ්ලේෂක / ERP උපදේශක
- තොරතුරු තාක්ෂණ විෂයයේ නියෝජිත ආචාර්යවරයා හෝ පර්යේෂකයෙක්

මෙම උපාධිය තොරතුරු තාක්ෂණය හා එයට අදාළ විෂයයන් පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහාද ශක්තිමත් පදනමක් ලබාදේ.

## 5.16 ව්‍යාපාර කළමනාකරණ පාසල (BMS) විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්

- **ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව)**

### 1. පසුබිම

BMS විශ්වවිද්‍යාලය විසින් එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය වැනි රටවල ලොව ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමග සහයෝගී ව, ගෝලීය රැකියා අවස්ථා ලබා ගැනීමට සඳහා උසස් තත්ත්වයෙන් යුත් අධ්‍යාපනයක් සහ පැහැදිලි ඉදිරි මගක් සලසමින්, වසර 25ක අනර්ඝ සේවාවක් අභිමානයෙන් යුතු ව සමරනු ලබයි. BMS විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති සියලු ම සේවාවන්වල පවතින අධ්‍යාපනික සහ වෘත්තීමය ගුණාත්මකභාවය හේතුවෙන්, එම විශ්වවිද්‍යාලය අසමසම කීර්තිනාමයක් ගොඩනඟා ඇත. වර්තමානයේ දී අපගේ ආදි විද්‍යාර්ථීන් බහුජාතික සමාගම්වල උසස් ධුරයන් දරන අතර,

තවත් පිරිසක් සාර්ථක ව්‍යාපාර අරඹමින් සමාජයට අර්ථවත් මෙහෙවරක් සිදු කරති. මෙය අප ආයතනයේ කල්පැවැත්මට තුඩු දෙන මනා සාක්ෂියකි.

**2.** වැඩසටහන් ව්‍යුහය

**ශ්‍රී ලංකා සුදුසුකම් රාමු (SLQF) මට්ටම් 6** ට අනුකූල වන පරිදි සකස් කර ඇති මෙම **ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය** මගින් කළමනාකරණ අධ්‍යයනයට අදාළ ව සියලු ම ප්‍රධාන අංශ පූර්ණ ලෙස ආවරණය කරනු ලබන අතර, ශ්‍රී ලංකාව තුළ **වසර හතරක දී (4)** සම්මාන 120ක් පිරිනමයි. මෙම වැඩසටහන මගින් නූතන ව්‍යාපාර පරිචයන්, ක්‍රමෝපායික තීරණ ගැනීම සහ සඵලදායී කළමනාකරණ ප්‍රතිපත්ති පිළිබඳ ගැඹුරු අවබෝධයක් සිසුන්ට ලබා දෙන අතර, පුළුල් පරාසයක පවතින ආයතනික සැකසුම් තුළ ඔවුනට ඉදිරියට ම යෑමට රුකුළක් සපයයි.

මැනවින් ව්‍යුහගත කරන ලද සහ ක්ෂේත්‍රයට අදාළ විෂය නිර්දේශය සමගින් සිසුන්ට කළමනාකරණය, මානව සම්පත්, ආයතනික හැසිරීම, උපායමාර්ගික කළමනාකරණය, නායකත්වය, අලෙවිකරණය, ජාත්‍යන්තර ව්‍යාපාර, මූල්‍ය, ගිණුම්කරණය සහ සමකාලීන ව්‍යාපාරික පරිසරය ඇතුළු ව, විවිධ ව්‍යාපාර ක්ෂේත්‍රයන් ඔස්සේ ප්‍රායෝගික කුසලතා උකහා ගැනීමට ඉඩකඩ හිමි වේ. මෙම වැඩසටහන මගින් සිසුන්ව දැනුවත් තීරණ ගැනීමට, සම්පත් සඵලදායී ව කළමනාකරණය කිරීමට සහ ආයතනික වර්ධනය සහ ප්‍රගතිය උදෙසා අර්ථාන්විත ව දායක වීමට සූදානම් කරවයි. මෙම වැඩසටහනෙහි ප්‍රධාන අංගයක් වන්නේ සිසුන්ට සැබෑ ලොව ව්‍යාපාර අභියෝග ගවේෂණය කිරීමට ඉඩ ලබා දෙන අතරවාරයේ දී ම, ඔවුන්ගේ විශ්ලේෂණාත්මක චින්තනය, ගැටලු නිරාකරණය සහ ශාස්ත්‍රීය ලේඛන කුසලතා ඔප්නංවන **අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතිය යි.** මීට අමතරව, **සය මාසික ව්‍යාපාර සීමාවාසික පුහුණුව** මගින් සිසුන්ට අගනා වෘත්තීමය අත්දැකීමක් ලබා දෙන අතර, එමගින් සිසුන් *දේශීය උපාධිධාරීන් ලෙස ගෝලීය රැකියා අවස්ථාවන්ට සහ ගෝලීය දැනුම සහිත ව දේශීය රැකියා අවස්ථාවන්ට නිරාවරණය කරනු ලබයි.*

**3.** රැකියා අවස්ථා

BMS විශ්වවිද්‍යාලය විසින් සිය සිසුන් BMS වෘත්තීය ජාලයේ කොටසක් වන ප්‍රමුඛ පෙළේ සේවායෝජකයන් සමග සෘජුව ම සම්බන්ධ කරවීමට, එම කාර්යය සඳහා ම වෙන් කළ රැකියා සෙවුම් වේදිකාවක් ලෙස — **graduatejob.lk** — යන වෙබ් අඩවිය ක්‍රියාත්මක කරනු ලබයි. **BMS විශ්වවිද්‍යාලයේ මෙම ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය** ශාස්ත්‍රීය සුදුසුකමකට වඩා යමක් ඔබට පිරිනමයි.

www.studentloans.mohe.gov.lk

BMS විශ්වවිද්‍යාලයේ සෑම සිසුවෙකු ම කිසිදු බාධාවකින් තොර ව පන්තිකාමරයේ සිට ව්‍යාපාරික ජීවිතය දක්වා පරිවර්තනය කිරීම සහතික කරමින්, ගෝලීය වශයෙන් පිළිගත් උපාධියක්, සැබෑ ලොව කර්මාන්ත නිරාවරණය සහ එක් එක් සිසුවාට උචිත පරිදි ලබා දෙන වෘත්තීය මගපෙන්වීම සමගින් සෑම සිසුවෙකු ම බලගන්වනු ලබයි. BMS විශ්වවිද්‍යාලය තෝරා ගැනීම යනු සැබෑ ලොව සාර්ථකත්වය සහ ගෝලීය වෘත්තීය වර්ධනය සමග අධ්‍යාපනය සම්බන්ධ කරන කදිම ශාස්ත්‍රීය ප්‍රජාවක කොටස්කරුවකු වීමකි.

- **ව්‍යාපාර කළමනාකරණවේදී**

**1. පසුබිම**

BMS විශ්වවිද්‍යාලය විසින් එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය වැනි රටවල ලොව ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමග සහයෝගී ව, ගෝලීය රැකියා අවස්ථා ලබා ගැනීමට සඳහා උසස් තත්ත්වයෙන් යුත් අධ්‍යාපනයක් සහ පැහැදිලි ඉදිරි මගක් සලසමින්, වසර 25ක අනර්ඝ සේවාවක් අභිමානයෙන් යුතු ව සමරනු ලබයි. BMS විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති සියලු ම සේවාවන්වල පවතින අධ්‍යාපනික සහ වෘත්තීමය ගුණාත්මකභාවය හේතුවෙන්, එම විශ්වවිද්‍යාලය සම කළ නොහැකි කීර්තිනාමයක් ගොඩනගා ඇති අතර, සිසුන්, දෙමව්පියන් සහ ජාත්‍යන්තර හවුල්කාරීත්ව ආයතනවලින් පැසසුම් ලබා ඇත. වර්තමානයේ දී අපගේ ආදි විද්‍යාර්ථීන් බහුජාතික සමාගම්වල උසස් ධුරයන් දරන අතර, තවත් පිරිසක් සාර්ථක ව්‍යාපාර අරඹමින් සමාජයට අර්ථවත් මෙහෙවරක් සිදු කරති. මෙය අප ආයතනයේ කල්පැවැත්මට තුඩු දෙන මනා සාක්ෂියකි.

**2.** වැඩසටහන් ව්‍යුහය

**ශ්‍රී ලංකා සුදුසුකම් රාමු (SLQF) මට්ටම් 5** ට අනුකූල වන පරිදි සකස් කර ඇති මෙම **ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය** මගින් කළමනාකරණ අධ්‍යයනයට අදාළ ව සියලු ම ප්‍රධාන අංශ පූර්ණ ලෙස ආවරණය කරනු ලබන අතර, ශ්‍රී ලංකාව තුළ **වසර තුනක දී (3)** සම්මාන 90ක් පිරිනමයි. මෙම වැඩසටහන මගින් නූතන ව්‍යාපාර පරිචයන්, ක්‍රමෝපායික තීරණ ගැනීම සහ සඵලදායී කළමනාකරණ ප්‍රතිපත්ති පිළිබඳ ගැඹුරු අවබෝධයක් සිසුන්ට ලබා දෙන අතර, පුළුල් පරාසයක පවතින ආයතනික සැකසුම් තුළ ඔවුනට ඉදිරියට ම යෑමට රුකුළක් සපයයි.

මැනවින් ව්‍යුහගත කරන ලද සහ කර්මාන්තයට අදාළ විෂය නිර්දේශය සමගින් සිසුන්ට කළමනාකරණය, මානව සම්පත්, ආයතනික හැසිරීම, උපායමාර්ගික කළමනාකරණය, නායකත්වය, අලෙවිකරණය, ජාත්‍යන්තර ව්‍යාපාර, මූල්‍ය, ගිණුම්කරණය සහ සමකාලීන ව්‍යාපාරික පරිසරය ඇතුළු ව, විවිධ ව්‍යාපාර ක්ෂේත්‍රයන් ඔස්සේ ප්‍රායෝගික කුසලතා උකහා ගැනීමට ඉඩකඩ හිමි වේ. මෙම වැඩසටහන මගින් සිසුන්ව

www.studentloans.mohe.gov.lk

දැනුවත් තීරණ ගැනීමට, සම්පත් සඵලදායී ව කළමනාකරණය කිරීමට සහ ආයතනික වර්ධනය සහ ප්‍රගතිය උදෙසා අර්ථාන්විත ව දායක වීමට සූදානම් කරවයි. මෙම වැඩසටහනෙහි ප්‍රධාන අංගයක් වන්නේ සිසුන්ට සැබෑ ලොව ව්‍යාපාර අභියෝග ගවේෂණය කිරීමට ඉඩ ලබා දෙන, ක්ෂේත්‍ර **පුහුණුකරණ යි.**

**3. රැකියා අවස්ථා**

BMS විශ්වවිද්‍යාලය විසින් සිය සිසුන් BMS වෘත්තීය ජාලයේ කොටසක් වන ප්‍රමුඛ පෙළේ සේවායෝජකයන් සමග ඍජුව ම සම්බන්ධ කරවීමට, එම කාර්යය සඳහා ම වෙන් කළ රැකියා සෙවුම් වේදිකාවක් ලෙස — **graduatejob.lk** — යන වෙබ් අඩවිය ක්‍රියාත්මක කරනු ලබයි. **BMS විශ්වවිද්‍යාලයේ මෙම ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය** ශාස්ත්‍රීය සුදුසුකමකට වඩා යමක් ඔබට පිරිනමයි. BMS විශ්වවිද්‍යාලයේ සෑම සිසුවෙකු ම කිසිදු බාධාවකින් තොර ව පන්තිකාමරයේ සිට ව්‍යාපාරික ජීවිතය දක්වා පරිවර්තනය කිරීම සහතික කරමින්, ගෝලීය වශයෙන් පිළිගත් උපාධියක්, සැබෑ ලොව කර්මාන්ත නිරාවරණය සහ එක් එක් සිසුවාට උචිත පරිදි ලබා දෙන වෘත්තීය මගපෙන්වීම සමගින් සෑම සිසුවෙකු ම බලගන්වනු ලබයි. BMS විශ්වවිද්‍යාලය තෝරා ගැනීම යනු සැබෑ ලොව සාර්ථකත්වය සහ ගෝලීය වෘත්තීය වර්ධනය සමග අධ්‍යාපනය සම්බන්ධ කරන කදිම ශාස්ත්‍රීය ප්‍රජාවක කොටස්කරුවකු වීමකි.

## 5.17 The Lyceum Campus (Private) Limited

### Bachelor of Education Honours in Primary Education / B.Ed Hons (Primary Education)

ලයිසියම් කැම්පස් (Lyceum Campus) විසින්ව පිරිනමනු ලබන ප්‍රාථමික අධ්‍යාපන ගෞරව උපාධි

වැඩසටහන ශ්‍රී ලංකා උපාධි රාමුව (SLQF) යටගේ 6 වන මට්ටගමේ ප්‍රමිතීන්ව පදනම් කරගගන නිර්මාණය කර ඇත. Credits 130ක් ඇතුළේ මෙම වැඩසටහන, වර්ගීකරණය කළ විෂය ක්ෂේත්‍රය පහකින් සමන්වවිත වේ. වෘත්තීය අධ්‍යයන (Professional Studies), අධ්‍යාපන අධ්‍යයන (Academic Studies), පදනම් අධ්‍යයන (Foundation Studies), (Elective Studies) සහ ක්ෂේත්‍ර අත්දැකීම් (Field Experience).

මෙම උපාධි වැඩසටහගනහි අරමුණ වන්නේ, දේශීය සහ ජාත්‍යන්ව අධ්‍යාපන ක්ශෂ්ත්‍රගේ පවතින හා ඉදිරියේදී ඇති වන අවශ්‍යතා සපුරාලීමට හැකි නගවෝත්පාදමය හා ගුරුවරුන්ව බිහි කිරීමයි.

එමඟින්ව නව ඉගැන්වීම් ක්‍රම, නවය උපකරණ හා තාක්ෂණ, සහ ප්‍රාගයෝගික අත්දැකීම් එකට සංගයෝජනය කරමින්, ඉගැන්වීම සහ ඉගනීමේ ගුණාත්දකභාවය උසස් කිරීගම් අරමුණ ඉටු කරයි.

මෙම පාඨමාලාව ඔස්සේ, දැනුම, කුසලතාව සහ වෘත්තීය හැසිරීම යන අංග ත්‍රිත්වයන්ගෙන් පරිපූර්ණ බහුකාර්ය හැකියාවන්වගගන්ව යුත් ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රයන්ගේ නව පරපුගර් ගුරුවරගයකු බිහි කිරීම මූළික අරමුණ වේ.

www.studentloans.mohe.gov.lk

විෂය ව්‍යුහය පදනම් අධ්‍යයන

(FS)

English for Communication

Information Communication Technology (ICT)
Study Skills

Interpersonal Skills Development
English for Academic Purposes
Speech & Drama

වෘත්තීය අධ්‍යයන (PS)

Philosophical Thoughts on Primary Education

www.studentloans.mohe.gov.lk

Psychological Bases in Primary education
Sociological Aspects in Primary Education
Counselling in Primary School

Teaching Methodology for Primary Classroom
Curriculum Practices in Primary Education

Special Learning Teaching Methods for Primary Classroom
Assessment for Learning in Primary Classroom

Inclusive Practices in Primary Classroom
Primary Teacher as a Classroom Manager
Primary Teacher as a Professional

Primary Teacher as a Reflective Practitioner
Research Methods in Education

අධ්‍යාපන අධ්‍යයන (AS)

First Language Studies
Primary Mathematics
Environmental Studies
Aesthetic Education
Basic Science

Health and Physical Education
Religious Studies

Second Language Studies
ICT

අධ්‍යයන (ES)

Comparative Studies in Primary Education
Managing Primary School

Early Childhood Education

Vocational and Non-Formal Education

ක්ෂේත්‍ර අත්දැකීම (FE)

Teaching Practice - Primary School Observation
Teaching Practice - Micro Teaching 1

www.studentloans.mohe.gov.lk

Teaching Practice - Teaching Practicum 1
Teaching Practice - Micro Teaching 2
Teaching Practice - Teaching Practicum 11
Teaching Practice - Teaching Practicum 111

www.studentloans.mohe.gov.lk

පර්යේෂණ අධ්‍යයනය

Research Study-Research Proposal
Research Study-Research
Dissertation

Learning Portfolio

ප්‍රායෝගික පුහුණුව

විෂය මාලාවට ඇතුළත් කර ඇති ඉගැන්වීම් නිරීක්ෂණ (School Observation) සහ ප්‍රාගයෝගික පුහුණුව (Teaching Practicum) ලයිසියම් කැම්පස් ආයතනය විසින්ව සංවිධානය කරනු ලැබේ.

ඉගැන්වීගම් ප්‍රාථමික පාසල් නිරීක්ෂණ (School Observation) - සති 1

ප්‍රායෝගික පුහුණුව (Teaching Practicum) - Micro Teaching i - සති 1

ප්‍රායෝගික පුහුණුව (Teaching Practicum - ප්‍රායෝගික ඉගැන්වීගම් පුහුණු සැසි i - සති 4

ප්‍රායෝගික පුහුණුව (Teaching Practicum - Micro Teaching ii - සති 2

ප්‍රායෝගික පුහුණුව (Teaching Practicum - ප්‍රායෝගික ඉගැන්වීගම් පුහුණු සැසි ii - සති 12

ප්‍රායෝගික පුහුණුව (Teaching Practicum - ප්‍රායෝගික ඉගැන්වීගම් පුහුණු සැසි iii - සති 16

www.studentloans.mohe.gov.lk

## 5.18 Gateway ආයතනය විසින් පිරිනමන උපාධි පාඨමාලා

අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව

Gateway Graduate School (GGS) මගින් පිරිනමනු ලබන අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව පරිපූර්ණ අධ්‍යාපනවේදියෙකු බිහි කිරීම සඳහා අවශ්‍ය සියලුම විෂය කරුණුවලින් සමන්විත වූවකි. මීට අදාළ විෂය නිර්දේශයේ අධ්‍යාපන මනෝ විද්‍යාව, නූතන ඉගැන්වීමේ ක්‍රම, පර්යේෂණ ක්‍රමවේදය, ඉගැන්වීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කිරීම හා නිර්මාණාත්මක ඉගැන්වීම ආදී විෂයයන් ඇතුළත්ව ඇත. එබැවින් මෙම උපාධි පාඨමාලාව අනාගතයේදී ගුරු වෘත්තියේ යෙදීමට හා අධ්‍යාපනය හා සම්බන්ධ රැකියා අපේක්ෂා කරන අයට ඉතා යෝග්‍ය වේ.

පාඨමාලා ව්‍යුහය

මෙය සිව් අවුරුදු පාඨමාලාවක් වන අතර අර්ධ වාර්ෂික (Semesters) 08 කින් සමන්විත වේ. උපාධි ලබාගැනීම සඳහා උපාධි අපේක්ෂකයින් සම්භාර (Credits) 120 ක් උපයා ගත යුතුය. ප්‍රධාන විෂයයන්ට අමතරව උපාධි අපේක්ෂකයින්ට වරණීය විෂයයන් :ධවඑසදබීක¯මඉවැජවී* පහක් අතුරින්, තම

උසස් පෙළ විෂය ධාරාවට අදාළව; ගණිතය, විද්‍යාව, කලා, මානව ශාස්ත්‍ර හා ව්‍යාපාර අධ්‍යයන යන විෂයයන්ගෙන් එකක් තෝරා ගත හැකිය. උපාධි අපේක්ෂකයින් අවසන් වසරේදී තෝරාගත් ප්‍රස්තුතයක් අනුව පර්යේෂණ නිබන්ධිකාවක්ද සම්පාදනය කළ යුතුය.

සීමාවාසික පුහුණුව

සියලුම උපාධි අපේක්ෂකයන්හට සෑම වසරකම රජයේ හෝ පුද්ගලික පාසල්වල අවම පැය 40කට නොඅඩු කාලයක් ඉගැන්වීමට අවස්ථාව සලසා දෙනු ඇත.

රැකියා අවස්ථා

සාර්ථකව අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්ට රජයේ හා පුද්ගලික පාසල්වල ආචාර්යවරුන් ලෙස කටයුතු කිරීමේ අවස්ථාව උදාකරගත හැක. ඊට අමතරව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඕනෑම රැකියාවකට යාමටද මෙමගින් අවස්ථාව සලසාගත හැක. තවද මෙම උපාධි සුදුසුකම පදනම් කරගෙන වෙනත් ඕනෑම රැකියාවකට හා පශ්චාත් උපාධි සඳහා ද අයදුම් කළ හැක.

www.studentloans.mohe.gov.lk

# 6 කොටස

## IFSLS හරහා උපාධි පාඨමාලා පිරිනමන ආයතන

1. SLIIT - www.sliit.lk
2. NSBM - www.nsbm.ac.lk
3. CINEC - www.cinec.edu
4. SIBA - https://siba.edu.lk/
5. ICASL - www.casrilanka.com
6. HORIZON - www.horizoncampus.edu.lk
7. KIU - https://kiu.ac.lk/
8. SLTC - www.sltc.ac.lk
9. SAEGIS - www.saegis.ac.lk
10. ESOFT - www.esoft.lk
11. AQUINAS - www.aquinas.lk
12. ICHEM - www.ichem.lk
13. ICBT - www.icbtcampus.edu.lk
14. BCI - www.bci.lk
15. NIIBS - https://niibs.lk/
16. BMS - www.bms.lk
17. LYC - www.lyceumcampus.lk
18. GATEWAY - https://gatewaycollege.lk

www.studentloans.mohe.gov.lk